# වාර්ෂික වාර්තාව 2014

## කා.සං.ම

## ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

## 2014 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන්වූ වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාව

---

# ආයතනය

### පසුබිම

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය මුලින්ම 1957 අංක 49 දරණ රජයේ කාර්මික නීතිගත සංස්ථා පනත යටතේ 1966 වර්ෂයේ දී ස්ථාපිත කරන ලදී. පසුව 1969 අංක 36 දරණ කාර්මික සංවර්ධන පනත යටතේ කාර්මික සංවර්ධන මණ්ඩලය එහි වර්තමාන ස්වරූපයෙන් සංස්ථාගත කරන ලදී. මෙම පනත ප්‍රකාරව කාර්මික සංවර්ධන මණ්ඩලයට ශ්‍රී ලංකාවේ කර්මාන්ත අංශය සංවර්ධනය කිරීමේ වගකීම පැවරී තිබේ.

### මණ්ඩලයේ අරමුණු

1969 අංක 36 දරණ කාර්මික සංවර්ධන පනත මගින් නියම කර ඇති පරිදි කාර්මික සංවර්ධන මණ්ඩලයෙහි අරමුණු පහත සඳහන් පරිදි වේ:

- ශ්‍රී ලංකාවේ කර්මාන්ත දිරිමත් කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා සහාය වීම;
- මෙරට ආර්ථිකයෙහි පෞද්ගලික සහ රාජ්‍ය අංශයන්ට අයත් සියලුම කාර්මික ව්‍යාපාරයන්හි නිසි සම්බන්ධීකරණය සහ එකිනෙකට සබැඳි වර්ධනය සඳහා සහායවීම;
- ශ්‍රී ලංකාවේ ස්වාභාවික සම්පත් උපයෝජනය කිරීම, කර්මාන්තවලදී භාවිතා කරනු ලබන තාක්ෂණික ක්‍රියාවලීන් සහ ක්‍රමවේද වැඩිදියුණු කිරීම සහ දේශීය කර්මාන්ත සඳහා යෝග්‍ය තාක්ෂණයන් සහ උපකරණ සංවර්ධනය කිරීම සහ නිෂ්පාදන අපද්‍රව්‍ය වඩා යහපත් ලෙස උපයෝජනය කිරීම සඳහා ක්‍රියාවලීන් සහ ක්‍රමවේදයන් සකස් කිරීම යන අරමුණු ඇතිව කර්මාන්ත පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම;
- දේශීය කර්මාන්ත නිෂ්පාදන විදේශීය වෙළඳපොළට අපනයනය කිරීම ප්‍රවර්ධනය කිරීම;
- කර්මාන්ත සංවර්ධනයට අවශ්‍ය වන හෝ හිතකර වන පරිදි අන්තර්ජාතික වෙළඳාම සහ කලාපීය සහයෝගීතාවය යන ක්ෂේත්‍රවලදී ගනු ලබන ක්‍රියාමාර්ග සඳහා සහාය දීම;
- ප්‍රාග්ධන, ණය, අලෙවිකරණ, කළමනාකරණ, සහ තාක්ෂණික පහසුකම් සහ නීති උපදෙස් සපයා දීම ද ඇතුළුව ශ්‍රී ලංකාවේ ඇති ඕනෑම කාර්මික ව්‍යාපාරයක් හෝ කාර්මික ආයතනකට හෝ ඒ අදාළව අවශ්‍ය කරන සෑම ආකාරයකම පහසුකම් සහ සේවා සැපයීම.

මණ්ඩලයේ විවිධ අංශ සහ සේවා

සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත අංශ සඳහා සේවා පැකේජයක් සපයා දීම පිණිස මෙම මණ්ඩලය විවිධ අංශ සහ ආයතන දහයකින් සමන්විත වී තිබේ:

1. පාලන අංශය (AD)
2. ව්‍යාවසායකත්ව සංවර්ධන සහ උපදේශන සේවා මධ්‍යස්ථානය (CEDACS)
3. ඉංජිනේරු අංශය (ED)
4. කාර්මික ජනපද අංශය (IED)
5. අලෙවි අංශය (MD)
6. සැලසුම් අංශය (PD)
7. ප්‍රාදේශීය සංවර්ධන අංශය (RDD)
8. තාක්ෂණ සේවා අංශය (TSD)
9. සම්භාණ්ඩ නිෂ්පාදන සහ පාවහන් සංවර්ධන මධ්‍යස්ථානය (CDLPF)
10. රබර් නිෂ්පාදන සංවර්ධන සහ සේවා මධ්‍යස්ථානය (RPDSC)

ප්‍රාදේශීය සංවර්ධන අංශය යටතේ කාර්යාල 25 කින් සමන්විත දිස්ත්‍රික් කාර්යාල ජාලය ද, කාර්මික ජනපද අංශය යටතේ කාර්මික ජනපද 19 ක් ද ක්‍රියාත්මක වේ. ඉංජිනේරු අංශය යටතේ ක්‍රියාත්මක වන සේවා මධ්‍යස්ථාන 2 ක් තිබේ. තාක්ෂණික සේවා අංශය, සම්භාණ්ඩ නිෂ්පාදන සංවර්ධන අංශය, රබර් නිෂ්පාදන සංවර්ධන මධ්‍යස්ථානය, සහ ඉංජිනේරු අංශය විසින් දේශීය ව්‍යවසායකයින්ට පහසුකම් සැලසීම පිණිස තාක්ෂණය සහ අදාළ අනෙකුත් සේවා සපයා දීම සිදු කරනු ලැබේ.

කාර්මික සංවර්ධන මණ්ඩලයේ අනුමත සමස්ත සේවක සංඛ්‍යාව 714 ක් වන අතර එම කාර්ය මණ්ඩලය මට්ටම් 11 ක් යටතේ කාණ්ඩ කර ඇත.

## 2014 ජනවාරි සිට දෙසැම්බර් දක්වා

නවාස් රජාබ්දීන් මහතා - සභාපති

එස්. ආනන්ද රාජා මහතා - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

ජී.සී. ද සිල්වා මහතා - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

එච්.එම්.වී. ජයසිංහ මහතා - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

ආචාර්ය සමන් කැලේගම මහතා - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

## 2014 ජනවාරි සිට මැයි දක්වා

එම්.එම්. මොහමඩ් ජමීල් මහතා - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික කා.සං.ම.

## 2014 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා

කේ.එන්. කුමාරි සෝමරත්න මහත්මිය - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

ඇපා දයාරත්න මහතා - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

## 2014 පෙබරවාරි සිට නොවැම්බර් දක්වා

ආර්.එම්.ජේ. රත්නායක මහතා - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික - භාණ්ඩාගාර නියෝජිත

## 2014 දෙසැම්බර් සිට

ජේ.ආර්.සී, ජයතිලක මහතා - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

## අපේ දැක්ම

**“ සමස්ත ශ්‍රී ලංකාව පුරා ඇති සියලුම කර්මාන්ත සංවර්ධනය කිරීම”**

## අපේ මෙහෙවර

***“සමස්ත ශ්‍රී ලංකාව පුරා ඇති සියලුම කර්මාන්ත දිරිමත් කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය ක්‍රමෝපායික, තාක්ෂණික සහ වාණිජමය පදනම සපයාදීම”***

# අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ සමාලෝචනය



මම 2014 වර්ෂයේ වාර්ෂික වාර්තාවට එම වර්ෂය පිළිබඳ සමාලෝචනය එක් කරන්නේ ඉමහත් ප්‍රීතියෙන් යුක්තවයි. එමෙන්ම මෙම වර්ෂය තුළදී කාර්මික සංවර්ධන මණ්ඩලය දේශීය කර්මාන්තවලට, විශේෂයෙන්ම ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තවලට මණ්ඩලය විසින් සාමාන්‍යයෙන් සපයා දෙනු ලබන සේවාවන්ට අගය එකතු කෙරෙන වැදගත් ක්‍රියාමාර්ග ගණනාවක් ගෙන ඇති බව ද ඉතාමත් සතුටින් සඳහන් කරමි. මූල්‍ය කාර්යසාධනය සමාලෝචනය කිරීමේදී, 2014 වර්ෂය තුළ ආදායම් වර්ධනයක් සිදුවී ඇති බවත්, එම වර්ධනය ප්‍රධාන වශයෙන්ම ලෝහ අබලි අලෙවිය වැඩිවීම සහ කාර්මික ජනපදවල කුලිය වැඩිකිරීම හේතුවෙන් සිදුවූ වර්ධනයක් බවත් සඳහන් කරනු කැමැත්තෙමි.

ප්‍රතිසංධාන ක්‍රියාවලියට සමගාමීව, ඉන්දීය රජයේ සහයෝගය මත ලැබුණු රුපියල් මිලියන 220.0 ක් පමණ වූ අරමුදල් යටතේ 2014 මැයි මාසයේදී යාපනය අච්චුවේලි කාර්මික ජනපදය නැවත ආරම්භ කිරීමට කාර්මික සංවර්ධන මණ්ඩලයට හැකි විය. කාර්මික සංවර්ධන මණ්ඩලයට අයත්, යුද්ධය හේතුවෙන් සම්පූර්ණයෙන්ම විනාශයට පත්වී තිබූ එම කාර්මික ජනපදයෙහි අක්කර 25 ක පමණ භූමි ප්‍රදේශයක ව්‍යාපෘති සේවා සඳහා වන එක්සත් ජාතීන්ගේ කාර්යාලයේ උපදේශකත්වය සමග ලැබුණු අරමුදල් සැපයීම මත විදුලි බලය, ජලය, සහ මළාපවහනය ඇතුළු සියලු පහසුකම් සපයා දෙමින් යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට කාර්මික සංවර්ධන මණ්ඩලයට හැකි විය. අභ්‍යන්තර මාර්ග ජාලය සහ මායිම් පවුරු සහිත මෙම පහසුකම් නිසා එහි පරිසරය ඕනෑම වර්ගයක කර්මාන්ත සඳහා සුදුසු තත්ත්වයක පවතී. එයට අමතරව, පල්ලෙකැලේ, වවුනියාව, පානළුව, සහ ගලිගමුව යන කාර්මික ජනපදවලට විශේෂ අවධානය යොමු කරමින් රුපියල් මිලියන 40 ක වියදමින් මෙම වර්ෂයේද කාර්මික ජනපදවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන තවදුරටත් ක්‍රියාත්මක කරන ලදී.

කාර්මික සංවර්ධන මණ්ඩලයේ ප්‍රධාන අරමුණු වන ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ප්‍රවර්ධනය කිරීමේ හා දිරිමත් කිරීමේ අරමුණු ප්‍රකාරව කටයුතු කරමින් කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් සංවිධානය කර බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වන ලද SMIDEX 2014 ප්‍රදර්ශනයේදී මණ්ඩලයට අයත් කාර්මික ජනපදවල කර්මාන්තකරුවන්ද ඇතුළු දේශීය කර්මාන්ත කරුවෙන්ගේ නිෂ්පාදන සහ සේවා ප්‍රදර්ශනය කිරීමට අවස්ථාව සලසා දීමට කාර්මික සංවර්ධන මණ්ඩලයට හැකි විය. මෙම ප්‍රදර්ශනයට සමගාමීව, එම කර්මාන්තකරුවන් ලබාගත් සාර්ථකත්වය ඇගයීමට ලක් කිරීම පිණිස ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් 220 දෙනෙකු පමණ පිළිගැනීමට ලක් කරමින් ඔවුන්ට ත්‍යාග ප්‍රදානය කිරීම පිණිස තිළිණ ප්‍රදානෝත්සවයක් ද පවත්වන ලදී.

දේශීය කර්මාන්තකරුවන් සඳහා ගෝලීය කර්මාන්ත තත්ත්වය නිරාවරණය පුළුල් කර අවශ්‍ය ජාත්‍යන්තර සම්බන්ධතා ගොඩනගාදීමේ වැදගත්කම අවබෝධ කර ගෙන කාර්මික සංවර්ධන මණ්ඩලය ඉන්දියාවේ නව දිල්ලි නුවර පැවති වෙළඳ ප්‍රදර්ශනයක් සහ වෙළඳපොළක් නැරඹීම පිණිස දේශීය කර්මාන්තකරුවන් කණ්ඩායමක් සඳහා විශේෂ චාරිකාවක් සංවිධානය කරන ලදී. එමෙන්ම, ඇලුමිනියම් වාත්තු කර්මාන්තය සංවර්ධනය කිරීමේ අරමුණ ඇතිව, කාර්මික සංවර්ධන මණ්ඩලය ඉන්දියාවේ බැන්ගලෝර් නුවර පැවති Alucast ප්‍රදර්ශනය සහ ඇලුමිනියම් වර්ණ වාත්තුකිරීම පිළිබඳ සම්මන්ත්‍රණයට සහභාගී වීම පිණිස දේශීය කර්මාන්තකරුවන් කණ්ඩායමක් රැගෙන ගියේය.

එපමණක් නොව, අමාත්‍යංශයේ සංවර්ධන වැඩසටහන්වලට සමගාමීව, කර්මාන්ත ගම්මාන සංවර්ධනය කිරීමේ ජාතික වැඩසටහන යටතේ ගෘහ කර්මාන්ත ප්‍රවර්ධන කරමින්, මැටි භාණ්ඩ නිෂ්පාදන ගම්මාන සංවර්ධන වැඩසටහන, කිතුල් නිෂ්පාදන සංවර්ධන වැඩසටහන, සහ ව්‍යවසාය ගම්මාන සහ කාන්තා ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන සමස්ත දිවයින පුරාම ක්‍රියාත්මක කරන ලදී.

එමෙන්ම, කාර්මික සංවර්ධන මණ්ඩලයට සහ එහි කාර්ය මණ්ලයට මණ්ඩලයේ වාර්ෂික ඉලක්ක සපුරා ගැනීම සඳහා අවශ්‍ය මගපෙන්වීම, දිරිමත් කිරීම සහ සහයෝගය ලබා දීම වෙනුවෙන් ගරු අමාත්‍යතුමාට, අමාත්‍යංශයේ ලේකම්තුමාට සහ කාර්ය මණ්ඩලයට කාර්මික සංවර්ධන මණ්ඩලයේ කාර්ය මණ්ඩලය වෙනුවෙන් මාගේ අවංක ස්තුතිය මෙයින් පුද කර සිටිමි.

තවද, අනෙකුත් ජාතික සහ අන්තර්ජාතික සංවර්ධන ආයතන සමග එක්ව ක්‍රමෝපායික ක්‍රියාමාර්ග, නව ව්‍යාපෘති සහ වැඩසටහන් සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා දැඩි කැපවීමෙන් යුතුව සහයෝගය ලබා දුන් මණ්ඩලයේ සභාපතිතුමාට සහ අධ්‍යක්ෂ මණ්ඩලයටත්, කළමනාකාරීත්වය ඇතුළු කාර්ය මණ්ඩලයටත් මාගේ කෘතඥතාවය පුද කිරීමට කැමැත්තෙමි.

පී.එල්.යූ. රත්නමලල
වැඩබලන අධ්‍යක්ෂ ජනරාල්

# ප්‍රධාන සේවාවන් සහ පහසුකම්



# ආයතනික ව්‍යුහය



සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලය
අභ්‍යන්තර විගණක
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්
අධ්‍යක්ෂ ජනරාල්
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (මෙහෙයුම්)
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සංවර්ධන)
අධ්‍යක්ෂ - පරිපාලන
අධ්‍යක්ෂ - මුදල්
අධ්‍යක්ෂ - සැලසුම්
අධ්‍යක්ෂ - ප්‍රාදේශීය සංවර්ධන
අධ්‍යක්ෂ - කාර්මික ජනපද
අධ්‍යක්ෂ - ව්‍යවසායකත්ව සංවර්ධන සහ උපදේශන සේවා මධ්‍යස්ථානය (CEDACS)
අධ්‍යක්ෂ - ඉංජිනේරු
අධ්‍යක්ෂ - තාක්ෂණික සේවා
අධ්‍යක්ෂ - අලෙවි

# පටුන


**1.0** කාර්යසාධන සමාලෝචනය **01 -03**

**2.0** ප්‍රධාන ජයග්‍රහණ **04 - 06**

- SMIDEX 2014 - සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ප්‍රදර්ශනය
- ජාතික තිළිණ ප්‍රදානය - 2014 –
  2014 වර්ෂයේ හඳුනාගත් විශිෂ්ඨතාවය දැක්වූ ව්‍යාපාර
- තාක්ෂණික ඉදිරිපත්කිරීම් සැසි සහ නිෂ්පාදන නිරූපණය කිරීම්
- ජාත්‍යන්තර පාවහන් සහ සම්භාණ්ඩ ප්‍රදර්ශනය - 2014
- සුනිත්‍ය බලශක්ති අධිකාරිය සමග අවබෝධතා ගිවිසුමකට එළැඹීම

**3.0** ප්‍රගති සාරංශය **07 - 11**

- කර්මාන්ත සහ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය දිරිමත් කිරීම,
  ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම
- අලෙවිකරණ සහ විකුණුම් සහාය සහ පහසුකම් සැලසීම
- කාර්මික ජනපද පිහිටුවීම, නඩත්තු කිරීම සහ පවත්වාගෙන යාම
- තාක්ෂණික, තාක්ෂණවේදී සහ ඉංජිනේරු සහාය සහ පහසුකම් සැලසීම
- කර්මාන්ත සහ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සඳහා ව්‍යාප්ති සහ උපදේශන සේවා

**4.0** කාර්යසාධන ජයග්‍රහණය

- පාලන අංශය (AD) **12 - 14**
- ප්‍රාදේශීය සංවර්ධන අංශය (RDD) **15 - 22**
- සැලසුම් අංශය (PD) **23 - 23**
- අලෙවි අංශය (MD) **24 - 27**
- කාර්මික ජනපද අංශය (IED) **28 - 31**
- ඉංජිනේරු අංශය (ED) **32 - 34**
- ව්‍යාවසායකත්ව සංවර්ධන සහ උපදේශන සේවා මධ්‍යස්ථානය (CEDACS) **35 - 39**
- තාක්ෂණ සේවා අංශය (TSD) **40 - 43**
- රබර් නිෂ්පාදන සංවර්ධන සහ සේවා මධ්‍යස්ථානය (RPDSC) **44 - 46**
- සම්භාණ්ඩ නිෂ්පාදන සහ පාවහන් සංවර්ධන මධ්‍යස්ථානය (CDLPF) **47 - 51**

**5.0** මූල්‍ය ප්‍රකාශන **52 - 77**

- 2014 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය
- ශේෂ පත්‍රය සඳහා සටහන්
- 2014 දෙසැම්බර් 31 දිනට දේපළ, යන්ත්‍රසූත්‍ර සහ පිරියත ක්ෂයවීම්
- සමුච්චිත හිඟය
- වර්ෂ 2013 – 2014 කාලපරිච්ඡේදය සඳහා ආදායම් වියදම් ප්‍රකාශනය
- 2014 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය
- කාර්ය මණ්ඩල පිරිවැය
- වෙනත් මෙහෙයුම් වියදම්

**6.0** මණ්ඩලයේ අදහස් ලබා ගැනීම සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාව **78 - 111**

# කාර්යසාධන සමාලෝචනය

කාර්යසාධන සමාලෝචනය

2014 වර්ෂය තුළදී කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් එහි අදාළ අංශ හරහා පහත සඳහන් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී:

වගුව 1.1 - ඉටු කරන ලද ක්‍රියාකාරකම්

| | ආයතනික අරමුණු ඉටුකරගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකාරකම් | ඒකක ගණන | ආයෝජනය (රු.) | රැකියා අවස්ථා ගණන |
|---|---|---|---|---|
| අ. | ස්වයංරැකියා ඒකක නිර්මාණය කිරීමට සහායවීම | 1,170 | 71,653,190 | 1,499 |
| ආ | නව කර්මාන්ත / ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ඒකක අරම්භකිරීම සඳහා තාක්ෂණික සහ අදාළ අනෙකුත් සහාය ලබාදීම. | 441 | 224,173,629 | 1,403 |
| ඇ | පවතින කර්මාන්ත වැඩිදියුණු කිරීමට, පුළුල් කිරීමට සහ නවීකරණය කිරීමට තාක්ෂණික සහ අදාළ අනෙකුත් සහාය ලබාදීම | 605 | 360,087,541 | 1,713 |
| | එකතුව | **2,216** | **655,914,360** | **4,615** |

ඉහත 1.2 වගුවේ (අ), (ආ) සහ (ඇ) යටතේ සඳහන් විෂයයන්ට අදාළ සංවර්ධන ක්‍රියාකාරකම් ක්ෂේත්‍රයේ සාමාන්‍ය කාර්සාධනය 2013 වර්ෂයේ එම ක්ෂේත්‍රවල කාර්සාධනයට සාපේක්ෂව අඩුවීමක් පෙන්නුම් කරයි. අලුතින් කර්මාන්ත ස්ථාපිත කිරීමේ අඩුවීමක් තිබුණ ද, 2013 වර්ෂයට සාපේක්ෂව 2014 වර්ෂයේදී සංවර්ධන වැඩසටහන් යටතේ සිදුකළ සමස්ත ආයෝජන ප්‍රමාණය 33% ට ආසන්න ප්‍රමාණයකින් වර්ධනය විය.

වගුව 1.2 - 2013 සහ 2014 වර්ෂවල සංසන්දනාත්මක තත්ත්වය

| විස්තරය | 2013 | 2014 | වර්ධනය (අඩුවීම) % |
|---|---|---|---|
| මුළු ඒකක ගණන (අ),(ආ),(ඇ) | **2,525** | **2,216** | **(-12.2)** |
| මුළු ආයෝජනය (රු) | **494,475,717** | **655,914,360** | **(33.4)** |
| සමස්ත රැකියා සංඛ්‍යාව | **4,389** | **4,615** | **(5.1)** |







**ප්‍රස්ථාරය 1.1 - කර්මාන්ත ඒකක සංඛ්‍යාව සහ ස්වයංරැකියා ඒකකවලින්, අලුතින් ආරම්භ කරන ලද කර්මාන්ත / ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ඒකකවලින් සහ දැනට පවතින ව්‍යාපාර මගින් උත්පාදනය කර ඇති රැකියා සංඛ්‍යාව.**

# ප්‍රධාන ජයග්‍රහණ

- **SMIDEX 2014 - සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ප්‍රදර්ශනය**

- **ජාතික තිළිණ ප්‍රදානය 2014 – 2014 වර්ෂයේ හඳුනාගත් විශිෂ්ඨ ව්‍යාපාර සඳහා තිළිණ ප්‍රදානය**

- **තාක්ෂණික ඉදිරිපත්කිරීම් සැසි සහ නිෂ්පාදන නිරූපණය කිරීම්**

- **ජාත්‍යන්තර පාවහන් සහ සම්භාණ්ඩ ප්‍රදර්ශණය 2014**

- **සුනිත්‍ය බලශක්ති අධිකාරිය සමග අවබෝධතා ගිවිසුමකට එළැඹීම**

**SMIDEX 2014 - සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ප්‍රදර්ශනය**

ශ්‍රී ලංකාවේ පවතින ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම පිණිස කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් සංවිධානය කරන ලද SMIDEX 2014 ප්‍රදර්ශනය සහ වෙළඳ පොළ **2014** මැයි මස **23 – 25** යන දිනවල කොළඹ බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවෙහිදී පවත්වන ලදී.

ජනාධිපතිතුමා **SMIDEX 2014** ප්‍රදර්ශනය නැරඹීම

ශ්‍රී ලංකාවේ ජනාධිපති අතිගරු මහින්ද රාජපක්ෂ මහතා **2014** මැයි මස **24** වැනි දින සන්ධ්‍යාවෙහිදී ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් එහි **45** වැනි සංවත්සරය සැමරීමට සමගාමීව සංවිධානය කර සිරිමාවෝ බණ්ඩාරනායක ප්‍රදර්ශන සහ සම්මේලන මධ්‍යස්ථානයෙහිදී පවත්වන ලද SMIDEX 2014 ප්‍රදර්ශනය නැරඹීමට පැමිණියේය.

අතිගරු ජනාධිපති රාජපක්ෂ මහතා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් නියෝජනය කරමින් දිවයිනේ දිස්ත්‍රික්ක **25** න් ම පැමිණ සිටි ව්‍යවසායකයින් හමුවී සාකච්ඡා කළේය. ප්‍රදර්ශන කුටි තුන්සියයකින් **(300)** සමන්විත මෙම ප්‍රදර්ශනයට සහභාගී වූ සමහර කර්මාන්තකරුවන් ඔවුන්ගේ නව නිපැයුම් සහ සේවා ප්‍රදර්ශනය කිරීම පිණිස එම ප්‍රදර්ශන කුටි සංවිධානය කර තිබූ අතර, දේශීය මෙන්ම විදේශීය වෙළඳපොළ ද ඉලක්ක කර ගනිමින් ප්‍රදර්ශනකරුවන් විශාල සංඛ්‍යාවකගේ ඒකරාශිවීම SMIDEX 2014 සමාරම්භන ප්‍රදර්ශනය මගින් දැක ගත හැකි විය.

සාම්ප්‍රදායික කර්මාන්ත සහ කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍ය ගරු ඩග්ලස් දේවානන්ද, ජ්‍යෙෂ්ඨ අමාත්‍ය ඒ.එච්.එම්. ෆවුසි, අධ්‍යාපන අමාත්‍ය ගරු බන්දුල ගුණවර්ධන, නියෝජ්‍ය අමාත්‍ය ගරු ගීතාංජන ගුණවර්ධන, සාම්ප්‍රදායික කර්මාන්ත සහ කුඩා ව්‍යවසාය සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය ගරු වීරකුමාර දිසානායක, සාම්ප්‍රදායික කර්මාන්ත සහ කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් වී. සිවඥානසෝති, සහ ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ සභාපති නවාස් රජාබ්දීන් යන මහත්වරු ද ජනාධිපතිතුමා සමග මෙම ප්‍රදර්ශනය නැරඹීමට එක්වී සිටියහ.

තම නව්‍ය වූ නිෂ්පාදන සහ සේවා ප්‍රදර්ශනය කළ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට ජනාධිපතිතුමාගේ පැමිණීම මහත් ශක්තියක් මෙන්ම ධෛර්යයක් ද විය. එමෙන්ම, කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් ප්‍රධාන වශයෙන්ම සම්භාණ්ඩ, පාවහන්, හස්ත කර්මාන්ත, දැව ආශ්‍රිත නිෂ්පාදන, රසායනික ද්‍රව්‍ය සහ මැටි ආශ්‍රිත නිෂ්පාදන වැනි සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තවල විවිධ උප අංශ නියෝජනය කරන විදේශීය විශේෂඥයින්ගේ සහභාගීත්වයෙන් තාක්ෂණ සැසි කිහිපයක් ද පවත්වන ලදී.

තවද, දේශීයව මෙන්ම අන්තර්ජාතික වශයෙන් ද නිෂ්පාදනය කරන ලද යන්ත්‍රසූත්‍ර සහ උපකරණ මෙම ප්‍රදර්ශනයෙහිදී ප්‍රදර්ශනය කරන ලදී.

ජාතික තිළිණ ප්‍රදානය **2014 – 2014** වර්ෂයේ හඳුනාගත් විශිෂ්ඨ ව්‍යාපාර සඳහා තිළිණ ප්‍රදානය

කාර්මික සංවර්ධන මණ්ඩලය දිවයින පුරා පිහිටි දේශීය නිෂ්පාදන කර්මාන්ත සඳහා ඇති පිළිගැනීම සහ එම කර්මාන්ත මගින් ජාතික ආර්ථිකයට ලබා දෙන දායකත්වය ප්‍රවර්ධනය කිරීම පිණිස ඒවායෙහි ව්‍යාපාර කාර්යසාධනය ඇගයීමට අවශ්‍ය කටයුතු සූදානම් කරන ලද අතර, ඒ අනුව ව්‍යවසායකයින් **583** දෙනෙකුට දිස්ත්‍රික් මට්ටමේ විශිෂ්ඨ කාර්යසාධනය වෙනුවෙන් ද, ව්‍යවසායකයින් **90** දෙනෙකුට පළාත් මට්ටමේ විශිෂ්ඨ කාර්යසාධනය වෙනුවෙන් ද, ව්‍යවසායකයින් **45** දෙනෙකුට ජාතික මට්ටමේ විශිෂ්ඨ කාර්යසාධනය වෙනුවෙන් ද තිළිණ ප්‍රදානය කරන ලදී.

තාක්ෂණික ඉදිරිපත් කිරීම් සැසි සහ නිෂ්පාදන නිරූපණය කිරීම්

SMIDEX 2014 ප්‍රදර්ශනයට සමගාමීව, ඉන්දියානු විශේෂඥයින්ගේ සහ නියෝජිතයින්ගේ සහයෝගය ඇතිව කාර්මික සංවර්ධන මණ්ඩලයෙහි තාක්ෂණික සේවා අංශය විසින් ඉදිරියේදී කර්මාන්තකරුවන් වීමේ හැකියාව සහිත පුද්ගලයින් මෙන්ම පොදු ජනතාව සඳහා ද පහත සඳහන් ප්‍රධාන ක්ෂේත්‍ර පිළිබඳව දැනුම්වත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී:

- උණ කර්මාන්තයෙහි ඇති තාක්ෂණික-ආර්ථික විභවයන්
- ගඩොල් සහ උළු කර්මාන්තයෙහි ඇති තාක්ෂණික ආර්ථික විභවයන්

## ජාත්‍යන්තර පාවහන් සහ සම්භාණ්ඩ ප්‍රදර්ශණය 2014

කාර්මික සංවර්ධන මණ්ඩලයේ සම්භාණ්ඩ නිෂ්පාදන සහ පාවහන් සංවර්ධන මධ්‍යස්ථානය සම සංවිධායකයෙක් ලෙස ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය සමග එක්ව 2014 පෙබරවාරි මස 7-9 යන දිනවල කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී තුන් වැනි වරටත් අන්තර්ජාතික පාවහන් සහ සම්භාණ්ඩ ප්‍රදර්ශනය - 2014 පවත්වන ලදී.
මෙම ප්‍රදර්ශනයෙහිදී දේශීය සහ විදේශීය ව්‍යාපාරිකයින්ගේ සහභාගීත්වය ඇතිව වෙළඳ කුටි 220 ට අධික සංඛ්‍යාව ඉදිකරන ලදී. කාර්මික සංවර්ධන මණ්ඩලය සුළු හා මධ්‍යපරිමාණ කර්මාන්ත ප්‍රදර්ශන කුටි 33 ක් ඇතුළත් කරමින් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ශාලා වල කාර්යයන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළේය. මෙම ප්‍රදර්ශනයෙහි විශේෂ අංග ලෙස පාවහන් සහ සම් භාණ්ඩ සැලසුම් කිරීම් සහ අතින් නිමවන ලද සපත්තු නිෂ්පාදනය පිළිබඳ නිරූපණය කිරීම් තරගයක් සහ වැඩමුළු ද පවත්වන ලදී. එයට අමතරව, 1900 වර්ෂයේ සිට 1950 වර්ෂය දක්වා කාලය තුළ මෙරට සම්භාණ්ඩ සහ පාවහන් අංශය වැඩිදියුණු කිරීම උදෙසා වැදගත් දායකත්වයක් ලබා දුන් පුද්ගලයින් ඇගයීමට ලක් කරමින් තිළිණ ප්‍රදානෝත්සවයක් ද පවත්වන ලදී.

### සුනිත්‍ය බලශක්ති අධිකාරිය සමග අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම

සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සඳහා වන ඒකාබද්ධ සුනිත්‍ය බලශක්ති වැඩසටහන් ක්ෂේත්‍රවල දක්වා ඇති දීර්ඝ කාලීන සහයෝගීතාව ගොඩනගා ගැනීම පිණිසත්, තාක්ෂණය හුවමාරු කර ගැනීම් සඳහාත්, ආයතන දෙකෙහි පවතින පරීක්ෂණ පහසුකම් භාවිතා කිරීම පිණිසත් කාර්මික සංවර්ධන මණ්ඩලය 2014 ජූනි මස 09 වැනි දින සුනිත්‍ය බලශක්ති අධිකාරිය සමග අවබෝධතා ගිවිසුමකට එළැඹුනේය.

# ප්‍රගති සාරාංශය

- කර්මාන්ත සහ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය දිරිමත් කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම
- කාර්මික ජනපද ආරම්භ කිරීම, නඩත්තු කිරීම සහ පවත්වාගෙන යාම
- අලෙවි සහ වෙළඳ සහාය සහ පහසුකම් සැලසීම
- කාර්මික, තාක්ෂණ සහ ඉංජිනේරු සහාය සහ පහසුකම් සැලසීම
- කර්මාන්ත සහ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සඳහා ව්‍යාපෘති සහ උපදේශණ සේවා සැපයීම

# වගුව **3.1** - ප්‍රගති සංරාංශය – 2014

| ප්‍රධාන තේමාව | වැඩසටහන / ක්‍රියාකාරකම | ප්‍රධාන කාර්යසාධන දර්ශක | ඉලක්කය | අත්කරගෙන ඇති ප්‍රගතිය |
|---|---|---|---|---|
| කර්මාන්ත සහ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය දිරිමත්කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම | අනාගත ව්‍යවසායකයින් වීමේ හැකියාව සහිත අය හඳුනාගැනීම පිණිස දැනුවත් කිරීමේ වැඩසටහන් / ආයෝජන ප්‍රවර්ධන සම්මන්ත්‍රණ සහ වැඩමුළු පැවැත්වීම. | පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව | 50 | 27 |
| | | සහභාගීවූවන් සංඛ්‍යාව | 2000 | 2604 |
| | අනාගත ව්‍යවසායකයින් වීමේ හැකියාව සහිත අය සහ පවතින කර්මාන්ත සඳහා තාක්ෂණය ලබාදීමේ වැඩසටහන් සහ තාක්ෂණ නිරූපණය කිරීමේ වැඩසටහන් පැවැත්වීම | පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව | 219 | 430 |
| | | සහභාගීවූවන් සංඛ්‍යාව | 4240 | 11080 |
| | නව සහ දැනට සිටින ව්‍යවසායකයින් / කර්මාන්ත සඳහා ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් පැවැත්වීම | පවත්වන ලද ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් සංඛ්‍යාව | 49 | 65 |
| | | සහභාගීවූවන් සංඛ්‍යාව | 1295 | 2648 |
| | තාක්ෂණික සහාය, උපදෙස් සහ උපදේශණ සේවා සපයාදීම | සපයාදෙන ලද තාක්ෂණික සහාය, උපදෙස් සහ උපදේශණ සේවා සංඛ්‍යාව | 624 | 181 |
| | | සහභාගීවූ ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 624 | 181 |
| | පහසුකම් සැලසීමේ සහ පසුවිපරම් ක්‍රියාකාරකම් | නිර්මාණය කරන ලද නව කර්මාන්ත සංඛ්‍යාව | 716 | 441 |
| | | නිර්මාණය කරන ලද ස්වයං රැකියා ඒකක සංඛ්‍යාව | 1060 | 1170 |
| | | ප්‍රවර්ධනය කරන ලද, පවතින කර්මාන්ත සංඛ්‍යාව | 786 | 605 |
| | | මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව | - | 4615 |

| ප්‍රධාන තේමාව | වැඩසටහන / ක්‍රියාකාරකම | ප්‍රධාන කාර්යසාධන දර්ශක | ඉලක්කය | අත්කර ගෙන ඇති ප්‍රගතිය |
|---|---|---|---|---|
| අලෙවි සහ වෙළඳ සහාය සහ පහසුකම් සැලසීම | කාර්මික නිෂ්පාදන සඳහා ප්‍රාදේශීය ප්‍රදර්ශන සහ අලෙවි මධ්‍යස්ථාන පිහිටුවීම | අලෙවි පහසුකම් ලබාගත් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සංඛ්‍යාව | 500 | 64 |
| | | සු.ම.ක. විසින් සිදුකළ අලෙවි කිරීම්වල වටිනාකම (රු.මි.) | 25 | 11 |
| | අලෙවි ප්‍රවර්ධන වෙළඳ ප්‍රදර්ශන / ගැණුම්කරුවන් සහ විකුණුම්කරුවන්ගේ හමු සංවිධානය කිරීම | අපනයන වෙළඳපොලට සම්බන්ධවී සිටින සු.ම.ක. සංඛ්‍යාව | 02 | - |
| | | දේශීය සහ විදේශීය වෙළඳ ප්‍රදර්ශනවලට සහභාගී වන ව්‍යාපාර සංඛ්‍යාව | 04 | 02 |
| | උපකොන්ත්‍රාත් හුවමාරු යටතේ කර්මාන්ත ලියාපදිංචි කිරීම | සු.ම.ක. සඳහා නිර්මාණය කර ඇති උපකොන්ත්‍රාත් ලබාදීමේ සහ ආපසු මිලදී ගැනීමේ අවස්ථා සංඛ්‍යාව | 84 | 107 |
| | උප කොන්ත්‍රාත් පහසුකම් සපයාදීම | උප කොන්ත්‍රාත්දීම් හුවමාරුවෙන් දෙන ලද ඇණවුම්වල මුළු වටිනාකම (රු.මි.) | 06 | 2.32 |
| | ගැණුම්කරුවන්ට අවශ්‍ය කරන අමුද්‍රව්‍ය විශාල තොග වශයෙන් මිලදී ගෙන සිල්ලරට විකිණීම | අමුද්‍රව්‍ය (අබලි ලෝහ) ලබාගත් ව්‍යාපාර සංඛ්‍යාව | 550 | 576 |
| | | එකතු කරන ලද අබලි ද්‍රව්‍ය ප්‍රමාණය (මෙ.ටො.) | 1,500 | 816 |
| | | බෙදා දෙන ලද අබලි ද්‍රව්‍ය ප්‍රමාණය (මෙ.ටො.) | 1,500 | 812 |
| | කේන්ද්‍රඅපසාරික රබර් කිරි සහ සංයෝගකළ රබර් විකිණීම | පිරිසැකසුම් කරන ලද සහ සපයන ලද කේන්ද්‍රඅපසාරික රබර්කිරි (ලී) | 12,500 | 9,008 |
| | | සේවා සපයාදී ඇති ව්‍යාපාර සංඛ්‍යාව | 80 | 82 |
| | රබර් සංයෝග, අමුද්‍රව්‍ය සහ රසායනික ද්‍රව්‍ය විකිණීම | සපයන ලද ප්‍රමාණය (කි.ග්‍රෑ.) | 55,000 | 35,498 |
| | | සේවා සපයාදී ඇති ව්‍යාපාර සංඛ්‍යාව | 290 | 310 |
| | රබර් සංයෝග ඇඹරීම සහ සැපයීම | සපයන ලද ප්‍රමාණය (කි.ග්‍රෑ.) | 35,000 | 17,231 |
| | | සේවා සපයාදී ඇති ව්‍යාපාර සංඛ්‍යාව | 55 | 58 |
| කාර්මික ජනපද ආරම්භ කිරීම, නඩත්තු කිරීම සහ පවත්වාගෙන යාම | අච්චුවේලි කාර්මික ජනපදයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම | සිදු කරන ලද සංවර්ධනය ක්‍රියාකාරකම්වල ප්‍රතිශතය | | |
| | නව ව්‍යාපාර සඳහා සංවර්ධනය කරන ලද බිම් කැබලි වෙන්කරදීම සහ නැවත බෙදාදීම | වෙන් කරන ලද හිස් බිම් කොටස් / කර්මාන්ත ශාලා ඒකක / සංවර්ධනය කරන ලද බිම් කැබලි සංඛ්‍යාව | 30 | 49 |
| | | වෙන්කර දෙන ලද කර්මාන්තශාලා ඒකක / සංවර්ධනය කරන ලද බිම් කැබලිවල ආරම්භ කර ඇති වාණිජ මෙහෙයුම් සංඛ්‍යාව | 20 | 08 |
| | | උත්පාදනය කර ඇති රැකියා අවස්ථා සංඛ්‍යාව | 300 | 184 |
| | පසුවිපරම් ක්‍රියාකාරකම් සිදු කිරීම | ස්ථාපනය කර ඇති අගය එකතුකිරීමේ කර්මාන්ත සංඛ්‍යාව | - | - |
| | කාර්මික ජනපදවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සහ අනෙකුත් ක්‍රියාකාරකම් (මාර්ග ඉදිකිරීම, වීදි ආලෝකමත් කිරීම, ආරක්ෂාව වැඩිදියුණු කිරීම, අපද්‍රව්‍ය බැහැර කිරීම, ජල සම්පාදනය ආදිය) | සිදු කරන ලද සංවර්ධන ක්‍රියාකාරකම් සංඛ්‍යාවේ ප්‍රතිශතය | - | - |

| ප්‍රධාන තේමාව | වැඩසටහන / ක්‍රියාකාරකම | ප්‍රධාන කාර්යසාධන දර්ශක | ඉලක්කය | ලබාගත ප්‍රගතිය |
|---|---|---|---|---|
| කාර්මික, තාක්ෂණ සහ ඉංජිනේරු සහාය සහ පහසුකම් සැලසීම | නිෂ්පාදනවල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සහ ලියාපදිංචිය සමග GMP, SLS තත්ත්ව සහතික ලබාගැනීමට සහායවීම. | GMP, SLS, ISO සහ අනෙකුත් සහතිකකිරීම්වලට / ප්‍රමිතීන්ට උපස්කරන ලද කර්මාන්ත සංඛ්‍යාව. | 10 | 08 |
| | සකස් කරන කරන ලද / පිරිසකසන ලද යන්ත්‍රසූත්‍ර සහ උපකරණ | අලුතින් සකස් කරන ලද යන්ත්‍රසූත්‍ර / උපකරණ සංඛ්‍යාව | 60 | 51 |
| | | යන්ත්‍රසූත්‍ර / උපකරණවලින් ප්‍රතිලාභ ලැබූ ව්‍යාපාර සංඛ්‍යාව | 60 | 51 |
| | ඉංජිනේරු සේවා සපයාදීම: තක්සේරු, වාත්තු වැඩපොළ, කම්හල් සේවා, විද්‍යුත් ලෝහාලේපන සහ රසායනාගාර සේවා | සපයා දෙන ලද ඉංජිනේරු සේවා සංඛ්‍යාව | 1,149 | 767 |
| කර්මාන්ත සහ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සඳහා ව්‍යාප්ති සහ උපදේශණ සේවා සැපයීම | ව්‍යාපෘති හඳුනාගැනීම, ආදර්ශ ව්‍යාපෘති වාර්තා සහ ව්‍යාපෘති ශක්‍යතා අධ්‍යයන සකස් කිරීම | ශක්‍යතා අධ්‍යයන වාර්තා / ව්‍යාපෘති වාර්තා ලබාගත් ව්‍යාපාර සංඛ්‍යාව | 106 | 87 |
| | යන්ත්‍රසූත්‍ර තක්සේරු කිරීම | සකස් කරන ලද තක්සේරු වාර්තා සංඛ්‍යාව | 97 | 47 |
| | නිෂ්පාදන සංවර්ධන සහ පරීක්ෂණ සේවා සපයාදීම | සපයා දුන් නිෂ්පාදන සංවර්ධන සහ රසායනාගාර පරීක්ෂණ සේවා සංඛ්‍යාව | 65 | 815 |
| | ප්‍රාදේශීය / දිස්ත්‍රික් කර්මාන්ත සංගම් පිහිටුවීම | දිස්ත්‍රික් සහ ජාතික මට්ටම්වලින් පිහිටුවන ලද / ශක්තිමත් කරන ලද කර්මාන්ත සංගම් සංඛ්‍යාව | 318 | 304 |

**ප්‍රස්තාරය 3.1 – කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් සපයා දෙන ලද පහසුකම් සළසන ලද සේවා**


අංශ අනුව ලබාදුන් අනෙකුත් සේවා පහසුකම්
සේවා සංඛ්‍යාව
1800
1600
1400
1200
1000
800
600
400
200
0
814
1599
1111
760
621
ඉංජිනේරු සේවා
ප්‍ර.සං.අං.
අලෙවි පහසුකම්
කාර්මික තොරතුරු
රබර්
අංශ


පවත්වන ලද පුහුණු වැඩසටහන් - 2014
ව්‍යවසායකයින් සහ වැඩසටහන්
12000
10000
8000
6000
4000
2000
0
27
2,604
11
614
219
11,080
65
2,648
42
1,260
දැනුම්වත් කිරීමේ වැඩසටහන
කළමනාකරණ වැඩසටහන
තාක්ෂණය ලබා දීමේ වැඩසටහන්
ව්‍යවසායකත්ව සංවර්ධන
හැකියා සංවර්ධන
වැඩසටහන
වැඩසටහන් සංඛ්‍යාව
ව්‍යවසායකයින් සංඛ්‍යාව


අංශ අනුව ආදායම - 2014
3.1
53
21.61
4
13
31.4
2
31.12
කා.සේවා.
කා.ජන.
රබර්
සම් භාණ්ඩ
ඉංජිනේරු
ප්‍රාදේ. සං.
ව්‍ය.සං.උ.සේ.ම.
අලෙවි

# කාර්යසාධන ජයග්‍රහණ

- පාලන අංශය (AD)
- ප්‍රාදේශීය සංවර්ධන අංශය (RDD)
- සැලසුම් අංශය (PD)
- අලෙවි අංශය (MD)
- කාර්මික ජනපද අංශය (IED)
- ඉංජිනේරු අංශය (ED)
- ව්‍යාවසායකත්ව සංවර්ධන සහ උපදේශන සේවා මධ්‍යස්ථානය (CEDACS)
- තාක්ෂණ සේවා අංශය (TSD)

## 4.1 පාලන අංශය

කාර්මික සංවර්ධන මණ්ඩලයේ සියලුම මානව සම්පත් කළමනාකරණ සහ මානව සම්පත් සංවර්ධන ක්‍රියාකාරකම්, ප්‍රසම්පාදන ක්‍රියාකාරකම්, සහ ආරක්ෂක සහ ප්‍රවාහන කටයුතු සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය කිරීම සහ ඇගයීම මණ්ඩලයේ පාලන අංශයේ වගකීම වේ.

මෙම අංශයට පැවරී ඇති කාර්යයන්:

- කළමනාකරණ චක්‍රලේඛ අංක 30 අනුව ආයතනික සහ ප්‍රතිව්‍යුහකරණ වැඩසටහන
- වැටුප් විෂමතා ඉවත් කිරීම
- කළමනාකරණ චක්‍රලේඛ අංක 30 අනුව බඳවාගැනීමේ පටිපාටිය සහ උසස්කිරීම් පටිපාටිය සකස් කිරීම
- සාමාන්‍ය බඳවාගැනීම්, කාර්යසාධන ඇගයීම්, උසස්කිරීම්, විශ්‍රාම ගැනීම් ආදියට අදාළ කටයුතු සිදු කිරීම
- විනය පරීක්ෂණ සිදු කිරීම
- විදේශ ශිෂ්‍යත්ව / පුහුණු සම්බන්ධීකරණය කිරීම
- දේශීය පුහුණු සංවිධානය කිරීම සහ පැවැත්වීම
- සේවක සුභසාධනය සහ සේවක වන්දි යෝජනා ක්‍රම කළමනාකරණය කිරීම
- අභ්‍යන්තර ආරක්ෂක සේවා කළමනාකරණය කිරීම
- මණ්ඩලයේ ප්‍රසම්පාදන කටයුතු කළමනාකරණය කිරීම
- මණ්ඩලයේ ප්‍රවාහන සේවා කළමනාකරණය කිරීම

වගුව **4.1.1 – 2014** දෙසැම්බර් **31** දිනට කාර්මික සංවර්ධන මණ්ඩලයේ කාර්ය මණ්ඩල සංඛ්‍යාව

| කාණ්ඩය | කාර්ය මණ්ඩල සංඛ්‍යාව | | එකතුව සහ ප්‍රතිශතය % |
|---|---|---|---|
| | පිරිමි | ගැහැණු | |
| HM කාණ්ඩය | 06 | - | 06 (1.2%) |
| MM සහ JM කාණ්ඩ | 74 | 40 | 114 (22.8%) |
| MA කාණ්ඩය | 105 | 86 | 191 (38.20%) |
| PL කාණ්ඩය | 183 | 06 | 189 (37.8%) |
| එකතුව | **368 (73.6 %)** | **132 (26.4%)** | **500 (100.0%)** |




ප්‍රස්තාරය **4.1.1** –කාර්මික සංවර්ධන මණ්ඩලයේ කාර්ය මණ්ඩල සංඛ්‍යාව

### වගුව 4.1.2 - 2014 මූල්‍ය වර්ෂය තුළ පාලන අංශයේ ප්‍රධාන කාර්යසාධනයන්

| සංයුක්ත අරමුණ | | සංයුක්ත අරමුණ ඉටුකරගැනීම සඳහා සිදුකළ ක්‍රියාකාරකම් | සංඛ්‍යාව |
|---|---|---|---|
| **G 13**<br>කාර්මික සංවර්ධන මණ්ඩලයෙහි ආයතනික, පරිපාලන සහ මූල්‍ය කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම. | **11.** | පහත සඳහන් සාමාන්‍ය මානව සම්පත් කළමනාකරණ ක්‍රියාකාරම් ඉටු කිරීම | |
| | **1** | මානව සම්පත් කළමනාකරණය - බඳවාගැනීම් | |
| | (i) | බඳවාගැනීම් (කාර්ය මණ්ඩල) | 76 |
| | (ii) | ඉල්ලා අස්වීම් | 08 |
| | (iii) | විශ්‍රාමයාම් | 33 |
| | (iv) | තනතුර අතහැර යාම් | 02 |
| | **2** | විනය කළමනාකරණය | |
| | (i) | විනය පරීක්ෂණ පැවැත්වීම | 05 |
| | (ii) | කම්කරු කොමසාරිස් මගින් කටයතු කළ කම්කරු නඩු | 13 |
| | **3** | මානව සම්පත් සංවර්ධනය - පුහුණු | |
| | (i) | දේශීය පුහුණු | 124 |
| | (ii) | විදේශීය පුහුණු | 08 |
| | **4** | මානව සම්පත් කළමනාකරණය - වන්දි | |
| | (i) | පුද්ගලයින් 33 දෙනෙකු සඳහා පාරිතෝෂික ගෙවීම් | රු. 9,163,147.00 |
| | **5** | මානව සම්පත් කළමනාකරණය - සේවක සුභසාධන | |
| | (i) | බයිසිකල් ණය | 36 |
| | (ii) | ආපදා ණය | 86 |
| | (iii) | වෛද්‍ය ප්‍රතිකාර යෝජනාක්‍රමය (වෛද්‍ය ප්‍රතිකාර බිල්පත් ප්‍රතිපූරණය කිරීම) | |
| | **6** | ආරක්ෂක කළමනාකරණය | |
| | (i) | ආරක්ෂක පිරිවැය | රු.25,200,000.00 |
| | **7** | බැහැරකිරීම් | |
| | (i) | පවත්වන ලද භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල | 01 |
| | **8** | සාමාන්‍ය උත්සව | |
| | (i) | උත්සව සංඛ්‍යාව | 03 |
| | **9** | තැපැල් සහ විදුලි සංදේශ ගාස්තු | |
| | (i) | තැපැල් ගාස්තු | රු.503,129.00 |
| | (ii) | විදුලි සංදේශ ගාස්තු | රු.4,403,638.00 |
| | **10** | ප්‍රවාහන කළමනාකරණය | |
| | (i) | ඉන්ධන වියදම | රු. 4,420,257.00 |
| | (ii) | වාහන නඩත්තු වියදම | රු. 3,650,854.00 |
| **G 13.12**<br>වෙබ්අඩවියේ කාර්යමණ්ඩල අංශය හරහා ප්‍රසිද්ධකර රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීම | **11** | ප්‍රසම්පාදන කළමනාකරණය | |
| | (i) | ඉදිරිපත් කරන ලද ඇණවුම් සංඛ්‍යාව | 403 |
| | (ii) | ප්‍රාග්ධන ප්‍රසම්පාදන | රු. 7,794,046.09 |
| | (iii) | පුනරාවර්තන ප්‍රසම්පාදන | රු. 41,235,148.05 |

## 4.2 ප්‍රාදේශීය සංවර්ධන අංශය

### 4.2.1 සාමාන්‍ය

දිවයින පුරා පිහිටි දිස්ත්‍රික් කාර්යාල 25 කින් සමන්විත ප්‍රාදේශීය සංවර්ධන අංශයට ප්‍රාදේශීය මට්ටමින් එහි ප්‍රධාන කාර්යයන් සහ ක්‍රියාකාරකම් සිදු කිරීම පිණිස කාර්මික සංවර්ධන පනත යටතේ විශාල වශයෙන් බලතල පවරා දී තිබේ.

2014 වර්ෂයේ ප්‍රාග්ධන අයවැයෙන් ප්‍රාදේශීය සංවර්ධන අංශයට රුපියල් මිලියන 15 ක මුදලක් වෙන් කර දී තිබූ අතර එම අංශයේ 2014 වර්ෂය සඳහා වන ක්‍රියාත්මක සැලැස්මට අනුව, නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් 21 දෙනෙකු, සහකාර අධ්‍යක්ෂවරුන් 06 දෙනෙකු සහ ව්‍යාපාර ප්‍රවර්ධන කළමනාකරුවන් 62 දෙනෙකු ඇතුළත් වන එහි ප්‍රාදේශීය කාර්ය මණ්ඩලය විසින් අත් කර ගෙන ඇති ප්‍රගතිය පහත සඳහන් පරිදි වේ:






වගුව 4.2.1.3 - ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් නව කර්මාන්ත ආරම්භ කිරීම සඳහා සහාය ලබා දීම - 2014 වර්ෂය

| පළාත | දිස්ත්‍රික්කය | ඒකක ගණන | මුළු ආයෝජනය (රු.) | රැකියා අවස්ථා ගණන |
|---|---|---|---|---|
| මධ්‍යම | මහනුවර | 41 | 10,827,000 | 141 |
| | මාතලේ | 20 | 7,442,000 | 50 |
| | නුවර එළිය | 6 | 6,580,000 | 42 |
| **එකතුව** | | **67** | **24,849,000** | **233** |
| නැගෙනහිර | අම්පාර | 5 | 1,063,000 | 10 |
| | ත්‍රිකුණාමලය | 13 | 1,621,500 | 37 |
| | මඩකලපුව | 37 | 2,062,500 | 92 |
| **එකතුව** | | **55** | **4,747,000** | **139** |
| උතුරු මැද | අනුරාධපුරය | 10 | 6,998,000 | 36 |
| | පොළොන්නරුව | 8 | 2,180,000 | 28 |
| **එකතුව** | | **18** | **9,178,000** | **64** |
| උතුර | යාපනය | 22 | 5,260,000 | 65 |
| | වව්නියාව | 15 | 1,053,500 | 27 |
| | කිලිනොච්චි | 8 | 280,500 | 13 |
| | මන්නාරම | 9 | 1,418,000 | 18 |
| | මුලතිවු | 6 | 403,000 | 16 |
| **එකතුව** | | **60** | **8,415,000** | **139** |
| වයඹ | කුරුණෑගල | 40 | 9,289,000 | 111 |
| | පුත්තලම | 8 | 12,180,054 | 40 |
| **එකතුව** | | **48** | **21,469,054** | **151** |
| සබරගමුව | රත්නපුර | 13 | 18,625,000 | 67 |
| | කෑගල්ල | 29 | 8,559,000 | 75 |
| **එකතුව** | | **42** | **27,184,000** | **142** |
| දකුණ | ගාල්ල | 30 | 9,251,000 | 70 |
| | මාතර | 24 | 15,632,500 | 82 |
| | හම්බන්තොට | 17 | 11,415,000 | 91 |
| **එකතුව** | | **71** | **36,298,500** | **243** |
| ඌව | බදුල්ල | 25 | 19,795,000 | 61 |
| | මොණරාගල | 12 | 5,812,495 | 30 |
| **එකතුව** | | **37** | **25,607,495** | **91** |
| බස්නාහිර | කොළඹ | 11 | 8,863,000 | 52 |
| | ගම්පහ | 23 | 30,193,000 | 110 |
| | කළුතර | 9 | 27,369,580 | 39 |
| **එකතුව** | | **43** | **66,425,580** | **201** |
| **මුළු එකතුව** | | **441** | **224,173,629** | **1,403** |

**වගුව 4.2.1.4 - ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් පවතින කර්මාන්ත සංවර්ධනය කිරීම සඳහා සහාය ලබා දීම - 2014 වර්ෂය**

| පළාත | දිස්ත්‍රික්ක | ඒකක ගණන | ආයෝජනය (රු.) | | | රැකියා අවස්ථා ගණන | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | පවතින | අමතර | එකතුව | පවතින | අමතර | එකතුව |
| මධ්‍යම | නුවර එළිය | 8 | 20,757,000 | 10,125,000 | 30,882,000 | 89 | 109 | 198 |
| | මහනුවර | 59 | 51,970,000 | 20,444,000 | 72,414,000 | 369 | 158 | 527 |
| | මාතලේ | 24 | 13,955,000 | 3,975,000 | 17,930,000 | 75 | 43 | 118 |
| එකතුව | | **91** | **86,682,000** | **34,544,000** | **121,226,000** | **533** | **310** | **843** |
| නැගෙනහිර | අම්පාර | 5 | 1,710,000 | 3,378,000 | 5,088,000 | 19 | 15 | 34 |
| | මඩකලපුව | 22 | 5,775,000 | 2,180,000 | 7,955,000 | 126 | 71 | 197 |
| | ත්‍රිකුණාමලය | 22 | 4,502,500 | 1,785,000 | 6,287,500 | 49 | 79 | 128 |
| එකතුව | | **49** | **11,987,500** | **7,343,000** | **19,330,500** | **194** | **165** | **359** |
| උතුරු මැද | අනුරාධපුරය | 8 | 3,432,000 | 1,002,000 | 4,434,000 | 15 | 9 | 24 |
| | පොළොන්නරුව | 11 | 40,040,000 | 13,110,000 | 53,150,000 | 80 | 38 | 118 |
| එකතුව | | **19** | **43,472,000** | **14,112,000** | **57,584,000** | **95** | **47** | **142** |
| උතුර | යාපනය | 28 | 7,520,000 | 4,848,000 | 12,368,000 | 69 | 41 | 110 |
| | වව්නියාව | 8 | 1,206,000 | 472,500 | 1,678,500 | 26 | 6 | 32 |
| | කිලිනොච්චි | 13 | 626,000 | 364,650 | 990,650 | 27 | 25 | 52 |
| | මන්නාරම | 5 | 750,000 | 740,000 | 1,490,000 | 10 | 4 | 14 |
| | මුලතිවු | 6 | 1,488,000 | 330,000 | 1,818,000 | 17 | 6 | 23 |
| එකතුව | | **60** | **11,590,000** | **6,755,150** | **18,345,150** | **149** | **82** | **231** |
| වයඹ | කුරුණෑගල | 54 | 58,383,000 | 10,689,365 | 69,072,365 | 218 | 130 | 348 |
| | පුත්තලම | 16 | 22,193,200 | 14,258,326 | 36,451,526 | 72 | 55 | 127 |
| එකතුව | | **70** | **80,576,200** | **24,947,691** | **105,523,891** | **290** | **185** | **475** |
| සබරගමුව | රත්නපුර | 19 | 16,148,000 | 11,830,000 | 27,978,000 | 73 | 38 | 111 |
| | කෑගල්ල | 40 | 28,635,000 | 17,944,000 | 46,579,000 | 143 | 119 | 262 |
| එකතුව | | **59** | **44,783,000** | **29,774,000** | **74,557,000** | **216** | **157** | **373** |
| දකුණ | ගාල්ල | 43 | 57,787,500 | 43,873,000 | 101,660,500 | 259 | 185 | 444 |
| | මාතර | 39 | 32,793,000 | 25,037,000 | 57,830,000 | 174 | 63 | 237 |
| | හම්බන්තොට | 27 | 18,819,000 | 4,822,000 | 23,641,000 | 96 | 26 | 122 |
| එකතුව | | **109** | **109,399,500** | **73,732,000** | **183,131,500** | **529** | **274** | **803** |
| ඌව | බදුල්ල | 32 | 67,082,000 | 51,283,200 | 118,365,200 | 138 | 13 | 151 |
| | මොණරාගල | 9 | 4,769,000 | 2,840,000 | 7,609,000 | 41 | 45 | 86 |
| එකතුව | | **41** | **71,851,000** | **54,123,200** | **125,974,200** | **179** | **58** | **237** |
| බස්නාහිර | කොළඹ | 37 | 68,378,000 | 9,108,000 | 77,486,000 | 374 | 56 | 430 |
| | කළුතර | 27 | 85,015,000 | 24,497,000 | 109,512,000 | 189 | 38 | 227 |
| | ගම්පහ | 43 | 137,303,700 | 81,151,500 | 218,455,200 | 614 | 341 | 955 |
| එකතුව | | **107** | **290,696,700** | **114,756,500** | **405,453,200** | **1,177** | **435** | **1,612** |
| මුළු එකතුව | | **605** | **751,037,900** | **360,087,541** | **1,111,125,441** | **3,362** | **1,713** | **5,075** |

වගුව **4.2.1.5 -** ස්වයං රැකියා ඒකක ආරම්භ කිරීම සඳහා ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් සහාය ලබාදීම - **2014** වර්ෂය

| පළාත | දිස්ත්‍රික්කය | ඒකක ගණන | ආයෝජනය (රු.) | රැකියා ගණන |
|---|---|---|---|---|
| මධ්‍යම | නුවර එළිය | 25 | 1,828,000 | 32 |
| | මහනුවර | 85 | 3,860,000 | 123 |
| | මාතලේ | 48 | 2,466,500 | 59 |
| එකතුව | | **158** | **8,154,500** | **214** |
| නැගෙනහිර | අම්පාර | 38 | 1,281,500 | 38 |
| | මඩකලපුව | 36 | 1,239,500 | 60 |
| | ත්‍රිකුණාමලය | 34 | 3,324,000 | 50 |
| එකතුව | | **108** | **5,845,000** | **148** |
| උතුරු මැද | අනුරාධපුරය | 17 | 1,338,000 | 25 |
| | පොළොන්නරුව | 43 | 2,263,500 | 49 |
| එකතුව | | **60** | **3,601,500** | **74** |
| උතුර | යාපනය | 46 | 7,634,000 | 70 |
| | වව්නියාව | 29 | 888,500 | 45 |
| | මන්නාරම | 25 | 1,289,000 | 29 |
| | කිලිනොච්චි | 29 | 290,650 | 29 |
| | මුලතිවු | 15 | 894,000 | 20 |
| එකතුව | | **144** | **10,996,150** | **193** |
| වයඹ | කුරුණෑගල | 100 | 5,483,500 | 137 |
| | පුත්තලම | 43 | 2,776,000 | 51 |
| එකතුව | | **143** | **8,259,500** | **188** |
| සබරගමුව | රත්නපුර | 35 | 2,686,000 | 38 |
| | කෑගල්ල | 64 | 5,267,000 | 81 |
| එකතුව | | **99** | **7,953,000** | **119** |
| දකුණ | ගාල්ල | 78 | 4,240,000 | 101 |
| | මාතර | 104 | 3,895,200 | 141 |
| | හම්බන්තොට | 66 | 3,666,500 | 89 |
| එකතුව | | **248** | **11,801,700** | **331** |
| ඌව | බදුල්ල | 52 | 5,927,000 | 52 |
| | මොණරාගල | 8 | 541,000 | 8 |
| එකතුව | | **60** | **6,468,000** | **60** |
| බස්නාහිර | කොළඹ | 55 | 3,349,000 | 63 |
| | ගම්පහ | 50 | 2,764,750 | 53 |
| | කළුතර | 45 | 2,460,090 | 56 |
| එකතුව | | **150** | **8,573,840** | **172** |
| මුළු එකතුව | | **1,170** | **71,653,190** | **1,499** |

**4.2.2** කර්මාන්ත ගම්මාන සංවර්ධනය කිරීමේ ජාතික වැඩසටහන

**(අ)** මැටි කර්මාන්ත ගම්මාන සංවර්ධන වැඩසටහන

මැටි කර්මාන්තයේ යෙදී සිටින්නන්ට වඩා දියුණු උපකරණ සහ නවීන තාක්ෂණය ලබා දීම මගින් උසස් ගුණාත්මකභාවයෙන් යුතු, නව්‍ය වූ නිෂ්පාදන සකස් කිරීමට හැකි වන පරිදි මැටි කර්මාන්ත ගම්මාන සංවර්ධනය කිරීම පිළිබඳව **2013** අයවැය කථාවෙහිදී සාකච්ඡා කරන ලදී. ව්‍යාපාර සහ රැකියා අවස්ථා නිර්මාණය කිරීම තුළින් මැටි කර්මාන්තයේ නියැළෙන ප්‍රජාවන්ගේ ආදායම වැඩි දියුණු කර දීම ද මෙම ව්‍යාපෘතියෙහි අරමුණක් වේ. මෙම වැඩසටහන යටතේ මැටි කර්මාන්ත ගම්මාන **6** ක් සංවර්ධනය කිරීම සඳහා **2014** වර්ෂයෙදී රුපියල් මිලියන **14.97** ක් වෙන් කරන ලද අතර එම වර්ෂය තුළදී රුපියල් මිලියන **10.6** ක් වියදම් කරන ලදී.

**(ආ)** ව්‍යවසාය ගම්මාන සහ කාන්තා ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන

ග්‍රාමීය අර්ථික සංවර්ධනයට සහාය ලබාදී එය වැඩියුණු කිරීමේ අරමුණ ඇතිව, ව්‍යවසාය ගම්මාන සංවර්ධනය කර ගම් මට්ටමෙන් කාන්තා ව්‍යවසායකයින් ශක්තිමත් කර ඔවුන්ට උපකාර කිරීමේ අවශ්‍යතාවය **2012** සහ **2013** වර්ෂවල අයවැය යෝජනා මගින් දැඩි ලෙස අවධාරණය කරන ලදී. මෙම වැඩසටහනට අදාළව ගම්මාන **5** ක් සංවර්ධනය කිරීම සඳහා **2014** වර්ෂයේදී රුපියල් මිලියන **7.7** ක් වෙන් කර දෙන ලද අතර එම ගම්මාන සංවර්ධන කිරීම සඳහා එම වර්ෂයේදී රුපියල් මිලියන **2.6** ක් වියදම් කරන ලදී. මෙම ගම්මානවල ජීවත්වූ **203** දෙනෙකුට එම ව්‍යාපෘතිය යටතේ ප්‍රතිලාභ හිමි විය.

**(ඇ)** හස්තකර්මාන්ත ගම්මාන සංවර්ධන වැඩසටහන

**2014** වර්ෂයේදී, ඉහත සඳහන් කළ වැඩසටහන යටතේ සංවර්ධන කාර්යයන් ක්‍රියාත්මක කිරීම පිණිස සාම්ප්‍රදායික හස්ත කර්මාන්ත ගම්මාන **2** ක් හඳුනා ගන්නා ලදී. එම කර්මාන්තවල තිරසාර පැවැත්ම සඳහා උපකාර කිරීම සහ තාක්ෂණය, කුසලතා සහ නිෂ්පාදනවල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම මෙම ව්‍යාපෘතියෙහි ප්‍රධාන අරමුණ විය. මෙම වැඩසටහන සඳහා **2014** වර්ෂයේදී රුපියල් මිලියන **2.23** ක් වෙන් කරන ලද නමුත් එම වර්ෂය තුළදී වැය කරන ලද්දේ එයින් රුපියල් මිලියන **0.51** ක් පමණි. **2014** වර්ෂයේදී මෙම වැඩසටහන යටතේ ව්‍යවසායකයින් **55** දෙනෙකු ප්‍රතිලාභ ලැබූහ.

### 4.2.3 කිතුල් නිෂ්පාදන සංවර්ධනය කිරීමේ ජාතික වැඩසටහන

කිතුල් ගසෙහි ඇති විවිධ වූ ප්‍රයෝජන නිසා එය ඉතා වටිනා ගසක් වන අතර කිතුල් මල එහි වටිනාම කොටස ලෙස සළකණු ලැබේ. කිතුල් රා, කිතුල් පැණි සහ කිතුල් හකුරු සෑදීමට යොදාගන්නා සාරය ලබා ගැනීම පිණිස කිතුල් මල මැදීම සිදු කරනු ලැබේ. එහෙත් කිතුල් මල් මැදීමෙහි ඇති වාණිජමය වටිනාකම පිළිබඳ ප්‍රජාව සතු නොදැනුවත්භාවය නිසා කිතුල් ගස් බොහොමයක මල් මැදීම සිදු නොකරන බව නිරීක්ෂණය වී තිබේ. එම නිසා සාම්ප්‍රදායික කර්මාන්ත සහ කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය විසින් කිතුල් කර්මාන්තය දියුණු කිරීම සඳහා විශේෂ වැඩසටහනක් ආරම්භ කරන ලදී.

කිතුල් නිෂ්පාදකයින්ගේ සමාජ ආර්ථික තත්ත්වය නගා සිටුවීම මගින් කිතුල් කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම මෙම වැඩසටහනේ අරමුණ වේ. මදිනු ලබන කිතුල් ගස් සංඛ්‍යාව වැඩි කිරීම, ප්‍රතිලාභීන්ගේ ආදායම් මට්ටම වැඩිදියුණු කිරීම, තාක්ෂණය නව්‍යකරණය කිරීම සහ නිෂ්පාදන විවිධාංගීකරණය කිරීම හරහා උසස් තත්ත්වයේ කිතුල් නිෂ්පාදන හඳුන්වාදීම සහ කිතුල් නිෂ්පාදන සඳහා දේශීය මෙන්ම විදේශීය වෙළඳපොළ වැඩිදියුණු කිරීම මෙම වැඩසටහනෙහි අනෙකුත් විශේෂිත අරමුණු අතර වේ. 2014 වර්ෂයේ දෙසැම්බර් මස අවසානය වන විට, සාම්ප්‍රදායික කර්මාන්ත සහ කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ මග පෙන්වීම යටතේ කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් පහත සඳහන් සංවර්ධන ක්‍රියාකාරකම් සිදු කර තිබූ අතර එමගින් ලබාගත් ප්‍රගතිය වගු අංක 4.2.3.1 හි දක්වා ඇත.

වගුව **4.2.3.1 -** කිතුල් නිෂ්පාදන සංවර්ධනය කිරීමේ ජාතික වැඩසටහනෙහි කාර්යසාධනය

| සංයුක්ත අරමුණ | සංයුක්ත අරමුණ ඉටුකරගැනීම සඳහා සිදුකළ ක්‍රියාකාරකම් | | වැඩසටහන් සංඛ්‍යාව ඉලක්කය | නිම කරන ලද වැඩසටහන් සංඛ්‍යාව | වියදම (රු.) |
|---|---|---|---|---|---|
| **G1a.** කර්මාන්ත දිරිමත්කිරීම , ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම | (i) | නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන | 16 | 10 | 118,945 |
| | (ii) | මල් මැදීමේ තාක්ෂණ පුහුණු වැඩසටහන | 50 | 38 | 390,382 |
| | (iii) | මල් මැදීමේ තාක්ෂණ පසුවිපරම් වැඩසටහන | | - | - |
| | (iv) | නිෂ්පාදන තත්ත්ව සංවර්ධන වැඩසටහන | 30 | 20 | 238,566 |
| | (v) | ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන | 7 | 4 | 253,143 |
| | (vi) | පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන | 3 | - | - |
| | (vii) | පසු විපරම් වැඩසටහන | 30 | 34 | 201,741 |
| | (viii) | අලුතින් මල් මදින්නන් බිහි කිරීම | 2000 | 611 | |
| | (ix) | අලුතින් මදිනුලබන ගස් සංඛ්‍යාව වැඩිකිරීම | 11900 | 5797 | |
| | (x) | සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය කිරීම | 50 | 45 | |
| | (xi) | නව සුළු කර්මාන්ත ආරම්භ කිරීම | 25 | 40 | |
| | (xii) | කර්මාන්ත GMP තත්ත්වයට වැඩිදියුණු කිරීම | 40 | 1 | |
| | (xiii) | මදින්නන් ලියාපදිංචි කිරීම | 1000 | 966 | |
| | (xiv) | මදින්නන් සඳහා හැඳුනුම්පත් නිකුත් කිරීම | 500 | 730 | |
| | (xv) | මදින්නන් සඳහා ආරක්ෂිත ඇඳුම් කට්ටල බෙදාදීම | 1000 | 476 | |
| | (xvi) | අක්කර 67 ක අලුතින් කිතුල් පැල රෝපණය කිරීම | 20000 | 1000 | |
| | (xvii) | "කිතුල් වරුණ" ප්‍රදර්ශණය පැවැත්වීම | 9 | 5 | 3,474,265 |
| | එකතුව | | | | **4,677,042** |

### 4.2.4 දිවි නැගුම ජාතික වැඩසටහන

සාම්ප්‍රදායික කර්මාන්ත සහ කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ සහාය ඇතිව ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් දිවි නැගුම ජාතික වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. තිරසාර ගෘහ පාදක කර්මාන්ත ආර්ථික ඒකක ප්‍රවර්ධනය කිරීම සහ ස්ථාපිත කිරීම සඳහා කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් එහි ප්‍රතිලාභීන්ට අවශ්‍ය පහසුකම් සැලසීම සහ සේවා සපයාදීම සිදු කරන ලදී.

මෙම වැඩසටහන යටතේ කාර්මික සංවර්ධන මණ්ඩලය නව ගෘහ පාදක කර්මාන්ත ආර්ථික ඒකක ආරම්භ කිරීමට කැමැත්තක් දක්වන, ඒ සඳහා හැකියාව සහිත නව ව්‍යවසායකයින් **751** දෙනෙකු හඳුනාගන්නා ලද අතර දිවයින පුරා රු.7,358,619.00 ක වියදමින් යන්ත්‍ර සූත්‍ර, මෙවලම් සහ උපකරණ බෙදා දෙන ලදී.

## 4.3 සැලසුම් අංශය

ලෝක ආර්ථිකයෙහි සිදු වෙමින් පවතින සීඝ්‍ර පරිවර්තනය හේතුවෙන් ව්‍යාපාර සංවර්ධන සේවාවන්හි ඇතිවී තිබෙන තරගකාරීත්වය නිසා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට වඩාත් අර්ථාන්විත ලෙස සේවා සපයාදීමට හැකි වන පරිදි කාර්මික සංවර්ධන මණ්ඩලය සඳහා ක්‍රමෝපායයන් නැවත සකස් කිරීමේ සහ නැවත නිර්වචනය කිරීමේ අභියෝගාත්මක කාර්යය සැලසුම් අංශයට පැවරී තිබේ.

සැලසුම් අංශයට පැවරී ඇති කාර්යයන්

කාර්මික සංවර්ධන මණ්ඩලයේ එක් එක් අංශයට අදාළ සංවර්ධන ක්‍රියාකාරකම් සැලසුම් කිරීම, අධීක්ෂණය කිරීම සහ ඇගයීම සැලසුම් අංශයට පැවරී ඇති ප්‍රධාන කාර්යයන් වේ. එයට අමතරව, සෑම වර්ෂයකම ආරම්භයේදී නියම තරගනු ලබන භෞතික සහ මූල්‍ය ඉලක්කවලට අදාළව කාර්මික සංවර්ධන මණ්ඩලය සඳහා සංයුක්ත ක්‍රමෝපායික සැලැස්ම සකස්කිරීම මෙන්ම එක් එක් අංශවල වාර්ෂික ක්‍රමෝපායික ක්‍රියාත්මක සැලසුම් අධීක්ෂණය කිරීම සහ ඇගයීම ද සැලසුම් අංශයේ වගකීම වේ. තවද, කාර්මික සංවර්ධන මණ්ඩල කාර්ය මණ්ඩලයෙහි කාර්යාසාධනය ඇගයීම පිණිස මෙම අංශය විසින් රේඛීය අමාත්‍යාංශයට සහ කාර්යසාධන ඇගයීම් තක්සේරුකරුවන්ට මෙන්ම අධ්‍යක්ෂ - පරිපාලන වෙත ද අදාළ කළමනාකරණ තොරතුරු සපයා දෙනු ලබයි.

කාර්මික සංවර්ධන මණ්ඩලයේ අනෙකුත් අංශවල කාර්යයන්ට පහසුකම් සැලසීම පිණිස පහත සඳහන් උපක්‍රියාකාරකම් ද මෙම අංශයට පවරා තිබේ:

- කාර්මික සංවර්ධන මණ්ඩලයෙහි සහ 1969 අංක 36 දරණ කර්මාන්ත සංවර්ධන පනතෙහි අනිවාර්ය අරමුණුවලට අනුකූලව ප්‍රතිපත්ති සහ ක්‍රමෝපාය මාර්ගෝපදේශ සම්පාදනය කිරීම.
- ආයතනික අයවැය සහ සමස්ත ක්‍රියාත්මක සැලැස්මට අනුකූලව ප්‍රාග්ධන සහ පුණරාවර්තන වියදම් අවශ්‍යතා සකස්කිරීමට පහසුකම් සැලසීම.
- ව්‍යාපාර / කර්මාන්ත සමීක්ෂණ පැවැත්වීමට පහසුකම් සැලසීම, කර්මාන්ත / ආර්ථිකය ආශ්‍රිත සංඛ්‍යාලේඛන යාවත්කාලීන කිරීම සහ ආදාළ ආංශික සංවර්ධන සැලසුම් සකස් කරීමට සහායවීම.
- විදේශ අරමුදල් සැපයීම් සඳහා සංවර්ධන ව්‍යාපෘති යෝජනා සහ සංකල්ප පත්‍රිකා සකස් කිරීම.
- දැනට පවතින, කර්මාන්ත ආශ්‍රිත ප්‍රතිපත්ති සම්පාදන කමිටුවලට කාර්මික සංවර්ධන මණ්ඩලයේ සහභාගීත්වය ලබා දීම සහතික කිරීම සහ අවශ්‍ය විට ප්‍රතිපත්ති පත්‍රිකා සකස් කිරීම.

අංශය විසින් ඉටුකරන ලද කාර්යයන්

I. කාර්මික සංවර්ධන මණ්ඩලයේ 2014 – 2016 කාල පරිච්ඡේදය සඳහා වන සංයුක්ත සැලැස්ම සැලසුම් අංශය විසින් සකස් කරන ලදී.
II. ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම හා එක්ව, ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සඳහා පරිගණකයෙන් තැනූ නාමාවලියක් සකස් කිරීම පිණිස සාම්ප්‍රදායික කර්මාන්ත සහ කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ ඉල්ලීම පරිදි කර්මාන්ත පිළිබඳ දත්ත සහ තොරතුරු ලබා ගැනීම පිණිස ආකෘතියක් සහ අදාළ ලිපි ලේඛන සකස් කරන ලදී.

III. මෙම අංශය විසින් පහත සඳහන් රජයේ ආයතන වෙත සංඛ්‍යාලේඛනමය දත්ත සපයා දී ඇත:

- වාර්ෂික වාර්තාව සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව වෙත
- ජාතික ගිණුම් ඇස්තමේන්තු සඳහා ජනසංඛ්‍යා හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව වෙත

IV. අමාත්‍යාංශයේ ඉල්ලීම පරිදි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් අතර බෙදා දීම පිණිස, කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති පිළිබඳව **2013.01.01** දින සිට **2014.05.31** දක්වා වන කාල පරිච්ඡේදය සඳහා වූ කාර්යසාධන වාර්තාව සකස් කරන ලදී.

V. අමාත්‍යාංශයේ ඉල්ලීම පරිදි, **2005** වර්ෂයේ සිට **2013** වර්ෂය දක්වා වූ (වර්ෂ **08** ක) කාල පරිච්ඡේදය සඳහා කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති සහ අනෙකුත් සේවා පිළිබඳ කාර්යසාධන වාර්තාව සකස් කරන ලදී.

VI. මාතර දිස්ත්‍රික්කයේ තිබෙන, සුනාමි ව්‍යවසනයෙන් හානියට පත් කර්මාන්තවල තත්ත්වය සහ ඒවා අලුත්වැඩියා කිරීමේ ක්‍රියාවලියෙහි ප්‍රගතිය ඇගයීම පිණිස රතු කුරුස සංවිධානයේ ඉල්ලීම පරිදි එම කර්මාන්ත අලුත්වැඩියා කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ පසුවිපරම් සිදු කිරීම සඳහා තොරතුරු සපයා දෙන ලදී.

VII. කාර්මික සංවර්ධන මණ්ඩලයේ අවශ්‍යතාවයන්ට අනුව සහ තවත් අයගේ ඉල්ලීම මත, තෝරාගත් භාණ්ඩ කිහිපයක් HS සංකේත පදනම් කර ගෙන දකුණු ආසියානු කලාපයේ රටවලට අපනයනය කිරීම සම්බන්ධයෙන් වාර්තාවක් සකස් කිරීමට අවශ්‍ය කටයුතු සූදානම් කිරීම. (භාණ්ඩ: කෝපි, තේ, කුළුබඩු, සහ රබර් සහ දැව ආශ්‍රිත නිෂ්පාදන.)

VIII. **2014** වර්ෂයේදී කර්මාන්ත **4,000** ක් දත්ත සංචිතයට ඇතුල් කිරීම පිණිස කර්මාන්ත පිළිබඳ දත්ත යාවත් කාලීන කිරීම සහ ඇතුළත් කිරීම. ISIC සංකේත සහිතව කර්මාන්ත **763** ක් පිළිබඳ තොරතුරු ඇතුළත් කරන ලදී.

IX. කාර්මික සංවර්ධන මණ්ඩලයේ පසුගිය වර්ෂ තුනෙහි ප්‍රගති වාර්තා පදනම් කර ගෙන නව කර්මාන්ත නාමාවලිය ඇතුල් කිරීම පිණිස දැනට පවතින කර්මාන්ත දත්ත සංචිතය යාවත්කාලීන කිරීම.

X. කර්මාන්ත පිළිබඳ තොරතුරු එක්රැස් කරගෙන, එම තොරතුරු වෙබ් අඩවිය හරහා අදාළ අංශ වෙත බෙදා හැරීම සඳහා අවශ්‍ය කටයුතු සූදානම් කිරීම.

## 4.4 අලෙවි අංශය

දිවයින පුරා සිටින ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් / කර්මාන්තකරුවන් මෙන්ම ස්වයංරැකියාවල නියුතුවූවන් විසින් නිෂ්පාදනය කරන ලද භාණ්ඩ අලෙවි කිරීමට අදාළ ක්‍රියාකාරකම් ආවරණය කරන අලෙවි අංශය කාර්මික සංවර්ධන මණ්ඩලයේ ප්‍රබල බලවේගය වේ. එය ඉතා වැදගත් පුද්ගලයා වන පාරිභොගිකයාගේ සම්පූර්ණ තෘප්තිමත්භාවය ඇති වන පරිදි අන්‍යෝන්‍ය වශයෙන් ප්‍රතිලාභ ගෙන දෙන, දීර්ඝ කාලීන වෙළඳ සම්බන්ධතාවයක් ගොඩ නගා ගැනීම හරහා පාරිභෝගිකයාට සේවා සපයා දෙයි.

කාර්මික සංවර්ධන මණ්ඩලයේ ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය යටතේ මුද්‍රණ සහ ප්‍රකාශන ඒකකය ද අලෙවි අංශයට අනුයුක්ත කර තිබේ.

අලෙවි අංශයට පැවරී ඇති කාර්යයන්

- කාර්මික ප්‍රදර්ශන සංවිධානය කිරීම සහ පැවැත්වීම / ජාතික ප්‍රදර්ශන සහ වෙළඳ ප්‍රදර්ශනවලට සහභාගීවීම.
- දිවයින පුරා සිටින, තෝරාගත් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් / කර්මාන්තකරුවන් මෙන්ම ස්වයංරැකියාවල නියතු පුද්ගලයින් සඳහා ද ජාතික තිළිණ ප්‍රදානෝත්සවය සංවිධානයකිරීම
- 'ලක්කම්' සහ 'ලක්නිපැයුම්' අලෙවි මධ්‍යස්ථානවල අලෙවි පහසුකම් සැපයීම
- උපකොන්ත්‍රාත් හුවමාරු සඳහා පහසුකම් සැලසීම
- වාත්තුවැඩ, ලුහු ඉංජිනේරු, කම්මල් වැඩ සහ අනෙකුත් ලෝහ වාත්තු සහ ශිල්පීය කර්මාන්තවල නියැළී සිටින කර්මාන්තකරුවන්ට සහනදායී මිල ගණන් යටතේ අමුද්‍රව්‍ය / අබලි ද්‍රව්‍ය සපයාදීම
- කර්මාන්ත / ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා අලෙවිකරණ සහාය සහ උපදේශණ සේවා සැපයීම

මෙම අංශය විසින් සපයනු ලබන වෙනත් සේවාවන් සහ සේවා ඒකක

'ලක්නිපැයුම්' සහ 'ලක්කම්' අලෙවි මධ්‍යස්ථාන - දිවයිනපුරා සිටින සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ගේ සහ ස්වයංරැකියාවල නියුතුවූවන්ගේ නිෂ්පාදන ඵලදායීතාවය නගාසිටුවීමේ සහ අලෙවිය ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව 'ලක්නිපැයුම්' සහ 'ලක්කම්' අලෙවි මධ්‍යස්ථාන මගින් ප්‍රදර්ශන සහ අලෙවි පහසුකම් සපයා දෙනු ලබයි.

උපකොන්ත්‍රාත් හුවමාරුව - ලෝක බැංකු අරමුදල් යටතේ පිහිටුවන ලද අලෙවි අංශය යටතේ ඇති උපකොන්ත්‍රාත් හුවමාරුව 1982 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ. එය සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් විසින් නිෂ්පාදනය කරන ලද භාණ්ඩ සැපයීමට සම්බන්ධ රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන සමග සම්බන්ධීකරණය සිදු කරනු ලබයි.

ලෝහ අබලි ව්‍යාපෘතිය - අලෙවි අංශය මගින් යකඩ මිශ්‍ර සහ යකඩ මිශ්‍රනොවන ලෝහ අබලි සහ වෙනත් අදාළ ද්‍රව්‍ය ගිවිසගත් මුදලකට කාර්මික සංවර්ධන මණ්ඩලය වෙනුවෙන් රාජ්‍ය ආයතන වෙතින් මිලදී ගනු ලබයි. මෙම ද්‍රව්‍ය කාර්මික සංවර්ධන මණ්ඩලයෙහි ලියාපදිංචි වී ඇති ලුහු ඉංජිනේරු කර්මාන්තකරුවන්ට අමුද්‍රව්‍ය ලෙස විකුණනු ලබයි.
ප්‍රදර්ශන - කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් ක්ෂුද්‍ර, සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසාකයින් සඳහා දිස්ත්‍රික් සහ පළාත් මට්ටමින් ප්‍රදර්ශන සංවිධානය කරනු ලබයි. දිස්ත්‍රික් සහ පළාත් මට්ටමේ ප්‍රදර්ශන පැවැත්වීමෙන් අනතුරුව ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ යන කාණ්ඩවලින් මුළු දිවයිනෙහිම විශිෂ්ඨ ව්‍යවසායකයින් තෝරාගැනීම සඳහා ජාතික මට්ටමේ වාර්ෂික ප්‍රදර්ශන සහ වෙළඳ ප්‍රදර්ශන පවත්වනු ලැබේ. මෙම ප්‍රදර්ශන මගින් රැකියා අවස්ථා නිර්මාණය කිරීමට සහ සුළු කර්මාන්ත ආරම්භ කිරීමට පහසුකම් සලසා දෙනු ලැබේ.

වගුව **4.4.1 -** අලෙවි අංශයේ කාර්යසාධනය - 2014

| කාර්යසාධනය | ලක්නිපැයුම් අලෙවි මධ්‍යස්ථානය | ලක්කම් අලෙවි මධ්‍යස්ථානය | උපකොන්ත්‍රාත් ලබාදීම | අබලි ලෝහ ව්‍යාපෘතිය | එකතුව (රු.මි.) |
|---|---|---|---|---|---|
| අලෙවි වටිනාකම (රු. මි.) | 0.0178 | 10.90 | 2.320 | 85.193 | 98.4308 |
| ආදායම (රු. මි.) | 0.0026 | 2.20 | 0.115 | 28.81 | 31.1276 |




ප්‍රස්තාරය **4.4.1 -** අලෙවි අංශයේ කාර්යසාධනය - 2014

**විශේෂ ක්‍රියාකාරකම්**

**සමාලෝචිත වර්ෂය තුළ මෙම අංශය විසින් පහත සඳහන් විශේෂ ක්‍රියාකාරකම් ඉටු කර තිබේ:**

- **2014 මැයි 23 - 25 යන දිනවල බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවෙහිදී පවත්වන ලද ජාතික ශිල්ප ප්‍රදානෝත්සවය**

  **- ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත අංශයට අයත් විවිධ නිෂ්පාදන අංශ නියෝජනය කරමින් පළාත් මට්ටමින් ශිල්පීන් 150 දෙනෙකු තෝරාගන්නා ලදී.**

- ප්‍රතිරූපය ගොඩනැගීමේ වැඩසටහන

  - **බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේ පැවති ශ්‍රී ලංකා ඉන්ටර්නැෂනල් මැනුෆැක්චරිං එක්ස්පො - 2014 ප්‍රදර්ශනයට රබර් සහ ප්ලාස්ටික් අංශවල කර්මාන්තකරුවන් සහභාගී කරවීම සහ සම්බන්ධීකරණය කිරීම.**
  - **බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේ පැවති දෙවැනි ශ්‍රී ලංකා වුඩ් ඉන්ටර්නැෂනල් එක්ස්පො - 2014 ප්‍රදර්ශනයට කර්මාන්තකරුවන් සහභාගී කරවීම සහ සම්බන්ධීකරණය කිරීම.**

- දියුණුවෙමින් පවතින තාක්ෂණය ලබාදීමේ වැඩසටහන් සඳහා ජාත්‍යන්තර මට්ටමේ අත්දැකීම් ලබා දීම
  - 2014 දෙසැම්බර් 14-27 දක්වා නව දිල්ලියේ පැවති ඉන්ඩියන් ඉන්ටර්නැෂනල් ට්‍රේඩ් ෆෙයාර් ප්‍රදර්ශනයට කර්මාන්තකරුවන් සහභාගී කරවීම සහ සම්බන්ධීකරණය කිරීම.
  - 2014 දෙසැම්බර් 03 – 06 යන දිනවල බැංගලෝරයේ පැවති ALUCAST ප්‍රදර්ශනය 2014 සඳහා සහභාගී වීම.

වගුව 4.4.2 - උපයාගත් ආදායම සහ ප්‍රධාන භෞතික කාර්යසාධනය

| සංයුක්ත අරමුණ | | | |
|---|---|---|---|
| G1a | කර්මාන්ත දිරිමත් කිරීම ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම | | |
| G1b | ව්‍යවසායකයින් පුහුණුකිරීම, සංවර්ධනය කිරීම සහ උපදේශකත්වය සැපයීම | | |
| G7 | දේශීය කාර්මික නිෂ්පාදන ප්‍රදර්ශනය කිරීම හෝ බෙදාහැරීම සඳහා දේශීය සංවිධාන හෝ විදේශීය ආයතන හෝ රජයයන් සමග කටයුතු කිරීම හෝ සහයෝගය දැක්වීම. | | |
| G9 | කාර්මික කටයුතු සඳහා ප්‍රාග්ධන, ණය, අලෙවිකරණ, කළමනාකරණ සහ තාක්ෂණික පහසුකම් සහ නීති උපදෙස් ඇතුළු සියළුම සේවා සහ පහසුකම් සපයාදීම. | | |
| G10 | කාර්මික යන්ත්‍රසූත්‍ර හෝ අමුද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා හෝ අදාල පහසුකම් සපයාදීම සඳහා ඕනෑම දේශීය සංවිධානයකට හෝ පුද්ගලයෙකුට හෝ පුද්ගලයින්ට මූල්‍යමය වශයෙන් හෝ අන්‍යාකාරයෙන් සහායවීම. | | |
| සංයුක්ත අරමුණු ඉටුකරගැනීම සඳහා ක්‍රියාත්මක කළ ක්‍රියාකාරකම් | | මිනුම් දර්ශකය | ලබාගත ප්‍රගතිය |
| G1a.25 | උපකොන්ත්‍රාත් ලබාදීමේ පහසුකම් සැලසීම සහ ඊ-මේල් / ජනමාධ්‍ය සහ අන්තර්ජාල වෙබ් අඩවි හරහා සේවා ප්‍රවර්ධනය කිරීම | | |
| (අ) | සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ අලෙවි ධාරිතාවය වැඩිදියුණු කිරීම | | |
| (i) | උප කොන්ත්‍රාත් ලබාදීමේ පහසුකම් සපයාදීම | බෙදා හරින ලද ඇණවුම් සංඛ්‍යාව | 30 |
| | | ඇණවුම්වල වටිනාකම (රු.) | 2,321,944.48 |
| | | උප-කොන්ත්‍රාත් ලබාගැනීම සඳහා පහසුකම් සලසන ලද කර්මාන්තකරුවන් සංඛ්‍යාව | 08 |
| | | ආදායම (රු.) | 115,252.39 |
| G1b.8 | SMIDEX සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ප්‍රදර්ශනය සංවිධානය කිරීම සහ ව්‍යවසායකයින් සඳහා තිළිණ ප්‍රදානය කිරීම. | | |
| (අ) | සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ වෙළඳපොළ කොටස වැඩිකිරීම | | |
| (i) | අමාත්‍යාංශය හා එක්ව ජාතික තිළිණ ප්‍රදානෝත්සවය සංවිධානය කිරීම | සංවිධානය කරන ලද ජාතික තිළිණ ප්‍රදානෝත්සව සංඛ්‍යාව | 1 |
| | | සේවා සපයන ලද ව්‍යාපාර සංඛ්‍යාව | 332 |
| | | වියදම (රු.) | 14,000,000 |
| | | ආදායම (රු.) | 115,252.39 |
| (ආ) | දේශීය ප්‍රදර්ශන සහ වෙළඳ ප්‍රදර්ශනවලට සහභාගී වීම | | |
| (i) | බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේ පැවති ශ්‍රී ලංකා ඉන්ටර්නැෂනල් මැනුෆැක්චරිං එක්ස්පො - 2014 ප්‍රදර්ශනයට රබර් සහ ප්ලාස්ටික් අංශයෙන් සහභාගීවීම. | පවත්වන ලද ප්‍රදර්ශන සංඛ්‍යාව | 1 |
| | | සහභාගීවූ කර්මාන්ත සංඛ්‍යාව | 30 |
| | | වියදම (රු.) | 300,000 |

| | | | |
|---|---|---|---|
| (ii) | බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේ පැවති දෙවැනි ශ්‍රී ලංකා වුඩ් ඉන්ටර්නැෂනල් එක්ස්පො - 2014 ප්‍රදර්ශනය | පවත්වන ලද ප්‍රදර්ශන සංඛ්‍යාව | 1 |
| | | සහභාගීවූ කර්මාන්ත සංඛ්‍යාව | 13 |
| | | වියදම (රු.) | 100,000 |
| (ඇ) | ජාත්‍යන්තර ප්‍රදර්ශන සහ වෙළඳ ප්‍රදර්ශන සඳහා සහභාගීවීම | | |
| (i) | 2014 දෙසැම්බර් 14-27 දක්වා නව දිල්ලියේ පැවති ඉන්ඩියන් ඉන්ටර්නැෂනල් ට්‍රේඩ් ෆෙයාර් ප්‍රදර්ශනයට කර්මාන්තකරුවන් සහභාගී කරවීම සහ සම්බන්ධීකරණය කිරීම. | පවත්වන ලද ප්‍රදර්ශන සංඛ්‍යාව | 1 |
| | | සහභාගීවූ කර්මාන්ත සංඛ්‍යාව | 32 |
| | | වියදම (රු.) | 2,160,000 |
| (ii) | 2014 දෙසැම්බර් 03 – 06 යන දිනවල බැංගලෝරයේ පැවති ALUCAST ප්‍රදර්ශනය 2014 සඳහා සහභාගී වීම. | පවත්වන ලද ප්‍රදර්ශන සංඛ්‍යාව | 1 |
| | | සහභාගීවූ කර්මාන්ත සංඛ්‍යාව | 16 |
| | | වියදම (රු.) | 900,000 |
| G7.6 | අලෙවි මධ්‍යස්ථානවල (ලක්නිපැයුම් සහ ලක්කම්) ප්‍රදර්ශන සහ අලෙවි පහසුකම් වැඩිදියුණු කිරීම | | |
| (i) | අලෙවි මධස්ථාන හරහා අලෙවි පහසුකම් සපයාදීම | අලෙවි පහසුකම් ලබාගත් කර්මාන්තකරුවන් සංඛ්‍යාව | 69 |
| | | අලෙවි පිරිවැටුම (රු.) | 10,972,335 |
| | | ආදායම (රු.) | 2,223,123 |
| G10.3 | කාර්මික සංවර්ධන මණ්ඩලයේ ලියාපදිංචි සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට සහනදායී මිල ගණන්වලට ලෝහ අබලි ද්‍රව්‍ය සපයා දීම. | | |
| (i) | ලෝහ අබලි ද්‍රව්‍ය ව්‍යාපෘතිය යටතේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට සහනදායී මිල ගණන් යටතේ ලෝහ අබලි ද්‍රව්‍ය සපයා දීම | මිලදී ගත් ප්‍රමාණය (මෙ.ටො.) | 989.77 |
| | | බෙදා දෙන ලද ප්‍රමණය (මෙ.ටො) | 979.88 |
| | | කර්මාන්තකරුවන් අතර බෙදා දෙන ලද අබලි ද්‍රව්‍ය | 611 |
| | | අලෙවි පිරිවැටුම (රු.) | 28,807,874.80 |

## 4.5 කාර්මික ජනපද අංශය

**සාමාන්‍ය**

දිවයිනේ සෑම ප්‍රදේශයකම සිටින කර්මාන්තකරුවන්ට සහායවීම සඳහා මෙන්ම ප්‍රදේශීය කාර්මික සංවර්ධනය වේගවත් කිරීමේ අරමුණ ද ඇතිව 1960 දශකයේදී කාර්මික ජනපද සංකල්පය ශ්‍රී ලංකාවට හඳුන්වා දෙන ලදී. දිවයිනේ විවිධ ප්‍රදේශවල පිහිටි කාර්මික ජනපද හරහා කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් ඉඩම් සහ ගොඩනැගිලි, අභ්‍යන්තර මාර්ග, තෙකලා විදුලි සැපයුම, වීදි ලාම්පු සවිකිරීම, කර්මාන්ත සඳහා අවශ ජලය සහ පානීය ජල සැපයුම, අපද්‍රව්‍ය බැහැර කිරීමේ පද්ධති, සහ විදුලි සංදේශ පහසුකම් ආදී යටිතල පහසුකම් සපයා දෙනු ලැබේ.

බස්නාහිර පළාතේ ඒකල, හොරණ, වවුලුගල සහ පානළුව යන ප්‍රදේශවල ද, මධ්‍යම පළාතේ පල්ලෙකැලේ, මාතලේ සහ කොටගල යන ප්‍රදේශවල ද, වයඹ පළාතේ පන්නල සහ ලුණුවිල යන ප්‍රදේශවල ද, සබරගමුව පළාතේ ගලිගමුව සහ පුස්සැල්ල යන ප්‍රදේශවල ද, දකුණු පළාතේ

**කරන්දෙණිය, බද්දේගම සහ බෙලිඅත්ත යන ප්‍රදේවල ද, උතුරු මැද පළාතේ නැගම්පහ සහ මිහින්තලේ යන ප්‍රදේශවල ද, උතුරු පළාතේ වවුනියාව සහ අච්චුවේලි යන ප්‍රදේශවල ද, ඌව පළාතේ බුත්තල ද පිහිටි කාර්මික ජනපද කාර්මික සංවර්ධන මණ්ඩලයේ කාර්මික ජනපද අංශය විසින් පවත්වාගෙන යනු ලබන කාර්මික ජනපද වේ. කාර්මික සංවර්ධන මණ්ඩලය යටතේ පවතින කාර්මික ජනපද 19 අතරින් පහත සඳහන් කාර්මික ජනපදවල වැසි ජලය බැසයාමේ කාණු ඉදිකිරීම ද ඇතුළුව අභ්‍යන්තර මාර්ග සකස් කිරීම, මායිම් වැට වෙනුවට තාප්ප ඉදි කිරීම, පානීය ජල පහසුකම් වැඩිදියුණු කිරීම, නව ගොඩනැගිලි ඉදිකිරීම සහ පවතින ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කිරීම ආදිය ඇතුළුව පවතින යටිතල පහසුකම් නවීකරණය කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා පෙර පැවති රේඛීය අමාත්‍යාංශය හරහා රජයේ භාණ්ඩාගාරයෙන් ලබාගත් රුපියල් මිලියන සියයකට (100) ආසන්න මුදලක් 2014 වර්ෂය තුළදී කාර්මික ජනපද අංශය විසින් වැය කර ඇත.**

**එම සංවර්ධන කටයුතු පිළිබඳ විස්තර පහත සඳහන් පරිදි වේ:**

| අනු අංකය | කාර්මික ජනපදය | ක්‍රියාකාරකම | මුදල (රු. මි.) | **100%** |
|---|---|---|---|---|
| 1 | ඒකල | කඩා බිඳ දමන ලද මායිම් තාප්පය ඉදි කිරීම | 3.99 | 100 |
| | | අභ්‍යන්තර මාර්ගවල කොටසක් කාපට් කිරීම | 25.40 | 30 |
| 2 | පල්ලෙකැලේ | අභ්‍යන්තර මාර්ගවල කොටසක් කාපට් කිරීම | 16.56 | 60 |
| 3 | හොරණ | කාර්යාල ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම සහ වැට ඉදිකිරීම | 11.28 | 100 |
| 4 | වවුලුගල | අභ්‍යන්තර මාර්ගවලට තාර දැමීම සහ වැසි ජලය බැසයාමේ කාණු ඉදිකිරීම | 5.40 | 100 |
| 5 | කලුදෑවල | අභ්‍යන්තර මාර්ගයේ කොටසක් අලුත්වැඩියා කිරීම (කොන්ක්‍රීට් යොදා) | 6.46 | 30 |
| 6 | පන්නල | නව ජල ටැංකියක් ඉදිකිරීම | 4.20 | 100 |
| 7 | ලුණුවිල | අභ්‍යන්තර මාර්ගවලින් කොටසකට තාර දැමීම | 3.00 | 60 |
| 8 | අච්චුවේලි | තැපැල් කාර්යාල සහ ආපනශාලා ගොඩනැගිල්ල ඉදිකිරීම | 6.66 | 100 |




රූපසටහන 4.5.1 - කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් කළමනාකරණය කරනු ලබන කාර්මික ජනපද

## අච්චුවේලි කාර්මික ජනපදය විවෘත කිරීම

සිවිල් යුද්ධය අවසන් වීමෙන් අනතුරුව යාපනය අච්චුවේලි කාර්මික ජනපදය යළි ක්‍රියාත්මක කිරීම අරඹන කරන ලද අතර එහි පළමුවන අදියරේ ඉදිකිරීම් සාර්ථකව නිම කරන ලදී. ඉන්දියානු සුළු ප්‍රදාන සංවර්ධන සහාය වැඩසටහන යටතේ රුපියල් මිලියන 220 ක අරමුදල් ලබා දුන් අතර, සම අරමුදල් සපයන්නෙකු වශයෙන් ශ්‍රී ලංකා රජය විසින් රුපියල් මිලියන 50 ක මුදලක් සපයා දෙන ලදී.

වැසි ජලය බැසයාමේ කාණු සහ පදික වේදිකා සහිත අභ්‍යන්තර මාර්ග පද්ධතිය, ජල ටැංකිය සහ අනෙකුත් සවිකිරීම් සහිත ජල සැපයුම් යෝජනාක්‍රමය, වීදි ලාම්පු සහිතව තෙකලා විදුලි සැපයුම, මල අපද්‍රව්‍ය පිරියම් කිරීමේ පද්ධතිය, ගිනි ආරක්ෂණ පද්ධතිය, සම්පූර්ණ මායිම් තාප්පය (සිමෙන්තියෙන් ඉදිකරන තාප්පය මායිම් ලකුණු කිරීම සහ ඇතුල්වීමේ දොරටු බාධකය සහිත දම්වැල් වැට), පරිපාලන ගොඩනැගිල්ලේ ආපන ශාලාව, තැපැල් කාර්යාලය සහ සේවා ගොඩනැගිල්ල ඇතුළු යටිතල පහසුකම් සපයා දෙන ලදී.

"අච්චුවේලි කාර්මික ජනපදයේ ආයෝජක වැඩසටහන" යන මාතෘකාව යටතේ කොළඹදී ආයෝජක සංසදයක් පැවැත්වීමෙහි ප්‍රතිඵලයක් ලෙස මුද්‍රිත මාධ්‍යවල සහ රේඛීය අමාත්‍යංශයේ සහ කාර්මික සංවර්ධන මණ්ඩලයේ වෙබ්අඩවිවල රාජ්‍ය භාෂා තුනෙන්ම දැන්වීමක් පළකර අච්චුවේලි කාර්මික ජනපදය සඳහා කර්මාන්තකරුවන් තෝරා ගැනීම පිණිස අයදුම්කරුවන් 58 දෙනෙකු සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවන ලදී. ඒ අනුව, කර්මාන්තකරුවන් 8 දෙනෙකු තෝරාගනු ලැබූ අතර මේ වන විට පී.වී.සී. බට, මිශ්‍ර ලෝහ ආලේපිත සින්ක් ඇලුමිනියම් සෙවිලි තහඩු, ඇණ සහ මුරිච්චි, සහ සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන නිපදවීම ආදී කර්මාන්ත ශාලා 04 ක් ක්‍රියාත්මකව පවතී.

### කර්මාන්ත ඒකක සඳහා කර්මාන්තකරුවන් තෝරා ගැනීම

දැනට කර්මාන්ත පිහිටුවා ඇති කර්මාන්තකරුවන් සහ අලුතින් ඉඩම් කොටස් / ඉදිකර නිමා කර ඇති ගොඩනැගිලි ලබා ගැනීම සඳහා අයදුම්පත්‍ර ඉදිරිපත් කරන ලද අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවා වර්ෂය තුළ ප්‍රායෝගික හැකියාව සළකා බලා කර්මාන්තකරුවන් 47 දෙනෙකු තෝරා ගන්නා ලදී.

### කල්බදු ගිවිසුම් අත්සන් කිරීම

ඉඩම් සහ ඉදිකර නිමා කර ඇති ගොඩනැගිලි සඳහා පිළිවෙලින් අවුරුදු 30 ක් සහ 20 ක් වශයෙන් සාර්ථකව ව්‍යාපාර කටයුතු සිදු කර ඇති කර්මාන්තකරුවන් සමග අදාළ ඉඩම් සහ ගොඩනැගිලි සඳහා කල්බදු ගිවිසුම් අත්සන් කරන ලදී. ඒ අනුව එම කර්මාන්තකරුවන් සමග කල්බදු ගිවිසුම් 12 ක් අත්සන් කරන ලදී.

### ප්‍රදර්ශනවලට සහභාගීවීම

කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් වාර්ෂිකව සංවිධානය කරනු ලබන නිල ප්‍රදර්ශනය වන බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවෙහි පවත්වන ලද SMIDEX ප්‍රදර්ශනයෙහිදී කාර්මික ජනපදවල පිහිටි තෝරාගත් එක් එක් කර්මාන්තවල ක්‍රියාකාරකම් ප්‍රදර්ශනය කෙරෙන ප්‍රදර්ශන කුටි 26 කින් සමන්විත වෙනමම ශාලාවක් සංවිධානය කරන ලදී.

කාර්මික සංවර්ධන මණ්ඩලයේ අලෙවි කණ්ඩායමෙහි සහභාගීත්වය ඇතිව කාර්මික ජනපද අංශය ඉංදියාවේ සහ ශ්‍රී ලංකාවේ රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදකයින්ගේ සංගමය ඒකාබද්ධව සංවිධානය කර බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවෙහි පවත්වන ලද **"SIMEX"** ජාත්‍යන්තර ප්‍රදර්ශනයට ක්‍රියාකාරී සහභාගී වෙන ලදී. ඒ අනුව, කාර්මික සංවර්ධන මණ්ඩලයේ ලියාපදිංචි කර්මාන්තකරුවන්ගෙන් සමන්විත ප්‍රදර්ශනය කුටි **24** ක් කාර්මික සංවර්ධන මණ්ඩල ලාංඡනය යටතේ වෙනම ශාලාවක ප්‍රදර්ශනය කරන ලදී.
එසේම කාර්මික සංවර්ධන මණ්ඩලය මෙම ප්‍රදර්ශනය නරඹා SMIEX ප්‍රදර්ශනය මගින් ලබා දෙන නව අදහස් ඉගෙන ගැනීමට දිවයින පුරා සිටින සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් දිරිමත් කරන ලදි.

කුලී ආදායම අයකර ගැනීම

කල්බදු දෙන ලද ඉඩම් සහ ගොඩනැගිලිවල මාසික / වාර්ෂික කුලී අයකර ගැනීම තුළින් මෙම වර්ෂය තුළදී රුපියල් මිලියන **53** ක ආදායමක් ලැබූ අතර එය බදුකරුවන්ගෙන් ලබාගත් මුළු ඉන්වොයිස්ගත ආදායමෙන් **90%** ට ආසන්න ප්‍රමාණයක් විය. මෙම වර්ෂය තුළදී බදුගැනුම්කරුවන් සමග බදු ගිවිසුම් අත්සන් කරන විට ඔවුන්ගෙන් ආපසු ගෙවනු ලබන වර්ෂ තුනක තැන්පතුවක් ලෙස අයකරගත් මුදල වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන චක්‍රීය අරමුදල රුපියල් මිලියන **2.33** ක් විය. ඒ අනුව **2014** වර්ෂය අවසානය වන විට එම චක්‍රීය අරමුදලෙහි සමුච්චිත අගය රුපියල් මිලියන **14** ක් විය.

දැනුම්වත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

කාර්මික ජනපදවල කර්මාන්තකරුවන්ගේ සංගමය සමග එක්ව පල්ලෙකැලේ කාර්මික ජනපදයෙහි කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදන ඵලදායීත්වය වැඩිදියුණු කර ඔවුන් පුද්ගලිකව නගා සිටුවීම සඳහා ශ්‍රී ලංකාවේ 'ආදර්ශ පරිසර හිතකාමී කාර්මික ජනපදය' යන්න මුළුමනින්ම අරමුණු කර ගනිමින් දැනුම්වත් කිරීමේ වැඩසටහන් දෙකක් සංවිධානය කරන ලදී.

## 4.6 ඉංජිනේරු අංශය

සාමාන්‍ය

මෙම අංශයෙහි විෂය පථය යටතේ ක්‍රියාත්මක වන අංශ සහ මධ්‍යස්ථාන පහත සඳහන් පරිදි වේ:

- කටුබැද්ද ප්‍රධාන කාර්යාලය - ඉංජිනේරු වැඩපොළ, වාත්තු වැඩපොළ, ඉංජිනේරු කාර්යාලය (තාක්ෂණික තොරතුරු සහ උපදේශණ සේවා, සහ තක්සේරු වාර්තා සඳහා), සිවිල් ඉංජිනේරු සහ විදුලි ඉංජිනේරු යන අංශ
- පැලියගොඩ - විද්‍යුත්ලෝහාලේපන මධ්‍යස්ථානය
- පන්නල - යෝග්‍ය තාක්ෂණ පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය
- මාතර - පොදු සේවා මධ්‍යස්ථානය
- පමුණුව - පිත්තල භාණ්ඩ සේවා මධ්‍යස්ථානය

මෙම අංශය විසින් ඉටුකරන ලද ක්‍රියාකාරකම්

**2014 වර්ෂය තුළදී ඉංජිනේරු අංශය විසින් සැලසුම් කරන ලද ක්‍රියාකාරකම් පහත සඳහන් පරිදි වේ:**

- **දැනට සිටින කර්මාන්තකරුවන්ට සහ නව කර්මාන්තකරුවන්ට / අනාගත කර්මාන්තකරුවන් වීමේ හැකියාව සහිත අයට අමුද්‍රව්‍ය සහ යන්ත්‍රසූත්‍ර තෝරාගැනීමේදී, සැලසුම් කිරීමේදී / සංවර්ධනය කිරීමේදී සහාය ලබාදීම සහ තාක්ෂණය / ක්‍රියාවලි පිළිබඳ දැනුම ලබාදීම.**
- **වැඩ ඇණවුම් මත කර්මාන්තකරුවන්ට පිරිසැකසුම්, වාත්තු කිරීම්, සහ ලෝහ නිමා කිරීම් සේවා සැපයීම.**
- **මණ්ඩලය වෙත සිවිල් සහ විදුලි ඉංජිනේරු ක්ෂේත්‍රවල අභ්‍යන්තර අළුත්වැඩියා, නඩත්තු / ප්‍රතිසංස්කරණ සහ ඉදිකිරීම් සැලසුම්කරණ සහ අධීක්ෂණ සහාය සපයාදීම සහ මණ්ඩලයේ වාහන නඩත්තු අවශ්‍යතාවලදී තාක්ෂණික සහ අධීක්ෂණ සහාය ලබාදීම.**
- **ග්‍රාමීය කර්මාන්ත සහ ස්වයං රැකියා උත්පාදන අමාත්‍යාංශයේ ප්‍රදර්ශන සහ ව්‍යාපෘති සඳහා සිවිල් සහ විදුලි ඉංජිනේරු උපකාරක සේවා සැපයීම.**
- **යන්ත්‍රෝපකරණ තක්සේරු වාර්තා සැපයීම, වාත්තු වැඩ අංශය සඳහා විද්‍යාගාර පරීක්ෂණ සේවා සැපයීම මෙන්ම කලින් නිෂ්පාදනය කරන ලද යන්ත්‍රෝපකරණ සහ මෙවලම් පිරිසැකසීම සහ අලෙවිය මෙම අංශය විසින් ඉටුකරන ලද අනෙකුත් ක්‍රියාකාරකම් අතර වේ.**
- **කර්මාන්ත සඳහා පිරිමැසුම් සහිත සහ යෝග්‍ය යන්ත්‍රසූත්‍ර මූලාකෘති සකස් කිරීම.**

**2014 වර්ෂයේ කාර්යසාධනය**

**ගාස්තු අයකරන සේවා, තක්සේරු, වාත්තුවැඩ/විද්‍යුත්ලෝහාලේපන විද්‍යාගාර සේවා, මෙවලම් විකිණීම සහ විවිධ අයිතම මගින් ලැබුණු ආදායම**

**විවිධ අංශ සහ මධ්‍යස්ථාන විසින් 2014 වර්ෂය තුළ ඉටු කරන ලද බාහිර සේවා මගින් උපයාගත් ආදායම පහත වගුවේ දක්වා ඇත. මෙම දත්ත 2014 වර්ෂය අවසානය වන දිනට අදාළ වන පරිදි ඉදිරිපත් කර ඇති අතර එයට වැට් සහ ජාතිය ගොඩනැගීමේ බදු අයත් නොවේ.**

වගු අංක 4.6.1 – **2014** වර්ෂයේදී ඉටුකරන ලද සේවාවන් සඳහා බාහිරින් උපයාගත් ආදායම

| යොමු අංකය | අංශය / කාර්යය | දළ ආදායම (රු.) (වැට් සහ ජා.ගො.බ. හැර) |
|---|---|---|
| 1 | ඉංජිනේරු වැඩපොළ - ප්‍රධාන කාර්යාලය, කටුබැද්ද | 7,871,096 |
| 2 | වාත්තු වැඩපොළ - ප්‍රධාන කාර්යාලය | 24,785 |
| 3 | තක්සේරු වාර්තා - ප්‍රධාන කාර්යාලය | 884,439 |
| 4 | සිවිල් ඉංජිනේරු සේවා - ප්‍රධාන කාර්යාලය | 80,000 |
| 5 | යෝ.තා.ප.සං.ම.., පන්නල | 1,739,228 |
| 6 | විද්‍යුත් ලෝහාලේපන මධ්‍යස්ථානය - පැලියගොඩ | 1,639,416 |
| 7 | පොදු සේවා මධ්‍යස්ථානය, මාතර | 436,283 |
| 8 | පිත්තල භාණ්ඩ සේවා මධ්‍යස්ථානය - පමුණුව | 408,567 |
| එකතුව | | **13,083,814** |

- අභ්‍යන්තර සේවා

විවිධ අංශ මගින් සපයාදෙන ලද අභ්‍යන්තර ඉංජිනේරු සේවා වැඩවල වටිනාකම (සේවා පිරිවැය පදනමින්) පහත සඳහන් පරිදි වේ :

වගු අංක 4.6.2 – **2014** වර්ෂයේදී අභ්‍යන්තරව සපයාදෙන ලද සේවාවල වටිනාකම

| යොමු අංකය | අංශය | සපයා දෙන ලද අභ්‍යන්තර සේවාවල වටිනාකම (රු.) |
|---|---|---|
| 1 | කම්හල - ප්‍රධාන කාර්යාලය | 299,145 |
| 2 | වාත්තු වැඩපොළ - ප්‍රධාන කාර්යාලය | 296,870 |
| 3 | සිවිල් ඉංජිනේරු සේවා - ප්‍රධාන කාර්යාලය | 1,381,377 |
| 4 | විදුලි ඉංජිනේරු සේවා - ප්‍රධාන කාර්යාලය | 238,500 |
| එකතුව | | **2,215,892** |

- **උපදේශක / ව්‍යාප්ති සේවා**

  **උපදේශක සේවා**

  **පන්නල පිහිටි යෝ.තා.ප.සං.ම., විද්‍යුත් ලෝහාලේපන මධ්‍යස්ථානය සහ ප්‍රධාන කාර්යලය (වැඩපොළ සහ ඉංජිනේරු කාර්යාලය) විසින් 2014 වර්ෂයේදී කර්මාන්තකරුවන් වෙත නිර්මාණ සහ පිරිසැකසුම් කිරීම පිළිබඳ තාක්ෂණික / ක්‍රියාවලි තොරතුරු සහ උපදෙස් ලබාදෙමින් උපදේශක සේවා 116 ක් සපයා දී ඇත.**

## 4.7 ව්‍යසායකත්ව සංවර්ධන සහ උපදේශකත්ව සේවා මධ්‍යස්ථානය

**පේෂකර්ම සහ ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය විසින් 1989 දෙසැම්බර් 15 වැනි දින ඉදිරිපත් කරන ලද කැබිනට් පත්‍රිකාවක් මගින් ව්‍යවසායකත්ව සංවර්ධන සහ උපදේශකත්ව සේවා මධ්‍යස්ථානය කාර්මික සංවර්ධන මණ්ඩලය යටතේ ඇති විශේෂ පුහුණු අංශයක් ලෙස පිහිටුවන ලදී. මෙම මධ්‍යස්ථානය පුහුණු අංශය, පුස්තකාලය සහ තොරතුරු කුටිය, තොරතුරු තාක්ෂණ අංශය සහ මුද්‍රණ අංශය යන අංශ හතරෙන් සමන්විත වේ.**

**කළමනාකරණ කුසලතා සහ ව්‍යවසායකත්ව සංවර්ධනය පිළිබඳව රට පුරා සිටින ව්‍යවසායකයින්ට විවිධ පුහුණු සපයාදීම පුහුණු ඒකකයේ ප්‍රධාන කාර්ය භාරය වේ. පුස්තකාල සහ තොරතුරු ඒකකය මගින් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත වැඩිදියුණු කරමින් ඒවා ප්‍රවර්ධනය කර සංවර්ධනය කිරීම පිණිස පුස්තකාල පහුකම් සහ කාර්මික තොරතුරු සපයා දෙනු ලැබේ. කාර්මික සංවර්ධන මණ්ඩලයේ තොරතුරු තාක්ෂණ ඒකකය මණ්ඩලය ඇතුළත ජාලගත සහ තොරතුරු පහසුකම් සපයා දෙමින් වෙබ් අඩවිය සංවර්ධනය කරයි. මුද්‍රණ ඒකකය විසින් වාර්තා, අත්පොත්, අත්පත්‍රිකා ආදිය ඇතුළත්ව අවශ්‍ය සියලුම ලිපි ලේඛන මුද්‍රණය කිරීමේ කටයුතු සිදු කරනු ලැබේ.**

**ව්‍යවසායකත්ව සංවර්ධන සහ උපදේශකත්ව සේවා මධ්‍යස්ථානයෙහි අරමුණු**

- **නව ව්‍යවසායකත්ව සංස්කෘතියක් නිර්මාණය කිරීම**
- **පවතින කර්මාන්ත පුළුල් කිරීම සඳහා නව කළමනාකරණ ක්‍රමෝපායයන් හඳුන්වාදීම**
- **පුහුණුකරුවන් පුහුණු කිරීම (ව්‍යවසායකත්ව සංවර්ධනය සහ කළමනාකරණ උපදේශකත්වය)**
- **දේශීය කර්මාන්තකරුවන්ට තාක්ෂණික දැනුම සහ ව්‍යාපාර අත්දැකීම් සපයාදීම.**
- **කාලීන වශයෙන් වැදගත් වන ව්‍යාපාර සහ කර්මාන්ත ක්ෂේත්‍ර පිළිබඳව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සහ අනාගත ව්‍යවසායකයින් වීමේ දක්ෂතාවය සහිත පුද්ගලයින් දැනුවත් කිරීම**
- **උපදේශණ සේවා සහ කාර්මික තොරතුරු සපයාදීම**

ව්‍යවසායකත්ව සංවර්ධන සහ උපදේශකත්ව සේවා මධ්‍යස්ථානය වෙත පැවරී ඇති කාර්යයන්:

- ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් පැවැත්වීම
- ව්‍යාපාර නිර්මාණය කිරීමේ වැඩසටහන් පැවැත්වීම
- ඵලදායිතාව වැඩිදියුණු කිරීමේ වැඩසටහන් පැවැත්වීම
- කළමනාකරණ කුසලතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම
- ව්‍යවසායකයින් සඳහා වාණිජ සහ ව්‍යාපාරික පුහුණුව ලබාදීම
- ක.ස.ම. තුළ එස් 5 වැඩසටහන ක්‍රියාත්මක කිරීම
- අන්තර්ජාල සහ ඊමේල් පහසුකම් සපයාදීම
- ප්‍රකාශණ අලෙවිකිරීම
- පුස්තකාල පොත්පත් එකතුව වැඩිදියුණු කිරීම (සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින්)
- පුස්කාල පොත් පත් ක්‍රියාවලිගත කිරීම
- කාර්මික තොරතුරු සංවිධානය කිරීම
- කා.සං.ම. සේවාදායකයින් අන්තර්ජාලගත දත්ත සංචිතයෙහි ලියාපදිංචි කිරීම
- අන්තර්ජාලගත දත්ත සංචිතයෙහි ලියාපදිංචි සේවාදායකයින් පිළිබඳ විස්තර ප්‍රාදේශීය කාර්යාල වෙත ලබාදීම.
- කර්මාන්තකරුවන්, සේවාදායකයින් සහ කා.සං.ම. කාර්යමණ්ඩලය වෙත කාර්මික තොරතුරු බෙදාහැරීම
- පුස්තකාලය වෙත අලුතින් ලබාගෙන ඇති පොතපත පිළිබඳ තොරතුරු බෙදාහැරීම
- ග්‍රන්ථවිද්‍යාත්මක දත්ත, දේශීය යන්ත්‍රසූත්‍ර සහ භාණ්ඩ නිෂ්පාදකයින්, වාර්තා, ශ්‍රී ලංකා ප්‍රමිතීන්, උපකාරක ආයතන, සහ පනත් එකතුව පිළිබඳ දත්ත සංචිත පවත්වාගෙනයාම සහ යාවත්කාලීන
- දේශීය සහ විදේශීය යන්ත්‍රසූත්‍ර පිළිබඳ තොරතුරු සපයාදීම
- ක.සං.ම. පුවත් සඟරාව සකස් කිරීම
- අත්පොත්, පැකේජ, අත්පත්‍රිකා, සුචිපත්‍ර සහ පත්‍රිකා ආදී ප්‍රකාශන සම්පාදනය කිරීම සහ යාවත්කාලීන කිරීම.
- විමසීම් සහ පිළිතුරු සේවාව
- විශේෂඥ උපදෙස් සඳහා යොමුකිරීම් සේවාව
- ප්‍රදර්ශන, සංසද සහ වැඩමුළු ආදිය සඳහා සහභාගීවීම සහ පුස්තකාල එකතුව යාවත්කාලීන කිරීම සඳහා නවතම තොරතුරු එක්රැස් කිරීම

## 2014 වර්ෂයේ කාර්යසාධනය

| ආයතනික අරමුණ ඉටුකරගැනීම සඳහා ඉටුකළ ක්‍රියාකාරකම් | මිනුම් දර්ශකය | ලබාගත් ප්‍රගතිය | ආදායම (රු.) |
|---|---|---|---|
| ව්‍යවසායකත්ව සංවර්ධනය සහ ඵලදායිතාවය වැඩිදියුණු කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන් | වැඩසටහන් සංඛ්‍යාව | 10 | 695,720 |
| | සහභාගීවූවන් සංඛ්‍යාව | 250 | |
| දැනුවත් කිරීමේ වැඩසටහන් | වැඩසටහන් සංඛ්‍යාව | 4 | 45,500 |
| | සහභාගීවූවන් සංඛ්‍යාව | 160 | |
| විෂයමාලා සංවර්ධනයකිරීම | විෂයමාලා සංඛ්‍යාව | 4 | - |
| වෙළඳ සහ තාක්ෂණික පුහුණුව සපයාදීම | වැඩසටහන් සංඛ්‍යාව | 11 | 817,225 |
| | සහභාගීවූවන් සංඛ්‍යාව | 160 | |
| උපදේශණය සහ උපදේශකත්ව සේවා | සපයාදෙන ලද සේවා සංඛ්‍යාව | 61 | - |
| කා.ස.ම. තුළ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම | වැඩසටහන් සංඛ්‍යාව | 1 | - |
| පුස්තකාල එකතුව සංවර්ධන කිරීම | පුස්තකාල ද්‍රව්‍ය සංඛ්‍යාව | 993 | |
| දත්ත සංචිතය පවත්වාගෙනයාම<br><br>අන්තර්ජාලය හරහා ලියාපදිංචිවී ඇති සේවාදායකයින්<br><br>ගොඩනැගිලි ද්‍රව්‍ය 63<br>ආහාර පාන 1084<br>තෙල් සහ ෆයිබර් 207<br>රසායනික ද්‍රව්‍ය 639 | සේවාදායකයින් ගණන | 1,993 | |
| අනෙකුත් දත්ත සංචිත<br>දේශීය යන්ත්‍රසූත්‍ර සහ භාණ්ඩ නිෂ්පාදකයින් | වාර්තා ගණන | 2,762 | |
| ග්‍රන්ථවිද්‍යාත්මක දත්ත | වාර්තා ගණන | 20,254 | |
| Lotus SmartSuite ප්‍රවේශය | වාර්තා ගණන | 20,249 | |
| වාර්තා | වාර්තා ගණන | 4,522 | |
| උපකාරක ආයතන | ආයතන ගණන | 325 | |
| ශ්‍රී ලංකා ප්‍රමිති | ප්‍රකාශන ගණන | 1,325 | |
| පනත් | වාර්තා ගණන | 1,024 | |
| කර්මාන්ත සමීක්ෂණ දත්ත | වාර්තා ගණන | 1,261 | |

| ආයතනික අරමුණු ඉටුකරගැනීම සඳහා ඉටුකළ ක්‍රියාකාරකම් | මිනුම් දර්ශකය | ලබාගත ප්‍රගතිය | ආදායම (රු.) |
|---|---|---|---|
| කාර්මික තොරතුරු ප්‍රචාරණය<br><br>උපදේශණ සේවා<br>විමසුම් සහ පිළිතුරු සේවාව | සේවාදායකයින් සංඛ්‍යාව<br>සේවාදායකයින් සංඛ්‍යාව | 1993<br>958 | 406,783 |
| කාර්මික සංවර්ධන මණ්ඩලය පිළිබඳ ප්‍රචාරය ලබා දීම පිණිස අත්පත්‍රිකා බෙදා හැරීම (සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි) | පත්‍රිකා සංඛ්‍යාව | 5000 | |
| නිෂ්පාදන ගොනු සකස් කිරීම<br><br>කරවල / දුම්ගැසූ වියළන ලද කරවල / ලුණු දැමූ කරවල<br>උක්හකුරු<br>සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත අර්ථ නිරූපණය | | 01<br>01<br>01 | |
| ප්‍රකාශන සම්පාදනය කිරීම<br><br>කාර්මික සංවර්ධන මණ්ඩල පොත්පිංච<br>ඇන්තූරියම් වගාව<br>ලියුම් කවර නිෂ්පාදනය පිළිබඳ පත්‍රිකාව<br>බේකරි නිෂ්පාදන පැකේජය<br>කිරි සහ කිරි නිෂ්පාදන පැකේජය<br>පුවත් සඟරාව<br>කා.සං.ම. කාර්ය මණ්ඩලය සඳහා නාම පත්‍ර සකස් කිරීම<br>කර්මාන්තකරුවන්ගේ නාමාවලිය සකස් කිරීම සඳහා සමාගම් පිළිබඳ තොරතුරු එක්රැස් කිරීම සඳහා කටයුතු සූදානම් කිරීම | පොත් පිංච සංඛ්‍යාව<br>පත්‍රිකා සංඛ්‍යාව<br>පැකේජ සංඛ්‍යාව<br>පැකේජ සංඛ්‍යාව<br>පැකේජ සංඛ්‍යාව<br>මුද්‍රණ සංඛ්‍යාව<br>නාම පත්‍ර සංඛ්‍යාව<br>සමාගම් වාර්තා සංඛ්‍යාව | 01<br>01<br>01<br>01<br>01<br>01<br>60<br>58 | |
| වැඩමුළු සංවිධානය කිරීම<br><br>ආහාර නිෂ්පාදන සඳහා ආහාර සුරක්ෂිතතාවය සහ විධි සහ නියමයන් | සහභාගීවූවන් සංඛ්‍යාව | 30 | |



**තාක්ෂණ සහ පර්යේෂණ අමාත්‍යාංශයේ නිලධාරීන්ට ව්‍යවසායකත්ව සංවර්ධන සහ උපදේශකත්ව සේවා මධ්‍යස්ථානය විසින් 2014 වර්ෂයේදී පුහුණුව ලබා දුන් අවස්ථාව**



**හිඟුරක්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේදී 2014 වර්ෂයේ පවත්වන ලද ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහනෙහි අවස්ථාවක්**



**2014 වර්ෂයේදී මහවැලි වැලිඔය ප්‍රදේශයේ පවත්වන ලද ගොඩනැගිලි ඉදිකිරීම් පුහුණු වැඩසටහනේ අවස්ථාවක්**

## 4.8 තාක්ෂණ සේවා අංශය

සාමාන්‍ය

**ශ්‍රී ලංකාවේ කර්මාන්ත ප්‍රජාවේ තාක්ෂණික අවශ්‍යතාවයන් සපුරා දීමට කටයුතු කරන තාක්ෂණික සේවා අංශය කාර්මික සංවර්ධන මණ්ඩලයෙහි ප්‍රධාන අංශ වලින් එකක් වේ. ව්‍යවසායකයින්ට සිය ව්‍යාපාර සැලසුම් සකස්කිරීම හරහා ආරම්භයේ සිට ක්‍රියාත්මක කිරීම දක්වාත්, පවතින ව්‍යාපාර පුළුල් කිරීම, නවීකරණය කිරීම, විවිධාංගීකරණය කිරීම සහ ගුණාත්මකභාවය සහ ඵලදායීතාවය වැඩිදියුණු කිරීම සඳහාත් අවශ්‍ය කරන තාක්ෂණික සහාය සපයාදීම තාක්ෂණික සේවා අංශයේ මූලික අරමුණ වේ. තාක්ෂණ සේවා අංශය මගින් සපයනු ලබන සේවාවන් ආහාර, රසායනික ද්‍රව්‍ය, තෙල් සහ කෙඳි, ගොඩනැගිලි ද්‍රව්‍ය සහ පරිගණක තාක්ෂණය යන උප අංශ පහ හරහා සපයනු ලබයි. තාක්ෂණ සහාය සපයාදීම ප්‍රධාන වශයෙන්ම හොඳින් සැලසුම්කළ ප්‍රායෝගික කොටසක් ද සහිත එක් දින තාක්ෂණය සපයාදීමේ වැඩමුළු හරහා සිදු කරනු ලැබේ. එයට අමතරව, මෑතකදී ආරම්භ කරන ලද කර්මාන්ත විද්‍යාපීඨය මගින් ඉහත සඳහන් කළ ක්ෂේත්‍ර ආවරණය වන සහතිකපත්‍ර පාඨමාලා ගණනාවක් පවත්වනු ලැබේ.**

කාර්යසාධන ජයග්‍රහණ

**තාක්ෂණ සේවා අංශය විසින් 2014 වර්ෂයේදී ඉටු කරන ලද ක්‍රියාකාරකම් පහත සඳහන් පරිදි වේ:**

**(1) පවත්වන ලද කාර්මික පුහුණු වැඩසටහන් සහ තාක්ෂණ නිරූපණය කිරීම් සහ වැඩමුළු**

- තාක්ෂණය ලබා දීමේ වැඩමුළු

තාක්ෂණ සේවා අංශයේ කාර්යමණ්ඩලය විසින් කාර්මාන්ත විශේෂඥයින් සහ විශ්වවිද්‍යාලවල අධ්‍යයන කාර්යමණ්ඩල සමග එක්ව තාක්ෂණික සේවා අංශයෙහිදී ආහාර, රසායනික ද්‍රව්‍ය, තෙල් සහ කෙඳි, ගොඩනැගිලි ද්‍රව්‍ය සහ ඛණිජ යන උප අංශ යටතේ තාක්ෂණය ලබාදීමේ වැඩමුළු **68** ක් සහ නිරූණය කිරීම් **39** ක් පවත්වන ලද අතර එම වැඩමුළු හා නිදර්ශණය කිරීම් හරහා සමස්ථයක් ලෙස ව්‍යවසායකයින් සහ කර්මාන්තකරුවන් **2093** දෙනෙකුට පුහුණුව සහ සහයෝගය ලබාදෙමින් රු. 3,185,344.00 ක මුදලක් උපයාගෙන ඇත. තාක්ෂණ සේවා අංශය විසින් **2014** වර්ෂය තුළදී තාක්ෂණය ලබා දීමේ වැඩමුළු / නිරූපණය කිරීම් හරහා පහත සඳහන් තාක්ෂණයන් ලබා දී ඇත

ගොඩනැගිලි ද්‍රව්‍ය සහ ඛණිජ:

- ෆයිබර්ග්ලාස් සවිගන්වනලද ප්ලාස්ටික තාක්ෂණය
- සිමෙන්ති මල් පෝච්චි
- සිමෙන්ති බ්ලොක් ගල්
- කොන්ක්‍රීට් බිම් ගඩොල් තාක්ෂණය
- සිමෙන්ති මගින් ස්ථායී කළ මැටි බ්ලොක් ගල්
- මැටි භාණ්ඩ

ආහාර:

- ක්ෂණික පළතුරු බීම
- ජෑම්
- කෝඩියල්
- චට්නි
- යෝගට්
- විජලනය කළ එළවළු
- ජෙලි කැට
- කුළුබඩු සැකසුම් කිරීමේ තාක්ෂණය
- දෙහි අච්චාරු
- ආහාර සුරක්ෂිතතාවය සහ ඇසිරීම
- බේකරි නිෂ්පාදන
- රසකැවිලි
- කෙසෙල් පෙති
- බිම්මල් වගාව
- ගොරක පේස්ට්
- අබ ක්‍රීම්
- සියඹලා සාන්ද්‍රිතය
- අලුතින් කපන ලද එළවළු
- ධාන්‍ය නිෂ්පාදන තාක්ෂණය
- පපඩම්
- බයිට්ස් සහ මිශ්‍රණ
- චිලි පේස්ට් සහ උම්බලකඩ සම්බෝල

රසායනික ද්‍රව්‍ය:

- ඩිටර්ජන්ට් වර්ග
- බෝතල් කළ පානීය ජලය
- තිනර් සහ ටර්පන්ටයින්
- දැව ආරක්ෂණ

- ඉටිපන්දම් සහ අලංකාර ඉටිපන්දම්
- කපුරු පෙති
- හඳුන්කූරු

තෙල් සහ කෙඳි:

- මෘදු දැව පිරියම් කිරීම
- රෙදි සෝදන සබන්
- කඩදාසි ප්‍රතිචක්‍රීයකරණය කිරීම සහ අතින් නිපදවන ලද කඩදායි
- අභ්‍යාස පොත්
- ලියුම් කවර

පරිගණක තාක්ෂණය:

- පරිගණක දෘඩාංග සහ ජාලගත කිරීම

**(2)** කර්මාන්තකරුවන්ගේ අවශ්‍යතාවයට අනුව සපයා දෙන පුහුණු වැඩසටහන්

තාක්ෂණ සේවා අංශයෙහි කාර්ය මණ්ඩලය පානදුර පිහිටි සීමාසහිත සී.ඩී. ද ෆොන්සේකා සහ පුත්‍රයෝ සමාගම වෙත ගොස් සෝයා සෝස් පෙරීමේ ක්‍රියාවලියෙහි කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය උපදේශකත්වය සපයා දෙන ලදී.

**(3)** ශ්‍රී ලංකාවේ ගඩොල් සහ උළු කර්මාන්තය සඳහා තාක්ෂණය වැඩිදියුණු කිරීමේ වැඩසටහන

ඉංදියාවේ විජයප්‍රකාෂ් ඉන්ඩස්ට්‍රියල්ස් සමාගමේ නියෝජිතයින්ගේ සහාය ඇතිව 2014 ජුනි මස 28 වැනි දින වයික්කාල, තොපුතොට සමස්ත ලංකා මැටි සෙවිලි උළු නිෂ්පාදකයින්ගේ සංගමය සඳහා ශ්‍රී ලංකාවේ ගඩොල් සහ උළු කර්මාන්තය වැඩිදියුණු කිරීමේ තාක්ෂණයන් පිළිබඳව ඉදිරිපත් කිරීමක් සිදු කරන ලදී.

**(4)** ආහාර සුරක්ෂිතතාවය සහ ඇසුරුම්කරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන

කාර්මික සංවර්ධන මණ්ඩලයේ ගම්පහ සහ කළුතර දිස්ත්‍රික් කාර්යාලවල සහාය ඇතිව ව්‍යවසාකයින් 91 දෙනෙකු සඳහා "ආහාර සුරක්ෂිතතාවය සහ ඇසුරුම්කරණය" පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් දෙකක් පවත්වන ලදී. කර්මාන්ත හා වාණිජ අමාත්‍යංශයේ අනුග්‍රාහකත්වය ඇතිව පවත්වන ලද එම වැඩසටහන් දෙක "Pro-Food Pro-Pack ප්‍රදර්ශනය - 2014" සඳහා පූර්ව-සංවිධානය කිරීමක් වශයෙන් පවත්වන ලදී.

**(5)** ජීවනෝපාය සංවර්ධන වැඩසටහන්

කාර්මික සංවර්ධන මණ්ඩලයේ කොළඹ දිස්ත්‍රික් කාර්යාලය විසින් සංවිධානය කර දිවිනැගුම වැඩසටහන යටතේ කොළඹ දිස්ත්‍රික්කයේ දිවිනැගුම ප්‍රතිලාභීන් සඳහා 2014 සැප්තැම්බර් 26 වැනි දින පවත්වන ලද ජීවනෝපාය සංවර්ධන වැඩසටහන සඳහා සම්පත් පුද්ගලයින් ලෙස තාක්ෂණ සේවා අංශයේ කාර්ය

මණ්ඩලය සහභාගී වූහ. මෙම වැඩසටහන් කිරිපට්ටි පාලන තාක්ෂණය, වෙල්ඩිං තාක්ෂණය, පෙදරේරු ශිල්පය, පිංතාරු ශිල්පය සහ විදුලි වැඩ වැනි ජීවනෝපාය අංශ යටතේ පවත්වන ලදී.

**(6)** ප්‍රාදේශීය සංවර්ධන අංශය සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම

කාර්මික සංවර්ධන මණ්ඩලයේ දිස්ත්‍රික් කාර්යාලවල සහාය ඇතිව පුහුණු වැඩසටහන් පහක් පවත්වන ලදී - මඩකලපුව දිස්ත්‍රික්කයේ මැටි කර්මාන්තය (මැටි දියර වාත්තුව) පිළිබඳව වැඩසටහනක් ද, යාපනය දිස්ත්‍රික්කයේ ෆයිබර්ග්ලාස් තාක්ෂණය පිළිබඳව වැඩසටහනක් ද, පුත්තලම දිස්ත්‍රික්කයේ කපුරු පෙති කර්මාන්තය පිළිබඳව වැඩසටහනක් ද, මඩකලපුව දිස්ත්‍රික්කයේ ඔඩ්ඩමාවඩි සහ එරාවූර් යන නගරවලදී සබන් නිෂ්පාදනය, හඳුන්කූරු නිෂ්පාදනය, ඉටිපන්දම් නිෂ්පාදනය සහ කපුරු පෙති නිෂ්පාදනය පිළිබඳව වැඩසටහන් දෙකක් ද පවත්වන ලදී. මෙම වැඩසටහන් තුළදී පුහුණු කරන ලද සමස්ත ව්‍යවසායකයින් සංඛ්‍යාව 128 ක් විය.

**(7)** සහතිකකිරීම ලබා ගැනීම සඳහා සහාය

පහත සඳහන් කර්මාන්ත ආයතන සඳහා ISO 22000 (ආහාර සුරක්ෂිතතා කළමණාකරණ ක්‍රමවේදය) සහතිකය සහ ශ්‍රී ලංකා ප්‍රමිති (SLS) සහතිකය ලබා ගැනීම සඳහා කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශය සමග එක්ව තාක්ෂණ සේවා අංශය විසින් සහාය දෙන ලදී.

- ෆෝකොන්ස් කැනරීස්, අංක 10, පංසල පාර, බේරුවල - (ISO 22000)
- වැලෙන්ජ් ෆුඩ් ප්‍රොඩක්ට්ස්, මල්වත්ත, ගොඩකවෙල - (SLS)
- නෙල්කො ෆුඩ් ප්‍රොඩක්ට්ස්, මල්වත්ත, ගොඩකවෙල - ( ISO 22000)

**(8)** පරිගණක දෘඩාංග ජාලගතකිරීමේ පාඨමාලාව (මාස 03, පූර්ණ කාලීන)

2014 වර්ෂයේදී සිසුන් 20 දෙනෙකු සඳහා පරිගණක දෘඩාංග සහ ජාලගතකිරීමේ පාඨමාලාවක් පවත්වන ලදී.

**(9) SMIDEX 2014** – කාර්මික ප්‍රදර්ශනය

තාක්ෂණ සේවා අංශය කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් සංවිධානය කරන ලද SMIDEX 2014 කාර්මික ප්‍රදර්ශනයට සහභාගිවී පහත සඳහන් කාර්යයන් ඉටු කරන ලදී.

- ➢ ඉංදියානු නියෝජිත කණ්ඩායමේ සහයෝගය ඇතිව තාක්ෂණික ඉදිරිපත්කිරීම් සංවිධානය කිරීම.
  - ✓ ඉංදියාවේ උණ සහ වේවැල් කර්මාන්ත සඳහා වන ජාත්‍යන්තර කාර්යාලයේ (INBAR) අධ්‍යක්ෂ සහ දකුණු ආසියානු උණ සහ වේවැල් කර්මාන්ත සඳහා වන ජාත්‍යන්තර කාර්යාලයේ (South Asia-INBAR) කලාපීය සම්බන්ධීකාරක ටී.පී. සුබ්‍රමනි මහතා විසින් ඉදිරිපත් කළ උණ කර්මාන්තයේ ඇති තාක්ෂණික-ආර්ථික විභවයන් පිළිබඳ ඉදිරිපත් කිරීම.
  - ✓ ඉංදියාවේ විජයප්‍රකාෂ් ඉංඩස්ට්‍රියල්ස් සමාගමේ බාබු අපාර්ත්, ජෝජ් මැතිව්ස් සහ කේ.කේ. විජයන් යන මහත්වරුන් ඉදිරිපත් කළ ගඩොල් සහ උළු කර්මාන්තවල තාක්ෂණයන් වැඩිදියුණු කිරීම පිළිබඳ ඉදිරිපත් කිරීම.
- ➢ ප්‍රදර්ශනයෙහිදී කර්මාන්තකරුවන්ට සහ මහජනතාවට නව නිපැයුම්, නවෝත්පාදන නිෂ්පාදන සහ නව තාක්ෂණයන් ප්‍රදර්ශනය කිරීම.

- මෙම ප්‍රදර්ශනයේදී අතින් නිෂ්පාදනය කරන ලද කඩදාසි, රෙදි සෝදන සබන්, ඉටිපන්දම්, සිමෙන්ති විසිතුරු භාණ්ඩ සහ පොල්කිරි ඇසුරුම් කිරීම පිළිබඳ තාක්ෂණය ලබාදීම නිරූපණය කිරීමේ වැඩසටහන් සංවිධානය කරන ලදී.
- රාජ්‍ය සහ පෞද්ගලික අංශවල ආයතන සම්බන්ධීකරණය කිරීම.

## 4.9 රබර් නිෂ්පාදන සංවර්ධන සහ සේවා මධ්‍යස්ථානය

රබර් ආශ්‍රිත දේශීය කර්මාන්ත සඳහා, විශේෂයෙන්ම සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සඳහා සහාය ලබාදීම පිණිස ලෝක බැංකුවේ මග පෙන්වීම සහ මූල්‍ය සහයෝගය යටතේ 1980 වර්ෂයේදී රබර් නිෂ්පාදන සංවර්ධන සහ සේවා මධ්‍යස්ථානය පැලියගොඩදී පිහිටුවන ලදී. එතැන් සිට මෙම මධ්‍යස්ථානය මගින් දේශීය රබර් නිෂ්පාදන කර්මාන්තකරුවන්ට පහත සඳහන් ක්ෂේත්‍රවල සේවා සපයාදී ඇත:

- තාක්ෂණික උපදේශණ සහ ව්‍යාප්ති සේවා
- නිෂ්පාදන සහ ක්‍රියාවලි සංවර්ධනය
- පරීක්ෂණ සහ තත්ත්ව සහතික කිරීම
- අර්ධ-වාණිජමය සේවා සැපයීම
- නව වෙළඳපොළ අවශ්‍යතාවලට හැඩගැසීම
- අධ්‍යයන සහ පර්යේෂණ හා සංවර්ධන ආයතන සහ පොදුවේ කර්මාන්ත අතර සම්බන්ධකයක් ලෙස කටයුතු කිරීම

මෙම අංශයෙහි 2014 වර්ෂයේ කාර්යසාධනය පහත සඳහන් පරිදි වේ:

වගුව 4.9.1 – රබර් නිෂ්පාදන සංවර්ධන සහ සේවා මධ්‍යස්ථානයේ කාර්යසාධනය

| ආයතනික අරමුණ | ආයතනික අරමුණ ඉටු කර ගැනීමේ ක්‍රියාකාරකම | | මිනුම් දර්ශකය | කාර්යසාධනය |
|---|---|---|---|---|
| **G1a.** කර්මාන්ත දිරිමත් කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම | **9** | නව කර්මාන්ත / ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ස්ථාපිත කිරීම සහ ක්‍රියාත්මක කිරීම | ඒකක ගණන | 4 |
| | **10** | පවතින කර්මාන්ත /ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත වැඩිදියුණු කිරීම සඳහා සහාය ලබා දීම | ඒකක ගණන | 33 |
| | **12/14** | තාක්ෂණික පුහුණු සහ තාක්ෂණය ලබාදීමේ වැඩසටහන්, නිරූපණය කිරීම් සහ වැඩමුළු පැවැත්වීම; ඊමේල් / ජනමාධ්‍ය සහ වෙබ් අඩවියේ පොදු අවකාශය හරහා සපයන සේවා ප්‍රවර්ධනය කිරීම. | | |
| | *(i)* | තාක්ෂණය ලබාදීමේ වැඩසටහන් | වැඩසටහන් සංඛ්‍යාව | 22 |
| | *(ii)* | පුහුණුලාභීන්ගේ අවශ්‍යතාවයට අනුව සකස්කරන ලද පුහුණු වැඩසටහන් පැවැත්වීම | වැඩසටහන් සංඛ්‍යාව | 02 |
| **G1b.** ව්‍යවසායකයින් පුහුණු කිරීම, සංවර්ධනය කිරීම සහ උපදේශණය සපයාදීම | **7.** | ව්‍යවසායකයින් සඳහා අලෙවිකරණය, තාක්ෂණය, මූල්‍යය, කළමනාකරණය, නිෂ්පාදනය ආදිය පිළිබඳ උපදේශනය සහ උපදේශකත්වය සපයාදීම. | | |
| | (i) | තාක්ෂණික සහාය සහ උපදේශකත්වය | ව්‍යවසායකයින් සංඛ්‍යාව | 42 |
| **G9.** ප්‍රාග්ධන, ණය, අලෙවිකරණ, කළමනාකරණ සහ තාක්ෂණික පහසුකම් සහ නීති උපදෙස් ලබාදීම ද ඇතුළත්ව කර්මාන්ත ව්‍යාපාර සඳහා අවශ්‍ය සියලුම සේවා සහ පහසුකම් සැපයීම | **4.** | රබර් නිෂ්පාදන සහ සංයෝග සකස්කිරීමේ පහසුකම් සපයාදීම | | |
| | (i) | නිෂ්පාදන සහ ක්‍රියාවලි වැඩිදියුණු කිරීම | වැඩ සංඛ්‍යාව | 03 |
| | | | කර්මාන්ත සංඛ්‍යාව | 12 |
| | (ii) | තත්ත්ව පරීක්ෂණ සහ සහතික කිරීම් සපයාදීම | සහතිකකිරීම් සංඛ්‍යාව | 6 |
| | (iii) | තත්ත්ව පරීක්ෂණ සහ සහතික කිරීම් සපයාදීම | පරීක්ෂා කරන ලද සාම්පල සංඛ්‍යාව | 129 |
| | | | සේවා සපයන ලද කර්මාන්ත සංඛ්‍යාව | 1,564 |
| | | | සහතිකකිරීම් සංඛ්‍යාව | 12 |
| | (iv) | රබර් භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා සහාය සපයාදීම | නිෂ්පාදන සංඛ්‍යාව | 14 |
| | (v) | රබර් භාණ්ඩ අභ්‍යන්තර වශයෙන් නිෂ්පාදනය කිරීම | නිෂ්පාදන සංඛ්‍යාව | 02 |

රබර් නිෂ්පාදන සංවර්ධන සහ සේවා මධ්‍යස්ථානයේහි සියලුම ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් මගින් උපයාගත් ආදායම පහත සඳහන් පරිදි වේ:

වගුව 4.9.2 – රබර් නිෂ්පාදන සංවර්ධන සහ සේවා මධ්‍යස්ථානයේ ආදායම

| ආයතනික අරමුණ | | ආදායම් උත්පාදනය: අමුද්‍රව්‍ය පිරිසැකසුම් කිරීම සහ සැපයීම, නියැදි පරීක්ෂාකිරීම සහ සහතිකකිරීම, අර්ධ-නිමි සහ නිමි නිෂ්පාදන ආදිය. | ප්‍රමාණය | ආදායම (රු.) |
|---|---|---|---|---|
| **G1a.12, 14, 25, G9.4, 9.5,** සහ **G.13.2, 13.3, 13.4** ප්‍රාග්ධන, ණය, අලෙවිකරණ, කළමනාකරණ සහ තාක්ෂණික පහසුකම් සහ නීති උපදෙස් ලබාදීම ද ඇතුළත්ව කාර්මික කාර්යයන් සඳහා අවශ්‍ය සියලුම සේවා සහ පහසුකම් සැපයීම | (i) | රබර් සංයෝග පිරිසැකසුම් කිරීම සහ සැපයීම | කි.ග්‍රෑ. 35,498 | 16,882,280 |
| | (ii) | රබර් සංයෝග ඇඹරීම | කි.ග්‍රෑ. 17,231 | 254,979 |
| | (iii) | කේන්ද්‍රඅපසාරික රබර්කිරි සහ සංයෝගය | ලීටර් 9,008 | 2,889,922 |
| | (iv) | උප කොන්ත්‍රාත් දීම | 06 | 1,009,474 |
| | (v) | තත්ත්ව පාලනය සහ රසායනාගාර පරීක්ෂණ | | |
| | | සහතික නිකුත් කිරීම | 129 | 300,008 |
| | | නිෂ්පාදන සාම්පල පරීක්ෂා කිරීම | 1,564 | |
| | (vi) | රබර් භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා සහාය ලබා දීම | 14 | 121,551 |
| | (vii) | රබර් භාණ්ඩ අභ්‍යන්තර වශයෙන් නිෂ්පාදනය | 02 | 50,000 |
| | (vii) | පුහුණුලාභීන්ගේ අවශ්‍යතාවයට අනුව සකස් කරන ලද පුහුණු පහසුකම් සපයාදීම | 02 | 56,250 |
| | (ix) | තාක්ෂණය ලබාදීමේ වැඩසටහන් | 22 | 55,000 |
| එකතුව | | | | **21,619,464** |

මධ්‍යස්ථානය විසින් සිදු කරන ලද විශේෂ කාර්යයන්:

(I) පර්යේෂණ සහ සංවර්ධන කටයුතු
 (i) තාපයට ඔරොත්තු දෙන ගැස්කට් සඳහා නියොප්‍රීන් රබර් සංයෝගය සකස් කිරීම

(II) ප්‍රධාන නිෂ්පාදන සංවර්ධන ක්‍රියාකාරකම්
 පහත සඳහන් නිෂ්පාදන සඳහා සංයෝග සකස් කිරීමේ සහ පිරිසැකසුම් තාක්ෂණ සකස්කර කර්මාන්තකරුවන් වෙත ලබා දෙන ලදී:
 (i) මෝටර් සම්බන්ධක
 (ii) ද්විත්න සීල් සංයෝග
 (iii) වයිබ්‍රේෂන් මවුන්ට්
 (iv) ඇඹරුම සහ බුසුව
 (v) ජෙනරේටර් මවුන්ට්
 (vi) රේඩ් පෑඩ්
 (vii) සොලිඩ් ඇන්කල් කුෂන් හීල් ෆුට්

(III) උපකොන්ත්‍රාත් අවස්ථා සඳහා පහත සඳහන් රබර් සංයෝග සැලසුම් කර සකස් කරන ලදී
 (i) දුම්රිය දෙපාර්තමේන්තුව සඳහා බොගියර් පෑඩ්
 (ii) දුම්රිය දෙපාර්තමේන්තුව සඳහා රබර් බූට්
 (iii) ශ්‍රී ලංකා නාවික හමුදාව සඳහා බීඩිං
 (iv) දුම්රිය දෙපාර්තමේන්තුව සඳහා වායු කපාට ඩයෆ්‍රම්

## 4.10 සම්භාණ්ඩ නිෂ්පාදන සහ පාවහන් සංවර්ධනය කිරීමේ මධ්‍යස්ථානය

ශ්‍රී ලංකාවේ සම්භාණ්ඩ නිෂ්පාදන සහ පාවහන් කර්මාන්ත අංශය සංවර්ධනය කිරීම සඳහා 1998 වර්ෂයේදී සම්භාණ්ඩ නිෂ්පාදන සහ පාවහන් සංවර්ධන මධ්‍යස්ථානය පිහිටුවන ලදී. මෙම මධ්‍යස්ථානය විසින් කෙටිකාලීන සහ දිගුකාලීන පාඨමාලා පැවැත්වීම, පුහුණු කම්කරුවන් සැපයීම, සුදුසු තාක්ෂණික තොරතුරු සපයාදීම සහ පාවහන් සහ සම්භාණ්ඩ නිෂ්පාදනය සඳහා අවශ්‍ය පහසුකම් සපයාදීම ආදී සේවාවන් සපයනු ලබයි. මෙහි ප්‍රධාන මධ්‍යස්ථානය මොරටුව, කටුබැද්දෙහි පිහිටා ඇති අතර වාරියපොළ සහ විතාරන්දෙනිය යන නගරවල ප්‍රාදේශීය මධ්‍යස්ථාන පිහිටුව ඇත.

මෙ මධ්‍යස්ථානය මගින් සපයාදෙනු ලබන සේවාවන් පහත සඳහන් පරිදි වේ:

- පාවහන් නිෂ්පාදනය පිළිබඳ තාක්ෂණය ලබාදීමේ වැඩමුළු පැවැත්වීම
- සම්භාණ්ඩ නිෂ්පාදනය පිළිබඳ තාක්ෂණය ලබාදීමේ වැඩමුළු පැවැත්වීම
- පාවහන් සැලසුම් කිරීම සහ මෝස්තර සැකසීම
- නව නිෂ්පාදන සහ නිෂ්පාදන සංවර්ධනය පිළිබඳ නවෝත්පාදන අදහස් සහ තොරතුරු සපයාදීම
- වෙළඳ සහ යන්ත්‍රසූත්‍ර තොරතුරු සපයාදීම
- අඩුගාස්තු යටතේ සේවා සහ පහසුකම් සපයාදීම
- කර්මාන්තය සඳහා පුහුණු ශ්‍රමිකයින් සපයාදීම
- පුහුණු සහ නිපුණතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම:
    - සැලසුම් සහ මෝස්තර සකස් කිරීම
    - පාවහන්වල ඉහළ වැස්ම
    - සම් කැපීම
    - කාන්තා පාවහන් නිෂ්පානය
    - පිරිමි පාවහන් නිෂ්පාදනය
    - සම් භාණ්ඩ නිෂ්පාදනය

මධ්‍යස්ථානයෙන් පහත සඳහන් පහසුකම් ලබා ගත හැක:

- සම් කැපීමේ යන්ත්‍ර
- පැලුම් යන්ත්‍ර
- සම් පටිකැපීමේ යන්ත්‍ර
- හැඩ කැපීමේ යන්ත්‍ර
- සම්පීඩනය කිරීමේ සහ දියර විදීමේ කාමරය
- ඔපකිරීමේ සහ නිමාව ගැනීමේ යන්ත්‍ර
- පාවහන්වල අඩිය තද කිරීමේ යන්ත්‍ර
- ප්‍රතික්‍රියක යන්ත්‍ර

වගුව 4.10.1 – සම්භාණ්ඩ නිෂ්පාදන සහ පාවහන් සංවර්ධන මධ්‍යස්ථානයේ කාර්යසාධනය

| ආයතනික අරමුණ | ආයතනික අරමුණ ඉටු කර ගැනීමේ ක්‍රියාකාරකම් | | මිනුම් දර්ශක | කාර්යසාධනය |
|---|---|---|---|---|
| **G1a**<br>කර්මාන්ත දිරිමත් කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම | **9.** | නව ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා සහ නව කර්මාන්ත ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික සහ අදාළ අනෙකුත් සහාය සපයාදීම | | |
| | (i) | නව පාවහන් සහ සම්භාණ්ඩ නිෂ්පාදන ඒකක ස්ථාපිත කිරීම සඳහා සෘජුවම සේවා සපයා දෙන ලදී | ඒකක ගණන | 30 |
| | **10.** | පවතින කර්මාන්ත වැඩිදියුණු කිරීමට / පුළුල් කිරීමට / නවීකරණය කිරීමට අවශ්‍ය තාක්ෂණික සහ ඒ අදාළ සහාය සපයාදීම | | |
| | (i) | පවතින කර්මාන්ත වැඩිදියුණු කිරීමට / පුළුල් කිරීමට / නවීකරණය කිරීමට අවශ්‍ය තාක්ෂණික සහ ඒ අදාළ සහාය සපයා දෙන ලදී. | කර්මාන්ත සංඛ්‍යාව | 17 |
| | (ii) | පාවහන් කර්මාන්තකරුවන් වැඩිදියුණු කිරීම පිණිස නව මෝස්තර සඳහා පිරිසැකසුම් පහසුකම් සලසා දීම | කර්මාන්තකරුවන් සංඛ්‍යාව | 151 |
| | **12.** | තාක්ෂණික පුහුණු වැඩසටහන් පැවැත්වීම සහ තාක්ෂණ දැනුම ලබාදීමේ සහ නිරූපණය කිරීම්, වැඩසටහන් සහ වැඩමුළු පැවැත්වීම | | |
| | (i) | දිවයිනේ විවිධ ප්‍රදේශවල ව්‍යවසායකයින් **442** දෙනෙකු සඳහා පෞද්ගලික අංශයේ රැකියා ලබාගැනීමට හැකිවන පරිදි සහ රජයේ සහ රාජ්‍ය නොවන සංවිධානවල අරමුදල් යටතේ ස්වයංරැකියා ව්‍යාපෘති ආරම්භ කිරීමට හැකි වන පරිදි තාක්ෂණය ලබාදීමේ වැඩසටහන් **22** ක් පවත්වන ලදී. | වැඩසටහන් සංඛ්‍යාව | 22 |
| | | | සහභාගීවූවන් සංඛ්‍යාව | 442 |
| | **13.** | තාක්ෂණික සහාය, උපදෙස් සහ උපදේශන සේවා සපයාදීම | | |
| | (i) | නිෂ්පාදනවල තත්ත්වය උසස් කිරීම පිණිස පාවහන් සහ සම්භාණ්ඩ අංශයේ සුළු පරිමාණ මෙන්ම මහා පරිමාණ කර්මාන්තවලට ද තාක්ෂණික දැනුම, උපදෙස් සහ උපදේශන සේවා සපයන ලදී. | සපයා දෙන ලද සේවා සංඛ්‍යාව | 09 |
| | **14.** | පුහුණුලාභීන්ගේ අවශ්‍යතාවට ගැළපෙන ලෙස සැලසුම් කළ පුහුණු වැඩසටහන් පැවැත්වීම | | |
| | (i) | පාවහන් නිෂ්පාදන අංශයේ සංවර්ධනය උදෙසා පාවහන් සැලසුම් කිරීම සහ මෝස්තර නිර්මාණය පිළිබඳ කර්මාන්තකරුවන්ගේ අවශ්‍යතාවට ගැළපෙන ලෙස සැලසුම් කළ පුහුණු වැඩසටහන් පවත්වන ලදී.. | ව්‍යවසායකයින් සංඛ්‍යාව | 82 |
| | | | වැඩසටහන් සංඛ්‍යාව | 05 |

| සංයුක්ත අරමුණ | සංයුක්ත අරමුණ ඉටු කර ගැනීමේ ක්‍රියාකාරකම් | | මිනුම් දර්ශක | කාර්යසාධනය |
|---|---|---|---|---|
| **G1a**<br>කර්මාන්ත දිරිමත් කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම | (ii) | පාවහන් සැලසුම් කිරීම සහ මෝස්තර නිර්මාණය කිරීම පිළිබඳව පාවහන් කර්මාන්තයේ නියැළී සිටින පුද්ගලයින් සඳහා අංශය පදනමින් ඉල්ලුමට අනුව සකස් කරන ලද වැඩසටහන් පැවැත්වීම. | පුද්ගලයින් සංඛ්‍යාව | 33 |
| | | | වැඩසටහන් සංඛ්‍යාව | 02 |
| | **25.** | උපකොන්ත්‍රාත් සඳහා පහසුකම් සැලසීම (පාවහන්) | | |
| | (i) | සුළු සහ මධ්‍ය පරිමාණ (සම්භාණ්ඩ) නිෂ්පාදකයින්ට සහනදායී මිලගණන් යටතේ උප-කොන්ත්‍රාත් ලබාගැනීමේ පහසුකම් සහ යන්ත්‍රසූත්‍ර සපයාදෙන ලදී. | වැඩ ඇණවුම් සංඛ්‍යාව | 87 |
| **G1b**<br>ව්‍යවසායකත්ව පුහුණුව සහ සංවර්ධනය, සහ උපදේශන සේවා සැපයීම | **1.** | රුචිකත්වයන්, ගැළපෙනබව සහ අවශ්‍යතා විශ්ලේෂණය කිරීම මගින් දැනුවත් කිරීමේ වැඩසටහන් හරහා අනාගත ව්‍යවසායකයින් වීමට හැකියාව සහිත පුද්ගලයින් තෝරාගැනීම. | | |
| | (i) | පාවහන් ක්ෂේත්‍රයේ කර්මාන්තයක් හෝ ව්‍යාපාරයක් ආරම්භ කිරීමට හෝ රැකියාවක නියැළීමට අවශ්‍ය පුද්ගලයින් හඳුනාගැනීම. (පාසල් හැරයන්නන්, උපාධිධාරීන්, වෘත්තීය පුහුණුව ලැබූවන් ආදීන්) | වැඩසටහන් සංඛ්‍යාව | 06 |
| | | | සහභාගාවූවන් සංඛ්‍යාව | 67 |
| **G7**<br>අපගේ කාර්මික නිෂ්පාදන ප්‍රදර්ශනය කිරීම හෝ බෙදාහැරීම සඳහා දේශීය සංවිධාන සහ විදේශීය ආයතන හෝ රජයයන් සමග එක්ව හෝ සහයෝගයෙන් යුතුව කටයුතු කිරීම | **2.** | මෙම කර්මාන්තය සඳහා වන දේශීය වෙළඳ ප්‍රදර්ශනවලට සහභාගීවීම සහ වෙබ් අඩවියේ පළකිරීම | | |
| | (i) | 2014 වර්ෂයේ පැවති අන්තර්ජාතික පාවහන් සහ සම්භාණ්ඩ වෙළඳ ප්‍රදර්ශනයේදී සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ප්‍රදර්ශන මණ්ඩපය, පාවහන් සහ සම්භාණ්ඩ මෝස්තර තරගාවලිය සහ වැඩමුළු සංවිධානය කිරීම | වෙළඳ ප්‍රදර්ශන සංඛ්‍යාව | 01 |
| | | | නිෂ්පාදකයින් සංඛ්‍යාව | 33 |
| **G9**<br>ප්‍රාග්ධන, ණය, අලෙවිකරණ, කළමනාකරණ සහ තාක්ෂණික පහසුකම් සහ නීති උපදෙස් ලබාදීම ද ඇතුළත්ව කාර්මික ව්‍යාපාර සඳහා සියලුම සේවා සහ පහසුකම් සැපයීම | **6.** | පාවහන් සඳහා පිරිසැකසුම් පහසුකම් සැපයීම; සාමාජිකයින්ට ඊ-මේල් මගින් දැනුම් දීමෙන් හා වෙබ්අඩවියේ තොරතුරු පළකිරීම මගින් සේවා ප්‍රවර්ධනය කිරීම | | |
| | (i) | කාර්මික සංවර්ධන මණ්ඩලයේ කටුබැද්ද සම්භාණ්ඩ මධ්‍යස්ථානයේදී සුළු පරිමාණ පාවහන් සහ සම්භාණ්ඩ නිෂ්පාදකයින්ට යන්ත්‍රසූත්‍ර පහසුකම් ලබා දෙන ලදී. | වැඩ සංඛ්‍යාව | 180 |

2014 වර්ෂය සඳහා සැලසුම් කරන ලද කාර්යයන්ගෙන් 50% ට වැඩි ප්‍රමාණයක් සාර්ථකව ඉටුකිරීම මගින් මෙම මධ්‍යස්ථානය සමාලෝචිත වර්ෂයේදී රු. 4,099,661/- ක ආදායමක් උපයා ගැනීමට සමත් විය.

මධ්‍යස්ථානය විසින් ඉටුකරන ලද විශේෂ ක්‍රියාකාරකම්

- සම්භාණ්ඩ නිෂ්පාදන සහ පාවහන් සංවර්ධන මධ්‍යස්ථානය සම සංවිධාකයෙකු ලෙස ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය සමග එක්වී 2014 පෙබරවාරි 7 – 9 යන දිනවල කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවෙහි පවත්වන ලද තුන්වන ජාත්‍යන්තර පාවහන් සහ සම්භාණ්ඩ ප්‍රදර්ශනය 2014 සංවිධානය කරන ලදී.
- මෙම ප්‍රදර්ශනයෙහිදී දේශීය සහ විදේශීය ව්‍යාපාරිකයින් ද ඇතුළත්ව වෙළඳ කුටි 220 ට අධික සංඛ්‍යාවක් ස්ථාපිත කර තිබුණි.

  සම්භාණ්ඩ නිෂ්පාදන සහ පාවහන් සංවර්ධන මධ්‍යස්ථානය විසින් සුළු හා මධ්‍ය පරිමාණ ප්‍රදර්ශන කුටි 33 ක්, පාවහන් හා සම්භාණ්ඩ නිර්මාණ තරග, වැඩමුළු සහ අතින් සාදන සපත්තු නිෂ්පාදනය පිළිබඳ නිරූපණය කිරීම් ඇතුලත් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත වේදිකාව සෘජුවම සංවිධානය කළේය. එයට අමතරව, 1900 වර්ෂයේ සිට 1950 වර්ෂය දක්වා කාලය තුළ මෙරට සම්භාණ්ඩ සහ පාවහන් ක්ෂේත්‍රය ප්‍රවර්ධනය කිරීම සඳහා වැදගත් දායකත්වයක් ලබා දුන් පුද්ගලයින් වෙනුවෙන් තිළිණ ප්‍රදානය කිරීමේ උත්සවයක් ද සංවිධානය කරන ලදී.

- කාර්මික සංවර්ධන මණ්ඩලයේ දිස්ත්‍රික්ක කාර්යාවල අධීක්ෂණය යටතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ මුතියම්මගම, ගාල්ල දිස්ත්‍රික්කයේ අම්පාවිල, අනුරාධපුරය දිස්ත්‍රික්කයේ දේවානම්පියතිස්සපුර, යාපනය දිස්ත්‍රික්කයේ කරවේඩි සහ අන්තිරාන්, නුවර එළිය දිස්ත්‍රික්කයේ වලපනේ, රත්නපුර දිස්ත්‍රික්කයේ පල්ලෙගෙදර සහ ගම්පහ දිස්ත්‍රික්කයේ මීගමුව යන ප්‍රදේශවල පාවහන් සහ සම්භාණ්ඩ නිෂ්පාදන ගම්මාන දිස්ත්‍රික් මට්ටමින් සාර්ථකව ක්‍රියාත්මක වේ.

- මෙම ක්‍ෂේත්‍රය සංවර්ධනය කිරීම සඳහා සහ තරුණ උපාධිධාරීන් මෙම ක්ෂේත්‍රයට ආකර්ෂණය කර ගැනීම පිණිස මොරටුව විශ්වවිද්‍යාලය සහ දෘශ්‍ය හා රංගකලා විශ්වවිද්‍යාලය සමග එක්ව දැනුම්වත් කිරීමේ සහ පුහුණු වැඩසටහන් පැවැත්වීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කරන ලදී.

- කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශය, ආර්ථික සංවර්ධනය පිළිබඳ ජාතික කමිටුව, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (කාර්මික සංවර්ධන මණ්ඩලය), ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය, සහ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සමග එක්ව විවිධ කමිටුවල ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ ක්‍රියාවලියට සහභාගීවීම සහ දායකත්වය ලබා දීම. මෙම උපදේශක කමිටු මගින් ශ්‍රී ලංකාවේ පාවහන් සහ සම්භාණ්ඩ නිෂ්පාදන අංශය සංවර්ධනය කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කරන ලදී.

- අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පවත්වනු ලබන පාසල් සිසුන්ට සපත්තු පරිත්‍යාග කිරීමේ ජාතික වැඩසටහන සඳහා සපත්තු සාම්පල තෝරාගැනීමට අවශ්‍ය කරන තාක්ෂණික දැනුම, උපදෙස් සහ උපදේශකත්වය සපයා දීම.
- ශ්‍රී ලංකාවෙහි සිටින පාවහන් සහ සම්භාණ්ඩ නිෂ්පාදකයින්ගේ සහ පුහුණු ආයතන පිළිබඳ දත්ත සංචිතයක් පවත්වාගෙන යාම. මෙම ක්ෂේත්‍රයෙහි සියලුම අංශ පිළිබඳව තොරතු ඇතුලත් මෙය මෙම ක්ෂේත්‍රයෙහි ඇති විශාලතම දත්ත සංචිතය වේ.
- කාර්මික සංවර්ධන මණ්ඩලය යටතේ පුහුණුව ලැබූවන්ගේ මුල් ආයෝජනයෙහි ඇති අවදානම අඩු කර ගැනීම පිණිස ඔවුන්ට අඩු ගාස්තු පදනමක් යටතේ අවශ්‍ය සේවා සහ පහසුකම් සපයා දීම.
- විවිධ රාජ්‍ය ආයතනවලට අවශ්‍ය පාවහන් සහ සම්භාණ්ඩ ප්‍රසම්පාදන අවශ්‍යතාවලදී එවායෙහි තාක්ෂණ ඇගයීම් කමිටුවලට සහභාගීවීම.

## මූල්‍ය ප්‍රකාශන

- **2014 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය**
- **ශේෂය පත්‍රය සඳහා සටහන්**
- **2014 දෙසැම්බර් 31 දිනට දේපළ, පිරියත සහ ක්ෂයවීම්**
- **සමුක්ෂිත හිගය**
- **2013 – 2014 කාලපරිච්ඡේදය සඳහා ආදායම් සහ වියදම් ප්‍රකාශනය**
- **2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය**
- **කාර්ය මණ්ඩල පිරිවැය**
- **අනෙකුත් මෙහෙයුම් වියදම්**

## ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

### මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

**(සියලුම මිල ගණන් ශ්‍රී ලංකා රුපියල්වලින් දක්වා ඇත)**

| | සටහන් | 2014 | 2013 |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ, යන්ත්‍රසූත්‍ර සහ උපකරණ | 16 | 1,183,148,184 | 243,201,773 |
| ක්‍රියාත්මක කෙරෙමින් පවතින ප්‍රාග්ධන කාර්යයන් | | 62,230,193 | 23,763,937 |
| ස්ථාවර තැන්පතු | | 10,536,959 | 28,125 |
| | | 1,255,915,336 | 266,993,834 |
| **ජංගම වත්කම්** | | | |
| බඩුවට්ටෝරු (තොග සහ ක්‍රියාත්මකවෙමින් ඇති වැඩ) | 17 | 30,859,050 | 37,483,282 |
| වෙළඳ සහ ලැබීමට ඇති අනෙකුත් (ණයගැතියන්) | 18 | 28,245,619 | 25,082,909 |
| අනෙකුත් ජංගම වත්කම් | 20 | 39,106,477 | 40,130,291 |
| පූර්ව ගෙවීම් | 19 | 64,101,314 | 64,537,904 |
| විශේෂ ව්‍යාපෘති | 12 | 26,072,964 | 9,925,434 |
| මුදල් සහ මුදල් හා සමාන දෑ | 22 | 46,786,787 | 33,464,340 |
| | | 235,172,211 | 210,624,159 |
| **මුළු වත්කම්** | | 1,491,087,547 | 477,617,994 |
| **කොටස් සහ වගකීම්** | | | |
| **ප්‍රාග්ධන සහ සංචිත** | | | |
| රජයේ ශුද්ධ දායකත්වය | 9 | 278,694,719 | 274,328,482 |
| ප්‍රාග්ධන සංචිත | | 6,243,013 | 6,243,013 |
| පවරාදෙන ලද වත්කම්වල වටිනාකම | 10 | 13,447,061 | 13,447,061 |
| ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගනණය කිරීම මත අතිරික්තය | | 953,015,969 | 14,820,829 |
| රජයේ වෙනත් ප්‍රදාන | 11 | 125,933,744 | 76,047,332 |
| | | - | - |
| | | 1,377,334,506 | 384,886,716 |
| රජයේ ප්‍රදාන | 13 | 1,930,291,117 | 1,930,291,117 |
| සමුච්චිත අලාභ | | (2,136,683,921) | (2,146,388,663) |
| | | (206,392,804) | (216,097,546) |
| **මුළු හිමිකම්** | | 1,170,941,702 | 168,789,170 |
| **ජංගම නොවන වගකීම්** | | | |
| පාරිතෝෂික සඳහා වෙන්කිරීම් | 23 | 100,395,508 | 115,063,783 |
| **ජංගම වගකීම්** | | | |
| රජයට ගෙවිය යුතු හිග | 14 | 69,679 | 66,604 |
| සංස්ථාවට ගෙවිය යුතු හිග | 15 | 3,656,897 | 3,752,890 |
| බැංකු ණය ශේෂ | 21 | 1,784,411 | 3,571,507 |
| විශේෂ ව්‍යාපෘති සඳහා ප්‍රදාන | 12 | 58,754,659 | 44,237,239 |
| ප්‍රතිපාදන සහ උපචිත වියදම් | 16 | 155,484,691 | 142,136,801 |
| | | 219,750,337 | 193,765,041 |
| **මුළු කොටස් සහ වගකීම්** | | 1,491,087,547 | 477,617,994 |

**සකස්කළේ :- ඩී.ජේ.එම්. කුසුමාවතී, වැඩබලන අධ්‍යක්ෂ - මුදල්**

**"පිටු අංක 05 සිට 12 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ පිටු අංක 13 සිට 24 දක්වා ඇති සටහන් මෙම ප්‍රකාශන සම්පූර්ණවීම සඳහා අවශ්‍ය කොටසක් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ සහ ඉදිරිපත්කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වන්නේය. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙම මූල්‍ය ප්‍රකාශන අනුමත කරන ලද අතර අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කරන ලද්දේ:"**

**මහින්ද ජිනසේන**
**සභාපති**

**එන්. සික්කන්දර්**
**අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික**

## ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

### විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

**(සියලුම මුදල් ගණන් ශ්‍රී ලංකා රුපියල්වලින් සඳහන් කර ඇත)**

| | සටහන් | 2014 | 2013 |
|---|---|---|---|
| අලෙවි සහ සේවා | 6 a | **188,539,103** | **167,506,534** |
| අලෙවි සහ සේවා පිරිවැය | 8 a | (103,502,334) | (82,574,878) |
| **දළ ලාභය** | | 85,036,769 | 84,931,655 |
| වෙනත් ආදායම් | 6 b | **62,283,657.91** | **37,453,072** |
| රජයේ පුනරාවර්තන ප්‍රදාන | 7 | **250,000,000.00** | **231,000,000** |
| පරිපාලන වියදම් | 8 b | **(396,572,923.24)** | **(437,708,275)** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වල ප්‍රතිඵල** | | 747,504 | (84,323,547) |
| මූල්‍ය පිරිවැය | 8 c | **(328,191.99)** | **(405,180)** |
| ශුද්ධ මූල්‍ය ආදායම / (පිරිවැය) | | (328,192) | (405,180) |
| බදු ගෙවීමට පෙර ලාභය | | 419,312 | (84,728,727) |
| **වර්ෂය සඳහා ලාභය / පාඩුව** | | **419,312** | **(84,728,727)** |
| **වෙනත් විස්තීර්ණ ආදායම්** | 8d | **961,019,480** | **(10,320,017)** |
| **වර්ෂය සඳහා මුළු විස්තීර්ණ පාඩුව / ආදායම** | | 961,438,792 | (95,048,744) |

# ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

## ස්කන්ධ වෙනස්වීම් ප්‍රකාශනය

**(සියලුම මුදල් ගණන් ශ්‍රී ලංකා රුපියල්වලින් සඳහන් කර ඇත)**

| | ශුද්ධ රජයේ දායක මුදල | ප්‍රාග්ධන සහ සංචිත | පවරාදෙන ලද වත්කම් වටිනාකම | ප්‍රත්‍යාගණන අතිරික්තය | වෙනත් රජයේ ප්‍රදාන | රජයේ ප්‍රදාන | සමුච්චිත අතිරික්තය / හිගය | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| **2013** ජනවාරි **01** දිනට ශේෂය | 273,382,457 | 6,243,013 | 13,447,061 | 14,820,830 | 64,971,123 | 1,930,291,117 | (2,012,883,988) | 290,271,613 |
| පෙර වර්ෂයේ ගැළපීම් | - | - | - | - | - | - | (38,455,931) | (38,455,931) |
| වර්ෂය සඳහා අලාභය | - | - | - | - | - | - | (95,048,744) | (95,048,744) |
| රජයේ ප්‍රදාන එකතුකිරීම | 25,000,000 | - | - | - | 14,007,310 | - | - | 39,007,310 |
| | | | | | | | | - |
| ප්‍රදාන ක්‍රමක්ෂය | (24,053,976) | - | - | - | (2,931,104) | - | - | (26,985,080) |
| **2013 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **274,328,481** | **6,243,013** | **13,447,061** | **14,820,830** | **76,047,329** | **1,930,291,117** | **(2,146,388,663)** | **168,789,168** |
| **2014** ජනවාරි **01** දිනට ශේෂය | 274,328,481 | 6,243,013 | 13,447,061 | 14,820,830 | 76,047,329 | 1,930,291,117 | (2,146,388,663) | 168,789,168 |
| | | | | | | | | - |
| | | | | | | | | - |
| පෙර වර්ෂයේ ගැළපීම් | - | - | - | - | - | - | (9,826,031) | (9,826,031) |
| | | | | | | | | - |
| | | | | | | | | - |
| වර්ෂය සඳහා අලාභය | - | - | - | - | - | - | 419,312 | 419,312 |
| ප්‍රත්‍යාගණන අතිරික්තය | - | - | - | 941,908,020 | - | - | - | 941,908,020 |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් | - | - | - | - | - | - | 19,111,460 | 19,111,460 |
| රජයේ ප්‍රදාන | 35,000,000 | - | - | - | 54,048,778 | - | - | 89,048,778 |
| | | | | | | | | - |
| ප්‍රතිලාභ ක්‍රමක්ෂය | (30,633,762) | - | - | - | (4,162,367) | - | - | (34,796,129) |
| | | | | | | | | - |
| ප්‍රත්‍යාගණන අතිරික්තය | | | | (3,712,881) | | | | (3,712,881) |
| **2014 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **278,694,719** | **6,243,013** | **13,447,061** | **953,015,969** | **125,933,740** | **1,930,291,117** | **(2,136,683,923)** | **1,170,941,697** |

## ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

### මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

**(සියලුම මුදල් ගණන් ශ්‍රී ලංකා රුපියල්වලින් සඳහන් කර ඇත)**

| | 2014 | 2013 |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත මුදල් ගලනයන්** | | |
| මෙහෙයුම් ක්‍රියාකාරම්වල (යෙදවූ)/ ඒ තුළින් ජනිතවූ මුදල් | (1,698,999) | 30,227,381 |
| ගෙවන ලද මූල්‍ය පිරිවැය | (328,192) | (405,180) |
| ගෙවන ලද විශ්‍රාම ප්‍රතිලාභ බැදීම් | (9,134,472) | (14,793,910) |
| මෙහෙයුම් ක්‍රියාකාරම්වල (යෙදවූ)/ ඒ තුළින් ජනිතවූ ශුද්ධ මුදල් | **(11,161,663)** | **15,028,291** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් සිදුවූ මුදල් ගලනයන්** | | |
| රජයෙන් ලැබුණු ප්‍රදාන | 35,000,000 | 25,000,000 |
| **ආයෝජන ක්‍රියාකාරකම් තුළින් ජනිතවූ මුදල් ගලනය** | | |
| වෙනත් රජයේ ප්‍රදාන | 54,048,778 | 14,007,310 |
| දේපළ, පිරියත සහ උපකරණ මිලදී ගැනීම | (50,484,328) | (67,151,318) |
| ස්ථාවර තැන්පත් වැඩිවීම | (10,508,834) | (3,125) |
| | | - |
| **ආයෝජන ක්‍රියාකාරම්වල (යෙදවූ) / ඒ තුළින් ජනිතවූ ශුද්ධ මුදල්** | **28,055,617** | **(28,147,132)** |
| **මුදල් සහ මුදල් හා සමාන දෙයෙහි ශුද්ධ (අඩුවීම) / වැඩිවීම** | **16,893,954** | **(13,118,841)** |
| වර්ෂය ආර්ම්භයේදී මුදල් සහ මුදල් හා සමාන දෑ | 29,892,833 | 43,011,674 |
| **වර්ෂය අවසානයේදී මුදල් සහ මුදල් හා සමාන දෑ** | **46,786,786** | **29,892,833** |

# ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

## වැදගත්වන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

## 1 සාමාන්‍ය තොරතුරු

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය 1969 අංක 36 දරණ ලංකා කාර්මික සංවර්ධන පනත යටතේ සංස්ථාගත කරන ලද ව්‍යවස්ථාපිත මණ්ඩලයකි. මෙම මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය අංක 615, ගාලු පාර, කටුබැද්ද යන ලිපිනයෙහි පිහිටා ඇත.

ශ්‍රී ලංකාවේ ඇති කර්මාන්ත දිරිමත් කිරීමට, ප්‍රවර්ධනය කිරීමට සහ සංවර්ධනය කිරීමට සහායවීම කර්මාන්ත සංවර්ධන මණ්ඩලයේ ප්‍රමුඛතම කාර්යය වේ

## 2 වැදගත්වන ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරින්ගේ ආයතනය විසින් නිකුත් කර ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කෙරන ප්‍රථම මූල්‍ය ප්‍රකාශන කට්ටලය මෙය වේ. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අදාළ කරගෙන ඇති ප්‍රධානතම ගිණුම්කරණ ප්‍රතිපත්තීන් පහත දක්වා ඇත. අන්‍යාකාරයෙන් සඳහන්කර නැත්තේනම් මිස මෙම ගිණුම්කරණ ප්‍රතිපත්තීන් ඉදිරිපත් කර ඇති සියලුම වර්ෂවලට අදාළ වන පරිදි යොදාගෙන ඇත.

### 2.1 සකස්කිරීමේ පදනම සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් අනුගමනය කිරීම

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුත් කර ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති - 2011 (SLFRS) / (LKAS) අනුගමනය කරමින් එහි මූල්‍ය ප්‍රකාශන සකස් කරයි. ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිති මණ්ඩලය විසින් නිකුත් කරන ලද ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් (IFRS) අන්තර්ගත කිරීම පිණිස ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති සංශෝධනය කරන ලද අතර ඒ අනුව 2012 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භ වන වර්ෂය සහ ඉන් පසු එළඹෙන වර්ෂ සඳහා සියලුම ආයතන විසින් මෙම ප්‍රමිති යොදා ගත යුතු වේ.

යම් යම් සංක්‍රාන්ති නිදහස්කිරීම් සහ 5 වැනි සටහනෙහි අනාවරණය කර ඇති නිදහස්කිරීම්වලට යටත්ව, කාර්මික සංවර්ධන මණ්ඩලය මෙම ගිණුම්කරණ ප්‍රතිපත්ති 2011 ජනවාරි මස 1 වැනි දිනට සහ ඉදිරිපත් කර ඇති සියලුම කාලපරිච්ඡේද පුරා මූල්‍ය තත්ත්වයෙහි ආරම්භක ප්‍රකාශනය සකස්කිරීමෙහිදී සියලුම කාලවලට අදාළ වන පරිදි මෙම ප්‍රතිපත්ති සැමවිටම බලපැවැත්වෙමින් තිබුණා සේ යොදා ගෙන ඇත. පෙර පැවති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රතිපත්ති (SLAS) යටතේ කාර්මික සංවර්ධන මණ්ඩලයේ 2012 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන්වූ වර්ෂය සඳහා සකස් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලදී යොදාගන්නා ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් වැදගත් වෙනස්කම් සිදුවූ ගිණුම්කරණ ප්‍රතිපත්තිවල ස්වභාවය සහ බලපෑම ද ඇතුළත්ව ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ක්‍රමවේදයට මාරුවීමෙන් කාර්මික සංවර්ධන මණ්ඩලයේ වාර්තා කර ඇති මූල්‍ය තත්වයට සහ මූල්‍ය කාර්යසාධනයට ඇතිවී ඇති බලපෑම සටහන 5 මගින් පෙන්වා ඇත.

මූල්‍ය වත්කම් සහ වගකීම් පිළි ඇගයීම සහ සාධාරණ ඇගයීම මගින් වෙනස් කර ඇති පරිදි ඓතිහාසික පිරිවැය සම්ප්‍රදාය යටතේ මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත. ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා ඉතා වැදගත් ගිණුම්කරණ නිමාන භාවිතා කිරීම අවශ්‍ය කරයි. කාර්මික සංවර්ධන මණ්ඩලයේ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් අදාළ කර ගැනීමේ ක්‍රියාවලියේදී කළමනාකරණය විසින් සිය විනිශ්චය යොදා ගැනීම ද අවශ්‍ය වේ. ඉහළ මට්ටමේ විනිශ්චයක් හෝ සංකීර්ණබවක් ඇතුළත්වන ක්ෂේත්‍ර, නැතහොත් උපකල්පන සහ ඇස්තමේන්තු කාර්මික සංවර්ධන මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවලට වැදගත් වන ක්ෂේත්‍ර 4 වැනි සටහනෙහි පෙන්වා ඇත.

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට මාරුවීම කාර්මික සංවර්ධන මණ්ඩලයේ වාර්තා කර ඇති මූල්‍ය තත්ත්වයට සහ මූල්‍ය කාර්යසාධනයට බලපා ඇත්තේ කෙසේද යන්න පිළිබඳ පැහැදිලි කිරීමක් 5.4 වැනි සටහනෙහි දක්වා ඇත.

### 2.2 ගිණුම්කරණ ප්‍රතිපත්තියෙහි වෙනස්කම් සහ අනාවරණ

*කුත් කර ඇති නමුත් 2012 ජනවාරි 01 වැනි දිනෙන් ආරම්භ වන මූල්‍ය වර්ෂය සඳහා බලාත්මක නොවන සහ කලින් යොදා නොගත් නව ප්‍රමිති, සංශෝධන සහ අර්ථ නිරූපණ.*

ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. (SLFRS) - 13 , ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. පුරා යොදා ගැනීම පිණිස සාධාරණ වටිනාකම යන්නෙහි තනි නිශ්චිත නිර්වචනයක් සහ සාධාරණ වටිනාකම් මිනුම් සහ හෙළිදරව්කිරීම් අවශ්‍යකතා වල එක් තනි මූලාශ්‍රයක් සපයාදීම මගින් අනුරූපත්වය වැඩිදියුණු කර සංකීර්ණත්වය අඩු කිරීම ‘සාධාරණ වටිනාකම් මිනුම’ මගින් අරමුණ කෙරේ. මෙම ප්‍රමිතියෙහි පූර්ණ බලපෑම කළමනාකරණය විසින් තක්සේරු කළ යුතුව තිබේ.

ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. 9, ‘මූල්‍ය සාධන පත්‍ර’ විසින් මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් වර්ගීකරණය කිරීම, ඇගයීම සහ  හඳුනාගැනීම් නිරාකරණය කරයි. ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. අංක 9 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 39 යටතේ මූල්‍ය සාධන පත්‍ර වර්ගීකරණය කිරීම සහ ඇගයීමට අදාළ කොටස් ප්‍රතිස්ථාපනය කරයි. ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. අංක 9 අනුව මූල්‍ය වත්කම් ඇගයීම් කාණ්ඩ දෙකකට වර්ග කළ යුතු වේ. එම කාණ්ඩ දෙක සාධාරණ වටිනාකමට ඇගයීම කරනු ලබන කාණ්ඩය සහ ක්‍රමක්ෂය කළ පිරිවැයට ඇගයීම් කරනු ලබන කාණ්ඩය වශයෙන් වේ. නිර්ණය කිරීම මුල්වරට හඳුනාගැනීමේදී සිදු කරනු ලැබේ. එම වර්ගීකරණය ආයතනයේ මූල්‍ය සාධන පත්‍ර කළමනාකරණය කිරීම සඳහා ආයතනයේ ඇති ව්‍යාපාර අනුරූපය සහ සාධන පත්‍රයේ ඇති ගිවිසුම්කර මුදල් ප්‍රවාහ ලක්ෂණ මත රඳා පවතී. මූල්‍ය වගකීම් සඳහා මෙම ප්‍රමිතිය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS) 39 හි ඇති අවශ්‍යතාවලින් බොහොමයක් එලෙසම තබාගෙන ඇත. ප්‍රධාන වෙනස්කම වන්නේ  මූල්‍ය වගකීම් සඳහා සාධාරණ වටිනාකම විකල්පය වශයෙන් ගෙන ඇති අවස්ථාවලදී, ගිණුම්කරණ නොගැළපීමක් ඇතිවීමට හේතු නොවන්නේ නම් මිස, ආයතනයක සිය ණය අවදානම ආදායම් ප්‍රකාශනයෙහි වාර්තා කරනවාට වඩා වෙනත් විස්තීර්ණ ආදායමක වාර්තාකිරීම හේතුවෙන් සාධරණ වටිනාකමක කොටස වෙනස් වීමයි. ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය ලං.මූ.වා.ප්‍ර. අංක 9 හි පූර්ණ බලපෑම තවමත් තක්සේරු කර නොමැති අතර 2015 ජනවාරි මස 1 දින හෝ ඉන් පසුව ආරම්භ වන ගිණුම්කරණ කාලපරිච්ඡේදයට පෙර ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. අංක 9 අනුගත කර ගැනීමට අපේක්ෂා කරයි.

කාර්මික සංවර්ධන මණ්ඩලය වෙත මූර්ත බලපෑමක් ඇති කරනු ඇතැයි අපේක්ෂා කරනු ලැබිය හැකි, තවමත් ක්‍රියාත්මකව නොමැති වෙනත් ප්‍රමිතීන්, සංශෝධන සහ අර්ථ නිරූපණ නොමැත.

### 2.3 දේපළ, පිරියත සහ උපකරණ

සියලුම දේපළ, පිරියත සහ උපකරණ මුල් අවස්ථාවේදී පිරිවැයට වාර්තා කර ඓතිහාසික පිරිවැයෙන් ක්ෂයවීම් අඩුකර සඳහන් කරනු ලැබේ. අදාළ අයිතම අත්පත් කර ගැනීම සඳහා සෘජුවම දරණ ලද පිරිවැය ඓතිහාසික පිරිවැයට ඇතුළත් වන අතර, අයිතමය අත්පත් කර ගන්නා අවස්ථාවේ හෝ කිසියම් කාලපරිච්ඡේදයක් ඇතුළත තොග උපදවීම හැර වෙනත් කාර්යයන් සඳහා එම කාලපරිච්ඡේදය තුළ එම අයිතමය භාවිතා කර තිබීමේ ප්‍රතිඵලයක් ලෙස ආයතනයක් දරනු ලබන බැඳීම වන එම අයිතම ගලවා ඉවත්කර එම අයිතමය තිබූ ස්ථානය යළි යථා තත්ත්වයට පත් කිරීම සඳහා මූලිකව ඇස්තමේන්තු කරන පිරිවැය ද ඓතිහාසික පිරියවැයට ඇතුළත්වේ.

වත්කමක් නැවත අගය කරන විට, ධාරණ වටිනාකමෙහි යම් වෙනස්වීමක් සිදුවුව හොත්, එය පූර්වයෙන් වියදමක් ලෙස හඳුනාගන්නා ලද එම වත්කමටම අදාළ පූර්ව ප්‍රත්‍යාගණන අඩුවීමකට ප්‍රතිවර්ත නොවන්නේ නම්, එය සෘජුවම ප්‍රත්‍යාගණන අතිරික්තයට බැරකරනු ලැබේ. මෙවැනි අවස්ථාවලදී, වැඩිවීම පූර්වයෙන් ලියා ගෙන ඇති ප්‍රමාණයට ආදායමක් ලෙස හඳුනාගෙන තිබේ. ප්‍රත්‍යාගණනයෙහි ප්‍රතිඵලයක් ලෙස වත්කමක ධාරණ වටිනාකම අඩුවූ විට, එම අඩුවීම එම වත්කමට අදාළ පූර්ව වැඩිවීමක් ප්‍රතිවර්තන නොකරන්නේ නම් වියදමක් ලෙස හඳුනාගනු ලබන අතර එවැනි අවස්ථාවකදී එම අඩුවීම එම වත්කමට අදාළව ප්‍රත්‍යාගණන අතිරික්තයෙහි දරනු ලබන මුදල ඉක්මවා නොයන මට්ටමට අදාළ ප්‍රත්‍යාගණන අතිරික්තයක් තිබේ නම් එයින් එය අය කරනු ලැබේ. වත්කමකට අදාළව ප්‍රත්‍යාගණන අතිරික්තයෙහි කිසියම් ශේෂයක් ඉතිරිවී තිබේ නම්, එය එම වත්කම ඉවත් කිරීමෙහිදී හෝ බැහැර කිරීමෙහිදී සෘජුවම සමුච්චිත ලාභයට / (අලාභයට) මාරු කරනු ලැබේ.

අයිතමය හා සම්බන්ධ අනාගත ආර්ථික ප්‍රතිලාභ කාර්මික සංවර්ධන මණ්ඩලය වෙත ප්‍රවාහය වීම සිදුවිය හැකි නම් සහ අයිතමයේ පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකි නම් පමණක්, ඉන්පසුව දරනු ලබන පිරිවැය යෝග්‍ය පරිදි වත්කම් ධාරණ වටිනාකමට ඇතුළත් කිරීම හෝ වෙනමම වත්කමක් ලෙස හඳුනාගැනීම සිදු කරනු ලැබේ. ප්‍රතිස්ථාපනය කරන ලද කොටසෙහි ධාරණ වටිනාකම ඉවත් කරනු ලැබේ. සියලුම අළුත්වැඩියා සහ නඩත්තු වියදම්, එම වියදම් දරන ලද මූල්‍ය කාලපරිච්ඡේදය ඇතුළත ආදායම් ප්‍රකාශනයට ඇතුළත් කරනු ලැබේ..

*(ආ). ක්ෂයවීම්*

දේපළ, පිරියත හෝ උපකරණ අයිතමයක් භාවිතා කිරීම සඳහා සූදානම්ව තිබීම අරම්භවූ දිනයේ සිටම ක්ෂවීම් අඩුකිරීම ආරම්භ වන අතර එම අයිතමය ඉවත් කරන තුරු, එම කාල පරිච්ඡේදය තුළ එම උපකරණය ප්‍රයෝජනයට නොගෙන තිබුණ ද, අඛණ්ඩව ක්ෂවීම් අඩු කරනු ලැබේ. ක්ෂයවීම සරල රේඛීය පදනමකින් දේපළ, පරියත හෝ උපකරණ අයිතමයේ ඇස්තමේන්තු කර ඇති ප්‍රයෝජනවත් ආයු කාලය පුරා ආදායම් ප්‍රකාශනයට අය කරනු ලැබේ. ඉඩම් ක්ෂය කිරීම සිදු නොකෙරේ. ඇස්තුමේන්තු කළ ප්‍රයෝජනවත් ජීවිත කාලයන් පහත සඳහන් පරිදි වේ:

| | | |
|---|---|---|
| 1 | ඉඩම් වැඩිදියුණු කිරීම | 2.5% |
| 2 | ගොඩනැගිලි | 2.5% |
| 3 | පිරියත සහ යන්ත්‍රසූත්‍ර | 10.0% |
| 4 | මුද්‍රණ යන්ත්‍ර | 10.0% |
| 5 | කාර්යාලයීය උපකරණ | 10.0% |
| 6 | විද්‍යාගාර උපකරණ | 10.0% |
| 7 | මෙවලම් | 25.0% |
| 8 | පොත් | 25.0% |
| 9 | ගමන් මලු | 25.0% |
| 10 | පරිගණක මෘදුකාංග | 7.0% |
| 11 | පරිගණක මෘදුකාංග | 20.0% |
| 12 | මෝටර් වාහන | 20.0% |
| 13 | ලිබඩු සහ සවිකිරීම් | 10.0% |
| 14 | පාපැදි | 10.0% |
| 15 | විවිධ වත්කම් | 10.0% |
| 16 | උපයෝජ්‍ය සේවා | 10.0% |
| 17 | PABX සේවා | 10.0% |
| 18 | වෙනත් වත්කම් | 10.0% |
| 19 | වෙනත් වත්කම් | 10.0% |

වත්කම්වල අවශේෂ වටිනාකම් සහ ප්‍රයෝජනවත් ජීවිත කාලයන් සෑම ශේෂපත්‍ර දිනයකදීම සමාලෝචනය කර යෝග්‍ය වන්නේ නම් ගැලපීම් සිදු කරනු ලැබේ.

වත්කමෙහි ධාරණ වටිනාකම එහි ඇස්තමේන්තු කළ නැවත අයකර ගත හැකි වටිනාකමට වඩා වැඩි නම් වහාම එම වත්කමෙහි ධාරණ වටිනාකම එහි නැවත අයකර ගත හැකි වටිනාකමට ලියා තබනු ලැබේ.

බැහැරකිරීමේදී සිදුවන ලාභය / පාඩුව බැහැරකිරීමෙන් ලබන මුදල ධාරණ වටිනාකම හා සංසන්දනය කිරීමෙන් තීරණය කරනු ලැබේ. මේවා ආදායම් ප්‍රකාශනයෙහි ඇතුළත් කර තිබේ.

### 2.4 මූල්‍ය වත්කම්

#### 2.4.1 වර්ගීකරණය

කාර්මික සංවර්ධන මණ්ඩලය මූල්‍ය වත්කම් අත්පත් කරගත් කාරණය පදනම් කරගෙන එහි මූල්‍ය වත්කම් ණය සහ ලැබිය යුතු මුදල් වශයෙන් වර්ග කර ඇත.

*ණය සහ ලැබිය යුතු මුදල්*

ණය සහ අයවිය යුතු මුදල් සක්‍රීය වෙළඳපොළක මිලගණන් ප්‍රකාශ නොකළ ස්ථාවර හෝ නිශ්චය කළ හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ. ඒවා ශේෂපත්‍ර දිනෙන් පසු මාස 12කට වැඩි කල්පිරීම් හැරෙන්නට වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ වශයෙන් ජංගම වත්කම්වල ඇතුළත් කර ඇත.

### 2.4.2 මූල්‍ය වත්කම් හඳුනාගැනීම

ණය සහ ලැබිය යුතු මුදල් ආරම්භක අවස්ථාවේදී සාධාරණ වටිනාකමට ගනුදෙනු පිරිවැය එකතු කළ අගයට හඳුනාගනු ලබන අතර ඉන් පසුව සඵල පොළී ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්ෂය කළ පිරිවැයට ගෙන යනු ලැබේ.

### 2.4.3 මූල්‍ය උපකරණ හිලව්කිරීම

හඳුනාගත් වටිනකම් හිලව්කිරීම සඳහා නීත්‍යානුකූලව බලාත්මක කළ හැකි අයිතියක් ඇති විට සහ ශුද්ධ පදනමක් මත පියවීමට හෝ එකවිට වත්කම උපලබ්ධි කර වගකීම පියවීමේ චේතනාවක් ඇති විට මූල්‍ය වත්කම් සහ වගකීම් හිලව්කර ශුද්ධ වටිනාකම ශේෂපත්‍රයේ වාර්තා කරනු ලැබේ.

### 2.4.4 මූල්‍ය වත්කම් හානිකරණය

*(අ) ක්‍රමක්ෂය කළ පිරිවැයට ගෙන යනු ලබන වත්කම් (ණය සහ ලැබිය යුතු මුදල්)*

සෑම වාර්තාකිරීමේ කාලපරිච්ඡේදයක් අවසානයේදීම කාර්මික සංවර්ධන මණ්ඩලය එහි මූල්‍ය වත්කමකට හෝ මූල්‍ය වත්කම්වලට හානි සිදුවී ඇති බවට වෛෂයික සාක්ෂි තිබේද යන්න තක්සේරු කරයි. කාර්මික සංවර්ධන මණ්ඩලයේ මූල්‍ය වත්කමක් හෝ වත්කම් මූලික වශයෙන් හඳුනාගැනීමෙන් අනතුරුව සිදුවූ සිද්ධීන් (අලාභ සිද්ධි) එකක හෝ වැඩිගණනක ප්‍රතිඵලයක් ලෙස එම වත්කම් හානිකරණය වී ඇති බවට වෛෂයික සාක්ෂි ඇත්නම් පමණක් සහ එම අලාභ සිද්ධිය (සිද්ධීන්) විශ්වාසනීය ලෙස ඇස්තමේන්තු කළ හැකි පරිදි කාර්මික සංවර්ධන මණ්ඩලයේ ඇස්තමේන්තු කළ අනාගත මුදල් ගලනයන්ට බලපෑමක් ඇති කරන්නේ නම් කාර්මික සංවර්ධන මණ්ඩලයේ මූල්‍ය වත්කමක් හෝ වත්කම් හානිවී ඇති බවට සළකණු ලබන අතර මණ්ඩලය හානිකරණ පාඩු දරණු ලැබේ.

හානිකරණයට අදාළ වෛෂයික සාක්ෂි පවතින්නේද යන්න කාර්මික සංවර්ධන මණ්ඩලය මූලින්ම තක්සේරු කරයි.

ණය සහ ලැබිය යුතු මුදල් සඳහා අලාභයෙහි වටිනාකම වත්කමෙහි ධාරණ වටිනාකමෙහි සහ වත්කමෙහි මුල් සපළ පොළී අනුපාතයට වට්ටම් කරන ලද ඇස්තමේන්තු කළ අනාගත මුදල් ගලනයන්හි (දැනට අලාභය දරා නොමැති අනාගත ණය අලාභ හැර) වර්තමාන වටිනාකම අතර වෙනස ලෙස මනිනු ලැබේ. වත්කමෙහි ධාරණ අගය අඩුකරනු ලබන අතර අලාභයෙහි වටිනාකම විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ.

පසුව එළඹෙන කාලපරිච්ඡේදයකදී හානිකරණ අලාභයෙහි වටිනාකම අඩුවන්නේ නම් සහ එම අඩුවීම වෛෂයිකව හානිකරණය හඳුනාගැනීමෙන් පසුව සිදුවූ සිදුවීමකට (ණයගැතියාගේ ණය ශ්‍රේණිගත කිරීමෙහි වර්ධනයක් වැනි) අදාළව විය හැකි නම්, පූර්වයෙන් හඳුනාගන්නා ලද හානිකරණ අලාභය ප්‍රතිවර්ත කිරීම විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ.

වෙළඳ ලැබිය යුතු දෑ හානිකරණ පරීක්ෂාකිරීම 2.10 සටහනෙහි විස්තර කර ඇත.

## 2.5 මූල්‍ය වගකීම්

කාර්මික සංවර්ධන මණ්ඩලයේ මූල්‍ය වගකීම්වලට වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ සහ ණයට ගැනීම් ඇතුළත් වේ. අනෙකුත් සියලුම මූල්‍ය වගකීම් ආරම්භක අවස්ථාවේදී ඒවායේ සාධාරණ වටිනාකමට හඳුනාගනු ලබන අතර ඉන් පසුව, වට්ටම් කිරීමෙහි ප්‍රතිඵලය නොසැළකිය හැකි මට්ටමේ නොමැති නම්, සඵල පොළී ක්‍රමය යොදාගනිමින් ක්‍රමක්ෂය කළ පිරිවැයට ඒවා මනිනු ලැබන අතර ඒවිට ඒවා පිරිවැයට සඳහන් කරනු ලැබේ.

## 2.6 තොග

තොග වටිනාකම පිරිවැයෙහි පහළ අගයට සහ ශුද්ධ උපලබ්ධි අගයට තක්සේරු කරනු ලැබේ. පෙර පිවිසි පෙර නිකුතු ක්‍රමය යොදාගනිමින් පිරිවැය තීරණය කරනු ලැබේ. ශුද්ධ උපලබ්ධි අගය යනු සාමාන්‍ය ව්‍යාපාර පරිපාටියෙහිදී තොග විකිණිය හැකි මිලෙන් නිම කිරීමේ ඇසත්මේන්තු කළ පිරිවැය සහ විකිණීම සිදු කිරීම සඳහා අවශ්‍යකරන පිරිවැය අඩුකළ විට ලැබෙන මිලයි.  තොග ඒවායේ වර්තමාන පිහිටීමට සහ තත්ත්වයට ගෙන ඒමට දරන ලද පිරිවැය පහත සඳහන් පරිදි ගණන් ගනු ලැබේ:

අමුද්‍රව්‍ය -  පෙර පිවිසි පෙර නිකුතු පදනමින් සත්‍ය පිරිවැයට
නිමි භාණ්ඩ - පිරිවැයට
කෙරෙමින් පවතින වැඩ - සෘජු ද්‍රව්‍ය සහ සෘජු ශ්‍රම පිරිවැයට සහ සාමාන්‍ය මෙහෙයුම් ධාරිතාව පදනම් කර ගෙන නිෂ්පාදන පොදුකාර්යවලින් යෝග්‍ය කොටසක්

## 2.7 වෙළඳ ලැබිය යුතු දෑ

වෙළඳ ලැබිය යුතු දෑ යනු සාමාන්‍ය ව්‍යාපාර පරිපාටියේදී විකුණන ලද භාණ්ඩ සඳහා හෝ ඉටුකරන ලද සේවා සඳහ ා ගනුදෙනුකරුවන්ගෙන් අයවීමට ඇති මුදල් වේ. එක් වර්ෂයක් හෝ එයට අඩු කාලයක් තුළ අයකර ගැනීමට අපේක්ෂා කරන්නේ නම් (හෝ ව්‍යාපාරයේ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රයේදී එයටත් වැඩි කාලයක් නම්), එම මුදල් ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. නො එසේ නම්, ඒවා ජංගම නොවන වත්කම් ලෙස ඉදිරිපත් කරනු ලැබේ.

## මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

### 2.7 වෙළඳ ලැබිය යුතු දෑ (ඉතිරි)

කාර්මික සංවර්ධන මණ්ඩලයට ලැබිය යුතු දේ ට අදාළ මුල් කොන්දේසි අනුව අයවීමට ඇති සියලුම වටිනාකම් අයකර ගැනීමට නොහැකිවනු ඇතැයි වෛෂයික සාක්ෂි ඇති විට, වෙළඳ ලැබිය යුතු දෑ හානිකරණ ප්‍රතිපාදනයක් පිහිටුවනු ලැබේ. ණයගැතියාගේ සැළකිය යුතු මූල්‍ය දුෂ්කරතා, ණයගැතියා බංකොලොත්භාවයට හෝ මූල්‍ය ප්‍රතිසංවිධානයට පත්වීමට ඉඩ තිබීම, ගෙවීම් පැහැරහැරීම හෝ කඩකිරීම ආදිය වෙළඳ ලැබිය යුතු දෑ හානිකරණය වී ඇති බව පෙන්නුම් කරන සාධක වේ. ප්‍රතිපාදනයෙහි වටිනාකම වත්කමෙහි ධාරණ වටිනාකම සහ මුල් සඵල පොළී අනුපාතයට වට්ටම් කළ ඇස්තමේන්තු කළ අනාගත මුදල් ගලනයන්හි වර්තමාන වටිනාකම අතර වෙනස වේ. ප්‍රතිපාදන පහත සඳහන් පරිදි ගණනය කරනු ලැබේ: වසර 5 ට වැඩි නම් 100% ප්‍රතිපාදනය කරනු ලබන අතර අනෙක්වා සඳහා 10% කි.

### 2.8 මුදල් සහ මුදල් හා සමාන දෑ

මුදල් සහ මුදල් හා සමාන දේට අත ඉතුරු මුදල්, බැංකුවල ඇති ඒක්ෂණ තැන්පතු, මාස තුනක හෝ එයට අඩු මුල් කල්පිරීමේ කාලයක් සහිත අනෙකුත් කෙටිකාලීන ඉහළ ද්‍රවශීලතාවයක් සහිත ආයෝජන සහ බැංකු අයිරා ඇතුළත් වේ. බැංකු අයිරා ශේෂ පත්‍රයේ ජංගම වගකීම්වල ණය ගැනුම් යටතේ පෙන්වා ඇත.

### 2.9 ප්‍රතිපාදන

කාර්මික සංවර්ධන මණ්ඩලයට අතීත සිද්ධියක ප්‍රතිඵලයක් ලෙස වර්තමාන නෛතික හෝ සම්මුතික බැඳියාවක් ඇති විට, එම බැඳියාව බේරුම් කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ඇතුළත් සම්පත් ගලායාමක් සිදුවීම අවශ්‍යවිය හැකි සහ බැඳියාවෙහි වටිනාකම විශ්වාසනීය ලෙස තක්සේරු කළ හැකි විට ප්‍රතිපාදන හඳුනාගනු ලැබේ.

### 2.10 වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ

ශේෂ පත්‍රයෙහි වෙනත් ගෙවිය යුතු දෑ ලෙස වර්ගීකරණය කර ඇති වගකීම් වන්නේ ඉල්ලූ විට හෝ ශේෂපත්‍ර දිනයේ සිට එක් වර්ෂයක කාලයක් ඇතුළත ගෙවීමට නියමිතව ඇති ගෙවිය යුතු දෑ වේ. ජංගම නොවන වගකීම් ලෙස වර්ගීකරණය කර ඇති අයිතම වන්නේ ශේෂ පත්‍ර දිනයෙහි සිට එක් වර්ෂයකට වැඩි කාල පරිච්ඡේදයකදී ගෙවීමට නියමිතව ඇති වගකීම් වේ.

### 2.11 නිර්වචිත ප්‍රතිලාභ සැලැස්ම

නිර්වචිත ප්‍රතිලාභ සැලැස්ම යන්නෙන් අදහස් කරන්නේ සේවකයෙකු විශාමගැනීමේදී එම සේවකයාට ලැබෙන ප්‍රතිලාභයෙහි වටිනාකම වන අතර එය සාමාන්‍යයෙන් සේවය කර ඇති වසර ගණන සහ වන්දිය වැනි සාධක එකක් හෝ වැඩිගණනක් මත රඳා පවතී. නිර්වචිත ප්‍රතිලාභ සැලැස්ම 1983 අංක 12 දරණ පනත යටතේ ලබාදෙන පාරිතෝෂිකයෙන් සමන්විත වේ.

නිර්වචිත ප්‍රතිලාභ බැඳියාව ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය භාවිත කර වාර්ෂිකව ගණනය කරනු ලැබේ. ප්‍රතිලාභ ගෙවනු ලබන ව්‍යවහාර මුදලින් බලපවත්වන රජයේ බැඳුම්කරවල පොළී අනුපාත භාවිතා කරමින් ඇස්තමේන්තු කරන ලද සහ කල්පිරීම සඳහා අදාළ විශ්‍රාම බැඳියාවෙහි කොන්දේසිවලට ආසන්න වන කොන්දේසි සහිත අනාගත මුදල් ගලායාම් වට්ටම්කරමින් නිර්වචිත ප්‍රතිලාභ බැඳියාවෙහි වර්තමාන වටිනාකම තීරණය කරනු ලැබේ.

අත්දැකීම් ගැලපීම් සහ ආයුගණක උපකල්පනයන්හි වෙනස්කම් මගින් හටගන්නා ආයුගණක ලාභ සහ පාඩු එම ලාභ හෝ පාඩු හටන්නා කාලපරිච්ඡේදය තුළ පරිපූර්ණ ආදායමෙහි ස්කන්ධයට අයකිරීම හෝ බැරකිරීම සිදු කරනු ලැබේ.

සැලස්මෙහි සිදු කරන වෙනස්කම් නිශ්චිත කාලපරිච්ඡේදයක් සඳහා (පැවරීමේ කාලපරිච්ඡේදය) සේවයේ රැඳී සිටින සේවකයින්ට කොන්දේසික නොවන්නෙහි නම් අතීත සේවා පිරිවැය එකෙනෙහිම පරිපූර්ණ ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ. මෙසේ කිරීමෙහිදී, අතීත සේවා පිරිවැය පැවරීමේ කාලපරිච්ඡේදය පුරා සරල රේඛීය පදනමකට ක්‍රමක්ෂය කරනු ලැබේ.

### 2.12 නිර්වචිත දායක සැලැස්ම

කාර්මික සංවර්ධන මණ්ඩලයේ සියලුම ස්ථිර සහ කොන්ත්‍රාත් සේවකයින් සේවක අර්ථසාධක අරමුදලෙහි සහ සේවක භාරකාර අරමුදලෙහි සාමාජිකයින් වන අතර, ඒ සඳහා කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් අනුපිළිවෙලින් එවැනි සේවකයින්ගේ මූලික වේතනය හෝ වැටුප සහ ජීවන වියදම් දීමනා වලින් 12% සහ 3% බැගින් දායක මුදල් ගෙවනු ලබයි.

### 2.13 ආයෝජන

ආයෝජන තනි ආයෝජන පදනමින් තීරණය කරන ලද පිරිවැයට ගෙන යනු ලැබේ. .

### 2.14 රජයේ ප්‍රදාන

රජයෙන් ලැබෙන ප්‍රදාන ඒවායේ සාධාරණ වටිනාකමට හඳුනාගනු ලැබේ. මෙහිදී ප්‍රදානය ලැබෙනු ඇති බවට සහ කණ්ඩායම ඒ සම්බන්ධිත සියලු කොන්දේසිවලට එකඟ වනු ඇති බවට සාධාරණ සහතිකයක් ඇත.

පිරිවැයට අදාළ රජයේ ප්‍රදාන මගින් හිලව් කිරීමට අපේක්ෂිත පරිවැය සමග ගැළපීමට අවශ්‍ය කරන කාලපරිච්ඡේදය පුරා එම ප්‍රදාන ආදයම් ප්‍රකාශනයෙහි විලම්භනය කර හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත සහ උපකරණවලට අදාළ රජයේ ප්‍රදාන විලම්බිත රජයේ ප්‍රදාන ලෙස ජංගම නොවන වත්කම්වල ඇතුළත් කර ඇති අතර අදාළ වත්කම්වල අපේක්ෂිත ජීවිත කාලය පුරා සරල රේඛීය පදනමකට ආදායම් ප්‍රකාශනයට බැර කරනු ලැබේ.

**2.15** පරිත්‍යාග

පරිත්‍යාග යනු සාමාන්‍යයෙන් අන්‍යෝන්‍ය නොවන මාරුකිරීම් වේ. කෙසේ වුවත්, කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් ප්‍රදායකයා වෙත නාමික ප්‍රතිෂ්ඨාව ලබාදෙන අවස්ථා තිබිය හැක. එවැනි පරිත්‍යාග සඳහා, ප්‍රදායකයින් වෙත ලබාදී ඇති ප්‍රතිෂ්ඨාව අසාධාරණ හුවමාරු ගණුදෙනුවක් ප්‍රතිඵලය වන තරමට ලැබුණු පරිත්‍යාගයෙහි ප්‍රතිෂ්ඨාවට වඩා සැළකිය යුතු තරමින් අඩු නම්, ඒවා ලැබුණු පරිත්‍යාග ලෙස හඳුනාගත යුතුය. .

**2.16** ආදායම් හඳුනාගැනීම

*(අ). විකුණන ලද භාණ්ඩ සහ ඉටුකරන ලද සේවා*

අවදානම් සහ ප්‍රතිලාභ ගැනුම්කරුට පවරාදී ඇති විට භාණ්ඩ අලෙවිකිරීමෙන් උපයාගත් ආදායම ආදායම් ප්‍රකාශනයේ හඳුනාගනු ලැබේ. අයවීමට ඇති ප්‍රතිෂ්ඨාව, ආශ්‍රිත පරිවැය අයකර ගැනීම හෝ භාණ්ඩ ආපසු එවිය හැකි වීම පිළිබඳ සැළකිය යුතු අවිනිශ්තතාවයන් තිබේ නම් කිසිදු ආදායමක් හඳුනාගනු නොලැබේ.

*(ආ). පොළී ආදායම*

පොළී ආදායම කාල ප්‍රමාණ පදනමකින් හඳුනාගනු ලැබේ.

කාර්මික සංවර්ධන මණ්ඩලයේ සාමාන්‍ය ක්‍රියා පටිපාටියෙහිදී ලැබුණු හෝ භාණ්ඩ හා සේවා අලෙවි කිරීම නිසා ලැබිය යුතු ප්‍රතිෂ්ඨාවන්හි සාධාරණ වටිනාකම්වලින් ආදායම සමන්විත වේ. ආදායම අගය එකතු කිරීමේ බද්ද, ප්‍රතිලාභ, ප්‍රතිදාන සහ වට්ටම්වල ශුද්ධ වටිනාකම ලෙස පෙන්වා ඇත.

**2.17** වියදම් හඳුනාගැනීම

*(අ). මෙහෙයුම් වියදම්*

වියදම් උපචිත පදනමකින් හඳුනාගනු ලැබේ. කාල පරිච්ඡේදය සඳහා ලාභය ගණනය කිරීමේදී සාමාන්‍ය ව්‍යාපාර පරිපාටියෙහිදී සහ කාර්යක්ෂම තත්ත්වයෙන් දේපළ, පිරියත සහ උපකරණ නඩත්තු කිරීමෙහිදී දරන ලද සියලුම වියදම් ආදායමට අයකරනු ලැබේ

*(ආ). ශුද්ධ මූල්‍ය පිරිවැය*

ශුද්ධ මූල්‍ය පිරිවැය ආදායම් ප්‍රකාශනයේ හඳුනාගනු ලබන ණයට ගැනීම් සඳහා ගෙවිය යුතු පොළිය, ආයෝජනය කරන ලද අරමුදල්වලින් ලැබිය යුතු පොළිය, සහ විදේශ විනිමය ලාභ සහ පාඩු වලින් සමන්විත වේ.

ණයට ගැනීම් සම්බන්ධයෙන් දරන ලද සියලු පොළී සහ අනෙකුත් පිරිවැය ශුද්ධ මූල්‍ය පිරිවැයෙහි කොටසක් ලෙස වියදම් දරා ඇත.

## 3 මූල්‍ය අවදානම් කළමනාකරණය

**3.1** මූල්‍ය අවදානම් සාධක

කාර්මික සංවර්ධන මණ්ඩලයේ ප්‍රධාන මූල්‍ය උපකරණ බැංකු ණය, කෙටි කාලීන තැන්පතු සහ මුදල්වලින් සමන්විත වේ. මෙම මූල්‍ය උපකරණවල ප්‍රධාන අරමුණ වන්නේ කාර්මික සංවර්ධන මණ්ඩලයේ මෙහෙයුම්වල ද්‍රවශීලතාවය ඉහළනැංවීම සහ පවත්වාගෙන යාමය සහ කාර්මික සංවර්ධන මණ්ඩලයේ සංචිත මත ලැබෙන ප්‍රතිලාභය උපරිම කිරීමයි. කාර්මික සංවර්ධන මණ්ඩලයට එහි ව්‍යාපාර ක්‍රියාකාරකම් වලින් සෘජුවම ඇතිවන ලැබිය යුතු වෙළඳ සහ ගෙවිය යුතු වෙළඳ ආදී වශයෙන් වූ වෙනත් විවිධ මූල්‍ය උපකරණ ද තිබේ.

කාර්මික සංවර්ධන මණ්ඩලය විවිධවූ මූල්‍ය අවදානම් රැසකට නිරාවරණය වී ඇත. විදේශ විනිමය අවදානම්, ණය අවදානම්, පොළී අනුපාත අවදානම් සහ ද්‍රවශීලතා අවදානම් මෙයට අයත් වේ. කාර්මික සංවර්ධන මණ්ඩලයේ ආර්ථික දර්ශනය සහ මෙම අවදානම්වලට එහි ඇති නිරාවරණය පදනම් කර ගෙන කාර්මික සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය කලින් කලට විවිධ අවදානම් කළමනාකරණ ක්‍රමෝපායයන් අනුමත කරයි.

***(i) පොළී අනුපාත අවදානම***

පොළී අනුපාත අවදානම යනු වෙළඳපොළ පොළී අනුපාතවල සිදුවන වෙනස්කම් නිසා මූල්‍ය උපකරණවල සාධාරණ වටිනාකම හෝ අනාගත මුදල් ගලනයන් උච්චාවචනය විය හැකි වීමේ අවදානමයි. කාර්මික සංවර්ධන මණ්ඩලය වෙළඳපොළ පොළී අනුපාත වෙනස්වීමේ අවදානමට ඇති නිරාවරණය මූලික වශයෙන්ම කාර්මික සංවර්ධන මණ්ඩලයෙහි පාවෙන අනුපාත සහිත ණය බැඳීම්වලට අදාළව වේ. කාර්මික සංවර්ධන මණ්ඩලය දෛනිකව මුදල් ගලනයන් අධීක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම, ණයට ගැනීම් අවම මට්ටමක තබා ගැනීම, සහ ණයට ගැනීම් සහ තැන්පතු සඳහා වාසිදායක අනුපාතයන් ගිවිසගැනීම ආදී ක්‍රම මගින් එහි පොළී අනුපාත අවදානම කළමනාකරණය කරයි.

***(ii) ණය අවදානම***

මුදල් සහ මුදල් හා සමාන දෑ, ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ, සහ බැංකු සහ මූල්‍ය ආයතනවල ඇති තැන්පතු මෙන්ම හිඟ ලැබිය යුතු දෑ සහ සිදුකළ ගනුදෙනු ද ඇතුළත්ව විදේශ ගනුදෙනුකරුවන්ට ඇති ණය නිරාවරණයන් ආදියෙන් ණය අවදානම ඇතිවේ.

## 3 මූල්‍ය අවදානම් කළමනාකරණය (ඉතිරි)

### 3.1 මූල්‍ය අවදානම් සාධක (ඉතිරි)

සාමාන්‍යයෙන් ණය ආවදානමට ලක්වන මූල්‍ය වත්කම්වල උපරිම අවදානම් තත්ත්වයන් ඒවායේ ධාරණ වටිනාකම්වලට සමාන වේ. උපරිම අවදානම් තත්ත්වයන් පහත සඳහන් වගුව මගින් පෙන්වා ඇත (2014.12.31 දිනට).

| | වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ | අදාළ පාර්ශවයන්ගෙන් ලැබිය යුතු වටිනාකම් | මුදල් සහ මුදල් හා සමාන දෑ | එකතුව |
|---|---|---|---|---|
| **අවදානම් නිරාවරණය** | | | | |
| වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ | 20,660,544 | | | 20,660,544 |
| මුදල් සහ මුදල් හා සමාන දෑ | | | 45,002,376 | 45,002,376 |
| | **20,660,544** | **-** | **45,002,375.61** | **65,662,919.4** |

### 3.2 ප්‍රාග්ධන කළමනාකරණය

ප්‍රාග්ධනය කළමනාකරණය කිරීමේදී කාර්මික සංවර්ධන මණ්ඩලයේ අරමුණු වන්නේ කොටස්කරුවන්ට ප්‍රතිලාභ ලබාදීම සහ අනෙකුත් පාර්ශවකරුවන්ට ප්‍රයෝජන සලසා දීම පිණිස ප්‍රවර්තන ව්‍යාපාරයක් ලෙස අඛණ්ඩව පවත්වාගෙන යාමට කාර්මික සංවර්ධන මණ්ඩලය සතු හැකියාව ආරක්ෂා කිරීමත් ප්‍රාග්ධන පිරිවැය අඩුකිරීම සඳහා ප්‍රශස්ත ප්‍රාග්ධන ව්‍යුහයක් පවත්වාගැනීමත්ය.

කර්මාන්තයේ නියැළී සිටින අනෙකුත් කර්මාන්තකරුවන් හා අනුකූලව, කාර්මික සංවර්ධන මණ්ඩලය තෝලන අනුපාතය පදනමින් ප්‍රාග්ධනය අධීක්ෂණය කරයි. මෙම අනුපාතය මුළු හිමිකම්වලින් මුළු ණයට ගැනීම් ලෙස ගණනය කරනු ලැබේ. මුළු ණය ගැනුම්වලට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි පෙන්වා ඇති පරිදි ජංගම නොවන සහ ජංගම ණයට ගැනීම් ඇතුළත් වේ. මුළු හිමිකම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ඇති මුළු හිමිකම ලෙස ගණනය කරනු ලැබේ.

2014 දෙසැම්බර් 31 දිනට තෝලන අනුපාතය පහත සඳහන් පරිදි විය:

| | 2014 | 2013 |
|---|---|---|
| මුළු ණයටගැනීම් | - | - |
| මුළු හිමිකම් | 1,170,941,702 | 168,789,170 |
| **තෝලන අනුපාතය** | **-** | **-** |

2014 වර්ෂයේ තෝලන අනුපාතයෙහි අඩුවීම එම වර්ෂයෙහි ණයට ගැනීම් අඩුවීමෙහි ප්‍රතිඵලයක් නිසා සිදු විය.

## 4 ප්‍රථම වතාවට ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. / ශ්‍රී.ලං.ගි.ප්‍ර. අනුගමනය කිරීම

මෙය කාර්මික සංවර්ධන මණ්ඩලය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (SLFRS / LKAS) අනුකූලව සකස් කරන ලද ප්‍රථම මූල්‍ය ප්‍රකාශන කට්ටලය වේ. 2011 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සංසදනාත්මක තොරතුරු සහ කාර්මික සංවර්ධන මණ්ඩලයේ සංක්‍රාන්ති දිනය වන 2011 ජනවාරි 01 දිනට ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. ආරම්භක මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සමග 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී සටහන අංක 02 හි දක්වා ඇති ගිණුම්කරණ ප්‍රමිති අදාළ කරගෙන ඇත.

පෙර වාර්තාකරන ලද මූල්‍ය කාලපරිච්ඡේද සඳහා ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සකස් කිරීමේදී, අදාළ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව අවශ්‍ය ගැලපීම් සිදු කර ඇත. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලින් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට මාරුවීමෙන් ඇතිවූ ප්‍රතිඵල සැසඳුම් ප්‍රකාශනවල සහ සැසඳුම් සඳහා ගිණුම්කරණ සටහන්වල පැහැදිලි කර ඇත.

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට මාරුවීමේදී ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. ප්‍රමිති අංක 01 යටතේ කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් අදාළ කර ගනු ලැබූ නිදහස්කිරීම් සහ ව්‍යතිරේකයන් පහත දක්වා ඇත.

## 4 ප්‍රථම වතාවට ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. / ශ්‍රී.ලං.ගි.ප්‍ර. අනුගමනය කිරීම (ඉතිරි)

### 4.1 SLFRS විකල්ප නිදහස්කිරීම්

පහත සඳහන් නිදහස්කිරීම් කාර්මික සංවර්ධන මණ්ඩලයට අදාළ නොවේ. .

4.1.1 LKAS 23 - ණය ගැණුම් පිරිවැය, පෙර පැවති GAAP (SLASs) යටතේ අනුගමනය කරන ලද ප්‍රතිපත්තිය LKAS 23 ට සමාන නිසා.

4.1.2 SLFRS 2 - කොටස් පදනම් කරගත් ගෙවීම්, SLFRS ට සංක්‍රාන්ති දිනය වන විට එවැනි ක්‍රමයක් පවරා නොතිබූ නිසා

4.1.3 SLFRS 4 - රක්ෂණ ගිවිසුම්, මෙය කාර්මික සංවර්ධන මණ්ඩලයේ මෙහෙයුම්වලට අදාළ නොවන නිසා

4.1.4 LKAS 21 - විදේශ මෙහෙයුම්, LKAS 21 හි අර්ථදක්වා ඇති පරිදි කාර්මික සංවර්ධන මණ්ඩලයට එවැනි විදේශ මෙහෙයුම් නොමැති නිසා.

4.1.5 IFRIC 4 - කල්බද්දක් අඩංගුවන එකඟවීම්, IFRIC 18 - ගනුදෙනුකරුවන්ගෙන් වත්කම් පැවරීම්, සංක්‍රාන්ති දිනය වන විට කාර්මික සංවර්ධන මණ්ඩලය මේ ආකාරයේ ගිවිසුම්වලට එළඹ නොතිබූ නිසා

4.1.6 LKAS 19 - සේවක ප්‍රතිලාභ, පෙර පැවති GAAP (SLASs) යටතේ අනුගමනය කරන ලද ප්‍රතිපත්තිය LKAS 19 ට සමාන නිසා.

4.1.7 LKAS 27 - පරිපාලිත සමාගම්, හවුලේ පාලනය කරනු ලබන ආයතන සහ ආශ්‍රිත සමාගම්, කාර්මික සංවර්ධන මණ්ඩලයට එවැනි ආයෝජන නොමැති නිසා

4.1.8 LKAS 39 යටතේ සංක්‍රාන්ති දිනයට පෙර විකිණීම සඳහා ඇති ලෙස හෝ කාර්මික සංවර්ධන මණ්ඩලයෙහි සහ සමූහයේ ලාභය හෝ පාඩුව නිසා වූ සාධාරණ වටිනාකම ලෙස පූර්වයෙන් හඳුනාගන්නා ලද මූල්‍ය උපකරණ සඳහන් කිරීම, කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් සංක්‍රාන්ති දිණයට පෙර විකිණීම සඳහා ඇති ලෙස හෝ ලාභය හෝ පාඩුව නිසා වූ සාධාරණ වටිනාකම ලෙස හෝ කිසිදු මූල්‍ය උපකරණයක් සඳහන් කර නොමැති නිසා.

4.1.9 IFRIC 1 - 9 IFRIC 1 - දේපළ, පිරියත සහ උපකරණ පිරිවැයෙහි ඇතුළත් ඉවත්කිරීමේ වගකීම්, දැනට පවතින ඉවත්කිරීමේ වගකීම්වල වෙනස්කම් සඳහා කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් යොදාගනු ලබන ගිණුම්කරණ පිළිපැදීම IFRIC 1 ට අනුකූල වන නිසා

4.1.10 IFRIC 12 - සේවා සහන වැඩපිළිවෙල, කාර්මික සංවර්ධන මණ්ඩලය IFRIC 12 හි විෂය පථය ඇතුළත ගිවිසුම්වලට එළඹ නැති නිසා

4.1.11 IFRIC 19 - හිමිකම් උපකරණ කරණකොට ශුන්‍ය වී යන මූල්‍ය උපකරණ, සංක්‍රාන්ති දිනය වන විට කාර්මික සංවර්ධන මණ්ඩලයට මේ වර්ගයේ මූල්‍ය උපකරණ නොමැති නිසා

4.1.12 LKAS 29 - අතිඋද්ධමනකාරී ආර්ථිකවල මූල්‍ය වාර්තාකරණය, කාර්මික සංවර්ධන මණ්ඩලය අති උද්ධමනකාරී ආර්ථියක ක්‍රියාත්මක නොවන නිසා

4.1.13 IFRS 1 - සළකණු ලබන පිරිවැය, ඓතිහාසික පිරිවැය පිළිබඳ ප්‍රතිපත්තිය නොවෙනස්ව පැවති නිසා නිදහස් කිරීම යොදා ගැනීමට කාර්මික සංවර්ධන මණ්ඩලය තීරණය කිරීම

4.1.14 LKAS 32 - සංයුක්ත උපකරණ - සංක්‍රාන්ති දිනය වන විට කාර්මික සංවර්ධන මණ්ඩලයට සංයුක්ත උපකරණ කියිවක් නොමැති නිසා

4.1.15 IFRIC 18 - ගනුදෙනුකරුවනගෙන් වත්කම් පවරාගැනීම්, මෙය කාර්මික සංවර්ධන මණ්ඩලයට අදාළ නොවේ

**SLFRS අනිවාර්ය ව්‍යතිරේක**

SLAS වලින් SLFRS වෙත පරිවර්තනය කිරීමේදී අදාළ කරගනු ලබන SLFRS 1 හි උපයෝගී කර ගත යුතු අනිවාර්ය ව්‍යතිරේක පහත දක්වා ඇත:

**තක්සේරු සඳහා ව්‍යතිරේක**

2011 අප්‍රේල් මස 01 වැනි දිනට SLFRS තක්සේරු ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව එම දිනයටම සකස් කරන ලද තක්සේරු සමග ගැළපෙයි.

SLFRS 1 හි අනෙකුත් අනිවාර්ය ව්‍යතිරේක කාර්මික සංවර්ධන මණ්ඩලයට අදාළ නොවන නිසා ඒවා උපයෝගී කරගෙන නැත.

- මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් ඉවත්කිරීම
- පාලනය නොවන හිමිකම්
- ඉදිරි රැකුම් ගිණුම්කරණය

## 4 ප්‍රථම වතාවට ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. / ශ්‍රී.ලං.ගි.ප්‍ර. අනුගමනය කිරීම (ඉතිරි)

### 4.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති SLFRS ට සැසඳීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLFRS / LKAS) අනුව ආයතනයක් විසින් පෙර කාලපරිච්ඡේද සඳහා හිමිකම්, විස්තීර්ණ ආදායම සහ මුදල් ගලනයන් සැසඳිය යුතු වේ. කාර්මික සංවර්ධනය මණ්ඩලය විසින් ප්‍රථම වතාවට එම ප්‍රමිති යොදාගැනීම සමස්ත මෙහෙයුම්, ආයෝජන හෝ මූල්‍යන මුදල් ගලනයන් මත බලපෑමක් ඇති නොකළේය. හිමිකම්, ඉපැයීම් සහ විස්තීරණ ආදායම සඳහා සටහන් කළ අදාළ කාලපරිච්ඡේද සඳහා SLAS වලින් SLFRS / LKASට සැසඳීම් 4.3.1 සහ 4.3.2 යන සටහන්වලින් පෙන්නුම් කරයි.

SLFRS / LKAS ට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී සියලුම අනිවාර්ය ව්‍යතිරේක සහ විකල්ප ව්‍යතිරේක පූර්ණ ලෙස SLFRS / LKAS ට අතීතානුයෝගීව යොදාගැනීම කාර්මික සංවර්ධන මණ්ඩලයට අදාළ නොවේ.

## 5 අවිනිශ්චිතතාවයන් සහ විනිශ්චයන් තක්සේරුකිරීමේ ප්‍රධාන මූලාශ්‍ර පිළිබඳ තොරතුරු

තක්සේරු සහ විනිශ්චයන් අඛණ්ඩව ඇගයීම් කරනු ලැබේ. ඒවා ඓතිහාසික අත්දැකීම් සහ පවතින වාතාවරණයන් යටතේ සාධාරණ යැයි විශ්වාස කළ හැකි, අනාගත සිදුවීම් පිළිබඳ අපේක්ෂාවන් ද ඇතුළත් අනෙකුත් සාධක මත පදනම්ව ඇත.

### 5.1 ඉතා වැදගත් ගිණුම්කරණ තක්සේරු සහ උපකල්පන

කාර්මික සංවර්ධන මණ්ඩලය අනාගතය සම්බන්ධ තක්සේරු සහ උපකල්පන සිදුකරයි. එයින් ප්‍රතිඵලවන ගිණුම්කරණ තක්සේරු ස්වභාවයෙන්ම අදාළ සත්‍ය ප්‍රතිඵලවලට සමානවන්නේ කලාතුරකිනි. මීළඟ මූල්‍ය වර්ෂය තුළ වත්කම් සහ වගකීම්වල ධාරණ වටිනාකමට ප්‍රමාණික ගැළපීමක් සිදුකිරීමට හේතුවන සැළකිය යුතු අවදානමක් සහිත තක්සේරු සහ උපකල්පනයන් පහත අනාවරණය කර ඇත.

**(අ) නිර්වචිත ප්‍රතිලාභ සැලැස්ම - පාරිතෝෂික**

නිර්වචිත ප්‍රතිලාභ බැඳීම්වල වර්තමාන වටිනාකම උපකල්පන ගණනාවක් භාවිතා කරමින් ආයුගණන පදනමකින් තීරණය කරනු ලබන සාධක ගණනාවක් මත රඳා පවතී. නිර්වචිත ප්‍රතිලාභ බැඳීම් සඳහා ශුද්ධ පිරිවැය (ආදායම) තීරණය කිරීමේදී යොදාගනු ලබන උපකල්පනවලට වට්ටම් අනුපාතය, අනාගත වැටුප් වර්ධක අනුපාතය, මරණ අනුපාතිකය, කාර්යභාරයෙන් ඉවත්වීමේ සහ ආබාධිතවීමේ අනුපාතයන් සහ විශ්‍රාම ගැනීමේ වයස ඇතුළත් වේ. මෙම උපකල්පනවලට සිදුකරනු ලබන කිසියම් වෙනස්කමක් මගින් නිර්වචිත ප්‍රතිලාභ බැඳීම්වල ධාරණ වටිනාකම මත බලපෑමක් ඇති කරනු ඇත.

නිර්වචිත ප්‍රතිලාභ බැඳීම ප්‍රක්ෂේපිත ඒකක ප්‍රතිලාභ ක්‍රමය භාවිතා කරමින් ස්වායත්ත ආයුගණකයින් අනුව ගණනය කරනු ලැබේ. නිර්වචිත ප්‍රතිලාභ බැඳීමෙහි වර්තමාන වටිනාකම ආයුගණක තක්සේරුකරු විසින් නිසි පොළී අනුපාත යොදාගනිමින් ඇස්තමේන්තු කළ අනාගත මුදල් ගලායෑම් වට්ටම් කිරීමෙන් තීරණය කරනු ලැබේ.

වෙළඳපොළ තත්ත්වයන් මත ද රඳා පවතී. අමතර තොරතුරු සටහන 20 හි සඳහන් කර ඇත.

**(ආ) දේපළ, පිරියත සහ උපකරණවල ප්‍රයෝජනවත් ජීවිත කාලයන්**

කාර්මික සංවර්ධන මණ්ඩලය ව්‍යාපාර සැලැස්ම සහ ක්‍රමෝපායයන්, අපේක්ෂිත භාවිත මට්ටම සහ අනාගත තාක්ෂණික වැඩිදියුණුකිරීම් වැනි සාධක පදනම් කර ගෙන දේපළ, පිරියත සහ උපකරණවල ඇස්තමේන්තුකළ ප්‍රයෝජනවත් ජීවිතකාලය වාර්ෂිකව සමාලෝචනය කරයි. ඉහත සඳහන්කළ සාධකවල සිදුවන වෙනස්කම් හේතුවෙන් මෙම ඇස්තමේන්තුවල ඇතිවිය හැකි වෙනස්කම් මෙහෙයුම්වල අනාගත ප්‍රතිඵලවලට ප්‍රමාණික ලෙස බලපෑ හැකිය. දේපළ, පිරියත සහ උපකරණවල ඇස්තමේන්තු කළ ප්‍රයෝජනවත් ජීවිත කාලයෙහි අඩුවීමක් සිදුවීම මගින් වාර්තා කර ඇති ක්ෂය අයකිරීම් වැඩිවිය හැකි අතර දේපළ, පිරියත සහ උපකරණ අඩුවිය හැක.

## ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

### මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

**6** ආදායම

| | | 2014 | 2013 |
|---|---|---|---|
| **6 a** | **විතුණුම්** | | |
| | විකුණුම් | 32,722,575.83 | 46,982,182.40 |
| | විකුණුම් (ලෝහ අබලි ව්‍යාපෘතිය) | 83,946,898.63 | 53,087,770.73 |
| | කැස්පර් ව්‍යාපෘතිය විකුණුම් ආදායම් | 2,396,950.00 | 2,234,935.00 |
| | ආයතනය විසින් ඉටුකළ කාර්යයන් සහ ප්‍රාග්ධනිත | | 926,911.77 |
| | ප්‍රකාශන අලෙවිකිරීම | 574,495.12 | 339,626.54 |
| | කුලිය - කාර්මික ජනපද | 40,610,481.96 | 32,172,840.36 |
| | ජල ගාස්තු | 6,728,096.31 | 6,906,752.83 |
| | යටිතල පහසුකම් | 324,017.00 | 1,982,325.99 |
| | වැඩිපුර අයකරගත් ගාස්තු | 1,381,701.88 | 2,564,815.41 |
| | රක්ෂණ වාරික | 44,896.52 | 94,997.95 |
| | පුහුණු වැඩසටහන් | 16,176,183.60 | 17,573,284.02 |
| | ව්‍යාපෘති වාර්තා | 972,527.03 | 737,333.49 |
| | කාර්මික ජනපද සඳහා සේවා ගාස්තු | 712,229.00 | 709,774.89 |
| | සේවා ගාස්තු | 1,948,050.32 | 1,192,982.27 |
| | | **188,539,103.20** | **167,506,533.65** |
| **6 b** | **වෙනත් ආදායම්** | | |
| | කොමිස් - ලක්කම් | | 250,017.50 |
| | කොමිස් (උපකොන්ත්‍රාත් හුවමාරු) | 112,487.67 | 332,613.35 |
| | කොමිස් - ලක්කකම් මධ්‍යස්ථානය | 2,366,892.15 | 1,767,588.76 |
| | සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම | 746,310.00 | 169,812.09 |
| | ආපසු නොගෙවනු ලබන ටෙන්ඩර් තැන්පතු | 7,080.00 | 45,920.00 |
| | ලක්කම් ශාලා ගාස්තු | 7,500.00 | - |
| | නොතාරිස් ගාස්තු | 190,260.00 | 198,060.00 |
| | දඩ | 60,362.84 | 182,410.75 |
| | වෙබ්අඩවි පළකිරීමේ ආදායම් | 10,385.00 | 1,500.00 |
| | සංචාරක බංගලා ගාස්තු | 179,674.25 | 268,604.73 |
| | ස්ථාවර වත්කම් විකිණීම | 3,083,676.25 | - |
| | විවිධ ආදායම් | 1,445,833.15 | 3,676,554.84 |
| | ඉතිරිකිරීමේ පොළී | 1,007,771.27 | 965,638.29 |
| | රසායනාගාර පරීක්ෂණ සඳහා සේවා ගාස්තු | 299,116.02 | 307,777.93 |
| | කාර්යමණ්ඩල ණය පොළී | 1,568,637.32 | 1,378,217.07 |
| | කාර්ය මණ්ඩල ණයවලින් ලැබුණු පොළී ආදායම (IFRS) | | 923,277.27 |
| | මාරුකරන ලද ප්‍රාග්ධන ප්‍රදාන | 34,796,128.99 | 26,985,079.82 |
| | ප්‍රදර්ශන ආදායම | 16,401,543.00 | |
| | | **62,283,657.91** | **37,453,072.40** |

**7** ප්‍රදාන

| | 2014 | 2013 |
|---|---|---|
| ආදායම් ප්‍රදාන | 250,000,000.00 | 231,000,000.00 |
| | **250,000,000.00** | **231,000,000.00** |

## 8 ස්වභාවය අනුව වියදම්

### 8 a විකුණුම් පිරිවැය

| | 2014 | 2013 |
|---|---|---|
| විකුණුම් පිරිවැය - සෘජු ද්‍රව්‍ය | 21,235,948.75 | 32,004,726.96 |
| විකුණුම් පිරිවැය - මිලදී ගැනීම් - ලෝහ නොවන අබලි ව්‍යාපෘතිය | 51,768,776.30 | 23,589,813.42 |
| විකුණුම් පිරිවැය - සෘජු ශ්‍රමය | 2,734,821.44 | 3,104,284.20 |
| විකුණුම් පිරිවැය - වක්‍ර ද්‍රව්‍ය | 3,543,637.57 | 5,566,542.53 |
| පාරිභෝජ්‍ය ඉංජිනේරුමය අමුද්‍රව්‍ය | 2,500.00 | - |
| පාරිභෝජ්‍ය - වාත්තු වැඩපොළ අමුද්‍රව්‍ය | | 121,318.65 |
| මුද්‍රණ යන්ත්‍ර නඩත්තු කිරීම | | |
| පිරියත සහ යන්ත්‍රසූත්‍ර නඩත්තු කිරීම | 279,962.00 | 1,047,607.17 |
| උපකරණ සහ අමතර කොටස් නඩත්තු කිරීම | | 3,272.07 |
| විදුලිබලය | 3,272,020.00 | 3,884,438.83 |
| පිරියත සහ යන්ත්‍රසූත්‍ර ක්ෂයවීම | 1,209,956.00 | 2,292,013.75 |
| උපකරණ ක්ෂයවීම | 49,810.00 | 51,248.89 |
| මුද්‍රණ යන්ත්‍ර ක්ෂයවීම | 335,535.50 | |
| ලෝහ නොවන අබලි එකතුකිරීමේ කොමිස් | 3,300.00 | - |
| ඉංජිනේරු වැඩ ගාස්තු | 336,752.08 | 136,267.39 |
| අලෙවිකරණ වියදම් | 93,032.30 | 188,942.19 |
| උපකොන්ත්‍රාත් ගාස්තු | 976,400.00 | 847,118.34 |
| කර්මාන්තශාලා පොදු කාර්ය | (1,957,432.39) | (2,934,679.10) |
| සාමාන්‍ය පොදු කාර්ය වශයෙන් අයකරගත් මුදල | (2,206,175.29) | (3,432,719.01) |
| කාර්මික ජනපද නඩත්තු කිරීම | 2,185,823.05 | 2,074,350.22 |
| රසායනාගාර උපකරණ නඩත්තු කිරීම | 2,500.00 | 1,264,000.00 |
| මුද්‍රණ යන්ත්‍ර නඩත්තු කිරීම | 25,335.98 | 250,447.96 |
| ප්‍රවාහන ගාස්තු | 1,641,375.14 | 1,279,113.50 |
| ජා.ගො.බ. වියදම් - ලක්කම් | 155,562.04 | |
| පුහුණු වැඩසටහන් | 17,812,893.68 | 11,236,770.33 |
| එකතුව | **103,502,334.15** | **82,574,878.29** |

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

**8 b පරිපාලන වියදම්**

| | | |
|---|---|---|
| මූලික වැටුප් | 120,318,962.49 | 127,597,485.45 |
| සභාපතිවරයාගේ වේතනය | 600,000.00 | 345,154.99 |
| විශේෂ දීමනා 5% | 27,007,834.95 | 22,102,451.03 |
| ජීවන වියදම් දීමනාව | 44,676,537.08 | 39,757,840.66 |
| වෙනත් දීමනා | 4,744,183.76 | 5,020,507.49 |
| සේ.අ.අ. (දායක මුදල්) | 20,212,519.60 | 78,813,481.32 |
| සේ.නි.භා.අ. (දායක මුදල්) | 5,053,948.37 | 13,275,370.50 |
| මණ්ඩලයේ සේවකයින් සඳහා ප්‍රසාද දීමනා | 453,000.00 | 491,000.00 |
| වර්ෂය සඳහා පාරිතෝෂික අයකිරීම් | 13,577,657.28 | 17,623,618.61 |
| පුහුණු දීමනා | 802,281.28 | 1,663,788.39 |
| දෛනික ගෙවීම්කරනු ලබන සහ මුරකරු දීමනා | 2,623,592.81 | 2,045,726.71 |
| කාර්ය මණ්ඩල පිරිවැය (IFRS ණය ගැළපීම්) | | 923,277.27 |
| ලබා නොගත් අසනීප නිවාඩු සඳහා ගෙවීම් | 10,025,747.01 | 8,348,314.64 |
| අතිකාල | 10,628,179.90 | 9,730,205.26 |
| නිවාඩුදින ගෙවීම් | 787,890.23 | 691,053.88 |
| ගමන් වියදම් (දේශීය) | 7,041,000.78 | 6,093,941.82 |
| ගමන් වියදම් (විදේශීය) | 869,229.93 | 605,053.13 |
| නවාතැන් වියදම් | 222,296.00 | 182,443.96 |
| ලිපිද්‍රව්‍ය සහ කාර්යාලීය අවශ්‍යතා | 2,848,544.35 | 2,595,675.95 |
| සැපයුම්කරුවන් ලියාපදිංචිකිරීමේ ගාස්තු | 24,579.00 | - |
| ඉන්ධන වියදම් | 4,430,757.22 | 4,388,227.06 |
| නිළ ඇඳුම් | 1,159,872.40 | 1,278,422.56 |
| ඉඩම් නඩත්තු කිරීම | 103,852.42 | 207,175.89 |
| ගොඩනැගිලි නඩත්තු කිරීම | 1,021,795.45 | 1,490,604.94 |
| පිරියත සහ යන්ත්‍රසූත්‍ර නඩත්තු කිරීම | 157,271.88 | 227,606.06 |
| පරිගණක උපාංග නඩත්තු කිරීම | 448,736.17 | 739,021.04 |
| මෝටර් වාහන නඩත්තු කිරීම | 3,638,853.60 | 3,604,555.48 |
| කාර්යාල උපකරණ නඩත්තු කිරීම | 492,193.24 | 908,084.90 |
| ලිබඩු, සවිකිරීම් සහ කාර්යාල උපකරණ නඩත්තු කිරීම | 357,565.33 | 411,679.80 |
| පාපැදි නඩත්තු කිරීම | 2,515.00 | 1,755.00 |
| PABX සේවා නඩත්තු කිරීම | 42,927.28 | 89,556.06 |
| විවිධ වත්කම් නඩත්තු කිරීම | 51,627.90 | 77,513.65 |
| ජල සැපයුම නඩත්තු කිරීම | 478,710.60 | 649,228.34 |
| ඉඩම් නඩත්තු කිරීම | 26,685.00 | 15,281.00 |
| විදුලිය ගාස්තු | 9,356,840.16 | 9,268,119.85 |
| දුරකථන ගාස්තු | 4,779,401.64 | 5,061,703.78 |
| ආරක්ෂක සේවා සඳහා ගෙවීම් | 21,064,040.28 | 21,479,111.80 |
| තැපැල් සහ විදුලි පණිවුඩ ගාස්තු | 938,753.10 | 804,323.97 |
| ජල ගාස්තු | 4,438,769.78 | 4,774,775.46 |
| කුලී, වරිපණම් සහ බදු | 14,279,488.53 | 3,311,973.94 |
| රක්ෂණ | 1,266,014.32 | 1,423,421.52 |
| පුවත්පත් සහ සඟරා | 600,890.54 | 677,367.00 |
| සංයුක්ත සැලැස්ම | | 673,850.84 |
| හැකියා සංවර්ධන වැඩසටහන් | 613,690.32 | 2,591,956.02 |
| අධ්‍යක්ෂවරුන්ගේ ගාස්තු | 649,800.00 | 334,200.00 |
| උපදේශන ගාස්තු | 251,200.00 | 1,000.00 |
| වෛද්‍ය ආධාර යෝජනාක්‍රම දායක මුදල් | 241,500.00 | 550,200.00 |
| විගණන ගාස්තු | 600,000.00 | 600,000.00 |
| වෛද්‍ය පරීක්ෂණ ගාස්තු | 16,000.00 | 74,180.00 |
| සුභසාධන | 1,316,021.27 | 1,470,891.70 |
| විනෝදාස්වාද | 331,062.29 | 315,861.27 |
| වෙළඳ දැන්වීම් | 1,357,720.14 | 1,496,237.87 |
| නීති සේවා ගාස්තු | 325,772.00 | 429,558.00 |
| වෘත්තීය පරීක්ෂණ සහ සම්මුඛ පරීක්ෂණ ආදිය සඳහා ගාස්තු | 82,555.00 | 13,366.00 |

## ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

### මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

| | | | |
|---|---|---|---|
| | මණ්ඩලයේ සේවකයින් සඳහා දේශීය පුහුණු | 1,211,791.79 | 439,330.00 |
| | වෘත්තියවේදී සංවිධාන (දේශීය සහ විදේශීය) සඳහා ගාස්තු | 8,820.00 | 800.00 |
| | බලපත්‍ර ගාස්තු | 195,119.66 | 224,865.00 |
| | ප්‍රවර්ධන වියදම් | 1,000.00 | 173,000.00 |
| | ප්‍රදර්ශන වියදම් | 22,644,444.68 | 1,234,718.18 |
| | අච්චුවේලි කා.ජ. විවෘතකිරීමේ වියදම් | 1,089,550.00 | |
| | පර්යේෂණ සහ සංවර්ධන | 223,720.31 | 118,811.43 |
| | සක්‍යතා අධ්‍යයන | 16,460.00 | - |
| | ප්‍රකාශන | 91,659.00 | 201,658.00 |
| | ඡායාරූප | 2,380.00 | 691.00 |
| | රජයේ ප්‍රදාන පුනප්‍රකාශනය | 39,730.00 | - |
| | විවිධ වියදම් | 596,638.63 | 51,311.00 |
| | ලියාපදිංචිකිරීම් ගාස්තු | 39,300.00 | 34,395.71 |
| | කම්කරු නඩු සඳහා වෙන්කිරීම් | | 4,406,388.54 |
| | කල් ඉකුත්වූ තොග සඳහා වෙන්කිරීම් | | 155,066.00 |
| | ඉඩම් වැඩිදියුණු කිරීම් ක්ෂයවීම | 1,485,666.66 | 1,410,559.24 |
| | ගොඩනැගිලි ක්ෂයවීම | 4,271,632.89 | 4,011,701.69 |
| | පිරියත සහ යන්ත්‍රසූත්‍ර ක්ෂයවීම | 2,476,073.82 | 1,901,809.40 |
| | පරිගණක උපාංග ක්ෂයවීම | 3,958,607.33 | 2,998,032.66 |
| | රසායනාගාර උපකරණ ක්ෂයවීම | 96,194.35 | 95,869.69 |
| | මුද්‍රණ යන්ත්‍ර ක්ෂයවීම | | 516,154.70 |
| | මෝටර් වාහන ක්ෂයවීම | 6,066,752.61 | 7,768,492.61 |
| | කාර්යාල උපකරණ ක්ෂයවීම් | 2,003,433.58 | 1,916,950.56 |
| | ගමන්මළු ක්ෂයවීම් | 20,615.68 | 28,989.00 |
| | ලීඩු සහ සවිකිරීම් ක්ෂයවීම | 1,094,915.08 | 1,048,869.08 |
| | පාපැදි ක්ෂයවීම් | 10,307.78 | 8,245.78 |
| | උපකරණ සහ අමතර කොටස් ක්ෂයවීම් | 48,319.92 | 5,118.00 |
| | පුස්තකාල පොත් ක්ෂයවීම් | 396,107.05 | 230,509.15 |
| | PABX සේවා ක්ෂයවීම් | 269,934.36 | 268,863.46 |
| | උපයෝගිතා සේවා ක්ෂයවීම් | 340,464.19 | 358,201.69 |
| | විවිධ වත්කම් ක්ෂයවීම් | 281,355.69 | 459,490.68 |
| | JICA උපකරණ ක්ෂයවීම් | 151,060.50 | 151,059.50 |
| | පරිගණක මෘදුකාංග ක්ෂයවීම | | 141,121.43 |
| | | **396,572,923.24** | **437,708,275.04** |
| | **මූල්‍ය පිරිවැය** | | |
| **8 c** | බැංකු ගාස්තු | 328,191.99 | 405,179.95 |
| | | **328,191.99** | **405,179.95** |
| **8 d** | වර්ෂය සඳහා ආයුගණක ලාභය (පාඩුව) | 19,111,459.68 | (10,320,017.14) |
| | ප්‍රත්‍යාගණන අතිරික්තය | 941,908,020.46 | |
| | | **961,019,480.14** | **(10,320,017.14)** |
| | වර්ෂය තුළ සේවය කළ සේවක සංඛ්‍යාවේ සාමාන්‍යය | | |
| | ස්ථිර | **500** | 484 |

## ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

### මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

**9** **ශුද්ධ රාජ්‍ය දායකය**

| | 2014 | 2013 |
|---|---|---|
| 2014 ජනවාරි 01 දිනට රජයේ ප්‍රාග්ධන ප්‍රදාන | 243,694,719.12 | 249,328,481.60 |
| 2014 වර්ෂය තුළ ලැබුණු රජයේ ප්‍රාග්ධන ප්‍රදාන | 35,000,000.00 | 25,000,000.00 |
| **ශුද්ධ රාජ්‍ය දායකය** | **278,694,719.12** | **274,328,481.60** |

**10** **පවරාදෙන ලද වත්කම්වල වටිනාකම**

| | | |
|---|---|---|
| 1969 ට පෙර කා.සං.ම. | 4,403,441.00 | 4,403,441.00 |
| කාර්මික ජනපද සංස්ථාව | 9,043,619.85 | 9,043,619.85 |
| | 13,447,060.85 | 13,447,060.85 |

**11** **අනෙකුත් රජයේ ප්‍රදාන**

| | 2014 | 2013 |
|---|---|---|
| එ.ජා.සං.වැ. වෙතින් ලැබුණු ප්‍රදාන | 1,010,000.00 | 2,020,000.00 |
| මැටි සැකසුම් යන්ත්‍ර ප්‍රදාන | 58,500.00 | 87,750.00 |
| සෙස් අරමුදල | 10,500,000.00 | 10,500,000.00 |
| Sirap අරමුදල - ගොඩනැගිලි | 27,232,449.43 | 27,930,717.36 |
| Srap අරමුදල - යන්ත්‍රසූත්‍ර | 458,850.00 | 917,700.00 |
| අමාත්‍යාංශ අරමුදල් අච්චුවේලි | 17,407,084.09 | 16,691,560.48 |
| අමාත්‍යාංශ අරමුදල් කාර්මික ජනපද | 59,266,860.33 | 7,899,604.05 |
| ලෝහ නොවන | 10,000,000.00 | 10,000,000.00 |
| **අනෙකුත් රාජ්‍ය ප්‍රදාන** | **125,933,743.85** | **76,047,331.89** |

**12** **විශේෂ ව්‍යාපෘති සඳහා ප්‍රදාන**

| | 2014 | 2013 |
|---|---|---|
| සුනාමි | 1,540,899.30 | 1,540,899.30 |
| ග්‍රාම සංවර්ධන ව්‍යාපෘති | 49,260,117.77 | 36,022,280.24 |
| කිතුල් සංවර්ධන ව්‍යාපෘතිය | 1,253,681.86 | |
| අමාත්‍යාංශ අරමුදල් දිවිනැගුම | 6,699,960.27 | 6,674,059.37 |
| දිවිනැගුම ව්‍යාපෘතිය | | - |
| **විශේෂ ව්‍යාපෘති සඳහා ප්‍රදාන** | **58,754,659.20** | **44,237,238.91** |
| **අඩුකළා** | | |
| පොදු සේවා මධ්‍යස්ථාන ඉදිකිරීම - ගම්මාන | | - |
| සේවා මධ්‍යස්ථානය සහ බෙදාහැරීම සඳහා තොගයේ ඇති භාණ්ඩ | 11,097,018.86 | - |
| බෙදාහරින ලද සුනාමි තොග | | - |
| Casper ව්‍යාපෘතිය - අමාත්‍යාංශය | 10,898,903.77 | 9,925,433.65 |
| දිවිනැගුම ව්‍යාපෘතිය - ගෘහ කර්මාන්ත | 4,077,041.53 | - |
| **විශේෂ ව්‍යාපෘති සඳහා වියදම්** | **26,072,964.16** | 9,925,433.65 |
| **විශේෂ ව්‍යාපෘති සඳහා ප්‍රදාන** | **32,681,695.04** | **34,311,805.26** |

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

## 13 සමුච්චිත හිගය

| | 2014 | 2013 |
|---|---|---|
| 2014.01.01 දිනට රජයේ පුනරාවර්තන ප්‍රදාන | 1,930,291,117.0 | 1,930,291,117.0 |
| වර්ෂයට සාපේක්ෂව ආදායම වැඩි වියදම අඩු කිරීම | (2,146,388,662.66) | (2,012,883,987.0) |
| පෙර වර්ෂයේ ගැළපීම් | (9,826,030.0) | (38,455,931.3) |
| වර්ෂය තුළ ලැබුණු රජයේ පුනරාවර්තන ප්‍රදාන | | 231,000,000.0 |
| ඉදිරියට ගෙනා හිගය | 19,530,771.4 | (326,048,744.4) |
| | (2,136,683,921.3) | (2,146,388,662.7) |
| **වර්ෂය සඳහා අතිරික්තය/හිගය එකතුකළා/අඩුකළා** | **(206,392,804.3)** | **(216,097,545.7)** |

## 14 රජයට ගෙවියයුතු

| | | |
|---|---|---|
| Commissioner of Inland Revenue | - | - |

| | 2014 | 2013 |
|---|---|---|
| දේශීය ආදායම් කොමසාරිස් | 28,879.00 | 28,879.00 |
| මුද්දර ගාස්තු - දේශීය ආදායම් කොමසාරිස් | 40,800.00 | 37,725.00 |
| **රජයට ගෙවිය යුතු** | **69,679.00** | **66,604.00** |

## 15 මණ්ඩල සහ සංස්ථාවලට ගෙවිය යුතු

| | 2014 | 2013 |
|---|---|---|
| ශ්‍රී ලංකා මහ බැංකුව - සේ.අ.අ.. | 3,218,069.31 | 3,301,455.73 |
| සේවානියුක්තීන්ගේ භාර අරමුදල | 438,827.63 | 451,434.68 |
| **මණ්ඩල සහ සංස්ථාවලට ගෙවිය යුතු** | **3,656,896.94** | **3,752,890.41** |

**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)**

## 16 වෙළඳ සහ අනෙකුත් ණයහිමියෝ, වෙන්කිරීම් සහ උපචිත වියදම්

| | 2014 | 2013 |
|---|---|---|
| ලුණුවිල ජනපදය තැන්පතු | 1,458,834.50 | 1,458,834.50 |
| සේවක පරිත්‍යාග | 8,695.08 | 8,695.08 |
| | | |
| ජාතිය ගොඩනැගීමේ බද්ද 3% | 1,640,769.09 | 1,705,112.27 |
| මුද්දර ගාස්තු | - | - |
| ගෙවිය යුතු කාර්යමණ්ඩල අවකරණ | 178,527.42 | 31,335.97 |
| | | |
| ගෙවියයුතු උපයන විට බද්දු | 25,778.33 | 16,960.58 |
| විවිධ ණයහිමියෝ | 3,072,949.13 | 3,357,487.60 |
| විවිධ ණයහිමියෝ - ප්‍රධාන කාර්යාලය | 6,162,741.22 | 5,562,741.22 |
| විවිධ ණයහිමියෝ - ලෝහ නොවන | 2,948,762.29 | 1,001,108.32 |
| EDB ගම්මානය | - | 813,500.71 |
| ගෙවියු යුතු වැටුප් | 1,991.00 | 1,991.00 |
| ලක්නිපැයුම් අලෙවි සහ ප්‍රදර්ශන මධ්‍යස්ථාන - ණය හිමියෝ | 74,897.50 | 83,897.50 |
| කාර්යය මත අත්තිකාරම් | 4,817,454.89 | 2,144,799.40 |
| ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු | 937,238.85 | 937,238.85 |
| ආරක්ෂක තැන්පතු | 218,267.31 | 207,650.53 |
| **ආපසු ගෙවිය යුතු තැන්පතු** | 33,858,338.12 | 31,635,853.56 |
| බෞද්ධ සංගමය පාලන ගිණුම - ප්‍රධාන කාර්යාලය | 4,140.20 | 3,300.20 |
| සුභසාධක සංගමය පාලන ගිණුම | - | 193,883.00 |
| සකසුරුවම් සමිතිය පාලන ගිණුම | 36,510.00 | 40,970.00 |
| අනෙකුත් දෙපාර්තමේන්තු පාලන ගිණුම | 44,638.62 | 44,510.56 |
| ගෙවිය යුතු ශත පාලන ගිණුම - ප්‍රධාන කාර්යාලය | 2,353.67 | 2,048.98 |
| වෘත්තීය සමිති පාලන ගිණුම | 4,528.50 | 3,878.50 |
| රක්ෂණ පාලන ගිණුම | 709,462.03 | 398,385.79 |
| ගණුදෙනුකරුවන්ට වැඩිපුර ගෙවීම් | 627,948.27 | - |
| වෛද්‍ය යෝජනාක්‍රමය | 2,368,791.37 | 3,564,691.37 |
| කම්කරු නඩු සඳහා වෙන්කිරීම් | 4,406,388.54 | 4,406,388.54 |
| උප කොන්ත්‍රාත් කෘෂි උපකරණ | 2,583,296.80 | 1,864,778.40 |
| උපචිත වියදම් | 89,291,388.51 | 80,949,809.12 |
| ලක්කම් ණය හිමියෝ | - | - |
| Slindex ප්‍රදර්ශනය 2013 | - | 1,696,949.00 |
| **වෙළඳ සහ අනෙකුත් ණයහිමියෝ, වෙන්කිරීම් සහ උපචිත වියදම්** | **155,484,691.24** | **142,136,800.55** |

# ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

## මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

### 17 2014.12.31දිනට දේපළ, පිරියත සහ උපකරණ

| | ඉඩම් | ඉඩම් සංවර්ධන | ගොඩනැගිලි | පිරියත, යන්ත්‍රසූත්‍ර සහ උපකරණ සවිකිරීම් | මුද්‍රණ යන්ත්‍ර | JICA ව්‍යාපෘති වත්කම් | කාර්යාල උපකරණ | විද්‍යාගාර උපකරණ | ගමන් මලු |
|---|---|---|---|---|---|---|---|---|---|
| **2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය** | | | | | | | | | |
| ආරම්භක ශුද්ධ පොත් වටිනාකම | 3,020,951 | 48,465,444 | 105,588,638 | 19,479,139 | 449,165 | 302,117 | 9,276,397 | 437,777 | 38,899 |
| කාල පරිච්ඡේදය තුළ එකතුකිරීම් | 3,564,311 | 3,120,350 | 21,002,711 | 2,216,172 | | | 2,201,244 | 6,070 | 29,000 |
| ගැලපීම් | | (26,240) | 44,108 | | | | | | |
| ක්ෂයකිරීම් ගාස්තු (සටහන 8) | | (1,410,559) | (4,011,702) | (4,193,823) | (516,155) | (151,060) | (1,916,951) | (95,870) | (28,989) |
| ගැලපීම් | | (31,765) | (308,851) | (175,000) | 175,000 | | | | |
| **ශුද්ධ පොත් අවසන් වටිනාකම්** | 6,585,262 | 50,117,230 | 122,314,905 | 17,501,488 | (66,990) | 151,058 | 9,560,690 | 347,978 | 38,910 |
| **2013 දෙස්මබර් 31 දිනට** | | | | | | | | | |
| පිරිවැය | 6,585,262 | 58,511,708 | 184,155,415 | 110,695,526 | 7,612,955 | 228,842,382 | 37,894,399 | 8,839,398 | 1,216,005 |
| සමුච්චිත ක්ෂය | | (8,394,477) | (61,840,510) | (94,944,038) | (5,929,945) | (228,691,324) | (28,333,709) | (8,491,420) | (1,177,095) |
| **ශුද්ධ පොත් මුළු ගණන** | 6,585,262 | 50,117,230 | 122,314,905 | 15,751,488 | 1,683,010 | 151,058 | 9,560,690 | 347,978 | 38,910 |
| **2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය** | | | | | | | | | |
| ආරම්භක ශුද්ධ පොත් වටිනාකම | 6,585,262 | 50,117,230 | 122,314,905 | 15,751,488 | 1,683,010 | 151,058 | 9,560,690 | 347,978 | 38,910 |
| කාල පරිච්ඡේදය තුළ එකතුකිරීම් | - | 20,113,799 | 606,208 | 168,000 | - | - | 1,303,151 | 7,500 | 18,800 |
| ගැලපීම් | | | 4,617,973 | 416,650 | | | (76,160) | | |
| ගැලපීම් | (6,585,262) | (44,324,713) | 60,172,804 | | | | | | |
| ක්ෂයකිරීම් ගාස්තු (සටහන 8) | | (1,485,667) | (4,183,776) | (3,644,365) | (335,536) | (151,061) | (2,003,434) | (96,194) | (20,616) |
| ගැලපීම් | | (852,995) | (87,505,054) | (333,320) | | | | | |
| ගැලපීම් | | (3,770,741) | (4,272,458) | | | | | | |
| ප්‍රත්‍යාගණන අගය | 676,552,750 | | 311,884,530 | | | | | | |
| **අවසාන ශුද්ධ පොත් මුළු ගණන** | 676,552,750 | 19,796,913 | 403,635,131 | 12,358,453 | 1,347,474 | (3) | 8,784,248 | 259,283 | 37,094 |
| **2014 දෙස්මබර් 31දිනට** | | | | | | | | | |
| පිරිවැය | | 23,567,654 | 129,706,335 | 111,280,176 | 7,612,955 | 228,842,382 | 39,197,550 | 8,846,898 | 1,234,805 |
| ප්‍රත්‍යාගණනය | 676,552,750 | | 311,884,530 | | | | | | |
| ගැලපීම් | | | | | | | (76,160) | | |
| සමුච්චිත ක්ෂය | | (3,770,741) | (37,955,734) | (98,921,723) | (6,265,481) | (228,842,385) | (30,337,142) | (8,587,615) | (1,197,711) |
| **ශුද්ධ පොත් මුළු ගණන** | 676,552,750 | 19,796,913 | 403,635,131 | 12,358,453 | 1,347,474 | (3) | 8,784,248 | 259,283 | 37,094 |

| ලිබඩු සහ සවිකිරීම් | බයිසිකල් පිරිවැය | උපකරණ සහ අමතර කොටස් | පුස්තකාල පොත් | PABX සේවා | උපයෝජ්‍ය සේවා | විවිධ | පරිගණක සහ සංනිවේදන උපකරණ | පරිගණක මෘදුකාංග | මෝටර් වාහන | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 5,479,058 | 40,264 | 68,534 | 369,280 | 1,571,524 | 2,063,460 | 2,427,029 | 7,754,163 | | 20,180,834 | 227,012,672 |
| 1,569,909 | 38,393 | 305,759 | 524,039 | 1,860 | | 1,469,195 | 7,338,368 | | | 43,387,381 |
| | | | (166,438) | | | | (987,850) | 987,850 | 165,239 | 16,670 |
| (1,048,869) | (8,246) | (56,367) | (230,509) | (268,947) | (358,202) | (459,491) | (2,998,033) | (141,121) | (7,768,493) | (25,663,385) |
| | | | | | | | | (846,729) | (359,849) | (1,547,194) |
| 6,000,098 | 70,411 | 317,926 | 496,373 | 1,304,436 | 1,705,259 | 3,436,733 | 11,106,648 | (0) | 12,217,731 | 243,206,145 |
| | | | | | | | | | | |
| 14,556,563 | 198,838 | 10,530,926 | 10,094,277 | 4,203,111 | 15,864,011 | 10,375,773 | 45,773,077 | 987,850 | 47,520,298 | 804,457,772 |
| (8,556,465) | (128,427) | (10,213,000) | (9,597,904) | (2,898,675) | (14,158,752) | (6,939,040) | (34,666,429) | (987,850) | (35,302,567) | (561,251,628) |
| 6,000,098 | 70,411 | 317,926 | 496,373 | 1,304,436 | 1,705,259 | 3,436,733 | 11,106,648 | (0) | 12,217,731 | 243,206,145 |
| | | | | | | | | | | |
| 6,000,098 | 70,411 | 317,926 | 496,373 | 1,304,436 | 1,705,259 | 3,436,733 | 11,106,648 | (0) | 12,217,731 | 243,206,145 |
| - | - | - | 308,266 | 11,620 | - | 590,781 | 2,655,615 | - | | 25,783,741 |
| | | | 1,625,075 | | | (6,845,707) | (7,350) | | (5,954,570) | (6,224,089) |
| | | | | | | | | | | 9,262,829 |
| (1,094,915) | (10,308) | (98,130) | (233,599) | (269,934) | (340,464) | (581,337) | (3,958,081) | | (6,059,328) | (24,566,743) |
| | | | (500,884) | | | 5,143,203 | (526) | | | (84,049,576) |
| | | | | | | | | | (203,834) | (8,247,033) |
| | | | | | | | | | 39,550,000 | 1,027,987,280 |
| 4,905,182 | 60,103 | 219,796 | 1,695,231 | 1,046,122 | 1,364,795 | 1,743,674 | 9,796,306 | (0) | 39,550,000 | 1,183,152,553 |
| | | | | | | | | | | 1,183,544,408 |
| 14,556,563 | 198,838 | 10,530,926 | 10,402,543 | 4,214,731 | 15,864,011 | 10,966,554 | 48,428,692 | 987,850 | 1,295,433 | 667,734,897 |
| | | | | | | | | | 39,550,000 | 1,027,987,280 |
| | | | 1,124,191 | | | (1,702,503) | (7,876) | | | (662,349) |
| (9,651,381) | (138,734) | (10,311,130) | (9,831,503) | (3,168,609) | (14,499,217) | (7,520,377) | (38,624,510) | (987,850) | (1,295,433) | (511,907,274) |
| 4,905,182 | 60,103 | 219,796 | 1,695,231 | 1,046,122 | 1,364,795 | 1,743,674 | 9,796,306 | (0) | 39,550,000 | 1,183,152,555 |

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

## 18 තොග සහ කෙරෙමින් පවතින වැඩ

| | 2014 | 2013 |
|---|---|---|
| ඉංජිනේරු අමුද්‍රව්‍ය - (ප්‍රධාන කාර්යාලය) | 1,073,493.93 | 1,200,810.9 |
| මුද්‍රණ අමුද්‍රව්‍ය | 145,223.00 | 189,099.5 |
| ලිපිද්‍රව්‍ය | 2,007,499.07 | 1,240,182.7 |
| වෙනත් අමුද්‍රව්‍ය | 1,865,500.35 | 2,392,674.2 |
| ග්‍රාම සංවර්ධන ව්‍යාපෘතියේ තොග | 6,502,888.49 | 11,829,995.4 |
| උප ගබඩාව - වාත්තු වැඩපොළ | 3,106,775.85 | 2,655,998.0 |
| උප ගබඩාව - රබර් | 6,006,948.71 | 5,490,227.2 |
| උප ගබඩාව - සම් | 226,026.10 | 193,100.3 |
| උප ගබඩාව - පො.සේ.ම.- මාතර | 122,984.45 | 297,835.5 |
| උප ගබඩාව - විද්‍යුත් ලෝහාලේපන මධ්‍යස්ථානය | 978,879.62 | 1,097,908.7 |
| උප ගබඩාව - යෝ.තා.ප.සං.ම. පන්නල | 897,722.49 | 833,289.3 |
| උප ගබඩාව - දිවිනැගුම | 138,554.81 | 4,072,171.5 |
| උප ගබඩාව - කිතුල් සංවර්ධන වැඩසටහන | 5,221,931.50 | 2,511,625.0 |
| පිත්තල මධ්‍යස්ථානය - පිළිමතලාව | 318,612.44 | 312,283.5 |
| කෙරෙමින් පවතින වැඩ - සෘජු ද්‍රව්‍ය (ප්‍රධාන කාර්යාලය) | 605,280.74 | 522,906.9 |
| කෙරෙමින් පවතින වැඩ - සෘජු ශ්‍රමය | 192,356.79 | 246,181.7 |
| කෙරෙමින් පවතින වැඩ - සාමාන්‍ය පොදුකාකර්ය | 123,500.47 | 142,339.1 |
| කෙරෙමින් පවතින වැඩ - කර්මාන්තශාලා පොදුකාර්ය | 69,915.00 | 81,171.3 |
| යකඩ නොවන ලෝහ අබලි | 4,303,512.78 | 5,222,037.0 |
| චංචල නොවන තොග හානිකරණය සඳහා වෙන්කිරීම් | (1,584,235.53) | (1,584,235.5) |
| කල් ඉකුත්වූ තොග හානිකරණය සඳහා වෙන්කිරීම් | (1,464,320.70) | (1,464,320.7) |
| **තොග** | **30,859,050.36** | **37,483,281.53** |

## 19 ණයගැතියෝ

| | 2014 | 2013 |
|---|---|---|
| විවිධ ණයගැතියෝ - ප්‍රධාන කාර්යාලය | 264,713.38 | 264,713.38 |
| විවිධ ණයගැතියෝ - සම් | 18,269.68 | 282,002.84 |
| විවිධ ණයගැතියෝ - සම් විතාරන්දෙනිය | - | 140,004.79 |
| විවිධ ණයගැතියෝ - ඉංජිනේරු | 599,611.30 | 599,603.30 |
| විවිධ ණයගැතියෝ - ඉංජිනේරු - වැඩපොළ) | 20,218,991.37 | 16,211,124.03 |
| විවිධ ණයගැතියෝ - රබර් අංශය | 1,217,200.91 | 1,203,292.95 |
| විවිධ ණයගැතියෝ - යෝ.තා.ප.සං.ම. පන්නල | 1,388,714.75 | 1,739,464.75 |
| විවිධ ණයගැතියෝ - විද්‍යුත් ලෝහාලේපන මධ්‍යස්ථානය | 53,794.82 | 46,084.42 |
| විවිධ ණයගැතියෝ - මුද්‍රණ | 374,061.45 | 374,061.45 |
| විවිධ ණයගැතියෝ - විදුලි | 701,825.80 | 701,825.80 |
| විවිධ ණයගැතියෝ - වාත්තු වැඩපොළ | 4,399,364.71 | 5,722,574.91 |
| විවිධ ණයගැතියෝ - සිවිල් | 2,155,802.72 | 2,167,226.72 |
| විවිධ ණයගැතියෝ - ලක්නිපැයුම් | 42,120.00 | 42,120.00 |
| විවිධ ණයගැතියෝ - පො.සේ.ම. - මාතර | 60,317.07 | 331,192.09 |
| විවිධ ණයගැතියෝ - පො.සේ.ම. අ'පුර | 15,024.50 | 15,024.50 |
| ණයගැතියෝ - ආපසු එවූ චෙක්පත් | 209,397.62 | 209,397.62 |
| බදුකරු ණයගැතියෝ | 33,028,715.06 | 31,864,580.47 |
| විවිධ ණයගැතියෝ | 406,706.93 | 406,706.93 |
| ලක්කම් අලෙවි මධ්‍යස්ථානය | - | - |
| ලෝහ නොවන ණයගැතියෝ - ගම | - | - |
| ලෝහ නොවන ණයගැතියෝ - යුගදැක්ම | - | - |
| | 65,154,632.07 | 62,321,000.95 |
| වෙන්කිරීම් | 36,909,013.44 | 37,238,091.57 |
| **වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ** | 28,245,618.63 | 25,082,909.38 |

### 20 තැන්පතු සහ පෙරගෙවුම්

| | 2014 | 2013 |
|---|---|---|
| ආරක්ෂක තැන්පතු | 218,267.31 | 207,650.53 |
| පෙර ගෙවීම් | 29,991,069.97 | 32,690,572.44 |
| පෙර ගෙවීම් හානිකරණය සඳහා වෙන්කිරීම් | (7,226,318.71) | (7,226,318.71) |
| පෙර ගෙවීම් අත්තිකාරම් - (ප්‍රධාන කාර්යාලය) | 192,205.99 | 192,205.99 |
| කාර්ය මණ්ඩලය සඳහා අත්තිකාරම් - ප්‍රධාන කාර්යාලය | 1,024,062.08 | 735,791.58 |
| පෙර ගෙවීම් අත්තිකාරම් හානිකරණය සඳහා වෙන්කිරීම් | (560,073.22) | (560,073.22) |
| කාර්යමණ්ඩලය සඳහා ඉන්ධන අත්තිකාරම් - (ප්‍රධාන කාර්යාලය) | 269,862.00 | 238,492.00 |
| පෙර ගෙවීම් අත්තිකාරම් හානිකරණය සඳහා වෙන්කිරීම් | (235,612.00) | (235,612.00) |
| ගමන්වියදම් අත්තිකාරම් | 6,000.00 | |
| ලැබිය යුතු වෙනත් තැන්පතු | 3,004,925.85 | 2,499,437.85 |
| කලින් ගෙවූ කාර්ය මණ්ඩල පිරිවැය (IFRs ගැලපීම්) | 37,226,305.13 | 35,995,758.00 |
| ගමන්වියදම් අත්තිකාරම් (විදේශීය) | 190,620.00 | |
| ලැබිය යුතු වෙනත් තැන්පතු | **64,101,314.40** | **64,537,904.46** |

### 21 අනෙකුත් ජංගම වත්කම්

| | 2014 | 2013 |
|---|---|---|
| උත්සව අත්තිකාරම් | 617,300.00 | 629,800.0 |
| යතුරුපැදි ණය | 1,261,045.50 | 2,042,679.5 |
| බයිසිකල් අත්තිකාරම් | 281,104.00 | 217,204.0 |
| ආපදා ණය | 37,739,859.31 | 37,466,720.5 |
| අඩුකළා - ප්‍රමාදවූ කාර්ය මණ්ඩල පිරිවැය | (37,226,305.13) | (35,995,758.0) |
| විශේෂ අත්තිකාරම් පොත | 11,900.00 | 14,900.0 |
| අනෙකුත් දෙපාර්තමේන්තුවලින් ලැබිය යුතු | 421,933.12 | 421,933.1 |
| මැතිවරණ කොමසාරිස්ගෙන් ලැබිය යුතු | | 47,709.4 |
| උප කොන්ත්‍රාත් හුවමාරු | 837,417.55 | 837,417.6 |
| ශිල්ප 2004 ප්‍රදර්ශනය | | 1,556,352.3 |
| හැකියා සංවර්ධන | 1,227,380.65 | |
| රඳවාගැනීම් බද්ද | 1,679,833.75 | 1,679,833.8 |
| භාණ්ඩ හා සේවා බද්ද ( G S T ) | 1,424,653.54 | 1,424,653.5 |
| ලැබිය යුතු වැට් | 16,843,916.78 | 17,168,660.2 |
| හම්බන්තොට ගම සඳහා අයවිය යුතු මුදල් | 2,020,949.28 | |
| ලෝහ නොවන - වැට් | 10,741,854.24 | 10,741,854.2 |
| විදේශීය සංචාර - දේශීය | | 190,620.0 |
| අවිනිශ්චිත ගිණුම | 6,524.21 | 6,525.0 |
| කිතුල් - අලෙවිකරණ | 281,674.86 | 281,674.9 |
| ලෝහ නොවන පාලන ගිණුම | 742,660.83 | 742,660.8 |
| ලක්කම් ණයහිමියෝ | 21,902.22 | 483,977.9 |
| ආර්ථික සේවා ගාස්තු | 170,872.00 | 170,872.0 |
| **අනෙකුත් ජංගම වත්කම්** | 39,106,476.71 | 40,130,290.59 |

## 22 මුදල් සහ බැංකු ශේෂ

| ගිණුම් කේතය | | ගිණුම් අංකය | 2014 | 2013 |
|---|---|---|---|---|
| | බැංකු ගිණුම - ලක්නිපැයුම් - පොළොන්නරුව | | 11,604.98 | 11,605.0 |
| 185065 | දිවිනැගුම ව්‍යාපෘතිය - ගෘහ කර්මාන්ත | 71889197 | 7,378.58 | (822,741.7) |
| 185200 | ජංගම ගිණුම - IRDP - මාතර | 00022667-9 | 2,075.74 | 2,075.7 |
| 185080 | ජංගම ගිණුම - උප කොන්ත්‍රාත් - අලෙවිකරණ | 683133 | 42,050.47 | 1,250,633.8 |
| | ජංගම ගිණුම - මොණරාගල | | | 17,005.5 |
| 185040 | ජංගම ගිණුම - ආපදා ණය | 683218 | 2,393,125.39 | 54,037.9 |
| 185010 | ජංගම ගිණුම - ඉඩම - මොරටුව | 682974 | (1,784,410.97) | (1,435,168.0) |
| 185110 | ජංගම ගිණුම - පැලියගොඩ - RPD&SC | 4064199 | 3,080,994.73 | 780,287.2 |
| 185020 | ජංගම ගිණුම - ප්‍රාග්ධන ප්‍රදාන බැංකු ගිණුම | 683231 | 3,971,481.05 | 1,462,026.7 |
| 185030 | බැංකු ශේෂය - ඉංජිනේරු අංශය | 683144 | 2,463,634.84 | 5,524,730.9 |
| 185050 | බැංකු ශේෂය - REAP | 1118722801 | 15,697.17 | 28,197.2 |
| 185180 | බැංකු ශේෂය - ග්‍රාම සංවර්ධන ව්‍යාපෘතිය | 4204245 | 2,252,444.86 | (62,374.3) |
| 185070 | බැංකු ශේෂය - ලෝහ නොවන | 682519 | 5,259,164.95 | 49,566.9 |
| 185060 | බැංකු ශේෂය - ප්‍රාදේශීය අංශය (කිතුල්) | 683237 | 522,914.70 | 534,364.9 |
| 185412 | ලංකා බැංකුව - "ඉඩම" අබලි ව්‍යාපෘතිය ඉතිරිකිරීමේ ගිණු | 7271240 | 172,848.62 | 166,084.2 |
| 185090 | ජංගම ගිණුම - මහජන බැංකුව | 100153657035 | 10,000.00 | 10,000.0 |
| 185415 | ජංගම ගිණුම - ලක්කම් අලෙවි මධ්‍යස්ථානය | 7153282 | 813,051.81 | 437,277.1 |
| 185015 | ජංගම ගිණුම - නිදහස්කරන ලද හර බද්ද | 70034730 | 1,023,358.76 | (431,544.2) |
| 185125 | දිස්ත්‍රික් කාර්යාලය - බැංකු ගිණුම (ප්‍රාදේශීය) | 74791255 | 1,911,023.49 | (819,678.7) |
| 185411 | ස්ථාවර තැන්පත් ගිණුම - ලංකා බැංකුව - ඉඩම | | 30,999.99 | 28,125.0 |
| 185410 | ස්ථාවර තැන්පත් ගිණුම - මහජන බැංකුව | 00006807-0 | 10,505,958.71 | - |
| 185413 | ඉතුරුම් ගිණුම - CESS අරමුදල | 9123868 | 11,114,908.75 | 10,854,502.9 |
| 185025 | ඉතුරුම් ගිණුම - ප්‍රාග්ධන අරමුදල් | 71648764 | 3,265,242.49 | 1,698,351.2 |
| 185135 | ඉතුරුම් ගිණුම - ජනපද තැන්පතු | 71582414 | 8,351,059.66 | 10,512,599.01 |
| | අග්‍රිම ගිණුම | | 42,116.90 | 10,385.10 |
| | විශේෂ අග්‍රිම - අයකැමි | | 23,378.54 | 23,378.54 |
| | මාර්ගස්ථ මුදල් | | 24,690.10 | 24,690.10 |
| | මාර්ගස්ථ මුදල් - ලෝහ අබලි ව්‍යාපෘතිය | | 12,540.00 | 12,540.00 |
| | **මුදල් සහ මුදල් හා සමාන දෑ** | | **55,539,334.31** | **29,920,957.73** |
| | **ස්ථාවර තැන්පතු** | | 10,536,958.70 | 28,124.99 |
| | **හර ශේෂ** | | 46,786,786.58 | 33,464,339.66 |
| | **ණය ශේෂ** | | (1,784,410.97) | (3,571,506.9) |
| | **මුදල් සහ මුදල් හා සමාන දෑ** | | **55,539,334.31** | **29,920,957.7** |

## 23 විශ්‍රාම ප්‍රතිලාභ බැදීම්

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි හඳුනාගන්නා ලද වටිනාකම් පහත සඳහන් පරිදි තීරණය කරනු ලැබේ:

| | 2014 | 2013 |
|---|---|---|
| අරමුදල් සපයා නොමැති බැදීම්වල වර්තමාන වටිනාකම | 100,395,507.96 | 115,063,782.5 |
| **මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි වගකීම** | **100,395,507.96** | **115,063,782.5** |

වර්ෂය තුළ නිර්වචිත ප්‍රතිලාභ බැදීම්වල චලනය පහත සඳහන් පරිදි වේ:

| | 2014 | 2013 |
|---|---|---|
| ජනවාරි 01 වැනි දිනට | 115,063,782.36 | 102,883,736.8 |
| වර්තමාන සේවා පිරිවැය | 6,627,285.00 | 4,511,322.5 |
| පොළී පිරිවැය | 6,950,372.28 | 12,142,615.9 |
| පශ්චාත් සේවා ප්‍රතිලාභ බැදීම් මත ආයුගණක පාඩුව / (ලාභය) | (19,111,459.68) | 10,320,017.1 |
| ගෙවූ ප්‍රතිලාභ | (9,134,472.00) | (14,793,910.0) |
| **මාර්තු 31 දිනට** | **100,395,507.96** | **115,063,782.4** |

භාවිතා කරන ලද මූලික ආයුගණක උපකල්පන පහත සඳහන් පරිදි වේ:

| | 2014 | 2013 |
|---|---|---|
| වට්ටම් අනුපාතය | | |
| අනාගත වැටුප් වැඩිවීම් | 5% | 10% |
| කාර්යමණ්ඩල පිරිවැටුම් අනුපාත | 7% | 13% |
| විශ්‍රාම ගැනීමේ වයස | 60 | 60 |

## 24 කාණ්ඩ අනුව මූල්‍ය උපකරණ

| | ණය සහ අයවීමට ඇති මුදල් 2014 | 2013 |
|---|---|---|
| **මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව වත්කම්** | | |
| පෙර ගෙවීම් හැර වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ | 67,352,095.34 | 65,213,199.97 |
| මුදල් සහ මුදල් හා සමාන දෑ | 46,786,786.58 | 33,464,339.66 |
| **එකතුව** | 114,138,881.92 | 98,677,539.63 |

ක්‍රමක්ෂය කළ පිරිවැයට අනෙකුත් මූල්‍ය වගකීම්

| | 2014 | 2013 |
|---|---|---|
| **මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව වගකීම්** | | |
| මූල්‍ය නොවනවගකීම් හැර වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ | 219,750,337.35 | 193,765,040.79 |
| **එකතුව** | **219,750,337.35** | **193,765,040.79** |

## 25 මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිතවූ මුදල්

බදු ගෙවීමට පෙර ලාභය මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිතවූ මුදල්වලට සැසඳීම:

| | 2014 | 2013 |
|---|---|---|
| බදු ගෙවීමට පෙර අලාභය | 419,311.73 | (84,728,727.23) |
| **ගැළපීම්:** | | |
| ක්ෂයවීම | 24,566,742.89 | 25,663,384.96 |
| ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය | (34,796,128.99) | (26,985,076.82) |
| ස්තාවර වත්කම් විකිණීම | (3,230,102.00) | (10,320,017.14) |
| මූල්‍ය පිරිවැය | 328,191.99 | 405,179.95 |
| කාරක ප්‍රාග්ධනයෙහි වෙනස්වීම් | | |
| - තොග | 6,624,231.17 | (4,165,279.84) |
| - වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ | (17,849,835.82) | 12,553,890.82 |
| - වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ | 27,772,392.51 | 90,830,070.71 |
| විශ්‍රාම ප්‍රතිලාභ බැදීම් | (5,533,802.40) | 26,973,955.53 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත මුදල්** | **(1,698,998.92)** | **30,227,380.94** |

# මණ්ඩලයේ අදහස් දැක්වීම පිණිස

# විගණකාධිපතිවරයාගේ වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } එල්එස්/එච්/අයිඩීබී/1/14/21 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2015 ඔක්තෝබර් 29 දින

සභාපති,
ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

**ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය,ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1969 අංක 36 දරන කාර්මික සංවර්ධන පනතේ 38 (1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධි විධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් මණ්ඩලයේ සභාපති වෙත 2015 මැයි 11 දින නිකුත් කරන ලදී.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට(ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, .- இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ.තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වන වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2 මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව කටයුතු නොකළ අවස්ථා පහත දැක්වේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 02 ප්‍රකාරව අවසන් තොගවල වටිනාකම පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන අගයන්ගෙන් වඩා අඩු අගයට මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති බව අනාවරණය කර තිබුණද වර්ෂය අවසාන දිනට රු.30,859,050 ක්වූ තොගය පිරිවැය මත මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ නමුත් පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය සමඟ සැසඳුම් කළ බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක16 ප්‍රකාරව ශුද්ධ පොත් අගය රු.37,450,946 ක් වන ප්‍රමාණාත්මකව වැදගත් යන්ත්‍රසූත්‍ර, උපකරණ, ගෘහභාණ්ඩ, පරිගණක දෘඩාංග හා මෘදුකාංග සාධාරණ අගයක් පෙන්නුම් කිරීම සඳහා ප්‍රත්‍යාගණනය නොකොට තවදුරටත් ඓතිහාසික පිරිවැයටම දක්වා තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 39 ප්‍රකාරව අයනොවන ණය ශේෂ වේනම් ඒවා මූල්‍ය ප්‍රකාශණ තුල වෙන්ව නිරූපණය කළයුතු වුවද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.447,082 ක අය නොවන ණය ශේෂ සාමාන්‍ය ණය යටතේම වර්ග කර තිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුල මණ්ඩලය විසින් වාහන විකිණීමෙන් ලද මුදල වූ රු 3,230,102 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුල ආයෝජන ක්‍රියාකාරකම් යටතේ නොදක්වා මෙහෙයුම් ක්‍රියාකාරකම් ලෙස වර්ග කොට තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුල දී මණ්ඩලය විසින් විකුණන ලද වාහන වලට අදාල රු.2,333,112 ක ප්‍රත්‍යාගණිත ලාභය ප්‍රත්‍යාගණන සංචිත ගිණුමෙන් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වත්කම් හා වියදම් ලෙස හඳුනාගෙන ගිණුම් ගත නොකරන ලද රු.29,991,070 ක් කලින් ගෙවීම් ලෙස ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි.

(ඉ) මණ්ඩලයේ කාර්ය මණ්ඩල ධාරිතා වර්ධනය සඳහා වැය වූ රු. 1,841,071 ක මුදල ක්‍රමක්ෂය කරන ලද ගිණුම් පිළිවෙත මූල්‍ය ප්‍රකාශන තුල හෙළිදරව් කර නොතිබුණි.

2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

එකතුව රු.67,198,057 ක්වූ ණයගැති ශේෂ හා එකතුව රු.15,703,805 ක් වූ අබලි ද්‍රව්‍ය ණයහිමි ශේෂ තහවුරු කරගැනීමට අදාලව ශේෂ සනාථ සහතික විගණනය වෙත ඉදිරිපත් නොවීය.

2.2.4 නොසැසඳූ පාලන ගිණුම්

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන කාර්මික ජනපද වල කර්මාන්තකරුවන්ගෙන් මණ්ඩලයට අයවිය යුතු මුදල්, කාර්මික ජනපද අංශයේ වාර්තා අනුව සැසඳීමේදී රු.11,307,861 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර එම වෙනසට හේතු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2010 වර්ෂයට පෙර සිට පැවත එන නිරවුල් නොකරන ලද රු. 235,570 ක් වූ ඉන්ධන අත්තිකාරමක් නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂය තුල දී අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) ලැබිය යුතු වෙනත් තැන්පතු යටතේ දැක්වෙන රු.3,004,925 ක්වූ ජලය, විදුලිය යනාදී සේවා සලසා ගැනීමේ දී හා ගොඩනැගිලි ඉදිකිරීම් වලදී පළාත් පාලන ආයතන වෙත ගෙවන ලද තැන්පතු වටිනාකම, අදාල සේවාව සලසා ගැනීමෙන් පසුව ද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) වෙළඳ හා වෙනත් ලැබිය යුතු ගිණුම් යටතේ දැක්වෙන රු 8,419,804 ක ශේෂයක් හා රු.20,225,259 ක්වූ විවිධ ණයගැතියන් යටතේ වර්ග කර ඇති ඉංජිනේරු වැඩහල සම්බන්ධ ණයගැති ශේෂය වූ රු.4,815,862 ක ශේෂය වසර 2 සිට 5 දක්වා අයකර ගැනීමකින් තොරව පැවතුණි.

(ඈ) මණ්ඩලයේ ප්‍රධානතම ආදායම් මාර්ගය ලෙස සැලකෙන කර්මාන්තකරුවන්ට කාර්මික ජනපද වල සංවර්ධිත ඉඩම් ලබා දීම මගින් බිම් කුලී ලබාගැනීම වුව ද මූල්‍ය ප්‍රකාශන අනුව රු.33,129,822 ක මුදලක් මණ්ඩලයට අයවිය යුතුව පැවති අතර එය මුළු අයවිය යුතු ශේෂයෙන් සියයට 51 ක් වේ.

(ඉ) එකතුව රු.10,741,964 ක් වූ ලැබිය යුතු එකතුකල අගය මත බදු වට්ටිනාකම හා වෙනත් ජංගම වත්කම් යටතේ දක්වා තිබූ රු.16,307,420 ක්වූ බදු වට්ටිනාකම් තුල වසර 5ක් ඉක්මවූ ශේෂද අඩංගු වන අතර මෙම වට්ටිනාකම් නිරවුල් කර ගැනීමට මණ්ඩලය විසින් කටයුතු කර නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය රු 419,312ක අතිරික්තයක් නිරූපනය වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌණතාවය රු 84,728,727ක් වූයෙන් ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේ දී සමලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු 85,148,039 ක වැඩිවීමක් දක්නට ලැබුණි. 2006 වසරේ සිට සේවක අර්ථ සාධක අරමුදල හා භාරකාර අරමුදල සඳහා ප්‍රේෂණය කිරීමේදී ජීවන වියදම් දීමනාව සැලකිල්ලට නොගැනීම මත මණ්ඩලයට ගෙවීමට සිදු වූ දායක මුදල් හා එහි පොළිය 2013 වර්ෂයේදී ගණනය කොට ගිණුම් තබා තිබුණු අතර එම අගය රු 66,354,739 ක් විය. මේ හේතුවෙන් 2013 වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය අසාමාන්‍ය ලෙස අඩුවීමත්, සමාලෝචිත වර්ෂයේදී පෙර වර්ෂයේ නොලද රු.16,401,543ක ප්‍රදර්ශන ආදායමත් නිසා සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය යහපත් ප්‍රවනතාවක් පෙන්නුම් කිරීමට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

3.2 වියදම්වල අසාමාන්‍ය වැඩිවීම

සමාලෝචිත වර්ෂය තුලදී කුලී හා බදු,අධ්‍යක්ෂ දීමනා,සංග්‍රහ වියදම් හා ප්‍රදර්ශන වියදම් සඳහා රු 16,439,000ක් දරා තිබූ අතර එය ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සියයට 68ක වැඩිවීමක් විය.මේ සඳහා ප්‍රධාන කාර්යාලය පිහිටි පරිශ්‍රය සඳහා පළාත් පාලන ආයතනයට වසර ගණනාවක් වෙනුවෙන් ගෙවිය යුතු වරිපනම් හා බදු සඳහා රු. මිලියන 10 ක් වෙන් කිරීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්ය සාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අබලි ද්‍රව්‍ය ව්‍යාපෘතිය තුල ලියාපදිංචි කර්මාන්ත කරුවන්ගෙන් සියයට 85 ක් බස්නාහිර හා මධ්‍යම පළාත් කේන්ද්‍ර කොට සිදුවී ඇති අතර සෙසු පළාත් වලට ව්‍යාප්ත කිරීම කෙරෙහි ඵලදායි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) මණ්ඩලය විසින් සකස් කර තිබූ ක්‍රියාකාරී සැලැස්මට මුදල් අංශයේ හා පරිපාලන අංශයේ කාර්යයන් ඇතුලත්ව නොතිබූ අතර අදාල ක්‍රියාකාරකම් ඉටුකිරීම සම්බන්ධයෙන් සෘජුව වගකිව යුතු පාර්ශ්ව හෝ අංශ හඳුනාගෙන නොතිබුණි.

(ඉ) එක් එක් අංශය සම්බන්ධයෙන් වූ ක්‍රියාකාරී සැලැස්ම පිළයෙල කිරීමේදී යොදාගත් ඉලක්ක ප්‍රායෝගික නොවීම, අනාගත ඉල්ලුම් හා නව වෙළඳපළ ප්‍රවනතා හඳුනා නොගෙන සාම්ප්‍රදායිකව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීම, අදාල අංශය හා සම්බන්ධ පාලනය කල නොහැකි ආවේනික ලක්ෂණ සැලකිල්ලට නොගැනීම, සෑම දිස්ත්‍රික්කයකම පවතින පුරප්පාඩු පිළිබඳ අවධානයක් යොමු නොකිරීම, අංශයේ සිටින කාර්ය මණ්ඩලයේ ප්‍රමාණය පිළිබඳව අධ්‍යයනයක් සිදු නොකිරීම යනාදී කරුණු හේතුවෙන් නියම කරන ලද ඉලක්ක ප්‍රායෝගික නොවූ අතර ඒ හේතුවෙන් සත්‍ය ප්‍රතිඵලය අතර විචලනයේ පරාසය සියයට 10 සිට සියයට 198 තරම් වූ අතර එය ඇතැම් අංශ වල සියයට 50 සිට සියයට 241 ක දක්වා පරාසයකට විහිදී ගොස් තිබුණි.

එමෙන්ම මණ්ඩලයේ වැදගත්ම අංශය වන ඉංජිනේරු අංශය විසින් ඉටුකරන ලද ක්‍රියාකාරකම් 10ක් ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුලත් වී නොතිබුණි. තාක්ෂණික සේවා අංශයේ ඇතුලත් ක්‍රියාකාරකම් 8 කින් ඉටු වී ඇත්තේ එක් ක්‍රියාකාරකමක් පමණක් වන අතර තවත් ක්‍රියාකාරකම් 04 ක් ඉටුකළද ඒවා ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුලත්ව නොමැති බවද නිරීක්ෂණය විය.

4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

සම්භාණ්ඩ අංශය,රබර් අංශය, තාක්ෂණික සේවා අංශය හා ඉංජිනේරු අංශය යනාදී අංශ විසින් ගනුදෙනුකරුවන් වෙත සලසන සැපයුම් හා සේවා සම්බන්ධයෙන් වූ පිරිවැය ක්‍රමය යාවත්කාලීන කර නොතිබුණි.

4.3 මතභේදයට තුඩුදෙන කරුණු

තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශයට පටහැනිව මණ්ඩලය සඳහා ආරක්ෂක සේවා සැපයීමෙ කොන්ත්‍රාත්තුව මීට ප්‍රථම අසතුටුදායක සේවාවක් සපයා තිබූ ආයතනයටම රු.20,994,741 ක්වූ වටිනාකමකට නැවත ලබා දී තිබුණි.

4.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරණු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුලදී උපදේශක සේවාවක් ලබා ගැනීමකින් තොරව රු.150,000 ක මුදලක් උපදේශක සේවා වෙනුවෙන් ගෙවා තිබුණි.

(ආ) 2010 දෙසැම්බර් මාසයේ හදිසි අවශ්‍යතාවයක් ලෙස සලකා තාක්ෂණික සේවා අංශය සඳහා රු මිලියන 2.9 ක් වැය කර ඉදි කරන ලද ගොඩනැගිල්ල කිසිඳු ප්‍රයෝජනයකට ගැනීමකින් තොරව නිශ්කාර්යව පැවතුනි.

(ඇ) 2008 වර්ෂයේදී රු.මිලියන 8.2 ක් වැයකර මිලදීගෙන තිබූ ජංගම තාක්ෂණ බස් රථය භාවිතයට ගෙන නොතිබිණි.

4.5 ආර්ථික නොවූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අබලි ද්‍රව්‍ය ප්‍රවාහනය සඳහා මණ්ඩලය සතු වාහන තිබියදී කුලී රථ යොදා ගැනීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුල රු.492,855 ක අමතර වියදමක් දරා තිබුණි.

(ආ) අවශ්‍යතාවය පිළිබඳ සැලකිල්ලකින් තොර ආයතන දෙකකින් දුරකථන හා අන්තර්ජාල පහසුකම් ලබාගැනීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.1,085,250 ක් ගෙවිය යුතුව තිබූ අතර ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයෙන් අන්තර්ජාල පහසුකම් ලබාගෙන තිබියදී ඩයලොග් ආයතනයෙන්ද අන්තර්ජාල පහසුකම් ලබාගෙන ඒ සඳහා රු.283,125 ක් සමාලෝචිත වර්ෂය තුල වැයකර තිබුණි.

(ඇ) මණ්ඩය තුල නීති නිළධාරිණියක් සේවයේ නිරත ව සිටියදී නීති වියදම් සඳහා රු 158,500 ක් සමාලෝචිත වසර තුල දී දරා තිබුණි.

4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 714 ක් වූ අතර තත්‍ය කාර්ය මණ්ඩලය 500 ක් පමණක් වූයෙන් කාර්ය මණ්ඩලයේ 214 ක පුරප්පාඩු පැවතුනි. මේ අතුරින් නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හා අධ්‍යක්ෂ තනතුරු සඳහා අනුමත කාර්ය මණ්ඩලය 11 ක් වන නමුදු ඉන් 06 ක්ම පුරප්පාඩු වී පැවතුණි. එමෙන්ම මණ්ඩලයේ ප්‍රධාන අරමුණු හා මෙහෙයුම් කාර්යසාධනය කෙරෙහි සෘජුව බලපාන සංවර්ධන නිළධාරි, ජ්‍යෙෂ්ඨ ව්‍යාපාර ප්‍රවර්ධන නිළධාරී තනතුරු වලින් සියයට 67ක්ම පුරප්පාඩුව පැවතුණි.

(ආ) පුරප්පාඩු තනතුරුවල වැඩබැලීමේ පදනමින් පත්කිරීම් සිදුකර ඒ සඳහා සමාලෝචිත වර්ෂය තුල දී පමණක් රු.1,039,748 ක දීමනා ගෙවා තිබුණි.

(ඇ) කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව නොවිමසා මණ්ඩලයේ සභාපතිවරයාගේ උපදෙස් හා අනුමතිය මත මණ්ඩලීය සේවක පිරිසකගේ වැටුප් සංශෝධය කිරීමට කටයුතු කර තිබූ අතර කළමණාකරණ සේවා චක්‍රලේඛ අංක 30 මගින් දී ඇති උපදෙස්මත ශ්‍රේණිගත උසස්වීම් සඳහා ක්‍රමවේදයක් හෝ සැකසීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණු අතර නිසිවැටුප් පියවරයන් අදාල කරනොගැනීම නිසා සාවද්‍ය වැටුප් ගණනය තුලින් 2006 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා පමණක් සේවක කණ්ඩායම් දෙකක් වෙත පිළිවෙලින් රු.6,268,931 ක් හා රු,1,222,589 ක් වැඩියෙන් හා අඩුවෙන් වැටුප් ගෙවා තිබුණි.

4.7 වාහන උපයෝජනය

සමාලෝචිත වර්ෂය තුල මණ්ඩලයේ සභාපති වෙත අතිරේක වාහනයක් අනුයුක්ත කර තිබූ අතර ඒ වෙනුවෙන් රියදුරු මහතෙකු ද සේවයේ යෙදවීම හේතුවෙන් වැටුප්, අතිකාල හා ගමන් වියදම් ලෙස රු.608,076 ක් ගෙවා තිබුණි.

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජූනි 02 දිනැති අංක 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව සෑම රාජ්‍ය සංස්ථාවකටම හා සම්බන්ධ කෙටුම්පත්, වාර්ෂික වාර්තා හා ගිණුම්, මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් තුල විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවද, මණ්ඩලය විසින් 2014 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන ලද්දේ 2015 මාර්තු 18 වන දින දීය.

5.2 අභ්‍යන්තර විගණනය

මණ්ඩලය තුල අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කොට තිබෙන නමුදු අභ්‍යන්තර විගණක තනතුර වසර ගණනාවක සිට පුරප්පාඩුව පවතී. එමෙන්ම කිසියම් වසරකට අදාල අභ්‍යන්තර විගණන සැලැස්ම සෑම වසරකම ජනවාරි 15 වන දින හෝ ඊට ප්‍රථම අනුමත කර ගත යුතු වුවද එසේ කර නොතිබූ අතර අදාල විගණන විමසීම්ද නියමිත පරිදි මණ්ඩලයේ ගණන් දීමේ නිළධාරීගේ අවධානය කෙරෙහි යොමු කර නොතිබුණි.

5.3 ප්‍රසම්පාදන කටයුතු

මණ්ඩලයේ සේවකයන් සඳහා සමාලෝචිත වර්ෂය තුල දී රු.555,988 කට මිලදී ගත් සපත්තු පිරිවිතර වලට පටහැනි වන අතර ලබාදුන් සපත්තු භාවිතයට සුදුසු මට්ටමක නොපැවතුණි.

5.4 අයවැය ලේඛනමය පාලනය

ඇස්තමේන්තු ගත වියදම්, සත්‍ය වියදම් හා සැසඳීමේ දී අයිතම 12ක ඇස්තමේන්තු ගත සීමාව ඉක්මවීමේ පරාසය සියයට 117 සිට සියයට 4,022 දක්වා විය. වියදම් පාලනයේ දුර්වලතා මෙන්ම ඇස්තමේන්තු කිරීමේ දුර්වලතාද හේතු වීමෙන් අය වැය ලේඛනය, මණ්ඩලයේ ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බවද නිරීක්ෂණය විය.

5.5 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2011 වර්ෂයේ වාර්ෂික වාර්තාව 2014 නොවැම්බර් 19 දින පාර්ලිමේන්තුවේ සභාගත කර තිබූ අතර 2012 හා 2013 වර්ෂවල වාර්ෂික වාර්තා විගණන දිනය තෙක් සභාගත කර නොතිබුණි.

6. පද්ධති හා පාලනයන්

විගණනයෙදී නිරීක්ෂණය වූ පද්ධති පාලන අඩුපාඩු වරින්වර මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී.පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි අවධානය යොමු විය යුතුය.

| | |
|---|---|
| (අ) කාර්ය මණ්ඩල පරිපාලනය | කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවීමට කටයුතු නොකිරීම. |
| (ආ) ගිණුම්කරණය | ගිණුම්කරණ ප්‍රමිති වලට අනුගත නොවීම. |
| (ඇ) ක්‍රියාකාරී සැලැස්මට අනුව ප්‍රගතිය වාර්තා කිරීම | ප්‍රගතිය යාවත්කාලීනව පිළියෙළ නොකිරීම. |
| (ඈ) අය-වැය පාලනය | අය-වැය පිළියෙළ කිරීමේ දී වියදම් පිළිබඳ නිවැරදි තක්සේරුවක් නොකිරීම. |
| (ඉ) ප්‍රසම්පාදන කටයුතු | තාක්ෂණික ඇගැයීම් කමිටු නිර්දේශ නොසලකා හැරීම හා පිරිවිතර වලට පටහැනිව භාණ්ඩ මිළදී ගැනීම. |
| (ඊ) ස්ථාවර වත්කම් පාලනය | මිළදී ගැනීම,භාවිතය ලේඛණ ගත කිරීම නිසි පරිදි සිදු නොවීම. |

ඩබ්ලිව්.පී.සී වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)

615, ගාලු පාර, කටුබැද්ද, මොරටුව, ශ්‍රී ලංකා.
615, காலி வீதி, கட்டுபெத்தை, மொரட்டுவ, இலங்கை.
615, Galle Road, Katubedda, Moratuwa, Sri Lanka.
Tel : +94-11-2605394,2624846-7,2605326-7
Fax : +94-11-2607002
E-mail : info@idb.gov.lk Web : www.idb.gov.lk

# 2014

**1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (2) (C) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**
**විගණන මතය විවේචනය කිරීම සඳහා පදනම් වූ ඡේද සඳහා විසඳුම් සහ වර්තමාන තත්ත්වය.**

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 29 ට අනුව ලක්කම් අලෙවි අංශයේ ආදායම 2014 වර්ෂය සඳහා උපචිත පදනම මත ගණනය කර ජර්නල් සටහන් ඇතුලත් කරන ලදී. ( සේජ් 87959. 87760 ) 2015 ජූනි මස සිට ලක්කම් අලෙවි අංශයේ ආදායම විකුණුම් අවස්ථාවේදීම ගිණුම්ගත කිරීමට කටයුතු කරන ලදී.

( ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 19 ට අනුව ආයුගණක අගය පදනම් කරගෙන පාරිතෝෂික වෙන් කිරීම්වලට අදාල මූලික උපකල්පන වැටුප් වර්ධක වේගය සහ පොලී අනුපාතය 5% සහ 7% ලෙස ගලපා ඒ අනුව පහත පරිදි ගිණුම් ගලපන ලදී.

| | ගණනය කර ඇති අගය | උපකල්පන වෙනස්වීමට අනුව අගය | වෙනස |
|---|---|---|---|
| වර්ෂය සඳහා අය කිරීම | 6,627,285/- | 6,627,285/- | - |
| පොලිය | 13,523,439/- | 6,950,372/- | 6,573,006/- |
| 2014.12.31 දිනට ශේෂය | 100,402,173/- | 100,395,508/- | 6,665/- |
| අතිරික්තය | 25,667,861/- | 19,111,458/- | 6,566,401/- |

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 02 ට අනුව පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගය වන පිරිවැය මත තොග අගය දක්වා ඇත. උද්ධමනය නිසා මිල මට්ටම ඉහල යාම නිසා පිරිවැය අඩු අගයක් ගන්නා බැවින් ශුද්ධ උපලබ්ධි අගය යොදාගෙන නොමැත.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 ට අනුව ඉතිරි ප්‍රාග්ධන වත්කම් ප්‍රත්‍යාගණනය කිරීම සිදුකර ගෙන යන අතර 2015 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන විට මෙම කටයුතු අවසන් කර මූල්‍ය ප්‍රකාශනවලට ප්‍රත්‍යාගණන අගය ඇතුලත් කරනු ලැබේ.

(ඉ) රු.941,908,020.46 ක ප්‍රත්‍යාගණන ලාභය විස්තීර්ණ ආදායම් ප්‍රකාශය වෙත මාරු කරන ලදී. (සේජ් 88192, 88203 )

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

(අ) වර්ෂය තුල විකුණන ලද වාහන 10 ට අදාල විකුණුම් ලාභය සහ එම වාහනවල ප්‍රත්‍යාගණන අතිරික්තය ස්ථාවර වත්කම් විකිණීම යටතේ ගිණුම්ගත කර තිබූ අතර ජර්නල් සටහන් ඇතුලත් කර වාහන විකිණීමේ ලාභය හා විකුණු වාහනවල ප්‍රත්‍යාගණන අතිරික්තය වෙනම ගිණුම්ගත කරන ලදී.

(ආ) වාහන විකිණීමෙන් ලද රු.3,230,102/- මුදල් ප්‍රවාහ ප්‍රකාශන තුල ඇතුලත් කරන ලදී.

(ඇ) විකුණන ලද වාහනවල ප්‍රත්‍යාගණන අතිරික්තය ස්ථාවර වත්කම් විකුණුම් ගිණුමට මාරු කර තිබූ අතර එම රු.2,339,112/- ඉවත් කර වෙනම ගිණුම්ගත කරන ලදී. ( සේජ් 87970, 87971)

(ඈ) වාහන සම්බන්ධව සිදුකරන අලුත් වැඩියා හා එකතු කිරීම් ගිණුම්ගතවීම සම්බන්ධව නිවැරදි කිරීම් ඇතුලත් කරන ලද උපලේඛන විගණනය වෙත ඉදිරිපත් කර ඇත.

(ඉ) වාහන විකුණුම් ගිණුම්ගත කිරීමේදී වැට් බද්ද සම්බන්ධව ගිණුම්ගත කිරීමේදී සිදුව තිබූ ගිණුම්කරණ දෝෂය නිවැරදි කරන ලදී. ( සේජ් 87972, 87973 )

(ඊ) වාහන උපලේඛනය මෝටර් සයිකල් අංක සහිතව නිවැරදි කිරීම් ඇතුලත් උපලේඛන පිලියෙල කර විගණනය වෙත ඉදිරිපත් කරන ලදී.

(උ) කලින් ගෙවීම් වලට අදාල පියවීම් වවුචර්පත් ඉදිරිපත් කල හැකි සෑම අවස්ථාවකම පියවීම් කර සංශෝධිත මූල්‍ය ප්‍රකාශනවල ශේෂය රු.56,572,130.29 සිට රු.29,991,069.97 ක් දක්වා අඩුකර ඇත. පැරණි ශේෂ පරික්ෂාව සඳහා කමිටුවක් පත්කර ඇති අතර එම කමිටු නිරීක්ෂණවල ඇතුලත් පියවීම් කර නොමැති එහෙත් භාණ්ඩ හා සේවා මණ්ඩලය වෙත ලැබී අවශ්‍යතාවය ඉටුවී ඇති ගණුදෙනු අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කර අනුමැතිය ලබා අවශ්‍ය නිවැරදි කිරීම් 2015 ගිණුම්වලදී සිදුකරනු ලැබේ.

(ඌ) මූල්‍ය ප්‍රකාශනවල විවිධ වත්කම් යටතේ ඇති රු.10,966,554/- ක ශේෂය රු.4,120,847,45/- දක්වා අඩුකර නිවැරදි කිරීම් ඇතුලත් කරන ලදී.

i. විවිධ වත්කම්වල ඇතුලත් කර තිබූ මෝටර් රථ උපාංග විවිධ වත්කම් වලින් ඉවත් කර නිවැරදි කරන ලදී. විගණනය වෙත උපලේඛන ඉදිරිපත් කර ඇත.
ii. පුස්තකාල පොත්, යන්ත්‍රසූත්‍ර හා පිරියතවලට ඇතුලත් විය යුතු වත්කම් විවිධ වත්කම් වලින් ඉවත් කර නිවැරදි කරන ලදී. විගණනය වෙත උපලේඛන ඉදිරිපත් කර ඇත.

(එ) රු.21.357,137/- ක වටිනාකම ජයිකා ව්‍යාපෘතියේ වත්කම් සඳහා වන අතර මෙම වත්කම ශුන්‍ය අගයන් ගෙන තිබීම නිසා 2006 වසරේ සිට උපලේඛන ඉදිරිපත් නොකරන ලදී. 2014 වසර සඳහා නැවත උපලේඛන ඉදිරිපත් කර ඇත. ප්‍රත්‍යාගණන කර සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශණවලට ඇතුලත් කිරීමට කටයුතු කරනු ලැබේ.

(ඒ) පරිගණක හා උපාංග මිලදී ගත් වර්ෂ උපලේඛනයේ ඇතුලත් කර ඇත. 2013 වසරේ සිට වර්ෂය, මාසය, දිනය ඇතුලත් කර ඇත.

(ඔ) පරිගණක මෘදුකාංග පද්ධතිය 2004,2005 වසරවල අත්තිකාරම් ගෙවා 2007 වසරේ ස්ථාපිත කරන ලද්දකි. 2007.12.31 ලෙස දිනය දක්වා ඇත. දැනට ශුන්‍ය අගයක් ගෙන ඇති මෙම වත්කම ප්‍රත්‍යාගණනය කර සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කෙරේ.

(ඔ) ප්‍රත්‍යාගණන ගිණුම් නිවැරදිය. උපලේඛනවල තිබූ එකතු කිරීම් දෝෂය නිවැරදි කර නැවත ඉදිරිපත් කර ඇත.

(ක) 2013 වර්ෂයේ සංශෝධිත මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන මුදල් ප්‍රවාහ ප්‍රකාශය හා 2014 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන 2013 මුදල් ප්‍රවාහ ප්‍රකාශය අතර වෙනස්කම් ඇති වී ඇත්තේ ආදායම් ප්‍රකාශයට හිලව් කරන ලද ප්‍රාග්ධන ප්‍රතිපාදන ප්‍රමාණය නැවත ශුද්ධ ප්‍රතිඵලයට ගැලපූ නිසාය. එය මූල්‍ය ප්‍රකාශණවල පිටු අංක 24 හි සටහන් අංක 25 න් පෙන්වා ඇත.

2.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) නොපියවා ඇති ඉන්ධන අත්තිකාරම් 2010 ට පෙර ශේෂය 235,562.00 ක් වන අතර 2011,2012, 2013, 2014 වර්ෂවල ලබාදෙන ලද සියලුම අත්තිකාරම් පියවා ඇත. පැරණි ශේෂ නිරවුල් කිරීම සඳහා නම් කර ඇති අභ්‍යන්තර විගණක සහ ගණකාධිකාරි ඇතුළු කමිටුව සකස් කල වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කර මෙම පැරණි ශේෂ නිරවුල් කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබේ.

(ආ) ලැබිය යුතු තැන්පතු යටතේ දක්වා ඇති රු.5,004,925/- ශේෂය තුල ඇතුලත් වී ඇත්තේ ජල සැපයුම, විදුලිය සැපයීම,ගොඩනැගිලි භාවිතයට ගැනීම සහ විවිධ සේවා සඳහා තැන්පතු ලෙස ගෙවන ලද මුදල්ය. මෙම සේවා ලබාගැනීමෙන් පසු එම ශේෂ නිරවුල් නොකිරීමෙන් මෙම තත්ත්වය උද්ගත වී ඇත. 2014 සංශෝධිත මූල්‍ය ප්‍රකාශනවල මෙම ශේෂය රු.3,004,925/- ක් දක්වා අඩුකර ඇත.

(ඇ) අබලි ද්‍රව්‍ය ව්‍යාපෘතියට අදාල රු.2,000,000/- තැන්පතුව පෙර ගෙවුම් ගිණුමට මාරු කරන ලදී. වර්ෂය තුල තැන්පතු ලෙස ඉතිරි වූ මුදලින් රු.150,000/- ක් කලින් ගෙවීමක් ලෙස හඳුනාගත්තත් එය ඉන්පසු කුලියට හිලව් නොකල නිසා තැන්පතු ලෙස ගිණුම් තබා ඇත.

(ඈ) 2013 සංශෝධනය කරන ලද ගිණුම් වාර්තා 2015.01.21 දින විගණකාධිපති දෙපාර්තමේන්තුව වෙත භාරදුන් අතර 2014 ගිණුම් වාර්තා 2015.03.17 දින භාරදෙන ලදී. එම කාල පරාසය හානිකරණ වෙන් කිරීම් ගැලපීමට සහ පැරණි ශේෂ නිරවුල් කිරීමට ප්‍රමාණවත් නොවිය. 2015 වසරේදි පැරණි ශේෂ නිරවුල් කර ගැනීම සඳහා පත්කර ඇති කමිටුවේ වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කිරීමෙන් පසු එම ශේෂ සමඟ හානිකරණ සඳහා වෙන් කිරීමේ ගිණුම නිරවුල් කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබේ.

(ඉ) 2014.12.31 දිනට මූල්‍ය ප්‍රකාශනවල පැවති පෙර ගෙවීම් රු.56,572,130/- ක ශේෂය පියවීම් ඇතුලත් කර රු.29,991,069.97 ක් දක්වා අඩුකර ඇත. 2014 වසරේ සැපයුම් අංශය මගින් ලබාදුන් අත්තිකාරම් වලින් රු.246,675.51 ක් පමණක් පියවීමට ඇත.

| | | | |
|---|---|---|---|
| i. | ජාතික ගොඩනැගිලිපර්යේෂණ ආයතනය 50% අත්තිකාරම් | රු. 122,133.93 | 2015 පියවා ඇත |
| ii. | ලංකා විදුලි පුද්ගලික සමාගම | රු. 9,487.18 | |
| iii. | සදාසරණ මෝටර්ස් ගම්මාන – 028412 2014.06.18 | රු. 61,174.40 | |
| iv. | බුද්ධිනි ඔටෝ ට්‍රේඩර්ස් - 028286 Spare parts 60/7463 | රු. 33,880.00 | |
| | | රු. 246,675.51 | |

අබලි ව්‍යාපෘතියේ 2014 වසරේදී ලබාදෙන ලද අත්තිකාරම් වලින් ඉතිරිව ඇත්තේ රු. 9.473,240.58 ප්‍රමාණයකි. එම අත්තිකාරම්ද 2015 වසරේදී පියවීමට කටයුතු කර ඇත.

(ඊ) මූල්‍ය ප්‍රකාශන අනුව· කාර්මික ජනපද වල සංවර්ධිත ඉඩම් ලබාගෙන කර්මාන්තකරණයෙහි නිරත කර්මාන්තකරුවන් ගේ 2014.12.31 දිනට රු.33,129,822/- ක මුදලක් අයවිය යුතු ශේෂ ලෙස දක්වා

ඇතත් ජනපද අංශයේ වාර්තාවලට අනුව රු.21,821,457/- ක් දක්නට ඇත. ඒ අනුව වෙනස රු.11,307,861/- කි. මෙම වෙනසට පහත සඳහන් හේතු බලපා ඇත.

i. කුලී ගෙවීම් පැහැර හැර නඩු මහට යොමු වී ඇති ණයගැති ශේෂ ජනපද අංශයෙන් අතහැරීම.
උදා : 1. ග්ලෝබල් සර්ජිකල් 2. ඩී.ආර්.සී.ෆර්ටිලයිසර්

ii. ජනපද අංශයේ නඩත්තු වන පොත්පත් ගිණුම්කරණ ක්‍රියාවලියට හසු නොවේ. වසර අවසන් මාසය සඳහා ලැබෙන මුදල් ඊලඟ ජනවාරි 10 – 12 දක්වා ලැබුනේ නම් මුදල් අංශයෙන් ඊලඟ වසරට ලැබීම් ලෙස සටහන් කර ගත්තත් එය ජනපද අංශයේ ලේඛනවල අදාල වර්ෂය තුල ලැබීමක් ලෙස සටහන් කෙරේ. නමුත් ජනපද අංශයේ පොත්පත් හා ලිපිගොනු පරීක්ෂා කර බලා සැසඳුම් කටයුතු කරගෙන යන අතර ඒ අනුව ගිණුම්කරණ දෝෂ නිසා ඇතිවී ඇති ශේෂ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර අවශ්‍ය කටයුතු කිරීමට සැලසුම් කර ඇත.

### 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

ණයගැති ශේෂ තහවුරු කර ගැනීම සඳහා 2013 වසරේදී ශේෂ සනාතන ලිපි ජනපද අධිකාරින් මගින් යොමුකල අතර එම ශේෂ තහවුරු ලිපි මේ වනතෙක් මුදල් අංශය වෙත ලැබී නොමැත. එසේ වුවද 2014 වර්ෂයේ ශේෂ සනාතන ලිපි මේවනවිට යොමු කර ඇත.

### 2.2.5 වෙළඳ හා වෙනත් ලැබිය යුතු ගිණුම්

2014 දෙසැම්බර් 31 දිනට වෙළඳ හා වෙනත් ලැබිය යුතු ශේෂ ලෙස රු.29,959,965 ක් නිරූපනය වේ.

i. රු.10,353,853/- ක ශේෂය වසර ගණනක සිට අයකර ගැනීමට නොහැකි ශේෂ ලෙස දක්වා ඇති අතර ඉන් රු.1,591,568.21 ක් ( ශ්‍රී ලංකා වරාය අධිකාරිය නමින් ඇති රු.1,327,835.05 ක ශේෂයත් සහ අපනයන සංවර්ධන මණ්ඩලය නමින් ඇති රු.263,733.16 ක ශේෂයත් ) 2014 සංශෝධිත ගිණුම්වල නිවැරදි කර ඇත. වාත්තු ඒකකයේ අධ්‍යක්ෂ අලෙවි නමින් ඇති රු.3,357,157.72 ක මුදල අතුරු කොන්ත්‍රාත් ඒකකයෙන් වාත්තු ඒකකය වෙත ලැබිය යුතුයි.

ii වසර 05 ඉක්මවූ පැරණි ශේෂ සැසඳුම් කටයුතු සිදුකර ගෙන යන අතර ඒ අනුව අවශ්‍ය ගැලපීම් 2015 වසරේදී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියෙන් පසු ඇතුලත් කරනු ලැබේ.

iii ජනපද තුල වන සංවර්ධිත ඉඩම් ලබාදීම නිසා ජනිත වූ අයවීමට ඇති රු.33,129,822/- ක ශේෂය සම්බන්ධව උපලේඛන අංක 01 යටතේ තොරතුරු සපයා ඇත. ඒ අනුව A ලෙස නම් නම්කර ඇති දැනට සිටින කර්මාන්තකරුවන්ගෙන් අයවීමට ඇති ශේෂය හා කාර්මික ජනපද පොත්වල ශේෂය අතර ඇත්තේ රු.1,272,497.09 ක වෙනසකි. කර්මාන්ත හැරගිය කර්මාන්තකරුවන් ලෙස හඳුනාගත් ශේෂය රු.9,993,653.75 සැසඳුම් කර අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් යොමු කෙරේ. මාසික ශේෂ සැසඳීම් කටයුතු කරගෙන යන අතර පවත්නා වර්ෂයේ වෙනස්කම් ඇති නොවීමට කටයුතු සම්පාදනය කර ඇත.

Iv 2013 සහ 2014 ගිණුම් විගණකාධිපති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කල කාල පරාසය අතර පැරණි ශේෂ සම්බන්ධ කටයුතු කිරීමට අවස්ථාවක් නොලැබීම මීට හේතු වී ඇත. සැසඳුම් කටයුතු සිදුකරන අතර අවශ්‍ය ගැලපීම් ඉදිරියේදී ඇතුලත් කරනු ලැබේ.

v. ඉංජිනේරු වැඩහල යටතේ ඇති රු.20,225,259/- ක මුදලින් රු.13,096,059.82 ක් ගම්මාන සංවර්ධන වැඩසටහන සඳහා ඉන්වොයිස් කල ඒවායි. මෙම ශේෂය ඇතුළු අනෙකුත් ශේෂ සම්බන්ධව සැසඳීම් කටයුතු දැනට කරගෙන යනු ලැබේ. 2015 වසරේදී අවශ්‍ය ගැලපීම් ඇතුලත් කරනු ලැබේ.

vi. රු.16,307,420/- තුල අඩංගු බදු හා සම්බන්ධ වටිනාකම් පිළිබඳව දේශීය ආදායම් කොමසාරිස්

ජනරාල් වෙත දන්වා අවශ්‍ය පියවර ගනු ලැබේ. එමෙන්ම අනිකුත් ශේෂ ගිණුම්කරණ දෝෂ ලෙස හඳුනාගෙන ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර අනුමැතිය ලබා නිවැරදි කිරීම් ඇතුලත් කෙරේ.

vii ලැබිය යුතු වැට් බදු ලෙස පෙන්වන මෙය රු.10,741,964/- වටිනාකම අබලි ව්‍යාපෘතිය සම්බන්ධ 2007ට පෙර වැට් බදු වන අතර ඒ සම්බන්ධව ගත හැකි පියවර සම්බන්ධයෙන් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙතින් උපදෙස් ලබා ඉදිරි කටයුතු කෙරේ.

Viii කාර්ය මණ්ඩල ධාරිතා වර්ධන සඳහා වැයවූ මුදල ක්‍රමක්ෂය යටතේ ගිණුම්ගත කර නිවැරදි කරන ලදී.

ix. පැරණි වර්ෂවල සේවකයින් විශ්‍රාම යනවිම උපලේඛනයේ දක්වා ඇති ශේෂ කිහිපයක් නිරවුල් කර ඇතත් ගිණුම්වල නිරවුල් වී නොමැත. අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා එම ශේෂ නිරවුල් කිරීමටත් පියවීමට ඇති ශේෂ සම්බන්ධව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමටත් කටයුතු කෙරේ.

3. මූල්‍ය සමාලෝචනය

3.1 2006 සිට 2007 ජූලි මාසය දක්වා ජීවන වියදම් දීමනාවට අදාලව සේවක අර්ථ සාධක අරමුදල් සහ සේවක භාරකාර අරමුදල් ගණනය කර 2013 වසරේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කිරීම නිසා රජයේ දායකය ගැලපීමට පෙර ඌනතාවය 2013 වසරට සාපේක්ෂව 2014 වසරේදී අඩුවී ඇත.

3.2 සම්මත අනුපාත යටතට මූල්‍ය ප්‍රකාශන වල අගයන් පත්කිරීමට කළමණාකාරීත්වයේ අවධානය යොමු වී ඇත.

3.3 වියදම්වල අසාමාන්‍ය වැඩිවීමට හේතුවී ඇත්තේ පහත කරුණු බලපෑමයි

I. ප්‍රධාන කාර්යාලයේ බදු ගෙවීම් සඳහා රුපියල් මිලියන 10 ක ප්‍රතිපාදන වෙන්කිරීම
II. 2013 වසරට සාපේක්ෂව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සහ විගණන කළමණාකරණ රැස්වීම් පැවැත්වීමේ වාර ගණන වැඩි වීම.
III. සංග්‍රහ වියදම් යටතේ අව්වුවේලි කාර්මික ජනපදයේ ආරම්භක උත්සව වියදම් ඇතුලත් කිරීම (නිවැරදි කර ඇත)
IV. බෙහෝ කලකට පසු ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය සංවිධානය කල සම්මාන උලෙළ හා කර්මාන්ත ප්‍රදර්ශනය සඳහා දරන ලද වියදම් වේ.

4.1 කාර්ය සාධනය

i සැලසුම් අංශය විසින් 2014 වර්ෂයට අදාලව සකස් කරන ලද ප්‍රගති වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලයට සහ අමාත්‍යාංශයට ලබාදී ඇත. සෙසු අංශ දෙකෙහි කාර්ය බහුලත්වය සහ බඳවා ගැනීම් පරිපාටියේ ඇතිවූ වෙනස්කම් අනුව ප්‍රමාද වූ අතර ඉදිරියේදී ප්‍රගතිය නිසි පරිදි ලබාදීමට කටයුතු කරනු ලැබේ.

ii. වාර්ෂික ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් සෘජු වශයෙන් වගකිව යුතු අංශයන් සඳහන් කර ඇති අතර එක් එක් ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් සවිස්තර වාර්තාවක් ක්‍රියාකාරි සැලැස්මට ඇතුලත් කිරීම ප්‍රායෝගික සංකීර්ණ කටයුත්තක් වුවත් 2016 වසර සඳහා සකසන ක්‍රියාකාරි සැලැස්මේ ඒ ඒ අංශ වල ක්‍රියාකාරි දායකත්වය ඇතුලත් කරනු ලැබේ.

(අ) රබර් සංවර්ධන අංශය

i රබර් සංවර්ධන අංශයේ ඉලක්කගත ක්‍රියාකාරකම් ප්‍රමාණයට වඩා නිමකල ප්‍රමාණය වැඩි වී වැඩි පරාසයක ක්‍රියාකාරකම් පෙන්වා ඇත්තේ එම අංශයේ රසායනාගාර සේවා ලබාගැනීමට කර්මාන්තකරුවන් වැඩි කැමැත්තක් දැක්වා එහි පැමිණෙන බැවිනි.

ii ක්‍රියාකාරි සැලැස්මේ ඇතුලත් නොවූවද එම අංශයේ විවිධ සේවා ලබාගත් පැරණි කර්මාන්තකරුවන් අපේක්ෂා නොකල පරිදි තම සේවා ලබාගැනීමට පැමිණෙන බැවින් එම සේවා ලබාදී ඇත.

iii මෙරට නිෂ්පාදිත නියම ප්‍රමාණයෙන් යුත් රබර් නිෂ්පාදනවලට වඩා අඩු ප්‍රමිතියේ නිෂ්පාදන චීනයෙන් සහ ඉන්දියාවෙන් අඩු මුදලට වෙළඳපලට ලැබෙන බැවින් බොහෝ කර්මාන්තකරුවන් අඩු මිලට අඩු ප්‍රමිතියෙන් රබර් සංයෝග මිළදී ගැනීම නිසා ඉලක්කගත ප්‍රගතියට ලඟාවීමට නොහැකිවී ඇත.

(ආ) සම්භාණ්ඩ සංවර්ධන මධ්‍යස්ථානය

i ක්‍රියාකාරි සැලැස්මෙහි ඇතුලත් ප්‍රගතිය අපේක්ෂිත ප්‍රමාණයට වඩා පසුගිය වර්ෂයේ වැඩි වී ඇත්තේ පුහුණුව හදාරන්නන් ව්‍යාපාර ඇරඹීම අපේක්ෂා කල ප්‍රමාණයට වඩා නැඹුරුවීමයි.

ii අදාළ වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මට ඇතුලත් නොවූවද කර්මාන්තකරුවන් ඉල්ලුම් කරන සේවාවන් ලබාදීම එම අංශයෙන් සිදු කර ඇත.

(ඇ) කාර්මික ජනපද අංශය

i ක්‍රියාකාරි සැලැස්මේ පළමු කාර්යය ( Selecting of Industrialists ) අවසන් වීමෙන් පසු කර්මාන්තයේ නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීම දක්වා වූ කර්මාන්තයට අදාළ එක් එක් අදියර යටතේ , එනම් පාරිසරික අනුමැතින් ලබා ගැනීම, ගොඩනැගිලි සැලසුම් ප්‍රාදේශීය සභාව මගින් අනුමත කර ගැනීම, මණ්ඩලීය තැන්පතු මුදල් සහ බදු මුදල් ගෙවා බිම් කොටස් භාරගැනීම, ගොඩනැගිලි ඉදිකිරීම, යන්ත්‍රසූත්‍ර සවිකර කර්මාන්තය ආරම්භ කිරීම වැනි කරුණුවලට මාස 06 ක සිට වසරක කාලයක් ගතවන බැවින්, අනෙකුත් කාර්යයවල ප්‍රගතිය එම වසරේදී මෙසේ අඩු වී ඇත.

ii අච්චුවේලි කාර්මික ජනපදය 2014 වසරේ දී නැවත ආරම්භ කළ අතර, කාර්මික ජනපද නවීකරණය කිරීමේ වැඩසටහන 2013 වසරේදී ආරම්භ කරන ලදී. කාර්මික ජනපද නවීකරණය කිරීමේ වැඩසටහන 2014 , 2015 සහ 2016 වසරවල ද අඛණ්ඩ වැඩසටහනක් ලෙස ක්‍රියාත්මක වෙමින් පවතී.

(ඇ) ප්‍රාදේශීය සංවර්ධන අංශය

i ක්‍රියාකාරකම් 05 ප්‍රගතිය 0 සිට 24 % දක්වා අඩුවීමට හේතු

- සම්පත් අධ්‍යයන වාර්තා සැකසීම
- කර්මාන්ත දත්ත පද්ධති සැකසීම
- උපදේශන සේවා

වැනි ඉහත ක්‍රියාකාරකම් ඇතුලත් 2014 වර්ෂයට නියමිත ක්‍රියාත්මක සැලැස්ම සකස් කිරීමේදී දිස්ත්‍රික් කාර්යාලවලට අනුයුක්ත සමස්ථ නිලධාරීන් ප්‍රමාණය මත එක් එක් දිස්ත්‍රික්ක සඳහා ඉලක්ක නියම කරන ලදී. මන්ද දිස්ත්‍රික් පුරප්පාඩු පිරවීමට එවකට සැලසුම් කර තිබු බැවිනි. එහෙත් පුරප්පාඩු පිරවීම එම වර්ෂය තුල ක්‍රියාත්මක නොවූ බැවින් ඉලක්ක ගත ප්‍රගතියට ලඟාවීමට නොහැකි විය.

ii ක්‍රියාකාරකම් 05 ක ප්‍රගතිය 133% සිට 221% දක්වා අගයක් ගැනීමට හේතු

ඉහත සඳහන් කල පරිදි නිලධාරීන් ගේ ප්‍රමාණය මෙන්ම ප්‍රාදේශීය විෂමතාවය මතද ඒ ඒ ක්‍රියාකාරකම් සඳහා ඉලක්ක නියම කරන ලදී. තවද විවිධ බාහිර ආයතනවල ඉල්ලීම සහ අරමුදල් මත බොහෝ වැඩසටහන් පැවැත්වීමට සිදුවූ අවස්ථාද ඇත. එබැවින් නිලධාරීන්ගේ හිඟයක් ඇතත්, ඒ ඒ දිස්ත්‍රික්ක වලින් නිලධාරීන් හුවමාරු කර ගැනීමෙන් මෙවැනි වැඩසටහන් පැවැත්වීම සඳහා කටයුතු සංවිධානය කරගත හැකි වූ බැවින් ප්‍රගතිය වැඩිවීමක් සිදුවිය.

(ඉ) අලෙවි අංශය

i ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රගතිය අතර වෙනස්වීම් සඳහා පහත කරුණු බලපාන ලදී.

අ) Improve display & Sales facilities at Lakkam Sales Center.

ලක්කම් අලෙවි මධ්‍යස්ථානයේ භාණ්ඩ ප්‍රදර්ශනයට 500 දෙනෙකු එක්කර ගැනීමට ඉලක්ක කර තිබුණද ඒ සඳහා සුදුසු කර්මාන්තකරුවන් ඉදිරිපත් නොවීම නිසා අදාල ඉලක්කය සපුරා ගත නොහැකි විය.

ආ) No of Marketing Programmers Conducted

අලෙවි අංශය තුල ප්‍රමාණවත් කාර්යය මණ්ඩලයක් නොසිටි බැවින් ඉලක්කගත වැඩසටහන් සපුරාගත නොහැකි විය.

ඇ) රජයේ ආයතනවල ලංසු කැඳවීම සඳහා මිල ගණන් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව කොන්ත්‍රාත් ඇණවුම් ලබාගෙන අතුරු කොන්ත්‍රාත් ඒකකයේ ලියාපදිංචි කර්මාන්තකරුවන් මගින් එම ඇණවුම සපයනු ලබයි. තරඟකාරී මිල ගණන් සලකා බැලීමෙන් ඇණවුම් ලැබෙන බැවින්, ඉලක්ක සපුරා ගැනීමට නොහැකි විය.

ඈ) Amount of Collection of metal Scrap

රජයේ ආයතනවලින් බැහැර කරන අබලි ද්‍රව්‍ය ලබාගෙන අප අබලි ව්‍යාපෘතියේ ලියාපදිංචි කර්මාන්තකරුවන් වෙත බෙදා හරිනු ලබයි. එක් එක් රාජ්‍ය ආයතන මගින් අප වෙත ලැබෙන අබලි ද්‍රව්‍ය ප්‍රමාණයන් අපහට ලබාගැනීමට සිදුවන නිසාවෙන් අදාල ඉලක්කය සපුරාගත නොහැකි විය.

ii. ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත්ව නොතිබීම නිසා එහි ප්‍රගතිය පරික්ෂා කිරීමට නොහැකි වීම.

මේ යටතේ 01 සහ 04 දක්වා සඳහන්ව ඇත්තේ SMIDEX – 2014 කර්මාන්ත ප්‍රදර්ශනය සහ විශිෂ්ඨතම ව්‍යවසායකයා තේරීමේ තරඟය පැවැත්වීම සම්බන්ධයෙනි.

2014 වර්ෂයට පෙර සිට ශිල්ප ප්‍රදර්ශනය ජාතික ශිල්ප සභාව හා කාර්මික සංවර්ධන මණ්ඩලය එක්ව පවත්වන ලදී. එම ප්‍රදර්ශනය පැවැත්වීම සඳහා අවශ්‍ය මුදල් ප්‍රතිපාදන සාම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය විසින් ලබාදෙන ලදී.

එහෙත් 2014 වර්ෂයේ සිට කාර්මික සංවර්ධන මණ්ඩලය පමණක් මෙම කර්මාන්ත ප්‍රදර්ශනය හා විශිෂ්ඨතම ව්‍යවසායකයා තේරීමේ තරඟය පවත්වන ලෙස අමාත්‍යාංශය විසින් ලබාදුන් උපදෙස් මත මෙම ප්‍රදර්ශනය පවත්වන ලදී. ඒ සඳහා උපදෙස් ලැබුනේ 2014 වර්ෂයේදී වන නිසා එම කාර්යය ක්‍රියාත්මක සැලැස්මට ඇතුලත්ව නොතිබුණි.

මෙහි අංක 06 න් සඳහන් කරුණට අනුව ලක් නිපැයුම් අලෙවි මධ්‍යස්ථානය කොටුව, ඕල්කොට් මාවතේ නව ස්ථානයට ගෙන යාමට සිදුවිය. අලුතින් ස්ථානයකට ගෙන ගොස් ඇති නිසා අදාල ඉලක්කය සපුරාගත නොහැකි විය.

(ඊ) ඉංජිනේරු අංශය

i) ක්‍රියාකාරි සැලැස්මේ ඇතුලත්ව තිබු ක්‍රියාකාරකම් ඉටුකිරීම සඳහා ප්‍රමාණවත් ඉංජිනේරු සහ තාක්ෂණ කාර්ය මණ්ඩලයක් නොමැතිවීම නිසා අදාල ඉලක්ක ගත ප්‍රමාණය සපුරාගත නොහැකි විය.

ii) ඉංජිනේරු අංශය යටතේ පවතින විවිධ උප අංශයන්හි ක්‍රියාකාරකම් දෛනිකව ක්‍රියාකාරකම් හා බැඳී පවතින අතර ක්‍රියාකාරි සැලැස්මේ ඇතුලත් නොවුවද දිගුකාලීනව මණ්ඩලීය සේවාවන් ලබාගත් ගණුදෙනුකරුවන් තම කර්මාන්ත කටයුතුවලදී අදාල නිෂ්පාදනය මත අවස්ථානුකූලව ඇතිවන සේවාවන් ලබාගැනීම සඳහා ඉංජිනේරු අංශය වෙත පැමිණි පසු එම සේවාවන් ලබාදීමට කටයුතු කර ඇත. ඒ අනුව ක්‍රියාකාරි සැලැස්මේ ඇතුලත් නොවූ ක්‍රියාකාරකම්ද ඉටු කර ඇත.

(උ) තාක්ෂණික සේවා අංශය

තාක්ෂණික සේවා අංශයේ ප්‍රගතිය පරික්ෂා කිරීමේදී 2014 වර්ෂය සඳහා අදාල ප්‍රගතිය පහත පරිදි වේ.
Product Demonstrations

| මාසය | ප්‍රදර්ශන සැසි ගණන |
|---|---|
| ජනවාරි | 05 |
| පෙබරවාරි | 03 |
| මාර්තු | 01 |
| අප්‍රේල් | 02 |
| මැයි | 02 |
| ජුනි | 08 |
| ජුලි | 07 |
| අගෝස්තු | 04 |
| සැප්තැම්බර් | 02 |
| ඔක්තෝම්බර් | - |
| නොවැම්බර් | 01 |
| දෙසැම්බර් | 04 |
| එකතුව | 39 |

ඒ අනුව අදාල ඉලක්කය වූ Product Demonstrations 10 ඉක්මවා සපුරා ගෙන ඇත.

| මාසය | ප්‍රදර්ශන සැසි ගණන |
|---|---|
| ජනවාරි | 01 |
| පෙබරවාරි | 02 |
| මාර්තු | 03 |
| අප්‍රේල් | 01 |
| මැයි | 01 |
| ජුනි | 04 |
| ජුලි | 03 |
| අගෝස්තු | 09 |
| සැප්තැම්බර් | 07 |
| ඔක්තෝම්බර් | 14 |
| නොවැම්බර් | 13 |
| දෙසැම්බර් | 10 |
| එකතුව | 68 |

ඒ අනුව Technology Transfer Workshop සඳහා ඉලක්කය වූ 40 සපුරා ගෙන ඇත.

Assisting Of Certification යටතේ ආහාර කර්මාන්ත 03 ක් සඳහා තත්ත්ව සහතික ලබාගැනීමට කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය හරහා රුපියල් ලක්ෂ 2 දක්වා මූල්‍ය සහන ලබාදීමට 2014 වර්ෂයේදී හැකි විය. මෙම ප්‍රගතිය 2015 ජනවාරි මාසයේදී වාර්තා කරන ලදී.

| අනු අංකය | ආයතනය | සහතිකකරණය |
|---|---|---|
| 01 | Foreconns Canneries<br>No 10, Temple Road, Beruwala | Completed ISO 22000 |
| 02 | Challenge Food Products<br>Malwatta, Godakawela | Completed SLS |
| 03 | Nalco Food Products<br>Malwatta, Godakawela | Completed ISO 22000 |

මේ අනුව මෙම ක්‍රියාකාරකම් යටතේ ද 2014 වර්ෂයේ ඉලක්කය සපුරාගෙන ඇත.

තවද Improving Quality and Productivity. Assisting to Upgrade existing Industries to the next desired level Facilitating Consultancy Services යන ක්‍රියාකාරකම් ඉටු කිරීමට ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් අංශය සතුව නොතිබිණි. ඒ බව පහත වගුව අනුව පැහැදිලි වේ.

| තනතුර | ඉල්ලා ඇති සේවක සංඛ්‍යාව | 2014 සිටි සංඛ්‍යාව |
|---|---|---|
| ව්‍යාපාර ප්‍රවර්ධන කළමනාකරුවන් | 09 | 03 |
| ඉංජිනේරු | 01 | - |
| තාක්ෂණික සහකාර | 02 | - |
| රසායනාගාර සහකාර | 04 | - |
| රසායනාගාර සේවක | 04 | 01 |
| කළමනාකාර සහකාර | 03 | 01 |
| කාර්යාල සහකාර | 02 | 01 |

එහෙත් අප විසින් පවත්වන ලද තාක්ෂණික පුහුණු වැඩමුළුවලට සහභාගී වූ පවතින කර්මාන්තකරුවන් විසින් තම නිෂ්පාදනවල තත්ත්වය හා කර්මාන්තයේ ඵලදායිතාව වැඩිදියුණු කරගෙන ඇති අතර එම කර්මාන්ත ඉහළ මට්ටමකට ගෙන ගොස් ඇත. මෙහි මේ පිළිබඳව පසු විපරම් කර අදාල ප්‍රගතිය වාර්තා කිරීමට අවශ්‍ය නිලධාරීන් බඳවාගත් පසු කටයුතු කරනු ලැබේ.

Products Development Work සඳහා ප්‍රමාණවත් නිලධාරීන් මෙන් ම රසායනාගාර කාර්ය මණ්ඩලය ද අංශය සතුව නොතිබුණි. එසේම මේ සඳහා අවශ්‍ය රසායනාගාර උපකරණ හා පහසුකම් ද ප්‍රමාණවත් නොවුණි.

2015 වර්ෂය සඳහා අවශ්‍ය උපකරණ ඇණවුම් කර ඇති අතර කොටසක් රසායනාගාර වෙත ලැබී ඇත. ඒ අනුව ඉදිරියේදී ක්‍රියාකාර සැලැස්මට අනුව කටයුතු කිරීමට හැකි වනු ඇත.

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

i.)
(අ)
(ආ)
(ඇ)
(ඈ)
(ඉ)

මණ්ඩලයේ මුදල් අංශයේ ක්‍රියාත්මක වන සේජ් නමැති සන්නම් නාමය සහිත ගිණුම්කරණ මෘදුකාංග පද්ධතියේ ඇති අඩුපාඩු සහ දැනට එය වත්මන් අවශ්‍යතාවයන්ට නොගැලපෙන නිසා නව මෘදුකාංග පද්ධතියක් ස්ථාපිත කර ඇත. මේ සඳහා ICTA ආයතනයෙන් උපදේශක සේවා ලබාගැනේ.

ii. තාක්ෂණික සේවා අංශයේ නව රසායනාගාරයට අවශ්‍ය උපකරණ ලබාගෙන ස්ථානගත කර 2015 මැයි මස දී විවෘත කරන ලදී.

iii. මණ්ඩලයේ හිටපු සභාපතිතුමා විසින් භාවිතා කරන ලද රු.199,000/- ක් වටිනා ජංගම දූරකථනය සහ වට්ටෝරුගත භාණ්ඩ ආපසු මණ්ඩලය වෙත බාරදී ඇත.

iv. අබලි ද්‍රව්‍ය ව්‍යාපෘතිය

අබලි ද්‍රව්‍ය ව්‍යාපෘතියේ සහන මිලට කර්මාන්ත කරුවන්ට අමුද්‍රව්‍ය සැපයීම යටතේ පහත කරුනු පෙන්වා දිය හැකිය.

(අ) 2014 වර්ෂයේ සාම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් විසින් අදාල පාර්ශවයන් හා සාකච්ඡා කර සකසන ලද මාර්ගෝපදේශන සංග්‍රහය අනුව ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් මගින් භාෂා තුනෙන්ම ප්‍රසිද්ධ කර අයදුම්පත් කැඳවා කර්මාන්ත පරීක්ෂා කර ඒ ඒ දිස්ත්‍රික් කාර්යාල මගින් ඉදිරිපත් කල අයදුම්පත්ද සලකා කර්මාන්තකරුවන් ලියාපදිංචි සිදු කර ඇත.

(ආ) අබලි ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීමේදී මණ්ඩලීය ලොරිවලට අමතරව දොඹකරයක්ද අවශ්‍ය වේ. මේ සඳහා යොදා ගෙන ඇති පෞද්ගලික වාහනය දොඹකරයක්ද සහිත වේ. එබැවින් දොඹකර සඳහා යන වියදම් අඩුවේ. තවද මේ වාහනවල ටොන් 10 ක් පැටවිය හැකි අතර මණ්ඩලීය වාහනවල පැටවිය හැක්කේ ටොන් 02 ක් පමණි. මණ්ඩලීය ලොරි රථ යොදා ගන්නේ නම් අබලි ද්‍රව්‍ය පැටවීමේ සහ බෑමේ කුලී වශයෙන් පිටතින් ලබාගන්නා ශ්‍රමිකයෙකුට දිනකට රු.1200/- බැගින් ගෙවිය යුතුවේ.

(ඇ) රජයේ මුද්‍රණාලයෙන් ගෙන එන ලද අබලි ද්‍රව්‍ය තොගය රජයේ මුද්‍රණාලයේ අභ්‍යන්තර ප්‍රශ්නයක් මත ආපසු රැගෙන යාමට සිදුවූ අතර එම තත්ත්වය අපහට පාලනය කරගත නොහැකි විය. එහෙත් රජයේ මුද්‍රණාලයෙන් ලබාගත් භාණ්ඩ වෙනුවෙන් රු.284,416.80 ක මුදලක් ගෙවීමට ඇති අතර එම මුදල ගෙවනවිට සිදුවූ පාඩුව අයකර ගැනීමට හැකිවේ.

(ඈ) 2011 වර්ෂයට පෙර අබලි ව්‍යාපෘතිය ග්‍රාමීය කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන ලද අතර ව්‍යාපෘති කාර්යාලය පිහිටියේද එම අමාත්‍යාංශ පරිශ්‍රයේය. 2013 හා 2014 වර්ෂවල පෙර ගෙවුම් පිලිවෙලින් රු.954,010/- ක් හා රු.31,384,211/- ක බිල්පත් පියවා ඇති අතර ඉතිරි බිල්පත් ඉතා ඉක්මණින් පියවා ගැනීමේ හැකියාව ඇත.2012 වසරේ ලබාගත් සියළුම පෙර ගෙවුම් අත්තිකාරම් පියවා ඇත.

(ඉ) අබලි ද්‍රව්‍ය කර්මාන්තකරුවන් අතර බෙදා හැරීමේදී කර්මාන්තකරුවන් කීපදෙනෙකු අතර වැඩි ප්‍රතිශතයක් බෙදී යාමට හේතු වන්නේ එම අමුද්‍රව්‍යවල ස්වභාවය, කර්මාන්තකරුගේ ස්වභාවය,අමුද්‍රව්‍යවල වටිනාකම ආදි කරුණු හේතුවන අතර පහත සඳහන් කර්මාන්තකරුවන් වෙත නිකුත් කර ඇති අදාල අමුද්‍රව්‍ය සහ වටිනාකම් අනුව එය තහවුරු කරගත හැක.

i. ඩබ්.පාලිත සිල්වා මහතා

කර්මාන්තකරු හට රු.10,887,484 /- ක්අබලි ද්‍රව්‍ය ලබාදී තිබුණ ද එයින් රු.9,557,590.91 ක මුදලකටම ලබාදී ඇත්තේ අබලි ට්‍රාන්ස්ෆෝමර් වේ. අබලි ට්‍රාන්ස්ෆෝමර්වල මිල ධාරිතාවය අනුව රු.82340/- ත් රු.440,966/- ත් අතර වන හෙයින් ලබාදී ඇති ට්‍රාන්ස්ෆෝමර් ප්‍රමාණය අතින් අඩු සංඛ්‍යාවකි.

2014 වර්ෂයේදී විදුලිබල මණ්ඩලය විසින් මසකට ට්‍රාන්ස්ෆෝමර් 500 ක්වත් මිලදී ගත යුතු බව පැවසූ නිසා ට්‍රාන්ස්ෆෝමර් ඉල්ලුම්කරුවන්ට සැපයීමට උත්සාහ කරන ලදී.

ඔහු වෙත ලබාදී තිබූ ඉතිරි අබලි ද්‍රව්‍ය වලින් 80 % ක්ම ඔහු වෙත ලබාදී ඇත්තේ අධිකාබනික සහිත වීනාච්චට්ටිය. මෙම අබලි ද්‍රව්‍ය වෙනත් කර්මාන්තකරුවන් මිලදී ගැනීම ප්‍රතික්ෂේප කළ හෙයින් ඉල්ලා සිටි කර්මාන්තකරුවන්ට ලබාදී ඇත.

ii. අයි.ඒ.ස්වහිර් මහතා

මෙම කර්මාන්තකරුට වැඩි ප්‍රමාණයක් ලබාදී ඇත්තේ ඇළුමිනියම් සර්විස් වයර් හා ඇළුමිනියම් බන්ඩල් වයර් වේ. මෙම අබලි ද්‍රව්‍ය මිලදී ගැනීමට කැමැත්ත ප්‍රකාශ කර ඇති කර්මාන්තකරුවන් අඩු ප්‍රමාණයක් වන හෙයින් ද මෙම කර්මාන්තකරු විශාල ධාරිතාවයකින් යුතුව ඇළුමිනියම් භාණ්ඩ නිෂ්පාදනය කරන හෙයින් ද ඔහු හට වැඩි ප්‍රමාණයක් අබලි ද්‍රව්‍ය ලබාදී ඇත. ඔහුට අනුමත ඇළුමිනියම් ප්‍රමාණයම මසකට කි.ග්‍රෑ 25000 ක් වේ.

iii. ජේ.ඒ.පී.මෙටල් (ප්‍රයිවට් ) ලිමිටඩ්

මෙම කර්මාන්තකරුටද වැඩි ප්‍රමාණයක් ට්‍රාන්ස්ෆෝමර් ලබාදී ඇත. ඒ නිසා වටිනාකමින් 50% ක් පමණ ට්‍රාන්ස්ෆෝමර්වල වටිනාකම වේ. කර්මාන්තකරු යකඩ, ඇළුමිනියම් හා තඹ සඳහා ද ලියාපදිංචි වී ඇති නිසා එම අබලි ද්‍රව්‍ය ද ඔහු වෙත නිකුත් කර ඇත.

iv. ටී.වින්සන් මහතා

අබලි ද්‍රව්‍ය ව්‍යාපෘතියේ අබලි ටයර් මිලදී ගැනීමට ලියාපදිංචි වී ඇත්තේ සීමිත සංඛ්‍යාවකි. ආයතන වලින් ටයර් මිලදී ගැනීමේදී තෝරා ගැනීමකින් තොරව සියළුම ටයර් ලබාගත යුතුව ඇති අතර, එයින් තේරීමකින් තොරව මෙම කර්මාන්තකරු ටයර් මිලදී ගන්නා හෙයින් ඔහු හට ටයර් වැඩි ප්‍රමාණයක් ලබාදී ඇත. 2012 වර්ෂයේදී කර්මාන්තකරුවන්ට ටයර් මිලදී ගැනීමට පෙර පරීක්ෂා කර බලා හොඳ තත්ත්වයේ ටයර් පමණක් මිලදී ගෙන ඇති බැවින්, ඒ ඒ ආයතනවල ඉතිරිවූ අබලි ටයර් නාවබිම ගබඩාවට රැගෙනවිත් ගොඩගසා ඇත.

4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

(අ) මණ්ඩලයේ මිල හා පිරිවැය තීරණය කිරීම විධිමත් කිරීමේ ක්‍රියාපරිපාටියක් ආරම්භ කර ඇත.

(ආ) ජංගම තාක්ෂණ බස් රථය සම්බන්ධ පත්‍රිකාවක් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමට ඉදිරිපත් කිරීමෙන් පසු තීරණ ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කිරීමට නියමිතය.

(ඇ) මණ්ඩලයේ නීති කටයුතු සඳහා නීති නිලධාරිනියක සිටියදී රු.158,500/- ක් වැය කර බාහිර නීතිඥයකුගේ සහාය ලබාගත් අතර එයින් රු.17,500/- ක් බාහිර නීතිඥවරුන්ට සහ රු.141,000/- නීතිපති දෙපාර්තමේන්තුවට ගෙවා ඇත. එයට පහත කරුණු බලපා ඇත.

1. මණ්ඩලය විසින් හා මණ්ඩලයට එරෙහිව පවරා ඇති නඩු සඳහා නීති නිලධාරියා පෙනී සිටිය යුතු වුවත් එකම දිනයක අධිකරණ ගණනාවක නඩු අඩගැසීමට නියම වීම වැනි අවස්ථාවන්වලදී එක නීති නිලධාරිනියකට සියලු අධිකරණයන් ආවරණය කළ නොහැකි බැවින් බාහිර නීතිඥ සහාය ලබා ගැනීමට සිදුවීම නොවැලැක්විය හැකි කරුණක් විය. එමෙන්ම බැහැර අධිකරණයන්හි අඩගැසෙන නඩුවල යම් යම් දිනයන්හි දී පුද්ගලිකවම නීති නිලධාරිනිය පෙනී සිටීම අත්‍යාවශ්‍ය නොවන අතර එවැනි දිනයන් සඳහා බාහිරව අදාල ප්‍රදේශයේ නීතිඥ මහතකුගේ සේවය ලබාගැනිම මගින් නිති නිලධාරිනිය සහභාගිවීම නිසා දැරීමට සිදුවන වියදම් අවම කරවා ගෙන ඇත.

ජීවන වියදම් දීමනාවට අදාලව අර්ථ සාධක නොගෙවීම සම්බන්ධයෙන් 2014.01.17 වන දිනට මොරටුව මහේස්ත්‍රාත් අධිකරණයේ කම්කරු කොමසාරිස් විසින් මණ්ඩලයට විරුද්ධව පවරන ලද නඩු 06 ක් අඩගැසීමට නියමිතව තිබු අතර එදිනට මණ්ඩලයට අදාලව මාතලේ දිසා අධිකරණයේ ද මහනුවර දිසා අධිකරණයේද මෙම විගණනයේ සඳහන් අංක 61668 දරණ නඩුව මහනුවර මහේස්ත්‍රාත් අධිකරණයේද අඩ ගැසීමට නියමිතව තිබුණි. මෙහිදී නීති නිලධාරිණියගේ වෘත්තීය දායකත්වය ලබාදීම එදිනට වඩාත් අදාල හා වැදගත් වූයේ මාතලේ දිසා අධිකරණ නඩුව වූ බැවින් ඊට සහභාගි වූ අතර අනෙකුත් නඩු සඳහා බාහිර නිතිඥ සහාය ලබා ගෙන ඇත. ඒ අනුව මොරටුව දිසා/මහේස්ත්‍රාත් අධිකරණ නඩු සඳහා නිතිඥ සේනානි වාසල මියගේ ද (වවුචර් අංක 1043 - නඩු 06 ටම රු.3000/- ක මුදලක් ගෙවන ලදී.) මහනුවර මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවට නිතිඥ ගල්කඩුව මියගේද (වවුචර් අංක 3503 ) සහායද ලබාගන්නා ලදී. මෙම නිතිඥවරුන්ට ගෙවනු ලබන මුදල මෙවැනි නඩු සඳහා නීතිපති දෙපාර්තමේන්තුව අයකරන මුදලින් 10% කටත් වඩා අඩු මුදලකි. ඔබ විසින් විමසා ඇති වවුචර් අංක 1044/45/47 යටතේ ගෙවීම් සිදුකර ඇත්තේ මහනුවර හා මාතලේ අධිකරණයේ නඩු සඳහා මැණිකේ ගල්කඩුව හා ලසන්ත බාලසූරිය යන නීතිඥ මහත්ම මහත්මීන්ට බව සඳහන් කර ඇති බැවින් එසේ ගෙවීම් කර ඇත්තේ මෙහි සඳහන් කර ඇති හේතු මතවේ.

2014.03.07 වන දින මහනුවර මහේස්ත්‍රාත් අධිකරණයේ අංක 61668 දරණ නඩුවේ ලිඛිත දේශන ඉදිරිපත් කිරීමට නියමිතව තිබු අතර එහිදී කරුණු දැක්වීමක් කිරීමට නොමැත. 2014.03.06 වන දින මාතර මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවකටද පෙනී සිටීමට සිදු වූ බැවින් 2014.03.07 වන දිනට මහනුවර නීතිඥ ගල්කඩුව මියගේ සහාය ලබාගෙන ඇත. (වවුචර් අංක 3504) මෙම නඩුව 2014.03.28 වන දිනට ලිඛිත දේශන ඉදිරිපත් කිරීම සඳහා කල්තබන ලද බැවින් ඒ සඳහා ද එම නීතිඥවරියගේ සහාය ලබාගෙන ඇත. (වවුචර් අංක 3505)

2014.06.11 වන දිනට මහනුවර මහාධිකරණයේ නඩු අංක 67/2011 දරණ නඩුව නියෝගය සඳහා අඩගැසීමට නියමිතව තිබු අතර එදිනට ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අංක SPL/LA/158/2013 පිළිබඳව නීතිපති දෙපාර්තමේන්තුවේ සාකච්ඡාවකට සහභාගිවීමට නියමිතව තිබුණි. මෙදින මහනුවර මහාධිකරණ නඩුවේ නියෝගය දීමට පමණක් නියමිතව තිබු බැවින් කරුණු දැක්වීමක් කිරීමේ අවකාශයක් නොමැති අතර මණ්ඩලය සඳහා හුදෙක් පෙනී සිටීමක් පමණක් ප්‍රමාණවත් වූ බැවින් ද නීතිපති දෙපාර්තමේන්තුවේ පැවති සාකච්ඡාව ජුනි මස 26 වන දිනට පෙර ඉදිරිපත් කිරීමට නියමිතව තිබු ලිඛිත හා වාචික දේශනයන් සම්බන්ධයෙන් වූ බැවින් හා එම නඩුවට පෙනී සිටින රජයේ අධිනීතිඥ මහතාට වෙනත් දිනයක් ලබාදීමට නොහැකි බව පවසන ලද හෙයින්ද මෙදිනට මහාධිකරණ නඩුව සඳහා මහනුවර නීතිඥ ගල්කඩුව මහත්මියගේ සහාය ලබාගෙන ඇත. (වවුචර් අංක 3504 ) තවද මෙදිනට මණ්ඩලීය නීතිඥවරිය විසින් සහතික කරනු ලබන ඔප්පුවල දෙවන පිටපත් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලය වෙත බාරදීමට ද නියමිතව තිබී ඇත.

2014.06.13 වන දිනට අර්ථසාධක අරමුදල් හා පාරිභෝගික නොගෙවීම පිළිබඳ නඩු 21 ක් මොරටුව දිසා මහේස්ත්‍රාත් අධිකරණයේ අඩගැසීමට නියමිතව තිබූ අතර මහනුවර දිසා අධිකරණයේ (DLM/00041/2013) ද නඩුවක් අඩගැසීමට නියමිතව තිබී ඇත. අර්ථසාධක අරමුදල් පිළිබඳ නඩුවලදී මණ්ඩලය වෙනුවෙන් කරුණු දැක්වීමක් කිරීමට තිබූ අතර මහනුවර දිසා අධිකරණයේ නඩුව පැමිණිලිකරුගේ ප්‍රතිඋත්තර ඉදිරිපත් කිරීම සඳහා පමණක් අඩගැසීමට නියමිතව තිබූ බැවින් මාගේ වෘත්තීමය දායකත්වය වඩාත් වැදගත් වූ මොරටුව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු සඳහා මණ්ඩලීය නීතිඥවරිය සහභාගිවූ අතර මහනුවර දිසා අධිකරණයේ නඩුව සඳහා නීතිඥ ගල්කඩුව මියගේ සහාය ලබා ඇත. (වවුචර් අංක 3505)

2014.06.20 වන දිනට මහනුවර මහේස්ත්‍රාත් අධිකරණයේඅංක 61668 දරණ නඩුව නියෝගය ප්‍රකාශ කිරීම සඳහා අඩගැසීමට නියමිතව තිබූ අතර එදිනට කම්කරු දෙපාර්තමේන්තුවේ පැවති පරීක්ෂණයකටද සහභාගිවීමට නියමිතව තිබුණි. එයින් නියෝගයදීම සඳහා පමණක් නියමිතව තිබූ මහනුවර මහේස්ත්‍රාත් අධිකරණ නඩුව සඳහා නීතිඥ ගල්කඩුව මියගේ සහාය ලබාගන්නා ලද අතර මණ්ඩලය නියෝජනය කිරීම සඳහා පල්ලෙකැලේ කාර්මික ජනපද අධිකාරි ගවරම්මාන මයා සහභාගි කරවා ඇත.

මාතලේ කළුදැවල කාර්මික ජනපදයේ එක් මායිමක් සම්බන්ධයෙන් තෙවන පාර්ශවයක් විසින් 2009 වර්ෂයේ මණ්ඩලයට එරෙහිව මාතලේ දිසා අධිකරණය ඉදිරියේ අංක L 6303/2009 දරණ නඩුව පවරන ලද අතර මණ්ඩලය වෙනුවෙන් උත්තර ඉදිරිපත් කිරීමෙන් අනතුරුව මායිම් නිරාකරණය කර ගැනීම සඳහා ඉඩම් මැනීමට නියම කරන ලදී. මෙම සඳහා ඉදිරි පියවර ගැනීම පැමිණිලිකරුගේ කාර්යයක් වන අතර අදාල කොමිෂන් වාර්තාව ඉදිරිපත් කරන තෙක් විත්තිකාර (මණ්ඩලය) පාර්ශවයට අධිකරණයේ හුදෙක් පෙනී සිටීම හැර වෙනත් කලයුතු දෙයක් නොමැත. මෙම සඳහා මණ්ඩලයේ නීතිඥවරිය සහභාගිවීම අත්‍යාවශ්‍ය නොවන බැවින් මණ්ඩලයට දැරීමට සිදුවන වියදම් සලකා බලා ඒ සඳහා මාතලේ දිස්ත්‍රික් කාර්යාලයේ නිර්දේශය මත මාතලේ නීතිඥ මහතකු වන ලසන්ත බාලසූරිය මහතාගේ සහාය ලබාගෙන ඇත. මෙම නඩුව 2014.05.16 වන දිනට කොමිෂන් වාර්තාව සඳහා අඩගැසීමට නියමිතව තිබූ අතර එදිනටමොරටුව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක 28852 හා අදාලව නීතිපති දෙපාර්තමේන්තුවේ සාකච්ඡාවකට සහභාගිවීමට නියමිතව තිබූ බැවින් 2014.05.16 වන දින මෙම නඩුව සඳහා නීතිඥ බාලසූරිය මහතාගේ සහාය ලබා ඇත. ( වවුචර් අංක 3506 )

තවද ආයතනයක නීති නිලධාරියකුගෙන් අපේක්ෂිත රාජකාරිය වන්නේ අවශ්‍ය නීතිඥ සහාය ලබාදීම වන අතර උපදේශනාත්මක හා අධිනීතිඥ සේවය අවශ්‍ය අවස්ථාවන්හිදී නීතිපති දෙපාර්තමේන්තුවේ සහාය ලබාගනී.

රාජ්‍ය ආයතනයන්හි නඩු සඳහා නීතිපති දෙපාර්තමේන්තුවේ සහාය ලබාගැනීම රජයේ චක්‍රලේඛනානුකූලව සිදු කරනු ලැබේ.

ඒ අනුව මහනුවර මහේස්ත්‍රාත් අධිකරණ නඩු අංක 53593 නඩුව සඳහා රජයේ අධිනීතිඥවරයකු පෙනී සිටි දින දෙක සඳහා පමණක් සහ ලිඛිත දේශන සැකසීම සඳහා රු.49500/- ක මුදලක් ද කොළඹ වාණිජ මහාධිකරණයේ මණ්ඩලයට එරෙහිව පවරා තිබූ අංක CHC/26/2011/MR දරණ නඩුව සඳහා රජයේ අධිනීතිඥ පෙනී සිටි දින 06 සඳහා පමණක් සහ විරෝධතා, උත්තර, ලිඛිත දේශන සකස් කිරීම සඳහා රු.91,500/- ක මුදලක් වශයෙන් රු.141,000/- ක මුදලක් නීතිපති දෙපාර්තමේන්තුව වෙත ගෙවන ලදී. ඉහත CHC/26/2011/MR නඩුවට අමතරව එම අධිකරණයේ CHC/27/2011/MR යටතේද නඩුවක් පවරා තිබුන අතර ඉහත අංක 26 දරණ නඩුව සමඟ ඒ සැම දිනකම මෙම නඩුවද අඩ ගසන ලද අතර ඒ සඳහා රජයේ අධිනීතිඥ සහාය ලබාදෙන ලද නමුත් ඒ සඳහා අමතර ගාස්තුවක් අය කර නොමැත.

නීතිපති දෙපාර්තමේන්තුව විසින් අයකරනු ලබන රේට්‍යන් කාලීනව වැඩි කරනු ලබන අතර එය පොදුවේ සියලුම රාජ්‍ය ආයතනයන්ට අදාල වන වියදමක් වේ.

4.4 මතභේදයට තුඩුදෙන කරුණු

(අ) ඔප්පු ගාස්තු ගෙවීම

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් පාලනය කරනු ලබන කාර්මික ජනපදයන්හි ඉඩම් සහ ගොඩනැගිලි කර්මාන්තකරුවන් වෙත දීර්ඝ කාලීන බදු පදනම මත පවරනු ලබන අතර නීත්‍යානුකූල බදු ගිවිසුම් අත්සන් කිරීමේදී ඒ සඳහා දැරිය යුතු මුද්දර ගාස්තු සහ නොතාරිස් ගාස්තු අදාල කර්මාන්තකරුවාගෙන් අයකරනු ලැබේ. ඒ අනුව මුද්දර ගාස්තු වශයෙන් අදාල බදු වටිනාකමින් 1% ක මුදලක් අය කරනු ලබන අතර එකී වටිනාකමට සරිලන මුද්දර අදාල ඔප්පුවේ දෙවන පිටපතට අලවා එළඹෙන මාසයේ 15 දිනට පෙර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයට බාරදීමට කටයුතු කරනු ලැබේ. අදාල බදු වටිනාකමින් 1% ක මුදලක්රු:20,000/- ක උපරිමයකට යටත්ව නොතාරිස් ගාස්තු වශයෙන් කර්මාන්තකරුගෙන් අයකරනු ලබන අතර එකී මුදලින් පහත සඳහන් පරිදි 2005.03.11 දින සහ අංක 4141 දරණ අධ්‍යක්ෂ මණ්ඩලීය තීරණය පරිදි නීති නිලධාරි හට ගෙවනු ලැබේ.

එනම් ඉහත කී පරිදි රු.5000/- දක්වා මුදලින් රු:1000/- ක මුදලක් ද රු.5000/- සිට 7500/- දක්වා මුදලින් රු:2000/- ක මුදලක් ද රු:10,000/- ට වැඩි රු:20,000/- අඩු මුදලින් රු: 3000/- ක මුදලක්ද බැගිනි.

බදු ගිවිසුම් අවලංගු කිරීමේ ඔප්පු සඳහා වටිනාකමක් නොමැති අතර මණ්ඩලය විසින් ඒ සඳහා කර්මාන්තකරුවන්ගෙන් නොතාරිස් ගාස්තු වශයෙන් රු:5000/- ක මුදලක් අය කරනු ලබන අතර එයින් රු:1000/- මුදලක් නීති නිලධාරියාට ආපසු ගෙවනු ලැබේ. ඒ අනුව ඉහත විගණනයේ සඳහන් අදාල ඔප්පු සඳහා මණ්ඩලය අයකර ගන්නා ලද මුදල සහ ඊට අදාල රිසිට්පත් අංකය පහත සඳහන් කර ඇත.

| වවුචර් අංකය | කර්මාන්තකරුගේ නම | කර්මාන්තකරුගෙන් අයකල මුදල | අදාල රිසිට්පත් අංකය | නොතාරිස් ගාස්තු |
|---|---|---|---|---|
| 401 | යූ.එස්.එස්.ඉංජිනියරින් | 20,000/- | 511246 | 3,000/- |
| 417 | එම්.එච්.එම්.අමීර්ඩීන් | 20,000/- | 515601 | 3,000/- |
| 758 | සී ඇන්ඩ් ඒ සිලිකේට් | 20,000/- | 511285 | 3,000/- |
| 2104 | රන්ෆර් | 20,000/- | 517808 | 3,000/- |
| 4311 | කෝ ලංකා | 5,000/-<br>20,000/- | 530028<br>530026 | 1,000/-<br>3,000/- |
| 5048 | එවර්ෂයින්<br>වෙන්ගඩේෂ්වර්<br>ඇග්‍රොටෙක්නිකා | 20,000/-<br>20,000/-<br>20,000/- | 530796<br>534022<br>530026 | 3,000/-<br>3,000/-<br>3,000/- |

ඒ අනුව මෙම මුදල කිසිසේත්ම මණ්ඩලය විසින් දරනු ලබන මුදලක් නොවන බවත් නොතාරිස් ගාස්තු වශයෙන් මණ්ඩලය විසින් කර්මාන්තකරුගෙන් අය කරනු ලබන මුදලින් අධ්‍යක්ෂ මණ්ඩලීය තීරණය මත නීති නිලධාරියාට කරනු ලබන ගෙවීමක් වේ. මේ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල තීරණය ලබාදීමට පෙර නීතිපති දෙපාර්තමේන්තුව වෙතින් මෙන්ම වෙනත් මෙවැනි රජයේ ආයතන වලින් ද විමසීමක් කර ඇත. නොතාරිස් ගාස්තු අය කිරීම පිළිබඳව පෙර පැවති අධ්‍යක්ෂ මණ්ඩලීය තීරණය අනුව නොතාරිස් ගාස්තු වශයෙන් කර්මාන්තකරුගෙන් අයකර ගනු ලබන මුදලින් 75% ක මුදලක් නීති නිලධාරියාට ගෙවිය යුතු වේ. නොතාරිස් කාර්යයන් නීති නිලධාරිනියගේ නිත්‍ය රාජකාරියට අයත් නොවන නමුත් මණ්ඩලය වෙනුවෙන් දිස්ත්‍රික් කාර්යාල සඳහා නොතාරිස් ගාස්තු අය කිරීමකින් තොරව වාර්ෂිකව බදු ගිවිසුම් අත්සන් කරනු ලැබේ. තවද

නොතාරිස්වරයෙකු විසින් ලියා සහතික කරන ලද ඔප්පු සඳහා ඔහුට ඇති වගකීම මණ්ඩලීය සේවා කාලය ඉකුත්වීමෙන් අනතුරුවද ඔහු හා බැඳී පවතී.

(ආ) ආරක්ෂක සේවා කොන්ත්‍රාත්තුව

පහත කරුණු සැලකිල්ලට ගෙන ආරක්ෂක සේවා කොන්ත්‍රාත්තුව පිරිනමා ඇත.

අවම මිළ සහිත Magnam 4 ආයතනයේ අඩුපාඩු කීපයක් තිබූ බැවින් එම ආයතනයට එම අවස්ථාව ලබාදී නොමැති අතර Allied Security හා C.P.Lanka යන ආයතන 02 ට වඩා අඩු මිල ගණන් ඉදිරිපත් කර තිබූ Sathira Security Services & Investigations (Pvt) Ltd ආයතනයේ පැවති අඩුපාඩුව වන EPF & ETF වාර්තා ඉදිරිපත් නොකිරීම එම ආයතනයේ ලේඛන ගෙන්වා පරීක්ෂා කර බලා සෑහීමකට පත්වීමෙන් පසුව, ටෙන්ඩරය ලබාදීමට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කර ඇත.

එමෙන්ම තෝරා ගෙන තිබූ Sathira Security Services & Investigations (Pvt) Ltd ආයතනයේ පසුගිය කාලය තුල අසතුටුදායක සේවාවන් සැපයූ බවට තා.ඇ.කමිටුවට හෝ ටෙන්ඩර් මණ්ඩලය වෙත ලිඛිතව වාර්තා වී නොමැත.

4.5 අරමුදල් ඌන උපයෝජනය

අ) 2013.12.31 දිනට ඉතිරි කිරීමේ ගිණුම්වල ආයෝජනය කර ඇති රු.22,904,059 ක ශේෂයේ වර්තමාන තත්ත්වය පහත පරිදි ඉදිරිපත් කරමි.

| | විස්තරය | ගිණුම් අංකය | 2013.12.31 | 2014.12.31 | 2015.07.30 |
|---|---|---|---|---|---|
| 1. | ඉතිරි කිරීමේ ගිණුම - සෙස් අරමුදල | 9123868 | 10,854.502.09 | 11,114,908.75 | 11,286,469.85 |
| 2. | ඉතිරි කිරීමේ ගිණුම - ප්‍රාග්ධන ප්‍රතිපාදන | 71648764 | 1,698,351.02 | 3,265,242.49 | 2,499,377.92 |
| 3. | ඉතිරි කිරීමේ ගිණුම - ජනපද තැන්පතුව | 71582414 | 10,512,599.01 | 8,351,059.66 | 2,809,077.31 |
| 4. | ස්ථාවර තැන්පතු ජනපද | 00006807 | - | 10,505,958.71 | 10,505,958.71 |

ඉහත අංක 1 යටතේ දක්වා ඇති සෙස් අරමුදල අබලි ද්‍රව්‍ය ව්‍යාපෘතියේ අමුද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා 2014 වසරේදී භාවිතා කර ඇති ආකාරය උපලේඛන අංක 2 මගින් ඉදිරිපත් කර ඇත. ස්ථාවර තැන්පතුවක ආයෝජනය කලේ නම් මෙසේ ආයතනයේ අවශ්‍යතා සඳහා මෙම අරමුදල භාවිතයට ගැනීමේදී ගැටලු සහගත තත්ත්වයක් ඇතිවේ. එම නිසා ස්ථාවර තැන්පතු පොලී මුදලද අහිමි වේ. නමුත් ඉතිරි කිරීමේ ගිණුම්වල රඳවා තබා ගැනීමෙන් අරමුදල භාවිතය නිසා විශාල වශයෙන් පොලිය අහිමිවීමක් සිදු නොවේ. 2015.08.01 දිනට ඉතිරිකිරීම් හා ස්ථාවර තැන්පතු අතර පොලී අනුපාතය 2% ක වෙනසක් පවතී.

අංක 2 යටතේ ප්‍රාග්ධන ප්‍රතිපාදන මිලදී ගැනීම් අවශ්‍යතා සඳහා මාරු කර ඇති ආකාරයද උපලේඛන අංක 03 මගින් ඉදිරිපත් කර ඇත.

අංක 3 යටතේ ජනපද තැන්පතු සඳහා ආයෝජනය කර තිබූ මුදල 2014 වසරේදී ස්ථාවර තැන්පතුවල ආයෝජනය කරන ලදී. එය අංක 4 යටතේ පෙන්වා දී ඇත.

ආ) ජංගම ගිණුම්වල පවතින ශේෂ එදිනෙදා ක්‍රියාකාරකම් නිසා වෙනස් වන අතර අමුද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා යොදා ගැනීමට සිදුවේ. අචල තැන්පතුවල ආයෝජනය කිරීමට කළමනාකාරිත්වයේ අවධානය යොමු වී ඇත. එමෙන්ම ජංගම ගිණුම්වල බැංකුවේ 2014.12.31 දිනට අයිරාවක් පෙන්නුම් නොකෙරේ.

ඇ) බැංකු අයිරා පහසුකම් ලබාගෙන නොමැත. තැන්පත් කල චෙක්පත් උපලබ්ධිවීමට ගත වන කාලය සහ බැංකුවේ ගිණුම් අතර මුදල් මාරුවීමට ගතවන කාල පරාසය නිසා මෙම අයිරාවන් ඇතිවී ඇත.

## 4.6 නිශ්ක්‍රිය ඌන උපයෝජන වත්කම්

(අ) අත් සකපෝරු බෙදා හැරීමට මණ්ඩලයේ නිළධාරීන් සම්බන්ධවී ඇති බවට තොරතුරු නොමැති අතර එවකට කුඩා හා ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශයේ නිළධාරීන් මෙම බෙදා හැරීම් කටයුතු සිදුකර ඇති බවට නිරීක්ෂණය වී ඇත. එනිසා මෙම පරීක්ෂණ කටයුතු සඳහා අමාත්‍යාංශ මට්ටමින් පරීක්ෂණ නිළධාරියෙකු/කමිටුවක් පත් කිරීම සුදුසු බවත් එවකට මණ්ඩලීය සභාපතිතුමා විසින් සම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් වෙත 2013.05.03 දාතමින් යුතු ලිපිය මගින් දන්වා ඇත. ඒ අනුව අමාත්‍යාංශ නියෝජිතයෙකු ඇතුළු කමිටුවක් මගින් මූලික විමර්ශනයක් කර වාර්තාවක් ඉදිරිපත් කරන ලදී. නමුත් එම තීරණය ප්‍රමාණවත් නොවන බැවින් මේ සඳහා මූලික පරීක්ෂණයක් සිදු කර වාර්තාවක් ලබාදෙන ලෙස 2013.11.20 දාතමින් යුතු ලිපියක් මගින් දැනුම්දී ඇත. ඒ අනුව මූලික පරීක්ෂණයක් පැවැත්වීම සඳහා බාහිර ස්වාධීන නිළධාරියෙකුගේ සේවය ලබා ගන්නා ලදී. එකී පරීක්ෂණය පැවැත්වෙමින් තිබියදී එවකට සභාපතිතුමාගේ උපදෙස් පරිදි අමාත්‍යාංශ මට්ටමින් මෙම පරීක්ෂණය සිදුකල යුතු බවට තීරණය කර ඉහත මූලික පරීක්ෂණය තාවකාලිකව අත්හිටුවා ඇත. ඉන්පසු මණ්ඩලයේ දැනුම් දීම මත අමාත්‍යාංශය විසින් නිළධාරියෙකු නම් කර එවන ලද නමුත් පසුව වරින් වර ඔවුන්ගේ නියෝජනය වෙනස් කර ඇත. ඒ අනුව සභාපතිතුමා විසින් අමාත්‍යාංශ නියෝජිතයෙක්ද මණ්ඩලයේ නිළධාරියෙක්ද ජාතික ශිල්ප සභාවේ නිළධාරියෙක්ද ඇතුළුව මෙම විමර්ෂණය පැවැත්වීමට පංච පුද්ගල කමිටුවක් පත් කරන ලද අතර එම කමිටුව විසින් නොයෙකුත් හේතූන් මත අදාල වාර්තාව ලබාදීමට ප්‍රමාද කරන ලද හෙයින් දැනට මෙම විමර්ෂණය අමාත්‍යාංශ නියෝජිතයෙකු සහ භාහිර ආයතන නිළධාරියෙකුගෙන් සමන්විත වෙනත් කමිටුවකට භාරදී ඇත.

(ආ) ජංගම තාක්ෂණ බස් රථය මිල දී ගැනීම සම්බන්ධව මූලික විමර්ශනයක් භාහිර පුද්ගලයෙකු විසින් සිදුකර ඇති අතර ඒ පිළිබඳ වාර්තාව හිටපු සභාපතිතුමා වෙත යොමුකර ඇත. වැඩිදුර උපදෙස් සඳහා අදාල වාර්තාව වත්මන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට නියමිතය.

(ඇ) මණ්ඩලය විසින් හා මණ්ඩලයට එරෙහිව පවරා ඇති නඩු සඳහා නිති නිළධාරියා පෙනී සිටිය වුවත් එකම දිනයක අධිකරණ ගණනාවක නඩු ඇසීමට නියමවීම වැනි අවස්ථාවලදී එක නීති නිළධාරියෙකුට සියළු අධිකරණයන් ආවරණය කල නොහැකි බැවින් බාහිර නිතිඥ සහාය ලබාගැනීමට සිදුවීම නිසා මෙම වියදම් දැරීමට සිදුව ඇත.

(ඈ) මණ්ඩලීය භාණ්ඩ සමීක්ෂණ කටයුතු වලට වට්ටෝරු ගත භාණ්ඩ වලට අමතරව අමුද්‍රව්‍ය තොග ගබඩාද ඇතුලත් වේ. අමුද්‍රව්‍ය තොග ගබඩා සමීක්ෂණ වලට සැහෙන කාලයක් ගත වන අතර සහභාගීවන නිළධාරීන්ට යම් දැනුමක්, පළපුරුද්දක් තිබිය යුතු අතර අවස්ථානුකූලව තාක්ෂණික දැනුම ඇති නිළධාරීන්ද යොදවා ගත යුතු වේ.බොහෝ දිස්ත්‍රික් කාර්යාලවල නිළධාරින් ඇත්තේ සීමිතවය. එම නිළධාරීන් භාණ්ඩ සමීක්ෂණ කටයුතු සඳහා යොදවා ගැනීමට නොහැකි වී ඇත්තේ එදිනෙදා එම කාර්යාල කටයුතු අඩපන වන බැවිනි. එසේ නමුදු ප්‍රධාන කාර්යාලයෙන් පිට දි. කාර්යාල වල සේවකයින් මේ සඳහා යොදා ගැනුනත් ඔවුන් ප්‍රධාන කාර්යාලයට පැමිණ අවශ්‍ය සමීක්ෂණ ලියකියවිලි රැගෙන යාම හා සමීක්ෂණය අවසන් වී අදාල වාර්තා ප්‍රධාන කාර්යාලයට භාරදීමට පෙර අදාල ගැලපුම් සකස් කිරීම නොගැලපීම් පිළිබඳ පසුගිය වාර්තා පරීක්ෂා කිරීම ආදිය සිදුකර අවසන් වාර්තා සකස් කරනු ලැබේ. එවැනි අවස්ථා වලදී අතිරේක වියදම් දැරීමට සිදුවන අතර එක් එක් කාර්යාල සහ සේවා ස්ථාන වල ඇති ගබඩා තොග හා වත්කම් අනුව ඊට අදාල තාක්ෂණ දැනුම, තොග ලේඛන පිළිබද දැනුම හා පළපුරුද්ද ඇති නිළධාරීන් ප්‍රධාන කාර්යාලයෙන් හා දි. කාර්යාලයෙන් තෝරා සුදුසු කණ්ඩායමක් වියදම් අවම වන ලෙස සමීක්ෂණ කටයුතු සඳහා යොදා ගැනීම සිදු වේ. වර්ෂ අවසානයේ මෙම භාණ්ඩ සමීක්ෂණ කටයුතු චක්‍ර ලේඛණ පරිදි අනිවාර්ය වේ.

උපදේශන සේවා ගෙවීම යටතේ ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය හා ප්‍රාදේශිය කර්මාන්ත හා වාණිජ මණ්ඩලය එක්ව කර්මාන්තකරුවන්ට අවශ්‍ය සේවාවන් සැපයීමට අදාල උපදේශන සේවාවන් ලබාගැනීමටත් ,අප ආයතනය මගින් සංවිධානය කරනු ලැබූ කර්මාන්ත ප්‍රදර්ශනයට (SMIDEX) අවශ්‍ය උපදේශන සේවාවන් ලබාගැනීමටත් සමන්ත බී.අබේවික්‍රම මහතාට 2014.02.01 දින සිට 2014.07.31 දක්වා වැඩ පැවරුමක් ලබාදෙන ලදී.මේ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා දී ඇත.ඒ අනුව මෙම ගෙවීම් කර ඇත.

(ඉ) සම්භාණ්ඩ අංශයේ ඇති භාවිතා නොකරන යන්ත්‍ර හා වෙනත් ද්‍රව්‍ය අතර බොහොමයක් පෞද්ගලික අංශයේ ආයතන වලින් පරිත්‍යාග ලෙස ලැබුනු ඒවා වේ. තවදුරටත් භාවිතයට ගත නොහැකි යන්ත්‍ර

පරීක්ෂා කර අපහරණ කටයුතු සිදු කිරීම සඳහා කමිටුවක් නම් කර ඇති අතර අපහරණ කටයුතු ඒ අනුව සිදුකරනු ලැබේ.

4.7 ආර්ථික නොවූ ගණුදෙනු

(අ), (ආ) තාක්ෂණික සේවා අංශයේ සෑම නිළධාරියෙකුටම සෘජු දුරකථන පහසුකම් ලබාගැනීමේ අරමුණින් සහ අන්තර්ජාල පහසුකම් සහ වෙබ් අඩවිය පවත්වාගෙන යෑම සඳහා ඩයලොග් ආයතනයෙන් පහසුකම ලබාගෙන තිබිණි. නමුත් ඩයලොග් ආයතනයෙන් ලබාගෙන ඇති මෙම පහසුකම ඒ සඳහා යන වියදම සමග ආර්ථික වශයෙන් ඵලදායී නොවන නිසා එවකට සිටි සභාපතිතුමා 2014.07.03 සිට මෙම සම්බන්ධතාවය නවතා දැමීමට ඩයලොග් ආයතනය වෙත දැනුම් දුන් අතර දැනට මෙම පහසුකම ක්‍රියාත්මක නොවේ.
මෙහි ඉතිරි ගෙවීම් සිදු කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරි රැස්වීමට ඉදිරිපත් කිරීමට නියමිතය.

4.8 කාර්ය මණ්ඩල පරිපාලනය

i. මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, අධ්‍යක්ෂ තනතුරු සඳහා ප්‍රසිද්ධ පුවත්පත් මගින් දැන්වීම් පළකර අයදුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණ පවත්වා අධ්‍යක්ෂ ජනරාල්, අධ්‍යක්ෂ මුදල් සහ අධ්‍යක්ෂ අලෙවි තනතුරු සඳහා බඳවා ගැනීම සිදුකර ඇත. ඉතිරි තනතුරු සඳහා ද ඉදිරියේදී බඳවා ගැනීම සිදු කිරීමට නියමිතය.

ii,iii අනුමත කාර්ය මණ්ඩලය තුල මෙම තනතුරු සඳහා බඳවා ගෙන නොමැති අතර නව අනුමත කාර්යය මණ්ඩලය අනුමතවීමට ප්‍රථම පැවති මෙම තනතුරු සඳහා ඒ ඒ පුද්ගලයන්ට අදාල සුදුසුකම් සපුරා තිබීම හේතුවෙන් ඔවුනට පුද්ගලික වනසේ මෙම තනතුරු ලබාදීම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර එවා ඇත.

Iv මණ්ඩලයේ ප්‍රධාන අරමුණ කෙරෙහි බලපාන පුරප්පාඩු ලෙස දක්වා ඇති JM කාණ්ඩයේ සංවර්ධන නිලධාරි, ජ්‍යෙෂ්ඨ ව්‍යාපාර ප්‍රවර්ධන නිලධාරි තනතුරු නව බඳවා ගැනීමේ පරිපාටිය අනුව වෙනම දක්වා තිබුණත් ඔවුන්ගේ රාජකාරි ස්වභාවය මත එම තනතුරු එකක් සේ සලකා කටයුතු කිරීමට අනුමැතිය ලබාගෙන ඇති අතර ඒ අනුව ඔවුන් ජ්‍යෙෂ්ඨ ව්‍යාපාර ප්‍රවර්ධන නිලධාරි තනතුරේ පිහිටුවා ඇත. ඒ අනුව එම තනතුරේ සියලු පුරප්පාඩු සම්පුර්ණ කර ඇත. නමුත් ව්‍යාපාර ප්‍රවර්ධන නිලධාරි (MA 5 - 2) තනතුරේ හා JM කාණ්ඩයට අයත් තනතුරුවල පවතින බඳවා ගැනීමේ කුසලතාවල පවතින විෂමතා හේතුවෙන් ඒ සඳහා බඳවා ගැනීමට නොහැකි වී ඇත. මේ පිළිබඳව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවටද දන්වා ඇත. අනුමැතිය ලැබුණු විගස බඳවා ගැනීමට නියමිතය.

v,vi ඉහළ තනතුරු සඳහා 2014.06.10 දින පුවත්පත් දැන්වීම මගින් අයදුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණ පවත්වා ඇත. ඒ අනුව එය නිශ්කාර්යය වියදමක් නොවන බවත්, එම තනතුරු සඳහා සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත බඳවා ගැනීමට නියමිත බවත් සඳහන් කරමි. එවිට වැඩ බැලීමේ තනතුරු ඉවත්ව යන අතර අංක (5) හා (6) මගින් පෙන්වා දී ඇති ගැටළු සහගත තත්ත්වය මඟ හැරී යනු ඇත.

Vii මණ්ඩලය විසින් කළමනාකරන සේවා චක්‍රලේඛණ අංක 30 ක්‍රියාත්මක කිරීම පිළිබඳව පහත කරුණු පෙන්වාදිය හැක.

(අ) වැටුප් විෂමතාවය ඉවත් කල සියලුම සේවකයින් කළමනාකාරණ සහකාර (තාක්ෂණික) ගණයට අයත් වන අතර මොවුන් සියලුදෙනා මණ්ඩලයට බඳවාගෙන ඇත්තේ කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) කාණ්ඩයට වඩා ඉහළ කාණ්ඩයේ පවතින වැටුප් තලයක පිහිටුවමිනි. නව අනුමත බඳවා ගැනීමේ පරිපාටිය අනුව තාක්ෂණික නොවන අය කළමනාකරණ චක්‍රලේඛ 30 ට අනුව එවකට සිටි වැටුප් පියවරට අනුරූපීව අදාල වැටුප් තලයේ පිහිටුවමින් අන්තර්ග්‍රහණය කලද තාක්ෂණික ගණයට අයත් සේවකයින් සිටි වැටුප් පියවරට අනුරූපී නොවන තලයක පිහිටුවා අන්තර්ග්‍රහණය කර තිබිණි. මේ හේතුවෙන් තාක්ෂණික සේවකයින් ගේ වැටුපට වඩා ඉහල වැටුප් තලයක තාක්ෂණික නොවන අය පිහිටුවීම හේතුවෙන් තාක්ෂණික නොවන හා තාක්ෂණික ගණයේ සේවකයින් අතර වැටුප් විෂමතාවයක්

ඇති විය. වැටුප් විෂමතාවයන්ට අදාලව පිහිටුවන ලද කමිටු මගින්ද මෙම තත්ත්වය දක්වා ඇති අතර මෙම සේවකයින් ද නිරන්තරයෙන් මෙ සම්බන්ධව ඉල්ලුම් කරන ලද හෙයින් සභාපතිතුමාගේ උපදෙස් හා අනුමැතිය මත එම වැටුප් විෂමතාවය නිවැරදි කිරීමට කටයුතු කරන ලදී.

(ආ) බඳවා ගැනීම් පරිපාටියේ කටයුතු දැනට අවසන් කර ඇති සුදුසු ක්‍රමවේදයන් තුලින් ශ්‍රේණිගත උසස්වීම් ලබාදීමට ක්‍රියාමාර්ග සකස් කර ඇත.

(ඇ) දීර්ඝ කාලයක් තිස්සේ මණ්ඩලය තුල නිසි උසස්වීම් ක්‍රමයක් නොතිබීම හේතුවෙන් ඉහත චක්‍රලේඛන වලට අදාලව වැටුප් පියවර වලට අන්තර්ග්‍රහනය කිරීමේදී උසස්වීම් ලබන හා නොලබන වශයෙන් කොටස් දෙකක් යටතේ වර්ගීකරණය කර නොතිබූ බැවින් මණ්ඩලයේ සියළුම සේවකයින් උසස්වීම් ලද සේ සලකා වැටුප් සකස් කර ගෙවීම් කටයුතු සිදුකර ඇත. මෙහිදී ඇතැම් සේවකයන්ට වැඩිපුර වැටුප් ගෙවා ඇති අතර ඇතැම් අයට අඩුවෙන් වැටුප් ගෙවා ඇති බව නිරීක්ෂණය කර තිබූ නමුත්, මේ පිළිබඳව එවකට කළමනාකාරිත්වය විසින් තීරණයක් නොගන්නා ලද බැවින්, වැටුප් තත්ත්වය එසේම පැවත ඇත. මෙයට අදාල වන සේවකයින් විශාල ප්‍රමාණයක් දැනටමත් විශ්‍රාම ගොස් ඇත.

4.9 වාහන උපයෝජනය

(අ) හිටපු සභාපතිතුමා විසින් මේවනවිට අදාල නිළ වාහන මණ්ඩලය වෙත විධිමත් පරිදි ලබාදී ඇති අතර මණ්ඩලයේ පැවති පිළිවෙත අනුව 2013 වර්ෂයේද එවකට හිටපු සභාපතිතුමාටද වාහන දෙකක් (02) භාවිතය සඳහා නිදහස් කර ඇත. එම වාහන දෙක සඳහා රියැදුරන් දෙදෙනෙක් අනුයුක්ත කරදී ඇත. සභාපතිතුමාගේ රාජකාරිමය අවශ්‍යතා මත දෛනිකව වැඩි පැය ප්‍රමාණයක් සේවය කිරීමට රියැදුරු මහතාට නියමව තිබූ බැවින් එම කාර්යය ඉටු කිරීමේදී වැඩි අතිකාල දීමනාවක් ගෙවීමට සිදුවී තිබිණි.

PD -- 6019 වාහනයද සභාපතිතුමා විසින් ඔහුගේ රාජකාරි කටයුතු සඳහා ධාවනයේ යොදා ගෙන ඇත. එමෙන්ම මෙම වාහනය සඳහා ඉන්ධන සපයා ගෙන ඇත්තේද සභාපතිවරයාගේ ඉන්ධන දීමනාවෙනි. එහෙත් ධාවන සටහන් හා ධාවනය කල දුර, ලබාගත් ඉන්ධන ප්‍රමාණයද සටහන් තබා ගණනය කර ඇත. එම ගණනයන් ප්‍රවාහන ඒකකයද පරීක්ෂා කර නිවැරදි බවට අදාල නිලධාරියා අත්සන් කර ඇත. තවද සියලුම ධාවන සටහන් වාහනය පාවිච්චි කල නිලධාරියා වන සභාපතිවරයා විසින් අනුමත කර ඇත.

(ආ) අමාත්‍යාංශයේ උපදෙස් පරිදි සභාපතිතුමාගේ රාජකාරි කටයුතුවල ද යාපනය ( අච්චුවේලි කාර්මික ජනපදය ) ආදී දුරබැහැර ප්‍රදේශවල ධාවනය කිරීමට සිදුවීම නිසා නඩත්තු වියදම් වැඩිවී ඇත.

5. ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය

5.1 2013 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශය ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අනුව සැකසීමට අවශ්‍ය කටයුතු කිරීම සඳහා විශාල කාලයක් ගතවීම සහ 2014 වර්ෂයේ පැරණි ශේෂ විශාල ප්‍රමාණයක් සැසඳුම් කටයුතු සිදුකිරීම නිසා මෙම ප්‍රමාදය ඇති විය. 2015 වසරේ චක්‍රලේඛය අනුව නියමිත දිනට මූල්‍ය ප්‍රකාශයන් ඉදිරිපත් කරනු ලැබේ.

5.2 අභ්‍යන්තර විගණනය

විගණන වාර්තාවන් වර්තමානයේදී මණ්ඩලයේ සභාපතිතුමාට ඉදිරිපත් කරන ලද අතර එහි පිටපතක් රජයේ විගණන කාර්යාලය වෙත ලබාදීමට කටයුතු කර ඇත. 2016 දී මණ්ඩලයේ ක්‍රියාකාරි සැලැස්ම අනුව 2016 ජනවාරි මස 15 දිනට පෙර විගණන සැලැස්මද ඉදිරිපත් කිරීමට කටයුතු සම්පාදනය ඇත.

## 5.3 පාවහන් මිලදී ගැනීම

මණ්ඩලයේ නිලධාරින් සඳහා සපත්තු මිලදී ගැනිමේ ක්‍රියාවලිය පහත පරිදි සිදුවී ඇත.

අ) 2014.05.21 වන දින පරිපාලන අංශය විසින් ඉදිරිපත් කර ඇති භාණ්ඩ හා සේවා අයදුම්පත්‍රයට අදාළව පිරිවිතරයන් සැකසීම සඳහා සැපයුම් අංශයෙන් තා.ඇ.කමිටුව වෙත ඉදිරිපත් කර ඇත. ඊට අදාලව මණ්ඩලයේ සේවක මහතුන්හට හොඳ තත්ත්වයේ පාවහන් මිලදී ගැනීම සඳහා පෙර වර්ෂවලදී සකස් කරන ලද පිරිවිතරයන්වලට අනුකූලවම මෙම වර්ෂයේද අදාල මිලදී ගැනීම් සිදුකිරීම සඳහා තා.ඇ.කමිටුව විසින් පිරිවිතරයන් සකසා ඉදිරිපත් කර ඇත. තා.ඇ.කමිටුව විසින් සපත්තු පළදින සේවක මහතුන්හට ප්‍රමුඛත්වයන් ලබාදී සාම්පල 09 ක් තුලින් පිරිවිතරයන්වලට ගැලපෙන හා නොගැලපෙන සාම්පල අතරින් තෝරා දෙන ලද "ලේස් " වර්ගයේ ආරක්ෂක පාවහන් හා ලේස් සපත්තු මිලදී ගැනීමට නිර්දේශ කර ඇත. මෙම සපත්තු තේරීම ප්‍රතිලාභී සේවක මහතුන් විසින්ම සිදු කර ඇත.

ආ) පිරිවිතර අනුව සාම්පල් ලද අතර, ඒ අනුව සේවක "පරාසය" තුල පාවහන් වර්ග තෝරාගත් අතර ඊට අදාලව වන පරිදි ඇණවුම නිකුත් කර ඇත. තවද තා.ඇ.කමිටු නිලධාරින් ඉදිරියේ මෙම සාම්පල තෝරා ගැනීමද සිදුකර ඇත.

ඇ) සේවක මහතුන් ගේ නිල ඇඳුම් සඳහා සැපයුම් අංශය විසින් තා.ඇ.කමිටුවේ පිරිවිතරයන්වලට අදාලව මිල ගණන් කැඳවා සේවක මහතුන්ගේ අවශ්‍යතාවය පරිදි සාම්පල් තෝරා එම සාම්පල සඳහා තා.ඇ.කමිටුවේ නිර්දේශයට අනුව , ටෙන්ඩර් මණ්ඩල අනුමැතියට යටත්ව අදාල මිලදී ගැනීම් වාර්ෂිකව සිදු කර ඇත.

ඈ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2:4:1 (4) ඡේදයට අනුව සම්පූරණ ප්‍රසම්පාදන ක්‍රියාවලිය තා.ඇ.කමිටුව හා ප්‍රසම්පාදන කමිටුව මගින් ඉතා නිවැරදිව සිදුකර ඇත. පළඳින ඇඳුම් හා කාර්මික ආරක්ෂාව සපයන භාණ්ඩ මිලදී ගැනීමේදී මින් ඉදිරියට එකම වර්ගයේ පාවහන් ලබාදීමට කටයුතු සම්පාදනය කරන බවත් මින් ඉදිරියේදී මණ්ඩලය සපයන පහසුකම් නිවැරදිව පරිහරණය කිරීම සොයා බැලීමට කටයුතු සම්පාදනය කර ඇත. මිලදී ගැනීමෙන් පසු ඇතිවන විකල්ප මතවාද නැති කිරීම සඳහා ඉදිරියේදී තා.ඇ.කමිටුව හා යෝජිත ප්‍රතිලාභී සේවක මහතුන් සමඟ තවදුරටත් සාකච්ඡා කර පිරිවිතර පිළියෙල කිරිමට අදහස් කර ඇත. පළඳින සේවක මහතුන් හා තා.ඇ.කමිටුව විසින් මිලදී ගැනිම සඳහා නිර්දේශ කර ඇති Lacing Shoes – 119 ප්‍රමාණයට අදාල සැපයුම්කරුවන් විසින් සපයා ඇත. නමුත් විවිධ ආයතනාවල සපත්තුවේ ප්‍රමාණය ( Size ) අප ඇණවුම්කල ප්‍රමාණයන්ගෙන්ම ( Size ) ලැබීම සිදුවිය නොහැක. එබැවින් මුළු ප්‍රමාණය නිවැරදි බවත්, ලැබී ඇති හා ඇණවුම්කල ප්‍රමාණයන්වල ගැටළුවක් පැවතුනහොත් ඊට අදාලව සපත්තු ප්‍රමාණයට ගැලපෙන ආකාරයට මාරුකරදීමට ඕනෑම ආයතනයක් සිදු කරයි. මිලදී ගනු ලබන සපත්තුවේ මිල, ප්‍රමාණයන් ( Size )වෙනස්වීමේදී ඒකක මිලෙහි කිසිදු වෙනසක් සිදු නොවෙයි.

ඉ) කළමනාකාරිත්වයේ උපදෙස් හා වාර්ෂික තොග ගණනය කිරීම යටතේ ඉතිරිව ඇති සපත්තු ඉතිරි තොග සියල්ල මණ්ඩලීය සේවක මහතුන් හට ටෙන්ඩර් මගින් විකිණීමට සැලසුම් කර ඇත. මෙවැනි තොග ප්‍රධාන ගබඩාවේ ඉතිරි වනුයේ සේවක මහතුන් විශ්‍රාම යාම, සපත්තු භාවිතා කිරීමට ඇති අකමැත්ත යන කරුණු නිසාය. එකම වර්ගයේ පාවහන් මාදිලියක් මින් ඉදිරියේදී මිලදී ගැනිම තුලින් මෙම ඉතිරිවන පාවහන් ප්‍රමාණය අඩුකර මිලදී ගැනීම් සිදුකල හැකි බැවින්, ඉදිරි වර්ෂයේ මිලදී ගැනීම්වලදී මෙම ක්‍රියාවලිය සිදුකිරිමට සැලසුම් කර ඇත.

ඊ) මණ්ඩලීය සේවකයන් හට ලබාදෙන පාවහන් හා නිල ඇඳුම් ඉදිරි වර්ෂයේ මුල් කාලයේ ලබාදීමට කටයුතු සම්පාදනය කර ඇත.

උ) සම්භාණ්ඩ පුහුණු මධ්‍යස්ථානයේ දැනට පුහුණු වැඩසටහන් පමණක් පවත්වයි. වාණිජ පදනමක් මත නිෂ්පාදන කටයුතු නොකරයි. නිෂ්පාදන කටයුතු සඳහා ආධුනික ශිල්පීන් යොදා ගැනීම පුහුණු කටයුතු පවත්වා ගැනිමට බාධාවකි. තවද නිෂ්පාදනය කර ඒවා අලෙවි කල පසු එහි නඩත්තු කටයුතු සිදු කිරිමටද සිදුවන හෙයින්, ඊට ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් මධ්‍යස්ථානය සතු නොවන බැවින්, මණ්ඩලයේ කාර්ය මණ්ඩලය සඳහා ලබාදෙන පාවහන් මෙම මධ්‍යස්ථානයේ නිෂ්පාදනය කිරිමේ ශක්‍යතාවයක් නොමැත.

5.4 අයවැය ලේඛනමය පාලනය

2014 වර්ෂයේ අයවැයගත වියදම් හා 2013 වර්ෂයේ සත්‍ය වියදම් පිළිබඳ දක්වා ඇති කරුණු අතර

i. ඇස්තමේන්තුගත සීමාව ඉක්මවා වියදම් දරණ ලද අයිතම 10 ක් ලෙස පෙන්වා දී ඇත.

අ) අතිකාල

ආදායම් ඉපයීමේ ක්‍රියාකාරකම් වැඩිවීම නිසා අතිකාල සඳහා යෙදවීම් අත්‍යාවශ්‍ය වූ අතර එම නිසා වියදම් වැඩිවී ඇත.

ආ) පාරිතෝෂික

වාර්ෂිකව ඇස්තමේන්තු සකස් කරන්නේ වසර 60 ක් සම්පූර්ණ වීම නිසා විශ්‍රාම යන සේවකයින් සඳහා පමණක් වන අතර විශ්‍රාමික වයසට පෙර ඉවත්ව යන් සේවකයින් නිසා ඇස්තමේන්තු සීමාව ඉක්මවා ඇත.

ඇ) ගමන් වියදම්

ආදායම් ඉපයීමේ ක්‍රියාකාරකම් වැඩිවීම නිසා ගමන් වියදම් සඳහා යෙදවීම් අත්‍යාවශ්‍ය වූ අතර එම නිසා වියදම් වැඩිවී ඇත.

ඈ) කාර්යාල උපකරණ නඩත්තුව

කාර්යාල උපකරණ නඩත්තු වියදම් වැඩිවී නොමැත. වාහන නඩත්තු වියදම් ඒ වෙනුවට විගණන විමසුමේ පිටපත් වී ඇත. කාර්යාල උපකරණ නඩත්තු වියදම රු.492,193.24 කි.

ඉ) විවිධ වත්කම්

පැරණි වත්කම් නඩත්තුව නිසා වියදම වැඩි වී ඇත.

ඊ) කුලී හා බදු

ප්‍රධාන කාර්යාලය සඳහා ගෙවිය යුතු වරිපනම් සඳහා වෙන් කිරීම් කල නිසා මෙම වියදම් ඉහල ගොස් ඇත.

උ) අධ්‍යක්ෂ දීමනා

ගිණුම් අනුව අධ්‍යක්ෂ දීමනා රු.649,800/- කි.

ඌ) සංග්‍රහ වියදම්

සංග්‍රහ වියදම් වැඩිවී ඇත්තේ අච්චුවේලි කාර්මික ජනපදය විවෘත කිරීමේ උත්සවයට අදාල රු.584,650/- සංග්‍රහ වියදම් යටතේ ගිණුම්ගත කිරීමෙනි. එම වියදම් අච්චුවේලි කාර්මික ජනපදයේ ආරම්භක වියදම් යටතට මාරු කරන ලදී.

එ) සාමාජික ගාස්තු දරා ඇත්තේ රු.8820/- කි. දේශීය පුහුණු වියදම් රු.1,211,792 කි.

ඒ) ලියාපදිංචි ගාස්තුව රු.39,300/- ක් වන අතර ණය පොලී IFRS ප්‍රමිත අනුව ගැලපීම රු.2,011,166/- කි.

ii) තක්සේරු, මිනුම්, සංයුක්ත සැලැස්ම, කර්මාන්ත මැනුම් හා විවිධ වියදම් යටතේ ඇස්තමේන්තු කල ද මණ්ඩලයේ උපයන ලද සත්‍ය ආදායම තුල එම කාර්යයන් ඉටුකර ගත නොහැකි විය.

iii) අයවැය ලේඛන සකස් කරනුයේ ඊට පෙර වර්ෂයේ මැයි ජූනි මාසවලදීය. අංශවල ඇස්තමේන්තු සහ ඒ දක්වා සත්‍ය වියදම මෙහිදී සැලකිල්ලට ගනු ලැබේ. ඉදිරියේදී වසර මැද සත්‍ය වියදම සලකා බලා අයවැය ලේඛනය සංශෝධනය කිරීමට කටයුතු කරනු ලැබේ.

5.5 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2012 වසරේ වාර්ෂික වාර්තා මුද්‍රණය කර කැබිනට් මණ්ඩල අනුමැතිය ලබාගැනීම සඳහා ග්‍රාමීය කර්මාන්ත හා ස්වයං රැකියා ප්‍රවර්ධන අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. 2013 අවසන් විගණන වාර්තාව මේ වනවිට මණ්ඩලය වෙත ලැබී ඇති අතර 2013 වර්ෂයේ වාර්ෂික වාර්තාව සහ 2014 වර්ෂයේ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තු සභාගත කිරීමේ කටයුතු කඩිනම් කිරීමට සහ 2015 වසරේ මූල්‍ය ප්‍රකාශණ නියමිත දිනට විගණකාධිපති වෙත යොමු කර වාර්ෂික වාර්තා සභාගත කිරීමේ ප්‍රමාදය අවම කර ගැනීමට සැලසුම් කර ඇත.

6) පද්ධති හා පාලකයන්

අ) අධ්‍යක්ෂ ජනරාල්, අධ්‍යක්ෂ මුදල් සහ අධ්‍යක්ෂ අලෙවි යන ප්‍රධාන තනතුරු පුරප්පාඩු කීපයක් පිරවීමට මේවනවිට කටයුතු කර ඇත. එමෙන්ම බඳවා ගැනීම් පටිපාටියේ ඇති අඩුපාඩු සකස් කරගෙන යන අතර මණ්ඩලයේ ඉතිරි පුරප්පාඩු ඉදිරියේදී පිරවීමටද කටයුතු කෙරේ.

ආ,ඇ,ඈ) නව ගිණුම්කරණ මෘදුකාංගයක් ස්ථාපිත කර ඇති අතර එමගින් මෙම පද්ධතින්වල ඇති අඩුපාඩු අවම කිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇත.

ඉ) වාහන භාවිතය හා ලේඛන නඩත්තුව සම්බන්ධව ඇති දුර්වලතා ඉවත් කිරීමට අවශ්‍ය උපදෙස් ලබාදෙන ලදී.

මහින්ද ජිනසේන
සභාපති
ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

පිටපත් :
1. නියෝජ්‍ය විගණකාධිපති ,ඒ.එම්.එච්.එල් අබන්වල මහතා
2. ලේකම්, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය
3. අධ්‍යක්ෂ, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව
4. විගණන අධිකාරී,රජයේ විගණන අංශය

සකස් කලේ : අධ්‍යක්ෂ මුදල් 4/10

පරීක්ෂා කලේ:අභ්‍යන්තර විගණක 10/8/15

සහතික කලේ: අධ්‍යක්ෂ ජනරාල් 10/8/15

INDUSTRIAL DEVELOPMENT BOARD

ESTATE DEBTORS-AS AT 31/12/2014

Annex 01

| | A | B | C | D | E | F |
|---|---|---|---|---|---|---|
| | | | A+B | | | |
| Estate | Total for existing | Total for ceased operation | Total | Balance for the above date as per the AQ 2014/22 | A - D Variance | C - D Variance |
| 61 Industrial Estate -Ekala | 5,899,893.77 | 3,068,529.72 | 8,968,423.49 | 6,374,290.00 | - 474,396.23 | 2,594,133.49 |
| 62 Pallekale | 4,524,373.55 | 3,157,816.63 | 7,682,190.18 | 1,696,851.00 | 2,827,522.55 | 5,985,339.18 |
| 63 Horana | 3,527,179.94 | 1,927,605.70 | 5,454,785.64 | 3,607,096.00 | - 79,916.06 | 1,847,689.64 |
| 64 Pannala | 567,247.78 | 1,169,794.79 | 1,737,042.57 | 615,566.00 | - 48,318.22 | 1,121,476.57 |
| 65 Lunuwilla | 792,774.57 | 40,947.30 | 833,721.87 | 1,026,747.00 | - 233,972.43 | (193,025.13) |
| 69 Mathale | 2,322,732.42 | 204,419.66 | 2,527,152.08 | 2,398,439.00 | - 75,706.58 | 128,713.08 |
| 71 Pussella | 208,430.52 | - | 208,430.52 | 294,333.00 | - 85,902.48 | (85,902.48) |
| 72 Galigamuwa | 242,194.20 | 153,398.09 | 395,592.29 | | 242,194.20 | 395,592.29 |
| 73 Panaluwa | 1,436,542.94 | 169,609.91 | 1,606,152.85 | 2,068,017.00 | - 631,474.06 | (461,864.15) |
| 74 Beliatta | 428,638.81 | 3,866.02 | 432,504.83 | | 428,638.81 | 432,504.83 |
| 75 Kotagala | 364,607.01 | 24,663.49 | 389,270.50 | 313,395.00 | 51,212.01 | 75,875.50 |
| 79 Vaulugala | 1,550,648.16 | - | 1,550,648.16 | 3,028,419.00 | - 1,477,770.84 | (1,477,770.84) |
| 81 Vavuniya | 1,228,686.42 | 73,002.44 | 1,301,688.86 | 398,300.00 | 830,386.42 | 903,388.86 |
| Total | 23,093,950.09 | 9,993,653.75 | 33,087,603.84 | 21,821,453.00 | 1,272,497.09 | 11,266,150.84 |

Date: 06/08/2015
Time: 10:19:45

# Industrial Development Board - 2014

Annexture Page: 2

## Nominal Activity

Date From: 01/01/1980
Date To: 06/08/2015

N/C From:
N/C To: 99999999

Tran..action From: 1
Transaction To: 99999999

N/C: 185413 Name: Cess Fund - Savings Account- 9123868 Account Balance: 11,114,908.75 DR

| No | Type | Date | Account | Ref | Details | Dept | T/C | Value | Debit | Credit | V | B |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 20543 | PA | 12/03/2014 | CEY030 | V N 01 | Payment on Account | 0 | T9 | 2,081,538.29 | | 2,081,538.29 | - | N |
| 20544 | PA | 27/03/2014 | CEY0047 | V N 02 | Payment on Account | 0 | T9 | 1,787,748.25 | | 1,787,748.25 | - | N |
| 20545 | PA | 31/03/2014 | CEY031 | V N 03 | Payment on Account | 0 | T9 | 1,150,300.57 | | 1,150,300.57 | - | N |
| 20546 | PA | 05/05/2014 | SRI029 | V N 04 | Payment on Account | 0 | T9 | 1,611,338.00 | | 1,611,338.00 | - | N |
| 20591 | BR | 31/01/2014 | 185413 | Pass Boo | Interest January | 9 | T0 | 36,875.57 | 36,875.57 | | N | N |
| 20592 | BR | 28/02/2014 | 185413 | Pass Boo | Interest February | 9 | T0 | 33,408.80 | 33,408.80 | | N | N |
| 20593 | BR | 31/03/2014 | 185413 | Pass Boo | Interest March | 9 | T0 | 31,969.56 | 31,969.56 | | N | N |
| 20594 | BR | 30/04/2014 | 185413 | Pass Boo | Interest April | 9 | T0 | 19,475.94 | 19,475.94 | | N | N |
| 38702 | JD | 01/08/2014 | 185413 | B/St | Fund Transfer | 150 | T9 | 2,500,000.00 | 2,500,000.00 | | - | N |
| 47150 | JD | 09/12/2014 | 185413 | B/St/12/ | Fund Transfer | 150 | T9 | 3,000,000.00 | 3,000,000.00 | | - | N |
| 47155 | JC | 09/12/2014 | 185413 | REVERSE | Reversal of Tran. 47150 | 150 | T9 | 3,000,000.00 | | 3,000,000.00 | - | N |
| 47158 | JD | 12/09/2014 | 185413 | B/St | Fund Transfer | 0 | T9 | 3,000,000.00 | 3,000,000.00 | | - | N |
| 51964 | JD | 13/10/2014 | 185413 | B/St | Fund Transfer | 0 | T9 | 1,800,000.00 | 1,800,000.00 | | - | N |
| 58215 | JD | 10/11/2014 | 185413 | B/St/11/ | Fund Transfer | 150 | T9 | 2,000,000.00 | 2,000,000.00 | | - | N |
| 65[illegible] | JD | 31/12/2013 | 185413 | OP BAL | Opening bal Imported from 2013 | 0 | T0 | 10,854,502.87 | 10,854,502.87 | | N | N |
| 7620[illegible] | JD | 22/12/2014 | 185413 | B/St/12/ | Fund Transfer | 150 | T9 | 1,076,854.40 | 1,076,854.40 | | - | N |
| 85609 | BR | 30/05/2014 | 185413 | Pass Boo | Saving Interest May | 9 | T0 | 15,464.02 | 15,464.02 | | N | N |
| 85610 | BR | 30/05/2014 | 185413 | Pass Boo | Saving Interest June | 9 | T0 | 10,477.64 | 10,477.64 | | N | N |
| 85611 | BR | 30/05/2014 | 185413 | Pass Boo | Saving Interest July | 9 | T0 | 10,858.93 | 10,858.93 | | N | N |
| 85612 | BR | 30/05/2014 | 185413 | Pass Boo | Saving Interest August | 9 | T0 | 19,111.31 | 19,111.31 | | N | N |
| 85613 | BR | 30/05/2014 | 185413 | Pass Boo | Saving Interest September | 9 | T0 | 24,734.31 | 24,734.31 | | N | N |
| 85614 | BR | 30/05/2014 | 185413 | Pass Boo | Saving Interest October | 9 | T0 | 28,148.82 | 28,148.82 | | N | N |
| 85615 | BR | 30/05/2014 | 185413 | Pass Boo | Saving Interest Novemberer | 9 | T0 | 30,615.72 | 30,615.72 | | N | N |
| 85616 | BR | 30/05/2014 | 185413 | Pass Boo | Saving Interest December | 9 | T0 | 35,056.79 | 35,056.79 | | N | N |
| 85627 | BP | 31/01/2014 | 185413 | Pass Boo | Bank Charges January 2014 | 9 | T0 | 3,687.56 | | 3,687.56 | N | N |
| 85628 | BP | 28/02/2014 | 185413 | Pass Boo | Bank Charges February 2014 | 9 | T0 | 3,340.88 | | 3,340.88 | N | N |
| 85629 | BP | 31/03/2014 | 185413 | Pass Boo | Bank Charges March 2014 | 9 | T0 | 3,196.96 | | 3,196.96 | N | N |
| 85630 | BP | 30/04/2014 | 185413 | Pass Boo | Bank Charges April 2014 | 9 | T0 | 1,947.59 | | 1,947.59 | N | N |
| 85631 | BP | 31/05/2014 | 185413 | Pass Boo | Bank Charges May2014 | 9 | T0 | 1,546.40 | | 1,546.40 | N | N |
| 85632 | BP | 30/06/2014 | 185413 | Pass Boo | Bank Charges June 2014 | 9 | T0 | 1,047.76 | | 1,047.76 | N | N |
| 85633 | BP | 30/07/2014 | 185413 | Pass Boo | Bank Charges July 2014 | 9 | T0 | 1,085.89 | | 1,085.89 | N | N |
| 85634 | BP | 30/08/2014 | 185413 | Pass Boo | Bank Charges August 2014 | 9 | T0 | 1,911.13 | | 1,911.13 | N | N |
| 85635 | BP | 30/09/2014 | 185413 | Pass Boo | Bank Charges Sept. 2014 | 9 | T0 | 2,473.43 | | 2,473.43 | N | N |
| 85636 | BP | 31/10/2014 | 185413 | Pass Boo | Bank Charges Oct.. 2014 | 9 | T0 | 2,814.88 | | 2,814.88 | N | N |
| 85637 | BP | 30/11/2014 | 185413 | Pass Boo | Bank Charges Nov.. 2014 | 9 | T0 | 3,061.57 | | 3,061.57 | N | N |
| 8[illegible]8 | BP | 31/12/2014 | 185413 | Pass Boo | Bank Charges Dec 2014 | 9 | T0 | 3,505.68 | | 3,505.68 | N | N |
| 8[illegible]0 | PA | 27/05/2014 | CEY020 | B/draft | Payment on Account | 0 | T9 | 1,155,430.65 | | 1,155,430.65 | - | N |
| 85703 | PA | 13/10/2014 | LAN009 | B/Draft | Payment on Account | 0 | T9 | 2,590,498.64 | | 2,590,498.64 | - | N |
| 85714 | BP | 12/03/2014 | 185413 | Pass Boo | Bank Charges | 9 | T0 | 1,248.92 | | 1,248.92 | N | N |
| 85715 | BP | 27/03/2014 | 185413 | Pass Boo | Bank Charges | 9 | T0 | 1,072.65 | | 1,072.65 | N | N |
| 85716 | BP | 31/03/2014 | 185413 | Pass Boo | Bank Charges | 9 | T0 | 690.18 | | 690.18 | N | N |
| 85717 | BP | 05/05/2014 | 185413 | Pass Boo | Bank Charges | 0 | T0 | 966.80 | | 966.80 | N | N |
| 85718 | BP | 30/05/2014 | 185413 | Pass Boo | Bank Charges | 0 | T0 | 693.25 | | 693.25 | N | N |
| 85719 | BP | 13/10/2014 | 185413 | Pass Boo | Bank Charges | 0 | T0 | 1,500.00 | | 1,500.00 | N | N |
| | | | | | | | Totals: | | 24,527,554.68 | 13,412,645.93 | | |
| | | | | | | | History Balance: | | 11,114,908.75 | | | |